# දහම් පාසල්
# 8 ශ්‍රේණිය



# දහම් පාසල

## 8 වන ශ්‍රේණිය


### ලේඛක මණ්ඩලය

ශාස්ත්‍රපති අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති පූජ්‍ය ඇස්වත්තේ රේවත ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති පූජ්‍ය ගෝණදූවේ ගුණානන්ද ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති පූජ්‍ය නෙළුවාකන්දේ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති පූජ්‍ය වඳමල්දෙණියේ සෝමාලෝක ස්වාමීන් වහන්සේ
ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි මහතා
ශාස්ත්‍රපති ගුණසේන මහතන්ත්‍රිගේ මහතා
ආචාර්ය දේශප්‍රිය ගුණසේන මහතා



සම්පාදනය හා ප්‍රකාශනය
**බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව**
**2018**

ශ්‍රී ලංකා ජනරජයේ පරිත්‍යාගයක් වූ මෙම පොත
නිසි ලෙස පරිහරණය කර සහෝදර සිසුවෙකුට
පිරිනැමීම සඳහා අවසානයේ ආපසු භාරදීම
ඔබේ යුතුකම වන්නේය.

## උපදේශක මණ්ඩලය

අතිපූජ්‍ය තෙරිපැහැ සෝමානන්ද මහානායක ස්වාමීන් වහන්සේ
ආචාර්ය පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේ
මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනුනායක ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති පූජ්‍ය ගෝණදූවේ ගුණානන්ද ස්වාමීන් වහන්සේ
අති පූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක ස්වාමීන් වහන්සේ
ආචාර්ය පූජ්‍ය තුඹුල්ලේ සීලක්ඛන්ධ නායක ස්වාමීන් වහන්සේ
පූජ්‍ය දික්වැල්ලේ තිස්ස නායක ස්වාමීන් වහන්සේ
පූජ්‍ය මැදගම ධම්මානන්ද ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති ගුණසේන මහතන්ත්‍රීගේ මහතා
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් - චන්ද්‍රප්‍රේම ගමගේ මහතා
බෞද්ධ කටයුතු කොමසාරිස් - එච්.එන්. කුමාරි මහත්මිය

## සංස්කරණය හා මුද්‍රණ කටයුතු සම්බන්ධීකරණය

ව්‍යාපෘති නිලධාරි කේ.එස්. අශෝක මංජුල බණ්ඩාර මහතා

## පරිගණක පිටු සැකැස්ම

ව්‍යාපෘති නිලධාරි එච්.එම්.බී.එස්.බී.හේරත් මහතා

## මුද්‍රණය

ඩිජිස්කෑන් සිකියුර් ප්‍රින්ට් සොලූෂන්ස් (පුද්ගලික) සමාගම

# දහම් පාසල් අධ්‍යාපනයේ පරමාර්ථ හා නිපුණතා

## පරමාර්ථය

බුදුදහම පදනම් කරගෙන තමා සහ අවට පරිසරය පිළිබඳ අවබෝධයක් ඇති, එම අවබෝධය අනුව හැසිරෙන සහ එසේ හැසිරීමේ ප්‍රතිඵල අත්දකින ගුණ නැණ දෙකෙන් පිරිපුන් දරු පිරිසක් බිහි කිරීම.

## නිපුණතා

**දහම් පාසල් දරුවා**

1. දහම් පාසල් අධ්‍යාපනයේ වටිනාකම හැඳින ගෙන තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.

2. බුද්ධ චරිතය හා වෙනත් ශ්‍රේෂ්ඨ චරිත හැඳින ජීවා චරිතායනය කරයි.

3. පන්සිල් සුරකිමින් සඟරුවනට හා ගුරු දෙගුරුන්ට ගරු බුහුමන් දක්වයි.

4. ධර්මය පිළිබඳ නිවැරදි, නිරවුල් දැනුමක් ඇති ව තමන්ටත්, අනුන්ටත් හිත පිණිස වන පෞරුෂයක් ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි.

5. කායික හා මානසික සෞඛ්‍යය පිළිබඳ සැලකිලිමත් වෙමින්, විවේකය ඵලදායි ලෙස ගත කරයි.

6. දේශාභිමානයෙන් යුතු ව ශාසනික උරුමය සහ බෞද්ධ සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කරයි.

7. බෞද්ධ නිර්ණායක අනුව කළ යුතු නොකළ යුතු දේ නිවැරදි ව හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

8. බෞද්ධ ආර්ථික හා දේශපාලන දර්ශනය හැඳිනගෙන ඊට අනුරූපී ව ක්‍රියා කරයි.

9. බෞද්ධ සිරිත් විරිත්, වත් පිළිවෙත් හා පරිසරය හැඳින ඊට අනුරූපී ව ක්‍රියා කරයි.

10. පාලි භාෂා කුසලතාව සහ අභිධර්මය පිළිබඳ මූලික දැනුම ඇතිකර ගැනීමට ක්‍රියා කරයි.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

## අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය

අධ්‍යාපනය මගින් කෙනෙකුට තමා තුළ ඇති හැකියාවන්, ශක්තියන් මතුකොට ගෙන ගුණාත්මකව හා සාර්ථකව ඉහළ තලයකට ගමන් කිරීමේ හැකියාව ලැබේ. ගුණ නැණ වෙලෙන යුතු දරුවෙකු බිහි කිරීමට පාසලෙන් පමණක් ලබාගන්නා අධ්‍යාපනය ප්‍රමාණවත් නොවන බව තර්කයෙන් තොරව පිළිගත යුතු සත්‍යයකි. එබැවින් දරුවාගේ ජීවිතය යහමගට යොමු කිරීමේ කේන්ද්‍රීය ස්ථානය වන්නේ දහම් පාසලයි.

තම දරුවාට දහම් අධ්‍යාපනය ලබාදීම දෙමාපියන් සතු සුවිශේෂී වගකීමකි. තම දරුවා උගතෙකු, දක්ෂයෙකු පමණක් නොව සාරධර්ම හා ගුණ දහමින් හෙබි සදාචාර සම්පන්න පුද්ගලයෙකු කිරීමට පියවර ගැනීම ද දෙමාපියන්ගෙන් ඉටුවිය යුතු වටිනා කාර්යභාරයකි.

යහපත් සමාජයක් උදෙසා 1895 දී උදාර සත්පුරුෂයින්ගේ පුරෝගාමීත්වයෙන් ඇරඹුණු දහම් පාසල් සේවාවෙන් එදා මෙදා තුර සමාජයට දායාද කර දුන් දරු පරපුර අප රටේ අගනා වස්තුවකි. සමාජයට වැඩදායී දරු පරපුරක් තැනීමෙහි ලා ලාභ අපේක්ෂාවෙන් තොරව තම කාලය හා ශ්‍රමය ස්වෙච්ඡාවෙන් කැප කරන සමස්ත දහම් පාසල් ගුරු පරපුරට අප සියලුදෙනාගේ ම ප්‍රණාමය හිමිවිය යුතු ය. යහ ගුණ වැඩීමට අමතරව භාවනාව තුළින් දරුවාගේ විනය සහ පෞරුෂත්වය වැඩීම දහම් පාසල තුළින් සිදුවන තවත් සුවිශේෂී කර්තව්‍යයකි.

ආදරණීය දුවේ, පුතේ, දහම් දැනුම ලබාගැනීම උදෙසා ඔබ වෙත පිරිනැමෙන මෙම අගනා කෘතිය හොඳින් පරිශීලනය කොට ලබන දහම් දැනුම ඔබේ ජීවිතය ඔපවත් කර ගැනීමටත්, ඔබට ජීවන මග හමුවන විවිධ දුක් ගැහැට උපේක්ෂා-වෙන් විමසා ජයග්‍රහණය කරා ළඟාවීමටත් හේතුවේවායි ඉතා සිතින් ප්‍රාර්ථනය කරමි !

ඔබට තෙරුවන් සරණයි !

මෛත්‍රීපාල සිරිසේන.

2015 මාර්තු මස 16 වැනි දින

## ගුරුභවතුන්ගේ අවධානය සඳහා

මෙය දහම් පාසල අටවන ශ්‍රේණියට නියමිත පාඨ ග්‍රන්ථයයි. මෙහි පාඩම් හතළිහක් ඇතුළත්ය.

මෙහි දැක්වෙන සියලු පාඩම් ජීවිතයට ප්‍රයෝජනවත් වන පරිදි ප්‍රායෝගිකව ඉගැන්වීම අපේක්ෂිතය. විශේෂයෙන්ම චරිත කතා ඇසුරෙන් මතු කර ගත හැකි ආදර්ශ සිසුන්ට පෙන්වා දීම අවශ්‍යය. පාලි ගාථා හා කවි නිවැරදි උච්චාරණයෙන් යුතුව ගායනා කළ යුතු අතර ඒ පිළිබඳ පුහුණුවක් ද ලබා දිය යුතුය.

ඒ ඒ දිනට නියමිත පාඩම් කියවා පූර්ව සූදානමක් ඇතිව පන්තියට යාමට පුරුදු වන්න. හැම විටම ගුරුවරයාගේ යුතුකම විය යුත්තේ මීළඟ සතියේ පාඩම් මොනවාද'යි ශිෂ්‍යයන් දැනුවත් කිරීමය. පෙළ පොතේ පාඩම් අවසානයේ දක්වා ඇති ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කිරීම ද අවශ්‍යය.

මෙම පාඨ ග්‍රන්ථයට පදනම් කරගෙන ඇති නිපුණතා සහ අදාළ පාඩම් පහත දැක්වේ. එම නිපුණතා ඉටුවන පරිදි පාඩම් ඉගැන්වීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

| නිපුණතාව | පාඩම් |
|---|---|
| නිපුණතාව 02 | 1,2,3,8,14,16,22,29,34 |
| නිපුණතාව 03 | 4,17 |
| නිපුණතාව 04 | 5,6,7,18,19,21,27,28,30 |
| නිපුණතාව 05 | 31,33 |
| නිපුණතාව 06 | 20,32,36 |
| නිපුණතාව 07 | 26,35 |
| නිපුණතාව 09 | 9,10,15,23,37,38 |
| නිපුණතාව 10 | 11,12,13,24,25,26,27,39,40 |

ලේඛක මණ්ඩලය

# පටුන


| පාඩම් අංකය | මාතෘකාව | පිටු අංකය |
|---|---|---|
| | **පළමු වාරය** | |
| 01. | බුදු සිරිතේ පළමු විසිවස | 1 |
| 02. | බුදුගුණ හැඳින බුත් සරණ යා යුතු | 4 |
| 03. | නොවරදින මග | 10 |
| 04. | සුබැසි බස් නෙපළමු දෙලොව යහපත සලසන | 13 |
| 05. | ධම්මපද ගාථා | 18 |
| 06. | දුක්ඛ සමුදය ආර්ය සත්‍යය | 23 |
| 07. | යහපත් පෞරුෂ ලක්ෂණ හතරක් | 27 |
| 08. | දැහැමි බව රැකි නිරිඳු බිම්සර | 32 |
| 09. | පාසල් පරිසරය බොදු සිරිතෙන් ඔපවත් කරමු | 37 |
| 10. | වඳිමු දළදා වඳිමු සිරිපා | 41 |
| 11. | පාළි I - නමස්කාර පාඨය | 43 |
| 12. | පාළි II - ඉතිපි සො පාඨය | 46 |
| 13. | අභිධර්මය 01. චෛතසික | 51 |
| | **දෙවන වාරය** | |
| 14. | ආදර්ශයෙන් සපිරි බුදුසිරිත | 55 |
| 15. | ප්‍රහාද බෞද්ධයා හැඳින ගනිමු | 58 |
| 16. | බුදුසසුන ඔපවත් කළ වාදිභසිංහයාණෝ | 62 |
| 17. | දෙගුරුන් ගුණ දැන අදරින් සලකමු | 68 |
| 18. | මෙත්ත සූත්‍රය | 73 |
| 19. | වපුරන අයුරුම අස්වැන්න ලැබේ | 81 |
| 20. | ලක් බුදු සසුනේ ආදිම තොරතුරු | 84 |

| අංකය | මාතෘකාව | පිටු අංකය |
|---|---|---|
| 21. | දස කුසල් හා දස අකුසල් | 89 |
| 22. | උතුම් අභිඥාලාභී ගෞරණීය | 93 |
| 23 | අපේ අවමඟුල් සිරිත් විරිත් | 97 |
| 24. | පාළි III - පැන් හා ආහාර පූජා කිරීමේ ගාථා | 101 |
| 25. | පාළි IV - දැහැත් හා සුවඳ දුම් පූජා කිරීමේ ගාථා | 105 |
| 26. | අභිධර්මය 02. අන්‍යසමාන රාශිය | 109 |


## තෙවන වාරය


| | | |
|---|---|---|
| 27. | සලකමු කළගුණ | 113 |
| 28. | දස පින් කිරියවත් | 117 |
| 29. | ඇසූ පිරූ තැන් ඇති ඛුජ්ජුත්තරා උවැසිය | 125 |
| 30. | ත්‍රි ශික්ෂාව හැඳින ගනිමු | 130 |
| 31. | සීලානුස්සති භාවනාවේ යෙදෙමු | 135 |
| 32. | අනුරපුරයේ අපේ උරුමය | 139 |
| 33. | සුවදායි නින්දක් ගුණදායි ආහාර රටාවක් | 145 |
| 34. | සිංහල බෞද්ධ ප්‍රබෝධයේ පුරෝගාමියා | 148 |
| 35. | පිරිහීමේ දොරටු වසාලමු | 154 |
| 36. | සමුපකාරය හා ආගන්තුක සත්කාරය | 159 |
| 37. | පාළි V - ප්‍රාර්ථනා ගාථා | 162 |
| 38. | පාළි VI - ආරක්ෂක ගාථා | 166 |
| 39. | අභිධර්මය 03. අකුශල රාශිය | 170 |
| 40. | අභිධර්මය 04. ශෝභන රාශිය | 174 |

# 01. පාඩම

## බුදු සිරිතේ පළමු විසිවස

සිදුහත් මහබෝසතාණන් වහන්සේ සත්‍යය කුමක්දැ'යි සොයමින් ගතකළ කාලය අවසන් විය. වෙසක් පුරපසළොස්වක් පොහෝදින දඹදිව බුද්ධගයාවේ ශ්‍රී මහා බෝධි මූලයේ දී සම්මා සම්බුද්ධත්වයට පත්වූහ. සති කීපයක් බෝ මැඩ අවටම ගතකළ බුදුරජාණන් වහන්සේ තමන් අවබෝධකරගත් ධර්මය ලෝවැස්සන්ට දේශනා කිරීම සඳහා සිත යොමු කළහ. බුදු ඇසින් ලොව බලා වදාරණ තථාගතයන් වහන්සේට මේ දහම තේරුම් ගත හැකි නුවණැත්තන් සිටින බව පෙනිණ.

මම කවරෙකුට පළමුව දහම් දෙසැම්දැ'යි භාග්‍යවතුන් වහන්සේට සිත් විය. කෙලෙස් අඩු තත්ත්වයක සිටි ආලාරකාලාම උද්දකරාමපුත්ත යන තවුසන් ඒ වන විට මියගොස් සිටි බැවින් තමන් වහන්සේ දුෂ්කර ක්‍රියා කරන සමයෙහි තමන්ට උදව් කළ පස්වග තවුසන් සිහියට නැගුණි. ඔවුන් ඒ වන විට බරණැස ඉසිපතනයෙහි වෙසෙන බව දැන ඉසිපතනය බලා වැඩම කළහ.

ඇසළ පුරපසළොස්වක පෝදිනයේ දී පස්වග තවුසන් මුණගැසිණි. මුලදී විශ්වාස නොකළද කරුණු දැක් වීමෙන් පසුව බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්ව ඇති බව පස්වග තවුසෝ පිළිගත්හ. ඉන් පසුව බුදුරජාණන් වහන්සේ පස්වග තවුසන්ට දහම් දෙසූහ. පැවිද්දකු විසින් අත්හළ යුතු අන්ත දෙකත් මධ්‍යම ප්‍රතිපදාවේ අගයත්, චතුරාර්ය සත්‍යයත් ඇතුළත් ධම්මචක්කපවත්තන සූත්‍රය එම දේශනාවයි. දහම් අසා කොණ්ඩඤ්ඤ තවුසා පළමුව සෝවාන්ව බුදු සව්වකු බවට පත් වූයේය. පසුව අනෙක් තවුසන් සතර දෙනා වහන්සේද සෝවාන්ව බුද්ධශ්‍රාවකත්වයට පත්වූහ. පස්දෙනා වහන්සේම අනත්තලක්ඛණ සූත්‍රය අසා රහත්ඵලයට පත්වූහ.

බුදුරජාණන් වහන්සේ එම වස් කාලය ඉසිපතනයේම ගත කළහ. මේ කාලය තුළදී බරණැස සිටුවරයාගේ පුත් යස කුලපුත්‍රයාත් ඔහුගේ

යාළුවන් පනස් හතර දෙනාත් බුදුරදුන්ගෙන් දහම් අසා පැවිදිබව ලැබූහ. මේ වන විට බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක පිරිස හැට නමක් වූහ. බුදුරජාණන් වහන්සේ එම ශ්‍රාවක පිරිස අමතා බොහෝ දෙනාගේ හිත සුව පිණිස චාරිකාවේ යෙදෙමින් දහම් දෙසන ලෙසටත් දෙනමක් එක මග නොවඩින ලෙසටත් අවවාද දී උන්වහන්සේලා පිටත් කොට යැවූහ.

බුදුරජාණන් වහන්සේ ද උරුවෙල් දනව්ව බලා වැඩිසේක. අතර මග වන පෙදෙසක දී මුණ ගැසුණ භද්දවග්ගිය කුමාරවරුන් තිස් දෙනා ද ඒ වන විට නේරන්ජරා නදිය අසබඩ විසූ දහසක් පිරිවර සහිත තුන් බෑ ජටිලයෝ ද බුදුරදුන්ගෙන් දහම් අසා පැවිදි වූහ.

බුදුරජාණන් වහන්සේ රජගහ නුවරට වැඩම කළ පසු උන්වහන්සේ දක්නට පැමිණි බිම්බිසාර රජතුමා තම රටේ විශාලම ජටිල ශ්‍රාවක පිරිස බුදුරදුන්ගේ ශ්‍රාවකයින් බවට පත්ව සිටිනු දැක සතුටට පත්ව දහම් අසා සෝවන් විය. බුදුසසුනේ ප්‍රථම ආරාම පූජාව සිදුවූයේ ද මේ අවස්ථාවේදීය. මෙකල රජගහ නුවර උපතිස්ස හා කෝලිත නම් වූ පරිබ්‍රාජකයින් දෙදෙනෙක් වූහ. ධර්ම ප්‍රචාරයෙහි යෙදෙමින් සිටි අස්සජී තෙරණුවන් කෙරෙහි ප්‍රසාදයට පත් උපතිස්ස පිරිවැජි තෙමේ උන්වහන්සේගෙන් දහම් අසා සෝවාන් වී තම යහළු කෝලිත පිරිවැජියා ද සමඟ බුදුරදුන් වෙත ගොස් දහම් අසා පැවිදිව රහත් වූහ. සැරියුත් මුගලන් නමින් ප්‍රසිද්ධියට පත් උන්වහන්සේලා දෙනම බුදුරදුන් විසින් අගසව් තනතුරට පත් කරන ලදහ.

ඉන් පසුව බුදුරජාණන් වහන්සේ සුදොවුන් රජතුමාගේ ආරාධනයෙන් කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයට වැඩම කළහ. මෙහි දී බුදුරජාණන්වහන්සේ විසින් නන්ද කුමරයාත්, රාහුල කුමාරයාත් පැවිදි කරවන ලදහ. නැවත බුදුරදුන් මල්ල රට අනුපිය අඹ වනයෙහි කලක් වැඩ සිටි අතර, ඉන් නික්ම රජගහ නුවරට වැඩමවා එහි වේළුවනාරාමයෙහි වැඩසිටියහ. එහිදී විශාලා මහනුවර ඇති වූ තුන් බිය සංසිඳ වූ බුදුරදුන් විසින් එනුවරට ශාන්තියක් සලසන ලදී. තවත් අවස්ථාවක දෙව්රම්වෙහෙර ඉදිකරවා පූජාකළ අනේපිඬු සිටුතුමා බුදුරජාණන් වහන්සේගෙන් දහම් අසා සෝවන් ඵලයට පත්විය.

සෝපාක සුනීත ආදී අසරණයන් බුදුරජාණන්වහන්සේ වෙත පැවිදිවීම, රෝහිණී ගඟේ ජලය බෙදාගැනීම පිළිබඳව ශාක්‍ය හා කෝලිය වංශිකයන් අතර ඇතිවන්නට ගිය යුද්ධය සංසිඳවීම ආදිය බුදුරජාණන් වහන්සෙ රජගහනුවර වෙසෙන සමයේ ඇතිවූ වැදගත් සිදුවීම්ය. මහාප්‍රජාපතී ගෝතමී දේවියගේ ඉල්ලීම පරිදි කාන්තාවන්ට පැවිදිවීමට අවසර ලබාදුන්නේ ද බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර වෙසෙන කල්හිය. බුදුරදුන් දිව්‍යලෝකයට වැඩමවා මාතා දිව්‍ය පුත්‍රයාට අභිධර්මය දේශනා කිරීම, ආලවක යක්ෂ දමනය, අනඳ තෙරණුවන් බුදුරදුන්ගේ අග්‍ර උපස්ථායක තනතුරට පත්වීම ආදිය මෙකල සිදුවිය. විවිධ ජනකොටස් බුදුසසුනට එක් වීමෙන් බුදුදහම මධ්‍යදේශය පුරා ශීඝ්‍රයෙන් පැතිරී ගියේ බුද්ධත්ත්වයෙන් මුල් විසිවස තුළදීය.

**ක්‍රියාකාරකම් :**

01. මුල් විසිවස තුළ බුදුසසුන පැතිරීයාමට අදාළව වැදගත් සිදුවීම් පෙළගස්වන්න.

02. ප්‍රථම ධර්ම දූත පිරිසට බුදුරදුන් අනුශාසනා කරන අයුරු චිත්‍රයට නගන්න.

# 02. පාඩම

## බුදු ගුණ හැඳින බුත් සරණ යායුතු

අපගේ ශාස්තෘ වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පන්සාළිස් වසක් අලුයම පිබිද මහා කරුණාවෙන් යුතුව කටයුතු කළේ ලෝ සතට සෙත සැනසුම සලසනු උදෙසා ය. ඒ නිසා ම විවිධ අය උන් වහන්සේ නිසා ලොව්තුරා සැප සම්පත් ලදහ. ඡත්ත මානවක තෙමේ ද ඒ අය අතර කෙනෙකි. සේතව්‍ය නුවර උපතලද හෙතෙම පොක්ඛරසාති බමුණු පඬිවරයාගෙන් සිප් සතර හදාළේය. කෙටි කලකින් ම ඉගෙනුම අවසන් කළ ඔහු මව්පියන් වෙතට ගියේ ගුරු පඬුරු රැගෙන යළි ගුරු ගෙදරට යන අදහසිනි. නමුත් එසේ පැමිණෙන අතර මග ඔහුට සිදුවන විපතක් බුදු නෙතට පෙනුණි.

මහා කාරුණිකයාණෝ ඔහු එන පෙරමගට වැඩමවා පිළිසඳර කතාකොට මහමග යනවිට ප්‍රකාශ කිරීම පිණිස තුණුරුවන් ගුණ ඇතුළත් ගාථා තුනක් ඔහුට ඉගැන්වූ සේක. අප දහම් පාසලේ දීත් පාසලේදීත් "යො වදතං පවරෝ මනුජේසු" ආදි වශයෙන් ගායනා කරන්නේ එම ගාථාවන්ය. ඡත්තමානවක අත තිබූ කහවණු සොරුන් විසින් රැගෙන ඔහු මරණයට පත් කරන ලදි. තෙරුවන් ගුණ සිහි කරමින් මියගිය හෙතෙම දෙව්ලොව උපන්නේය.

මෙහි සඳහන් වන ත්‍රිවිධ රත්නය අතර පළමු රත්නය බුද්ධ රත්නයයි. බුදුගුණ අනන්තය. ඒ බුදු ගුණ අතර කීපයක් හයවන සහ සත්වන ශ්‍රේණිවලදී හඳුනාගෙන ඇත. අද අපි මෙම පාඩමෙන් සත්ථා, බුද්ධ, භගවා යන බුදු ගුණ වීදාගම මෛත්‍රෙය මාහිමිපාණන් වහන්සේ විසින් රචිත බුදු ගුණාලංකාරය ඇසුරෙන් ඉගෙන ගනිමු.

**සත්ථා**

බව කතරින් එතෙර - ලනුයෙන් සතන් හැමවර
තිලෝගුරු මුනිවර - වීය සත්තා නමින්පුවතර

මෙම කවියට අනුව සත්වයන් සසර කතරින් හැමකල්හි ම එතෙර කරන බැවින් තිලෝගුරු භාග්‍යවතුන් වහන්සේ "**සත්ථා**" නම් වන සේක.

"සත්ථා" යන්නෙහි තේරුම අනුශාසනා කරන්නා, ගුරුවරයා යන්නය. බුදුරජාණන් වහන්සේ දෙවියන්ට මිනිසුන්ට ගුරුවරයකු වන බැවින් "සත්ථා දේව මනුස්සානං" යන නමින් හැඳින්වෙති. දෙවියෝ ද මිනිස්සු ද දැනුමෙන් එක සමාන වූවාහු නොවෙති. පළමු ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණිය දක්වා පන්තිවලට එකම පාඩමක් එක ලෙසට ඉගැන්විය නොහැකිය. එයට හේතුව ඔවුන්ගේ බුද්ධි මට්ටම විවිධ වන බැවිනි. බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන් වහන්සේලාට කරුණු අවබෝධ කරලනු පිණිස දේශනා ක්‍රම රැසක් යොදා ගත්තේ ඒ අනුවය. පහත සඳහන් සිද්ධිවලින් එය පැහැදිලි වේ.

- චූල්ල පන්ථක තෙරුන් වහන්සේට පිරිසිදු රෙදි කැබැල්ලක් අතට ලබාදී පිරිමැදීමට සැලැස්වීම.

- රාහුල තෙරුන් වහන්සේට මුහුණ බලන කණ්ණාඩියක් සහ කුඩා බඳුනක් උපමාවට ගනිමින් දහම් දෙසීම.

- කිසා ගෝතමියට කිසිවකු නොමළ ගෙදරකින් අබ ටිකක් ගෙන ඒමට නියම කිරීම.

- කසී භාරද්වාජ බමුණාට බිත්තර වී, වර්ෂා ජලය, වියගහ, නඟුල ආදිය යොදා ගනිමින් ධර්මාවබෝධය ලබාදීම. මෙයින් ප්‍රකට වන්නේ උන්වහන්සේගේ ශාස්තෘත්වයයි.

අප අධ්‍යාපනය ලබනුයේ විවිධ ගැටලු ප්‍රශ්න අවහිරතා මැද විය හැකිය. වරෙක ඒවා අපට අභියෝග වීමට පුළුවන. එහෙත් ඒවායින් අපට ජය ලැබෙනුයේ ඒවාට සාර්ථකව මුහුණදුන් විටය. එසේ ම අපට දිනපතා පාසලේදී මෙන් ම දහම් පාසලේදීත්, පන්ති නායක, ශිෂ්‍ය නායක, කණ්ඩායම් නායක සහ ශිෂ්‍ය සමිතිවල විවිධ නිලතල දැරීමට සිදුවේ. ඒවායින් පාසලටත් අපටත් කීර්තියක් යහපතක් සැලසෙන්නේ එම තනතුරුවලට අදාළ වගකීම් සමුදාය නිසිලෙසින් ඉටු කළහොත් පමණි. ඒ සඳහා මෙම බුදු ගුණය අපට හොඳ මඟ පෙන්වීමක් ලබා දෙයි.

"සත්ථා" බුදු ගුණයෙන් මෛත්‍රිය, කරුණාව, ඉවසීම, ආදර්ශ සම්පන්න බව, පරහිතකාමී බව, සෑම විෂයයක් පිළිබඳව ඇති සැබෑ,

දැනුම, බුද්ධිමත් බව ආදී ගුණාංග රැසක් ශිෂ්‍ය ජීවිතයට ඇතුළත් කර ගැනීමට පුළුවන.

බුද්ධ

**සිව් සස් සිය නැණින් - දැන දැන්විය කුළුණින්**
**දුරලයි අනුවණින් - එ බුදු නම්විය ගුණ පමණින්**

ඉහත සඳහන් කළ කවියට අනුව එම බුදු ගුණයට අදාළ කරුණු තුනකි.

එනම්,

1. තම නුවණින් චතුරාර්ය සත්‍යය (සිව්සස්) අවබෝධ කර ගැනීම.
2. සිව්සස් කරුණාවෙන් යුතුව අන් අයට අවබෝධ කරවීම.
3. අනුවණ කමින් සත්වයන් මුදවාලීම.

එදා දුෂ්කර ක්‍රියාවෙහි නියැලුණු අප මහා බෝසතාණෝ ලෝක සත්වයා සසර දුකෙන් මුදවාලන තිර අදිටනින් තම ඉලක්කය සපුරා ගනු පිණිස හැම විට කැප කිරීම් කරමින් තවුස්දම් පිරූහ. එයින් තම විමුක්තිය නොලද බෝසතාණන් වහන්සේ සිත සමාධි ගතකර සිව්සස් සිය නැණින් දැන බුදු බවට පත් වූ සේක. මෙය බුද්ධ ගුණයට අදාළ සළමුවන කරුණය. මෙම ගුණාංගය තුළින් ශිෂ්‍ය ජීවිතයට අදාළ කරගත හැකි ආදර්ශය වන්නේ ස්ථිර අධිෂ්ඨානයකින් යුක්තව ක්‍රියා කරන්නේ නම් තම අපේක්ෂාවන් සපුරා ගතහැකි බවයි.

බුද්ධ යන්නෙහි දෙවන කරුණ වන්නේ තමන් වහන්සේ ලබාගත් දැනුම අන්අය සමග බෙදා හදා ගැනීමයි. බුදුරජාණන් වහන්සේට සමකාලීනයන් වූ සෝණ දණ්ඩ , වංගී, සකුලුදායි ආදී සුප්‍රකට ශ්‍රමණ බ්‍රාහ්මණයන් ද උන් වහන්සේ ඇගයුමට ලක් කළේ "බුද්ධ" යන ගුණය නිසා ය. අප ද අප තුළ ඇති විවිධ හැකියාවන් අන්අය සමග හුවමාරු කරගන්නේ නම් එය "බුද්ධ" යන ගුණය තම ජීවිතයට අදාළ කර ගැනීමකි.

මෙම බුදු ගුණයට අදාළ තුන්වන කරුණ නම් අනුවණකමින් සත සුදා ගැනීමයි. තම පියාගේ ඉල්ලීම මත සැම දිනකම උදෑසන පිබිද

ස්නානය කර, තෙත බරිත ඇඳුමින් සඳිසා නමස්කාරය කළ තරුණයාට නිවැරදි සඳිසා නමස්කාරය දේශනා කිරීම ඉහත සඳහන් බුදුගුණය ප්‍රකට කළ එක් අවස්ථාවකි. පස්පව් දස අකුසල් ආදී දුසිරිතෙහි යෙදී සිටිය අයට පන්සිල් දස කුසල් ආදී සුසිරිතෙහි නියැලීමට උපදෙස් දීමෙන් පැහැදිලි වන්නේ ද මෙම බුදුගුණයයි. මෙවන් සාරධර්ම සුරැකීමට ශිෂ්‍ය අවධියේ සිටම පුරුදු පුහුණු විය යුතුය.

හගවා

බෙදුයෙන් දහම් කඳ - බජනය කළෙන් ගුණ කඳ
බග දහමින් සසඳ - බැවින් බගවත් විය මුනිසඳ

මෙම කවියෙන් ප්‍රකාශ වන්නේ කරුණු තුනක් නිසා බුදුරජාණන් වහන්සේ "භගවා" ගුණයෙන් යුක්තවන බවයි.

1. සියලු ධර්මයන් කොටස් ලෙස බෙදා දැක්වීම.
2. උතුම් මිනිස්දම් පැවතීම.
3. භග ධර්මයෙන් යුක්ත වීම. එම කරුණුය.

සියලු ධර්මයන් කුසල්-අකුසල්, පින්-පව්, සාර-අසාර ආදී වශයෙන් බෙදා දැක් වූ නිසාත් සාමාන්‍ය මිනිස් ගුණවලට වඩා උසස් මට්ටමක වූ උතුම් මිනිස් දම් ඇති නිසාත් ඉසුරුමත් බව කීර්තිය, ශෝභා සම්පන්න බව ආදී භග ධර්මයන් ඇති නිසාත් බුදුරජාණන් වහන්සේ "භගවා" යනුවෙන් හඳුන්වනු ලබති.

ඉහත කවියෙහි දැක්වෙන භගවා ගුණයට අදාළ තෙවැනි කරුණ වූ "භග ධර්මයන්" තවදුරටත් පැහැදිලි කර ගනිමු. රියැදුරෙකුට තමාට අවශ්‍ය පරිදි රිය ගමන් කරවිය හැකි ලෙස තමාම තමාගේ සිත පාලනය කරන්නා සේ අටලෝ දහමට කම්පා නොවී කටයුතු කළ හැකි නම් ඉසුරුමත් බව ලබාගත හැකිය. මාගන්දි බැමිණිය මිනිසුන්ට අල්ලස් දී අපහාස කළ විටත් තිර්ථකයන් සුන්දරී මරා දමා නින්දා කළ විටත් චිංචා මානවිකාව ඉදිරියට පැමිණ චෝදනා කළවිටත් තථාගත බුදුපියාණන් වහන්සේ ඒ සියල්ල හමුවෙහි නොසැලී අභීතව වැඩසිටීමෙන් පැහැදිලි වන්නේ උන්වහන්සේගේ "භගවා" යන බුදු ගුණයයි.

දහම් දෙසූ අය බුදුරජාණන් වහන්සේගේ දේශනය නිම [illegible] ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේ විසින් යටිකුරු කළ [illegible]දුනක් උඩුකුරු කොට තැබුවා සේ, වසා තිබූ දෙයක් විවර කළා සේ, මං මුළා වූ අයකුට මග කියා දෙන්නා සේ, ඇස් ඇත්තෝ රූප දකිත්වා යි අඳුරට පහනක් දැල්වූවාසේ දහම දෙසන ලදි යනුවෙන් ප්‍රකාශ කළේ උන්වහන්සේ භාග්‍ය සම්පන්න වූ බැවිනි.

බෝධි සත්වයන් වහන්සේ ලෙස සසර සැරි සරා කළ පින්කම් බලයෙන් දෙතිස් මහා පුරුෂ ලක්ෂණත්, අසූවක් කුඩා ලක්ෂණත් බුදු සිරුරෙහි දක්නට තිබුණි. ලොව වෙනත් කිසිවකු නොලද එම ලක්ෂණ උන්වහන්සේ තුළ තිබීමෙන් සනාථ වන්නේ ද "භගවා" යන බුදු ගුණයයි.

මෙම බුදු ගුණය තුළින් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ රැසකි. විවිධ කැප කිරීම් කරමින් යමක් සාර්ථකව නිමවනතුරු වීර්යවන්තව කටයුතු කිරීම ලෝක ධර්මතා කවර ලෙසකින් පැවතුන ද ඒවාට නොබියව අභීතව මුහුණදීමට ඇති හැකියාව, තමාගේ වාසනාව තමා විසින්ම මතු කර ගත යුතු බව ඒවායින් කීපයකි.

**ක්‍රියාකාරකම් :**

පහත දැක්වෙන උදාහරණය සැලකිල්ලට ගනිමින් පාඩමෙහි සඳහන් අනෙක් බුදුගුණ දෙක ඇතුළත් වන සේ වගුවක් සම්පූර්ණ කරන්න.

| බුදුගුණය | බුදුගුණයට අදාළ උදාහරණය | සිසුදිවියට ගතහැකි ආදර්ශය |
|---|---|---|
| සත්ථා | දෙව් මිනිසුන්ට ධර්ම දේශනා කිරීම. | ඇසුරු කරන්නාන්ට කලණ මිතුරකු වීම. |

පුහුණුවට

කිච්ඡො මනුස්ස පටිලාභෝ
කිච්ඡං මච්චාන ජීවිතං
කිච්ඡං සද්ධම්ම සවණං
කිච්ඡො බුද්ධානං උප්පාදෝ

ධම්මපදය - බුද්ධ වග්ග

කලකිනි මිනිසත් බව ලැබ ගන්නේ
දුකකිනි දිවි පැවතුම් රැක ගන්නේ
කලකිනි සදහම් සවණට ගන්නේ
කලකිනි බුදු උපතක් ලැබ ගන්නේ

## 03. පාඩම

## නොවරදින මග

01. බඹදත් නිරිඳු බරණැස රජ කළ එසඳ
බෝසත් තුමා ඉපදුණි කුලයක වෙළෙඳ
නායකයෙකි පිරුණු ගුණ නැණයෙන් නිබඳ
සැරසුණි පිරිස සමඟින් යාමට වෙළෙඳ

02. නායකයෙකි තවත් වෙළෙඳාමෙහි යෙදෙන
උපා නොදන්නෙකි වාණිජ කමෙ බැඳුන
ගැල් පන්සියය පුරවා බඩු ගෙන සොඳින
බෝසත් තුමා හමුවීමට ඇත පැමිණ

03. දෙදෙනා එකට යාමෙන් ලාබය අඩුවේ
එබැවින් පළමු එක් පිරිසක් යා යුතුවේ
පසුවද පළමුවද යන බව කිව යුතුවේ
ඔබ ගත් තීන්දුව මට පැවසිය යුතුවේ

04. නොබිඳුනු මගක යාහැක පළමුව යාමෙන්
නොඉඳුල් පලා පැන් ලද හැකි වේ පේමෙන්
රිසි රිසි මිළට ගෙන යන බඩු විකිණීමෙන්
ලොකු ලාභයක් ලද හැක පළමුව යාමෙන්

05. බෝසත් තුමා වෙත ඔහු යොමු කොට සවන
වැඩි වාසියක් ලද හැකිවේ යැයි සිතිණ
පළමුව යාම සුදුසුයි පිරිසද රැගෙන
ඒ බව දැන්විය නිගමනයට පැමිණ

06. ඔහුගේ සිතැඟියාවත් නැණ බෙලෙන් දූන
බෝසත් තුමා දුනි ඔහු හට පළමු තැන
දෙවනුව තමන් සහ පිරිවර කැටුව යන
සැරසුණි ගමන යාමට මග ගෙන හැඳින

07. පුරවා බඳුමුට්ටු ගැල් පන්සියය ගෙන
පිටවිය වෙළඳාමෙ නායක වෙළෙඳ තැන
බෝසත් තුමාටත් වැඩියෙන් ලාබ ගෙන
සිතමින් ගියා විඳගත හැකි සැපත ගැන

08. වියලියි, රළුයි, කටුකයි යන ගමන දුරයි
වෙහෙසයි නිදිමතයි, නෑ ඉම කතර දිගයි
පැමිණෙති අස් රියක පිරිසක් ඉසුරු බරයි
දන්වති ජලය ඈතක නොව ළඟම තිබෙයි

09. තෙත් වූ ඇඳුම් ඇඳ සිටි ඒ පිරිස ගැන
විශ්වාසය තැබූ නායක වෙළෙඳ තැන
හිස් කොට දියබඳු බර අඩු කරව ගෙන
යන්නට ගමන දුනි උපදෙස් මග නො දූන

10. බොන්නට දියබිඳක් නැහැ මග තොට තිබුණේ
නින්දට යන විටදි හාමතයයි දූනුණේ
යක්පෙළ ඇවිත් හැමගෙම ජීවිත නැසුනේ
මග කී අය යකුන් බව නැහැ නොවැ හැඟුනේ

11. මාස දෙක තුනක් ඉක්මව ගිය බැවිණි
වෙළෙඳාමට සුදුසු කාලය බව හැඟුණි
නායක බෝසතුන් සගයින් වෙත පැමිණි
මෙලෙසට පැවසීය උපදෙස් දෙන ලෙසිණි

12. දුරු කතරකට පිවිසෙන බව දත යුතුය
දිය හා අහර ඉවතට නොදැමිය යුතුය
මල් පල අපට නුපුරුදු බව දත යුතුය
මා නොවිමසා අහරට නොම ගත යුතුය

13. රුවන් සදිසි උපදෙස් අරගෙන හිතට
ලබන්නට සිතා ලාබය අඩු නො කොට
පෙළින් පෙළ සැදී ගැල් අරගෙන යසට
බසින්නට වීය වෙළඳාමට මගට

14. සුපුරුදු ලෙස මිනිස් වෙස් ගත් යකුන් කැළ
සුමියුරු වදන් පවසා මන වඩන ලොළ
රැවටීමට කළත් වීරිය නොවුණි පල
නායක වෙළෙන්දා කළ නොහැකිය සසළ

15. මේ අය කියති ඉදිරියෙ ඇති බව ජලය
විමසා බලමු එය නම් නුවණැති කමය
හැමදෙන පිරික්සා බැලුවත් වා තලය
රළු බව පමණි තෙතමනයක් නැති හැඩය

16. ඉවත නොදා අප අරගෙන ආ ජලය
සුරැකිව තබාගෙන අප දුන් යා යුතුය
මිනිස් වෙසින් ආවත් මේ යක් රැළය
නුවණින් වටහගෙන අප වැඩ කළ යුතුය

17. පිරිස ද රැකුණි වෙළඳාම ද සාරවුණි
ලාබ ද ලැබුණි ජීවන මග එළියවුණි
ඥාණය ඇති තැනදී බාදක බිඳ වැටුණි
ජාතක පොත අපට කීවේ මේ ලෙසිණි

(අපණ්ණක ජාතකය ඇසුරිණි)

**ක්‍රියාකාරකම් :**

01. අපණ්ණක ජාතක කථාව ජාතක පොත් වහන්සේගෙන් කියවා ඔබේ බසින් ලියන්න.

02. නුවණ මෙහෙයවා කටයුතු කිරීමේ අගය මේ කතාව තුළින් පිළිබිඹුවෙන අයුරු පැහැදිලි කරන්න.

03. අධ්‍යාපන හා වන්දනා චාරිකාවක දී අපණ්ණක ජාතක කථාවෙන් ගතහැකි ආදර්ශ පෙන්වා දෙන්න.

# 04. පාඩම

## සුබැසි බස් තෙපළමු දෙලොව යහපත සලසන

ජන සමාජයේ විවිධ අංග මැනවින් පවත්වා ගැනීම උදෙසා විනයක් පැවතීම අත්‍යවශ්‍යය. සත්‍ය වචනය එම විනය පවත්වා ගැනීමේ වැදගත් මාර්ගයකි. පන්සිල් පදවල සිව්වැන්න මුසාවාදයෙන් වැළකීම හෙවත් අනුන් වචනයෙන් නොරැවටීමයි. පුද්ගලයා සමාජය සමග කටයුතු කිරීමේදී ප්‍රබල සන්නිවේදන කාර්යයක් වචනය මගින් සිදු කරනු ලබයි. එබැවින් පුද්ගලයාගේ වචනයෙහි ඇති සත්‍යවාදී බව සමාජ පිළිගැනීමට හේතු වන්නකි. අන් අය නො රවටා නොමග නො යවා ඇත්ත කථා කිරීම අපගේ යුතුකමක් වේ. එසේ නොකොට සමහරු අනුන් රැවටීමේ අරමුණ ඇතිව බොරු පොරොන්දු බොරු සාක්ෂි සපයති. බොරු ගිවිසුම් බොරු ප්‍රකාශන නිවේදන නිකුත් කරති. ලිඛිතව සහ වාචිකව කරනු ලබන මෙබඳු ක්‍රියා සමාජ විරෝධී වේ. එමෙන්ම ඒවා අකුසල්ය. මුසාවාදය හෙවත් අනුන් රැවටීම අංග සතරකින් සම්පූර්ණ විය යුතු ය.

ඒවා නම් ;

* **ඇත්ත නොවීම**
* **රවටන සිත**
* **ඒ පිණිස උපක්‍රම යෙදීම**
* **එයින් රැවටීමට පත් වීම යන සතරයි.**

නො තතු සඟවන සිතු
කී මුත් එම සිතට නතු
ඇසුවන් දැනුම් යුතු
මුසා සතරඟ මෙසේ දත යුතු

(කව්සේකරය)

සත්‍යය නම් වූ එකම ගුණය ඉක්මවා බොරු කියන පරලොව දියුණුව නො සිතන අයට නො කළ හැකි පවක් නැති බව ධම්ම පදයෙහි මෙසේ සඳහන්ව තිබේ.

ඒකං ධම්මං අතීතස්ස
මුසාවාදිස්ස ජන්තුනෝ
විතිණ්ණ පරලෝකස්ස
නත්ථි පාපං අකාරියං

බොරු කීම සම්බන්ධව අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙහි දැක්වෙන දිය බඳුන් උපමාව මෙහිදී අවධානයට ගැනීම සුදුසුය.

රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ සිටියදී දිනක් සවස් කාලයක භාග්‍යවතුන් වහන්සේ රාහුල ස්වාමීන් වහන්සේ වෙතට වැඩම කළහ. රාහුල සාමණේරයන් වහන්සේ බුදුරජාණන් වහන්සේ දැක අසුන් පනවා පා දොවා ගැනීමට පැන් ද තැබූහ.

භාග්‍යවතුන් වහන්සේ පා සෝදා භාජනයෙහි වතුර ටිකක් ඉතිරි කර මෙය දුටුවේ දැයි රාහුල හිමියන්ගෙන් ඇසූ සේක. එහෙමයි ස්වාමීනි, භාග්‍යවතාණෙනි පිළිතුරු දුන්හ. දැන දැන බොරු කීමෙහි ලැජ්ජා නැති අයගේ පැවිද්ද මේ වතුර ටික මෙන් ස්වල්පයයි වදාළ සේක.

තථාගතයන් වහන්සේ නැවත එම වතුර ඉවතලා, ඒ වතුර ටික ඉවත දැමූ අයුරු දුටුවෙහිදැයි ඇසූ සේක. එහෙමයි, ස්වාමීනි, සාමණේරයෝ පිළිතුරු දුන්හ. දැන දැන බොරු කීමෙහි ලැජ්ජා නැති අයගේ පැවිද්ද මේ වතුර ටික මෙන් ඉවත දමන ලද යැයි වදාළ සේක.

සුගතයන් වහන්සේ යළිත් ඒ බඳුන මුනින් නමා එය දුටුවේදැයි විමසූහ. එහෙමයි, ස්වාමීනි, රාහුල හිමියෝ පිළිතුරු දුන්හ. දැන දැන බොරු කීමෙහි ලැජ්ජා නැති නම් ඔවුන්ගේ පැවිද්ද මෙම බඳුන මෙන් මුනින් නමන ලද්දෙකැ'යි වදාළහ.

අනතුරුව ශාන්ති නායකයාණෝ ඒ බඳුන උඩුකුරු කොට හිස් බඳුන දුටුවේදැයි ඇසූහ. එසේ යැ'යි රාහුල හිමියෝ පිළිතුරු දුන්හ. දැන දැන බොරු කීමෙහි ලැජ්ජා නැත්තාගේ ජීවිතය මෙලෙස හිස් වූවකැයි දේශනා කළහ.

දිය බඳුන උපමා කොට සෙල්ලම් පිණිසවත් බොරු නොකියන ලෙස රාහුල හාමුදුරුවන්ට බුදුරජාණන් වහන්සේ උපදෙස් දුන්සේක.

මුසාවාදය අත්හැර සත්‍යය ප්‍රකාශ කරන්නා ඇදහිය හැකි පිළිගත හැකි ප්‍රිය වචන ඇති අයකු වේ. ඇත්ත කීම අවංක බවේ සලකුණකි. එමගින් මානව සබඳතා ගොඩ නැගේ. බොරු කීම, පොරොන්දු කඩ කිරීම, අනුන් රැවටීම සත්‍යවාදියාගේ ලක්ෂණ නොවේ. බුදු බව පතා පෙරුම් දම් සපුරණ බෝසතාණන් වහන්සේලා ධන ධාන්‍ය අඹු දරුවන් ආදි බාහිර වස්තු විනාශ වුනත් ශාරීරික අඟ පසඟ අහිමි වුනත් ජීවිත විනාශ වුනත් මුසාවාදයෙන් අනුන් නොරවටති. සුතසෝම ජාතකයෙන් ඒ බව පැහැදිලි වේ.

පෝරිසාදයාට හසුවූ මහා සුතසෝම රජතුමා බමුණෙකුට කලින් දුන් පොරොන්දුවක් ඉටු කිරීම පිණිස රජ මැදුරට ගොස් ආපසු එන බවට පෝරිසාදයාට පොරොන්දු විය. ඒ අනුව රජතුමා බමුණාට තම පොරොන්දුව ඉටු කර පෝරිසාදයා ළඟට ආවේය. රජතුමා සත්‍යයෙහි පිහිටා ක්‍රියා කිරීම ගැන පෝරිසාදයා විශ්මයට පත් විය. රජතුමාට අභය දානය ලැබුණි. පෝරිසාදයා මිනී මස් කෑමෙන් වැළකුණේ ය. එලෙස පාරමී සම්පූර්ණ කළ බෝසතාණෝ කිසිදු භවයක බොරුවක් කියා නොමැත. සම්බුදු බවට පත්ව උන්වහන්සේ දෙසූ ධර්මය අද දක්වාම කෙදවත් වීමට බලවත් වීමට බොහෝ කාලයක් පැතිර පැවතීමට ප්‍රබල සාධකයක් බවට පත්ව ඇත්තේ ඒ පාරමී ධර්මයන් තුළ තිබුණ සත්‍යවාදී ගුණයයි.

අනුන් රැවටීමේ චේතනාවෙන් බොරු නොකීම විරමණය යි. සත්‍ය කතා කිරීම, පිළිගත හැකි අයුරින් කථා කිරීම, අනුන් නොරැවටෙන ලෙස කථා කිරීම, සත්‍ය හෙළිදරව් කිරීම සමාදානයයි. යම්කු

බොරු කියා මා රවටන්නේ නම් මා එයට අකමැතිය. මම එය ප්‍රිය නොකරමි. මා ද මුසා බසින් අනුන් රවටන්නේ නම් ඔවුහු ද එයට ප්‍රිය නොකරති. මට යමක් අප්‍රිය වේද අන් අයට ද එය අප්‍රිය වේ. ඒ අනුව අප්‍රිය දෙයෙහි අන් අය කෙසේ නම් මම යොදවන්නෙම් ද? මේ අයුරින් තමා හා සසඳා උපමා කොට අන් අයට බොරු නො කිව යුතුය. මෙය "අත්තුපනායික ධර්ම ක්‍රමය" ලෙස බුදු දහමෙහි හැඳින්වේ. ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලයට අනුව මුසා බසින් වැළකීම ක්‍රම තුනකින් පිරිසිදු කර ගත හැකිය.

ඒ පහත සඳහන් පරිදිය.

**ධම්මික සූත්‍රයට අනුව :**

* තමන් බොරු කීමෙන් වැළකී සිටීම.
* අනුන් ලවා බොරු නොකියවීම.
* අනුන්ගේ බොරු කීම අනුමත නොකිරීම.

**වේළුද්වාර සූත්‍රයට අනුව :**

* තමා බොරු නොකියා සිටීම.
* අනුන් බොරු කීමෙන් වැළැක්වීම.
* බොරු නොකීමෙන් ලැබෙන අනුසස් කියා දීම.

ත්‍රිකෝටික පාරිශුද්ධයට අනුව බොරුවෙන් වළකින අයුරු පැළැණේ ශ්‍රී වජිරඥාන මාහිමිපාණන් වහන්සේ කවියට නගා ඇත්තේ මෙසේ ය.

බොරු නොමැ කියමි අනුනුදු එහි නො මැ යොදමි
කියවුනට ද කිසිසෙක් අනුබල නොදෙමි
නිසිතැනැ පමණ දැනැ ඇත්තක් ම පවසමි
සිව්වන සික ද මෙලෙසින් සපුරා රකිමි

මෙම දහම් කරුණ මැනවින් ඉගෙන හැදෙන වැඩෙන දරුවන් සත්‍යවාදී විය යුතුය. ඇති ගුණ මකා නැති ගුණ වැනුමත්, දැන දැන බොරු කීමත් (සම්පජාන මුසාවාද) කියන බොරු, හඟවන බොරු, කරන බොරු, ගොතන බොරු, පෙන්වන බොරු, පතුරුවන බොරු, ආදියෙන් වැළකී සිටිය යුතුය. බොරුව සමාජ අපචාරයකි. එයින් වැළකීමෙන් සාමය, සමගිය සාමදානය, සතුට ඇතිවේ. අනුන් නොරැවටීමෙන් ගුරු දෙගුරු සැමගේ ජනාදරයට පත් වීමට පුළුවන. අවංක විශ්වාස සත්‍යය කතා කරන උසස් මිනිස්දම් ඇති සුන්දර මිනිසකු විය හැකිය. එලෙස ක්‍රියා කිරීමෙන් නිවැරදි වචන ඇති, පිරිසිදු මුතුවන් දත් ඇති, මුඛයේ සුවඳ හමන, ගොත නොගසන බව අනුසස් ලෙස ලබාගත හැකි වේ. ළමා කාලයේ සිට ම සමාජයේ පිළිකුලට ලක්වන මුසා බසින් වැළකී අනුන් නොරවටා සත්‍යය ප්‍රකාශ කිරීමට පුරුදු පුහුණු වෙමු. එය දෙලොව යහපතට ද හේතු වේ.

**ක්‍රියාකාරකම් :**

01. බොරු බස් නොකීමෙන් ලද හැකි ප්‍රයෝජන කවරේ ද?
02. බොරුවෙන් මිදෙන අයුරු පැහැදිලි කරන්න.
03. "සත්‍යවාදී වීමේ අගය" ගැන රචනාවක් හෝ කවි දෙකක් නිර්මාණය කරන්න.
04. ජාතකට්ඨකථාවේ එන චේතිය ජාතකය සොයා ගෙන කියවන්න.

**පුහුණුවට :**

අසවා ම කියන බස් අරතර යේ
මුසවා බස් කීමෙන් එක මුර යේ
වසවා දෙව්ලොව යන මංතර යේ
පැසවා මිස නොහරී ගොස් තිර යේ

ලැදිව රජෙක් බොරු බස් කී විගසක යා
නැතිව රිද්දි බලයත් ඒ මිනිස්ක යා
පොළොව පලාගෙන ගොස් වැටුනි නරක යා
මෙලොව සතුනි ඉන් බොරු කීම නරක යා

ලෝවැඩ සඟරාව

# 05. පාඩම

## ධම්මපද ගාථා

ධම්මපදයේ එන ගාථා තුනක් පිළිබඳව ඉගෙනීමට අපි දැන් සූදානම් වෙමු. මෙම ගාථා තුන බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ භික්ෂූන් වහන්සේලාගේ කණ්ඩායම් තුනකට අවස්ථා තුනකදීය. මෙම ගාථා තුනෙන්ම දේශනා කර ඇත්තේ විසුද්ධියට හෙවත් නිවනට මාර්ගයයි.

**01 සබ්බේ සංඛාරා අනිච්චාති**
**යදා පඤ්ඤාය පස්සති**
**අථ නිබ්බින්දති දුක්ඛේ**
**ඒස මග්ගෝ විසුද්ධියා**

බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කළේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩසිටියදී පන්සියයක් භික්ෂූන් වහන්සේලා වෙනුවෙනි. පළමුව මෙම භික්ෂු පිරිස බුදුරජාණන් වහන්සේ වෙතින් භාවනා කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාගෙන වන සෙනසුනකට වැඩම කළහ. කොතෙක් භාවනා කළද එහි දී උන්වහන්සේලාට රහත් වීමට නොහැකි විය. මේ නිසා උන්වහන්සේලා බුදුරදුන් හමුවට වැඩියහ. ඒ අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ මේ භික්ෂූන් වහන්සේලාට කුමන භාවනාවක් ගැළපේද සප්පාය වේදෝයි නුවණින් විමසා බැලූහ. කාශ්‍යප බුද්ධ ශාසනයෙහි මේ භික්ෂූන් වහන්සේලා අවුරුදු විසිදහසක් අනිත්‍ය භාවනාව පුරුදු කළ පිරිසක් බව උන්වහන්සේ නුවණින් දුටුහ. එහෙයින් පෙර පුරුදු කර ඇති භාවනාව තවදුරටත් වැඩිදියුණු කර ගැනීමෙන් මේ භික්ෂූන්ට රහත් විය හැකි බව නුවණින් දුටු බුදුරජාණන් වහන්සේ මුලින් ඉදිරිපත් කළ ගාථාව දේශනා කළහ.

දේශනා කළ ධර්මය අසමින් නුවණින් මෙනෙහි කිරීම නිසා පන්සියයක් භික්ෂූන් වහන්සේලාට රහත් වීමට හැකිවිය.

මේ ගාථාවේ පද පිළිවෙළ මෙසේය.

**(යෝ) සබ්බේ සංඛාරා අනිච්චා ඉති යදා පඤ්ඤාය පස්සති අථ දුක්ඛේ නිබ්බින්දති විසුද්ධියා ඒස මග්ගෝ**

අර්ථය

(යමෙක්) සියලු සංස්කාර අනිත්‍ය ලෙස යම් කලෙක විදර්ශනා නුවණින් දකීද එවිට (ඔහු) දුක ගැන කලකිරෙයි. (ඒ නිසා චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගනී) විසුද්ධියට හෙවත් නිවනට මෙය මාර්ගයයි.

**සබ්බේ සංඛාරා**

කාම භවයේත්, රූප භවයේත්, රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පහ සංඛාර, සංස්කාර යනුවෙන් හඳුන්වා ඇත. එසේ හඳුන්වා ඇත්තේ ස්කන්ධවලට අයත් සියල්ල හේතූන් නිසා ඇති වන හෙයිනි.

අනිච්ච

මේ සංස්කාරවල ස්වභාවය ඇති වී නැති වීමයි. ඇතිව නැතිවන හෙයින් අනිත්‍යයි. අනිත්‍ය, අනිස යන වචන අනිච්ච යන වචනයට සමානය. මේ ගාථාව අනිත්‍යය මුල් කරගෙන කළ දේශනාවකි.

**02. සබ්බේ සංඛාරා දුක්ඛාති**
**යදා පඤ්ඤාය පස්සති**
**අථ නිබ්බින්දති දුක්ඛේ**
**ඒස මග්ගෝ විසුද්ධියා**

මේ ගාථාව දේශනා කිරීමට අදාළ හේතුව පළමු ගාථාව දේශනා කිරීමට අදාළ හේතුවට සමානයි. මෙහි ඇති වෙනස මේ භික්ෂූන් වහන්සේලා පෙර ආත්මයකදී දුක්ඛ ලක්ෂණය භාවනා කළ පිරිසක් වීමයි.

අර්ථය

(යමෙක්) සියලු සංස්කාර දුක් ලෙස විදර්ශනා නුවණින් දකීද එවිට (ඔහු) දුක ගැන කලකිරෙයි. (ඒ නිසා චතුරාර්ය සත්‍යය අවබෝධ කරගනී) විසුද්ධියට හෙවත් නිවනට මෙය මාර්ගය යි.

දුක්ඛ

රූපාදී පංච උපාදානස්කන්ධයම දුකයි. කෙනෙකුට රෝගාබාධයක් වැලඳුන විට ඔහු හෝ ඇය ඒ නිසා පීඩාවට පෙළීමට පත් වෙයි. ඒ නිසා පීඩාවට පෙළීමට පත්වෙන අර්ථයෙන් සියලු සංස්කාර දුක් ලෙස දේශනා කොට ඇත. මේ දේශනාව ඇසූ භික්ෂූන් වහන්සේලාද රහත් බවට පත්වූහ. මේ ගාථාව දුක මුල් කරගෙන කළ දේශනාවකි.

03 සබ්බේ ධම්මා අනත්තාති
යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛේ
ඒස මග්ගෝ විසුද්ධියා

මේ ගාථාව දේශනා කිරීමට හේතුව පළමු ගාථාව දේශනා කිරීමට අදාළ හේතුවට සමානයි. මෙහි ඇති වෙනස මේ භික්ෂූන් වහන්සේලා පෙර ආත්මයකදී අනත්ත ලක්ෂණය භාවනා කළ පිරිසක් වීමයි.

අර්ථය

(යමෙක්) සියලු ධර්ම අනාත්ම ලෙස යම් කලෙක විදර්ශනා නුවණින් දකීද එවිට (ඔහු) දුක ගැන කලකිරෙයි. (ඒ නිසා චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගනී) විසුද්ධියට හෙවත් නිවනට මෙය මාර්ගය යි.

සබ්බේ ධම්මා

සබ්බේ = සියලු, ධම්මා = ධර්ම, ධම්ම යන වචනයට හේතූන්ගෙන් හටගත් සංඛාර හෙවත් සංඛත ධර්ම මෙන්ම හේතූන්ගෙන් හට නොගත් හෙයින් අසංඛත නම් වූ නිවනද ඇතුළත්ය. එහෙත් සියලු ධර්ම අනාත්ම ලෙස විදර්ශනා නුවණින් දැකීමේදී කලකිරෙන්නේ නිවනට නොවේ දුකටය, එනම් පංචස්කන්ධයටය. අනාත්ම භාවනාව වඩන්නේ නිවන ලබා ගැනීමට මිස නිවන ගැන කලකිරීමට නොවේ. ඒ නිසා මෙම ගාථාවේ එන සබ්බේ ධම්මා යන වචනවලින් අදහස් වන්නේ පංචස්කන්ධයයි.

යමෙකු මා ජරාවට පත්නොවේවා, මරණයට පත්නොවේවා, රෝගියකු නොවේවා යනුවෙන් පැතුවද එය එසේ සිදු නොවේ. ජරාවට, මරණයට, රෝගවලට පත් වෙයි. මේ ශරීරය තමන්ගේ වසඟයෙහි තමාට අවශ්‍ය පරිදි පවත්වා ගත නොහැකිය. වේදනා සංඥා ආදියත් එසේම යි.

තමාගේ වසඟයෙහි පවත්වා ගත නොහැකි හෙයින් අනාත්ම යනුවෙන් හඳුන්වා ඇත. මේ පංචස්කන්ධයෙහි ආත්මයක් නැත. අයිතිකාරයෙක් නැත. අධිපතියෙක් නැත. මේ දේශනාව ඇසූ භික්ෂූන් වහන්සේලාද රහත් බවට පත්වූහ. මේ ගාථාව අනාත්මය මුල් කරගෙන කළ දේශනාවකි.

ක්‍රියාකාරකම්

01. බුදුරජාණන් වහන්සේ දහම් දෙසීමට පෙර, භාවනාවට උපදෙස් දීමට පෙර, දහම් අසන අයගේත් භාවනාවට උපදෙස් ගන්නා අයගේත් පෙර ජීවිත ගැන සොයා බලන්නේ ඇයි?

02. සබ්බේ ධම්මා අනත්තාති යන ගාථාවේ පද පිළිවෙළ ලියා දක්වන්න.

03. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන වචන තුන හැඳින්වීමට සුදුසු පදය පහත සඳහන් වචනවලින් කුමක් ද?

1. ත්‍රි ශික්ෂාවයි,
2. ත්‍රි ලක්ෂණයයි,
3. ත්‍රි භවයයි.

## 06. පාඩම

## දුක්ඛ සමුදය ආර්ය සත්‍යය

බුදුරජාණන් වහන්සේ ඉසිපතන මිගදායේදී පස්වග තවුසන් අමතා පළමු වරට චතුරාර්ය සත්‍යය දේශනා කළ සේක.

01. දුක-දුක්ඛ ආර්ය සත්‍යය.
02. දුකට හේතුව-දුක්ඛ සමුදය ආර්ය සත්‍යය.
03. දුක නැතිකිරීම-දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය.
04. දුක නැති කරන මග-දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය.

යනු එම ආර්ය සත්‍ය සතරයි. එයින් දුක්ඛ ආර්ය සත්‍යය ගැන අපි සත්වැනි පන්තියේදී ඉගෙන ගත්තෙමු. දුක්ඛ සමුදය හෙවත් දුකට හේතුව මේ පාඩමේදී සාකච්ඡා කරමු.

පස්වග තවුසනට දේශනා කරන ලද ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දුක්ඛ සමුදය ආර්ය සත්‍යය හඳුන්වා දෙන ලද්දේ මෙලෙසිනි.

**ඉදං ඛෝ පන භික්ඛවේ දුක්ඛසමුදයං අරියසච්චං**
**යායං තණ්හා පෝනෝභවිකා නන්දිරාග සහගතා තත්‍රතත්‍රාභි**
**නන්දිනී සෙය්‍යථීදං, කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා**

මේ පාඨයෙහි තේරුම මෙසේය:

පුනර්භවය ඇතිකරන, නන්දි හෙවත් සතුටද, රාගය හෙවත් ඇල්ම ද සහිත, ඒ ඒ තැන විශේෂයෙන් සතුටුවන්නා වූ කාම තණ්හාව, භව තණ්හාව සහ විභව තණ්හාව වශයෙන් ප්‍රභේද ගත වූ මෙම තෘෂ්ණාව දුක්ඛ සමුදයාර්ය සත්‍යය යි.

මෙසේ තණ්හාව දුකට හේතුව බව මෙහි දක්වේ. ඒ තණ්හාවේ ලක්ෂණ කිහිපයක් ද අවධාරණය කර තිබේ.

1. පෝනෝභවිකා - තණ්හාව පුනර්භවය ඇති කරයි. පුනර් යනු නැවත නැවතය. භවය නැවත නැවත ඇති කිරීම පුනර්භවයයි.

2. නන්දිරාග සහගතා - නන්දිය හා රාගයෙන් යුක්තය. නන්දිය යනු සතුටය. රාගය නම් ඇලීමය. සතුටු වීමත්, ඇලීමත් යන ලක්ෂණ දෙක තණ්හාවේ දක්නට ලැබේ.

3. තත්‍ර තත්‍රාභිනන්දිනී - තත්‍ර තත්‍ර යනු ඒ ඒ තැනය. උපදින උපදින භවයන්හි හා ලැබෙන අරමුණුවලය. අභිනන්දනය යනු විශේෂයෙන් සතුටුවීමය.

මේ තණ්හාව ත්‍රිවිධය. කාමතණ්හා, භවතණ්හා, විභව තණ්හා යනුවෙනි. කාමයන්ට හෙවත් කාම වස්තූන්ට ඇතිවන තණ්හාව කාමතණ්හාවය. භවයට හෙවත් නැවත නැවත හටගැනීමට, නැවත නැවත ඉපදීමට ඇති තණ්හාව භව තණ්හාවයි. මරණයෙන් සියල්ල අවසන් වේයැයි සිතා, මරණයට පළමු මේ භවයේදීම සියලු සැප සම්පත් විඳීමට ඇතිවන ආසාව විභව තණ්හාවය.

කාමය යනු කැමැත්තය. කාම වස්තූන්ට ඇති කැමැත්ත කාම තණ්හාවය. අප සිරුරෙහි ඉන්ද්‍රිය පහක් පිහිටා තිබේ. ඒවාට ලබා ගත හැකි අරමුණු පහක් ලෝකයේ තිබේ.

ඒ ඉන්ද්‍රිය හා අරමුණු මේවාය :

1. චක්ඛු ඉන්ද්‍රිය (ඇස) - එයට රූපය අරමුණු වේ.
2. සෝත ඉන්ද්‍රිය (කන) - එයට ශබ්දය අරමුණු වේ.
3. ඝාන ඉන්ද්‍රිය (නාසය) - එයට ගන්ධය අරමුණු වේ.
4. ජිව්හා ඉන්ද්‍රිය (දිව) - එයට රස අරමුණු වේ.
5. කාය ඉන්ද්‍රිය (කය=සම) - එයට ස්පර්ශය අරමුණු වේ.

මේ අරමුණු පහ, එනම් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ වන දෑ යන පහ කාම වස්තූන්ය. මේ පහට මුළු ලෝකයම ඇතුළත් වේ. ඒවාට ඇති කර ගන්නා තදබල ඇල්ම, ආසාව හෙවත් තණ්හාව කාම තණ්හාවය.

ජීවත් වීමේදී අපට මේ කාම වස්තූන් පරිහරණය කිරීමට, කාම අරමුණුවලින් ප්‍රයෝජන ගැනීමට සිදුවේ. එසේ කාම වස්තු පරිහරණය කිරීම වැරදිද? එසේ කිරීම තණ්හාවද? මෙය හොඳින් තේරුම් ගත යුතු කරුණකි. ඇස පිහිටා ඇත්තේ අපට රූප බැලීමටය. අනෙකුත් ඉන්ද්‍රිය පිහිටා ඇත්තේද ඒ ඒ අරමුණු ලබා ගැනීමටය. ඒ නිසා රූප බැලීමවත්, ශබ්ද ඇසීමවත්, සුවඳ විඳීමවත්, රස බැලීමවත්, ස්පර්ශ ලැබීමවත් වැරදි ක්‍රියා නොවේ. එසේ අරමුණු ලබා ගැනීම තණ්හාවද නොවේ.

එහෙත් අපේ ස්වභාවය වන්නේ ලස්සන රූප දකීමෙන් සෑහීමට පත් නොවීමය. මිහිරි ශබ්ද ඇසීමෙන් සෑහිමට පත් නොවීමය. ඒ නිසා අපි ලස්සන රූපවල ඇලෙමු. මිහිරි ශබ්දවල ඇලෙමු. ඒවායෙහි නිතර, නිතර සීමාවක් නැතිව ආස්වාදය සොයමු. එසේ අරමුණුවල ඇලී නිතර ආස්වාදය සෙවීම තණ්හාවය.

රූපවාහිනිය බැලීමට හෝ මිහිරි සිංදු ඇසීමට හෝ නිරන්තරයෙන් කාලය ගත කිරීම අපගේ සියලු කටයුතුවලට හානි සිදුකර ගැනීමකි. එසේ සීමාවල ඉක්මවා අරමුණුවල ඇලී ඇස පිනවීමට, හෝ කන පිනවීමට යෑම තණ්හාවට යටවීමය.

බොහෝ අය අද සුවඳ විලවුන්වලට පුදුම ආසාවක් දක්වති. තමන්ගේ ආදායමෙන් විශාල කොටසක් ඒ සඳහා වියදම් කරති. ඇඳ, පුටු, කොට්ට, මෙට්ට, ආදියෙන් හා වෙනත් ආකාරයෙන් සුවදායක ස්පර්ශ ලබා ගැනීමට අප්‍රමාණ කාලයක්, ධනයක් වියදම් කරති. මේ සියල්ලම තණ්හාවේ වරදය.

කාම තණ්හාව යනුවෙන් හැඳින්වෙන්නේ මේ අයුරින් අරමුණුවල ඇලී ගැලී ක්‍රියා කිරීමය. එසේ සිටින තාක් දුකින් මිදීමට අවස්ථාව නොලැබේ. මේ නිසා අප වටහා ගත යුත්තේ තණ්හාවෙන් තොරව අරමුණුවලින් ප්‍රයෝජන ගන්නා ආකාරයයි.

ජීවත් වීම ගැන, මේ ජීවිතයෙන් පසු ද තව බොහෝ කාලයක් නැවත නැවත ඉපදෙමින් ජීවිතය පවත්වා ගෙන යෑමට ඇති ආසාව භව තණ්හාවයි. මිනිසුන් නොයෙකුත් පින්කම් කරමින් සුගති සැප ප්‍රාර්ථනා කරමින්, සෑහීමකට පත් නොවී ක්‍රියා කරන්නේ ද භව තණ්හාව නිසාමය.

''මිය යෑමෙන් ජීවිතය අවසන් වේය, නැවත ඉපදීමක් නැත'' යනුවෙන් සිතාගෙන සියලු සැප සම්පත් මෙලොවදීම විඳ අවසන් කිරීමට පෙළඹීම විභව තණ්හාවයි.

මේ භවයේ දුක ද, සංසාරයේ දුක ද ඇති වන්නේ කාම, භව, විභව තණ්හාවෙන් නිසා බව තේරුම් ගතහොත් තණ්හාව නැති කළ හැකිය. තණ්හාව නැතිවන තාක් භවයෙහි සැරිසරමින් සිටීමට සිදුවේ.

**ක්‍රියාකාරකම්**

01. පංච ඉන්ද්‍රිය හා ඒවායේ අරමුණු නම් කරන්න.
02. ත්‍රිවිධ තණ්හාව ලියා ඒවා පැහැදිලි කරන්න.
03. තණ්හාව නිසා අරමුණුවල ඇලීමෙන් දුක ඇතිවන ආකාරය නිදසුනක් මගින් පැහැදිලි කරන්න.

# 07. පාඩම

## යහපත් පෞරුෂ ලක්ෂණ හතරක්

මෙත්ත සූත්‍රය හෙවත් වඩාත් ප්‍රසිද්ධව ඇති පරිදි කරණීය මෙත්ත සූත්‍රය මිනිසාගේ චරිතය ගොඩනගා ගැනීම සඳහා යහපත් ගුණධර්ම පහළොවක් ඉදිරිපත් කර තිබේ. එයින් කිහිපයක් අපි සවැනි සහ සත්වැනි ශ්‍රේණිවලදී ඉගෙන ගතිමු. මේ ශ්‍රේණියේදී නව ගුණධර්ම සතරක් පිළිබඳව විමසා බලමු. එනම් අප්පකිච්ච, සල්ලහුකවුත්ති, සන්තින්ද්‍රිය හා නිපක යන හතරයි.

### 1. අප්පකිච්ච

අප්පකිච්ච යනුවෙන් හැඳින්වෙන්නේ වැඩි වැඩ නැති බවයි. වෙන වචනයකින් කිවහොත් වැඩ අඩු බවයි. අල්පකෘත්‍යතාවයි ද කිව හැකිය.

අපට වැඩ වැඩි වන්නේ අනුන් විසින් වැඩියෙන් වැඩ පැවරීම නිසා හෝ අප විසින්ම කැමැත්තෙන් වැඩියෙන් වැඩ පවරා ගැනීම නිසාය.

අපගේ කායික ශක්තිය අනුව අපට කළ හැකි වැඩ ප්‍රමාණයක් ඇත. එසේම මානසික ශක්තිය අනුව ද අපට කළ හැකි වැඩ ප්‍රමාණයක් ඇත. කායික වූ හා මානසික වූ මේ ශක්ති ප්‍රමාණය ඉක්මවා කිරීමට ඇති වැඩ කොටස වැඩි වැඩය.

ප්‍රමාණය ඉක්මවා වැඩියෙන් වැඩ කරන විට කායිකව හා මානසිකව දුර්වල වීම සිදුවේ. වෙහෙස වැඩිවේ. ඒ නිසා රෝගාබාධයන්ට ගොදුරු වීමට සිදුවේ. කාලය නිසිලෙස කළමනාකරණය කර ගැනීමට නොහැකි වේ. එවිට කරන වැඩවල ගුණාත්මක අගය අඩු වේ. සාර්ථකත්වය හීන වේ. අසාර්ථක වේ. ඒ නිසා මේ වැඩකින් උපරිම ලෙස ප්‍රතිඵල

ලැබීමට නම් තම ශක්තියට ප්‍රමාණවත් පරිදි වැඩ පවරා ගත යුතුය. එහෙත් ඇතැම් විට අපගේ අනුදැනීමෙන් තොරව වැඩියෙන් වැඩ අපවෙත පවරන ලද අවස්ථා තිබිය හැකියි. එවැනි තැනදී වඩා බුද්ධිමත්ව හා වැඩි උත්සාහයෙන් ක්‍රියා කිරීමට සිදුවේ. බොහෝ විට ප්‍රශ්නයක් ඇති කර ගන්නේ අප විසින්මය. තම ශක්තිය දැන හෝ නොදැන එයට වැඩි වූ වැඩ ප්‍රමාණයක් අප වෙත පවරා ගැනීමට පෙළඹෙන අය සිටිති. තමන් ගැන අධි තක්සේරුවක් නිසා මෙසේ සිදු විය හැකියි. ලැබෙන ලාභය කෙරෙහි ඇති ලොල් බව නිසාද එසේ විය හැකියි.

ඒ කවර ක්‍රමයෙන් වුවද වැඩි වැඩ කිරීමට යෑම අසාර්ථක පුද්ගලයකු වීමට මග පාදයි. ඒ නිසා තම ශක්තිය නිවැරදිව හැඳිනගෙන තමන්ට සාර්ථක ලෙස නිම කිරීමට හැකි වැඩ කොටසක් පමණක් භාර ගෙන එය ඉටු කර තෘප්තිමත් වීමට අප ඉගෙන ගත යුතුය. එවිට සුව පහසුව ලැබීමටත්, විවේකය භුක්ති විඳීමටත්, තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමටත් අවස්ථාව ලැබේ. එසේ ක්‍රියා කරන තැනැත්තාගේ මෙලොව ජීවිතයද පරලොව ජීවිතයද සාර්ථක වී ආධ්‍යාත්මික දියුණුවද ලබා ගත හැකිය. එසේ කිරීම සැබෑ බෞද්ධකමය. අත්ථකුසල පුද්ගලයා යනු එසේ සාර්ථකත්වය ලබන තැනැත්තාය.

## 2. සල්ලහුකවුත්ති

සල්ලහුකවුත්ති යනුවෙන් කියවෙන්නේ සැහැල්ලු පැවතුම් ඇති බවයි. ඇතැම් අය බොහෝ භාණ්ඩ පරිහරණයට කැමැත්තෝය. ඇඳුම් පැළඳුම්, ආභරණ වර්ග, ගෙදර බඩු භාණ්ඩ, විවිධ උපකරණ හා මෙවලම් අවශ්‍යතාවන්ට වැඩියෙන් පරිභෝග කරති. මෙවැනි බහු භාණ්ඩික පරිභෝජනය සැහැල්ලු පැවැත්මට සම්පූර්ණයෙන් පටහැනි ජීවන රටාවකි. අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා පරිභෝජනයෙහි යෙදීමේ ආදීනව දුටු තැනැත්තා බහු භාණ්ඩිකත්වය අතහැර සැහැල්ලු ජීවිතයට පුරුදු වේ. බහු භාණ්ඩිකත්වයේ ඇති වරද කුමක්ද?

තිබෙන දේ ලැබෙන දේ මදි කියා සිතන තැනැත්තා තව තවත් භාණ්ඩ රැස් කිරීමේ යෙදේ. ඒ සඳහා වැඩි වැඩියෙන් මුදල් අවශ්‍යය.

මුදල් සෙවීමට අධික සේ මහන්සි වීමට සිදුවේ. ලබා ගත් දේ රැක ගැනීමට ද අපහසුය. නිතර ප්‍රයෝජනයට ගන්නා දේ මෙන් නොව ආශාව නිසා රැස්කරගත් අතිරේක දෑ නිසි පරිදි සොයා නොබැලුවහොත් ඉක්මනින් විනාශයට පත්වේ. අපතේ යෑම, අතපසුවීම, නිසි රැකවරණය නොලැබීම ආදී හේතු නිසා භාණ්ඩ විනාශ වී යෑම පුද්ගලයාගේ පරිහානිය සිදු කරන්නකි.

අවශ්‍ය ප්‍රමාණයට පරිභෝජනයේ යෙදෙන්නා සුවපහසුවද ලබමින්, අධික වෙහෙසට පත් නොවී, තෘප්තිමත්ව ජීවත් වේ.

චාම් බව බුදු දහමෙන් අගය කරන්නේ එමගින් පුද්ගලයාගේ සුව පහසුවද, සන්තුෂ්ටියද, තෘප්තිය ද ලැබෙන නිසා පමණක් නොවේ. දුකට හේතුව තණ්හාව බව බෞද්ධ ඉගැන්වීමයි. චාම් බව හෙවත් සැහැල්ලු පැවැත්ම තණ්හාව තුනී කිරීම සඳහා අනුගමනය කළ හැකි ප්‍රතිපත්තියකි. එසේම සතුට හෝ තෘප්තිය භාණ්ඩවල තිබෙන්නක් නොවේ. ඒවා පරිහරණය කරන පුද්ගලයාගේ සිතේ ඇතිවන සිතුවිල්ලකි. ඒ නිසා යහපත් ජීවිතයක්, සාර්ථක ජීවිතයක් ගත කිරීමට අපේක්ෂා කරන අය චාම් ජීවිතයකට හුරු විය යුතුය.

### 3. සන්තින්ද්‍රිය

සන්තින්ද්‍රිය යන්නෙන් අදහස් කරන්නේ ඉන්ද්‍රිය සංවර කර ගැනීමයි. ඇස, කන, නාසය, දිව, ශරීරය (= සම) යන පස පංචේන්ද්‍රිය වේ. ඒවාට රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු ගෝචර වේ. මිනිසා ලෝකය ගැන කරුණු දැන ගන්නේ ඉන්ද්‍රිය මගින් අරමුණු ලබා ගැනීමෙනි. ඒ නිසා ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය ජීවත්වීම සඳහා අත්‍යවශ්‍ය කරුණකි.

ඉන්ද්‍රිය මගින් අරමුණු ලබා ගන්නා විට මිනිසාට වින්දනයක් ඇතිවේ. ඒ වින්දන සැප සහගත දුක් සහගත හෝ මධ්‍යස්ථ වේ. මිනිසා සැප අරමුණුවල ඇලේ. දුක් වේදනා දෙන අරමුණු හා ගැටේ. මධ්‍යස්ථ අරමුණු නිසා බොහෝ විට මුලාවට පත්වේ. මේ ඇලීම්, ගැටීම්, මුලාවීම් නිසා කළයුතු දේත් නොකළ යුතු දේත් කරයි. කිරීමට සුදුසු දේ කරන විට යහපත් ප්‍රතිඵල ලැබෙතත් නොකළ යුතු දේ කරන විට ලැබෙනුයේ අයහපත් ප්‍රතිඵලය. ඒ නිසා නොකළ යුතු දේ නොකිරීමට පුහුණු

විය යුතුය. ඒ සඳහා ඉන්ද්‍රියයන්ට ලැබෙන ලැබෙන අරමුණු සොය සොයා ඒවා පසුපස නොයා යුතුයි. එසේ සංවර වීම, අවබෝධයෙන් යුතුව ඉන්ද්‍රිය පාලනය කර ගැනීම ඉන්ද්‍රිය සංවරය නම් වේ. පොහෝ දා අටසිල් සමාදන් වීමෙන් තරමක් දුරට ඉන්ද්‍රිය සංවරය සිදුවේ. එදින විශේෂයෙන් නැටුම්, ගැයුම්, වැයුම්, විසුලු දැකීම්, මල් ගඳ විලවුන් දැරීම්, සැරසීම් අතහරින නිසා ඇස ද, කන ද, නාසය ද, සිරුර ද යම් තරමකින් සංවර වේ. විකාල භෝජනයෙන් වැළකීම නිසා දිව සංවර වේ. පන්සලේ ගත කිරීමේ දී ගෙදරදී මෙන් අනවශ්‍ය ක්‍රියාවන්හි නොයෙදෙන නිසා පසිඳුරන් ම තරමක් දුරට සංවර වේ. ඒ නිසා බෞද්ධයාට පොහොය දින අටසිල් සමාදන් වීම ඉන්ද්‍රිය සංවරය පුහුණු වීමට ඉතා හොඳ අවස්ථාවක් වේ.

## 4. නිපකෝ

නිපක යනුවෙන් නුවණ ඇති බව අදහස් වේ. සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීම සඳහා මෙන් ම පරිභෝජනයෙහි තෘප්තියක් ලැබීම සඳහා ද නුවණින් යුතුව ක්‍රියා කළ යුතුය. සිල් රැකීමේ දී නුවණැතිව එය කළ යුතුය යන්න භික්ෂූන් වහන්සේගේ ජීවිතය සම්බන්ධයෙන් පෙන්වා දී තිබේ. එසේම සිවුරු, පිරිකර, ආදිය පරිහරණය සම්බන්ධයෙන් ඇති නුවණැති බවද අවධාරණය කර තිබේ. මෙය ගිහි ජීවිතය සම්බන්ධව සලකා බලන විට තැනට සුදුසු නුවණින් ක්‍රියා කිරීම යනුවෙන් ද කිව හැකිය. කය වචනය සංවර කරගෙන ක්‍රියා කිරීම සිල් රැකීමයි. කය වචනය සංවර කළ යුතු දේ නොකළ යුතු දේ කර ගැනීමට නම් කළ යුතු දේ නොකළ යුතු දෙයින්ද කිව යුතු දේ නොකිව යුතු දෙයින්ද වෙන් කොට හැඳින ගත යුතුය. යහපත අයහපත, හොඳ නරක වෙන්කොට හැඳින ගැනීම යනුවෙන්ද එයම අදහස් වේ. සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය නුවණ එයයි. එසේම, පරිභෝජනයෙහිදී පරිභෝජනය කළ යුතු බව නොකළ යුතු බව වෙන වෙනම තේරුම් ගැනීම මෙන්ම පරිභෝජනය කළ යුත්තේ කුමන අරමුණු ඉටු කර

ගැනීමටදැයි දැන ගැනීම මෙහිදී බලාපොරොත්තු වන නුවණයි. තැනට සුදුසු නුවණ යනුවෙන් මේ අදහසම ප්‍රකාශ වේ.

මේ පාඩමෙහි ඉගෙනගත් අල්පකෘත්‍යතාව, සැහැල්ලු පැවැත්ම, ඉන්ද්‍රිය සංවරය හා නුවණින් යුතුව ‍ක්‍රියා කිරීම බෞද්ධයා කුඩා කල සිට තමා කෙරෙහි ඇති කර ගෙන චරිතය මැනවින් වැඩි දියුණු කර ගැනීමට උත්සුක වියයුතු ගුණ ධර්ම ය. එසේ කරන්නා සාර්ථක ජීවිතයකට හිමිකරුවෙක් වේ. නිවන් දැකීමේ මාර්ගයටද පිවිසි ශ්‍රාවකයකු වෙයි. මේ අනුව ඔහු හෝ ඇය අත්ථකුසල පුද්ගලයකුයි හැඳින්විය හැකිය.

**ක්‍රියාකාරකම්**

01. ''වැඩ වැඩි කර ගැනීමෙන් ජීවිතය අසාර්ථක වේ'' මෙය සත්‍ය ප්‍රකාශනයක්ද? හේතු දක්වන්න.
02. ''බහු භාණ්ඩික බව'' විස්තර කරන්න. එහි ඇති වරද කුමක්ද?
03. ශිෂ්‍යයකු විසින් ඉන්ද්‍රිය සංවර කර ගැනීමට කළ හැකි දේ පෙන්වා දෙන්න.
04. ''නිපකෝ'' යන ගුණය විස්තර කරන්න.

# 08. පාඩම

## දැහැමි බව රැකි නිරිඳු බිම්සර

අප තථාගතයන් වහන්සේ දිවමන් කල මගධය ප්‍රබල රාජ්‍යයක්ව පැවතුණි, රජගහනුවර එහි අග නගරය විය. ජීවක අඹ වනය, වේළුවනාරාමය, සප්තපර්ණි ගුහාව ආදී ස්ථාන රැසක් පිහිටියේ ද රජගහ නුවරය. මෙකල මෙහි පාලකයා වූයේ මගධාපති, සේනිය, ධම්මික යන ගෞරවනාමයන්ගෙන් ජනාදරයට පත්ව සිටි බිම්බිසාර මහ රජතුමාය.

### මිත්‍රශීලී පාලකයෙක්

අසල් වැසි රාජ්‍යයන් සමග මිත්‍රශීලීව ක්‍රියා කළ බිම්බිසාර රජතුමා සැබවින්ම දක්ෂ පාලකයෙක් විය. විවිධ රටවලින් පැමිණි රාජදූතයන් හා වෙළෙන්දන් මගින් ලිපි හා තුටු පඬුරු යැවීමෙන් එම මිතුරුදම් ගොඩනගාගෙන තිබුණි. සුද්ධෝදන රජතුමා ද එලෙස සබඳතා ඇති කරගත් රාජ්‍ය පාලකයෙකි.

සුදොවුන් රජතුමාගේ පුතකු වූ සිදුහත් බෝසතාණන් වහන්සේ ගිහිගෙය අතහැර තවුස් වෙස් ගෙන රජගහ නුවරට පිවිසුනහ. නගරයේ වීදියක පිඬු සිඟා වඩින එතුමන් දුටු නුවර වැසියන් ඒ ගැන බිම්බිසාර රජුට දැන් වූයේ සෙසු තවුසන් ට වඩා කිසියම් විශේෂත්වයක් එතුමන් වෙතින් දුටු බැවිනි. රජතුමා සිදුහත් තාපසතුමා වෙත ගොස් තොරතුරු විමසා බුදුබව ලබා පළමුව තම රටට වැඩමවන ලෙස බෝසතාණන් වහන්සේට ආරාධනා කළේය.

### සැදැහැති උපාසකයෙක්

බුදුවීමෙන් පසුව උන්වහන්සේ එම ඇරයුම මත සදහම් චාරිකාවෙහි යෙදෙමින් රජගහ නුවරට නුදුරින් පිහිටි තල් වනයට වැඩමවා නුග

රුකක් මුල වැඩ සිටි සේක. බිම්බිසාර රජතුමාට ඒ බව සැලවිය. විශාල පිරිසක් සමග භාග්‍යවතුන් වහන්සේ හමුවීමට පැමිණියේය. බුදුරජාණන් වහන්සේ දුටු සැණින්ම රජතුමාට ඇති වූයේ ඉමහත් සතුටකි. එකල රහතුන් ලෙස කිතුගොස් ලබා සිටි උරුවෙල් කාශ්‍යපාදීන් සසුන් ගතව සිටිනු දැක රජතුමා පුදුමයට පත්විය. මෙහිදී ශාන්ති නායකයන් වහන්සේ දෙසූ දහම් ඇසීමෙන් රජතුමා ඇතුළු බොහෝ දෙනෙක් සෝවාන් වූහ. සෙසු අය තෙරුවන් සරණ ගියහ.

මෙලෙස සැදැහැති උපාසකයකු වූ රජතුමා තමා තුළ පැවති අපේක්ෂා පහක් ඉටු වූ බව බුදුරජාණන් වහන්සේට දන්වා සිටියේය. එනම්,

1. මගධයෙහි රජවීම.
2. බුදුරජාණන් වහන්සේ තම රටට වැඩමවා ගැනීම.
3. දහම් ඇසීම.
4. බුද්ධෝපස්ථාන කිරීම.
5. ධර්මාවබෝධය ලබා ගැනීම.

එම කරුණු වේ.

මෙම ප්‍රකාශය කර, පසු දින දානයට රජ මැදුරට භික්ෂු මහා සංඝයා පිරිවරා වැඩම කරවන ලෙස භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කළේය. තම යහපත් අරමුණු මල්පල ගැන්වෙන විට තමාට දැනෙන සතුට කෙබඳු ද යන්න මෙම සිද්ධියෙන් තහවුරු වේ.

**කුලුපග දායකයෙක්**

රජතුමාගේ ඇරයුම මත නිදුකාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා සමග පසුදින දානයට රජ මාළිගාවට වැඩම කළහ. සැදැහැසිතින් යුතුව රජතුමා දන් පිරිනැමුවේය. දන් වළඳා අවසන් වූ පසු රජතුමා එකත්පසව සිට බුදුරජාණන් වහන්සේට මෙසේ ප්‍රකාශ කළේය.

" ස්වාමීනි තුණුරුවන්ගෙන් තොරව මට ජීවත්වීමට නොහැකිය. එබැවින් ඉඩකඩ ලද හැමවිටම ඔබ වහන්සේ හමුවට එන්නෙමි. තල්වනය ඇත්තේ රජ මැදුරට බොහෝ දුරිනි. අපේ වේළුවන උයන

එතරම් ඈතක නොවේ. එසේම වැඩි ළඟත් නොවේ. යාමට ඒමට වඩාත් පහසුය. දහවල ජනතාවගේ ගැවසීමක් නැත. රාත්‍රියට නිහඬය. කාය විවේකයට සුදුසුය."

මෙසේ තම අදහස් දන්වා බිම්සර රජු වේළුවන උයන බුදුරජාණන් වහන්සේ ඇතුළු මහ සඟරුවනට පූජා කළේය. බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව මෙයයි. බුදු දහම ප්‍රචාරය කිරීමටත් රැක ගැනීමටත් බිම්බිසාර රජතුමා ක්‍රියා කළ අයුරු මෙයින් පැහැදිලි වේ. භාග්‍යවතුන් වහන්සේ දෙවන, තෙවන, සිව්වන, දාහත්වන සහ විසිවන වස් කාලයන් ගත කළේ වේළුවනාරාමයේය. මෙම ආරාමය කේන්ද්‍ර කරගෙන විශාල පිරිසක් නිවන් පසක් කළහ. ඒ අය අතර සැරියුත් මුගලන් දෑග සව්වන් වහන්සේලා ද වෙති.

## කල්‍යාණ මිත්‍රයෙක්

පුක්කුසාති නම් මල්ල රජු වරක් තමා නොදුටු මිතුරකු වන බිම්බිසාර රජතුමාට පුද පඬුරු එවා තිබුණි. එයට කළගුණ සලකා බිම්සර නිරිඳු විසින් රන්පතක ලියා යවන ලද්දේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ පුවත සහ තෙරුවන් ගුණ පිළිබඳවත්ය. පුක්කුසාති රජතුමා බෞද්ධයකු බවට පත් වූයේ එම ලිපිය කියවීමෙන් පසුවය.

බිම්බිසාර රජතුමාගේ බිසවක වූ ඛේමා රූප මදයෙන් මත්ව සිටි කැනැත්තියකි. රූපයෙහි ආදීනව පවසන බව අසා ඈ බුදුපියාණන් වහන්සේ හමුවට නොගියා ය. පසුව ඛේමා බිසව උපායශීලීව වේළුවනය වෙත පැමිණවීමට රජතුමා පියවර ගත්තේය. ඒ අනුව තෙරුවන් සරණ ගිය ඈ රහත් මෙහෙණියක් බවට පත්වූවා ය. තවද අග්‍රශ්‍රාවිකා තනතුරටත් නුවණැති භික්ෂුණීන් වහන්සේලා අතර අග තනතුරටත් පත්වූයේ ඇයයි.

## වගකීම් ඉටු කළ රාජ්‍ය නායකයෙක්

විශාලා මහනුවරට දුර්භික්ෂ, රෝග, අමනුෂ්‍ය යන තුන්බියක් ඇති විණි. එයින් වැසියෝ ඉමහත් පීඩාවට පත්ව සිටියහ. මේ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ එම බිය දුරුකිරීම පිණිස එහි වැඩම කර රතන සූත්‍රය දේශනා කළ සේක. ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර

දෙමින් භාග්‍යවතුන් වහන්සේට අනුග්‍රහය ලබාදුන්නේ බිම්බිසාර මහ රජතුමාය.

## කාරුණික පියෙක්

බිම්බිසාර රජතුමා පියකු ලෙස තම පුත් අජාසත් කුමරා උපන් දිනයේ සිට මැනවින් රැකබලා ගත්තේය. අවශ්‍ය අධ්‍යාපනය, රැකවරණය නො අඩුව සලසා දුනි. දිනක් ඇඟිල්ලක විස බුබුලක් හට ගැනීමෙන් ළදරු අජාසත් කුමරා මහත් වේදනාවෙන් හඬන්නට විය. බිම්බිසාර රජතුමා කුමරාගේ හැඬීම නවතනු පිණිස එම ඇඟිල්ල මුව තුළට ගෙන ඉරීය. ඇඟිල්ලෙහි වූ විස බුබුල පුපුරා මුව තුළටම ලේ සැරව ගැලුවේය. එහෙත් පුතු සනසනු පිණිස එම ලේ සැරව ගිලිමින් ම ඇඟිල්ල ඉරීය. එනමුදු දෙව්දත් තෙරුන් වහන්සේගේ ඇසුරෙන් කුමරා නොමග ගියේය. මව්පිය ඇසුරෙන් මිදුණු අජාසත් කුමරා දෙව්දත් තෙරුන් වහන්සේගේ යෝජනාවක් අනුව පිය රජු මැරීමට කටයුතු කළේය. මේ බව දත් ඇමතිවරු අජාසත් කුමරා ඇතුළු එම පිරිස විනාශ කරන ලෙස රජුගෙන් ඉල්ලා සිටියහ. එහෙත් බිම්බිසාර රජ තම පුතු කෙරෙහි පැවති සෙනෙහස නිසා ම වරදට සමාව දී තම රාජ්‍යය ද පවරා දුන්නේය. එහෙත් සිපිරි ගෙදර තබා දරුණු වද දී තම පියාණන් මැරවීමට අජාසත් උපක්‍රම යෙදවීය. පුත් කුමරු තමන්ටත් තම රාජ්‍යයටත් තර්ජනයක් එල්ලවන අවස්ථාවක පවා ඉවසීමෙන් යුතුව රාජ්‍යය පවරා දීමට බිම්බිසාර රජතුමා කාරුණික වූයේ ය.

## දයාබර බිරිඳක් ලද සැමියෙක්

අඹු සැමි දෙදෙනාම සදාචාර සම්පන්න පරිත්‍යාගශීලි, නිවැරදි දැක්මක් ඇති අය නම් එය දෙවියෙකුගේත් දෙවඟනකගේත් එකට විසීමකි. මෙය සිදුවන්නේ අන්‍යෝන්‍ය යුතුකම් ඉටු කිරීම පදනම් කරගෙන ගොඩ නැගෙන පවුල් ජීවිතයෙනි. මෙම සබැඳියාව බිම්බිසාර රාජ චරිතයෙහි ද දක්නට ලැබේ. රහසිගතව රන් තැටියකින් ආහාර ගෙන ගිය කෝසල දේවිය පසුව කෙස් කළඹෙහි ද මිරිවැඩියෙහිද සඟවා ආහාර ස්වල්පයක් ගෙන ගියාය. අවසානයේදී ආහාර රැගෙන යන්නේ සුවඳ පැනින් නා ඇගේ චතුමධුර ගල්වාගෙන සළුවක්

පොරවාගෙනය. රජතුමා බිසවුන්ගේ ඇඟ ලෙව කා කුසගින්න නිවා ගත්තේය. අවසානයේ බිසවට සිරමැදුරට යාම ද තහනම් විය. එහෙත් දෙදෙනාගේ අඹු සැමි සෙනෙහස මියෙන තුරා පැවතුණි.

## කර්ම විපාක ලද රජෙක්

සිරගෙය තුළදීම බිම්බිසාර රජතුමාගේ මරණය සිදුවිය. එලෙස සිරමැදුරේදී මිය යාමට සිදු වූයේ පෙර කරන ලද අකුසලයක් නිසාය. බිම්බිසාර රජතුමා බුදුසසුනේ උන්නතියට සුවිශේෂී මෙහෙවරක් කළ සැදැහැති උපාසකයෙකි. ඔද තෙද සුරැදි දැහැමි පාලකයෙකි. දරුවනට සෙනෙහසින් අනූන පියාණන් කෙනෙකි. බිරිඳට ලෙන්ගතු දයාබර සැමියෙකි. බිම්බිසාර රජතුමාගේ චරිතය ලොවට ආදර්ශයකි.

## ක්‍රියාකාරකම්

01. "බිම්බිසාර රජතුමා බලයෙන් උදම් නොවූ දැහැමි පාලකයෙකි" මෙම ප්‍රකාශය සනාථ කිරීමට කරුණු දක්වන්න.

02. බිම්බිසාර රජතුමාගේ ශාසනික මෙහෙයන් අගය කරමින් ඡේදයක් ලියන්න.

03. මෙම චරිත කථාවෙන් ඔබේ ජීවිතයට සම්බන්ධ කරගත හැකි යහපත් ලක්ෂණ විස්තර කරන්න.

04. බිම්බිසාර රජතුමාගේ චරිතයට අදාළව කවි දෙකක් නිර්මාණය කරන්න.

# 09. පාඩම

## පාසල් පරිසරය බොදු සිරිතෙන් ඔපවත් කරමු

අපේ පාසල අනුරාධගම ආදර්ශ මහා විද්‍යාලයයි. ''**සීලේන අනුපේතස්ස සුඛේනත්ථෝ න විජ්ජති**'' යනු එහි ආදර්ශ පාඨයයි. එහි සරල තේරුම චරිතය හොඳ නැති තැනැත්තාගේ උගත් කමින් පලක් නැත යන්නයි. එම පාඨයට අනුව දැනුමෙන් මෙන්ම හැසිරීමෙන් ද පෙහෙසත් අය වීමට විදුහල්පතිතුමන් ප්‍රධාන ගුරු මණ්ඩලයෙන් අපහට ලැබෙන්නේ මහඟු මගපෙන්වීමකි. අපේ මවුපියෝ ද ඒ සඳහා අප දිරි ගන්වති. පාසලේ උතුම් අරමුණුවලට අනුකූලව ගුරු මණ්ඩලයේ සිත් දිනාගෙන බෞද්ධ දරුවන් ලෙස පාසල් පරිසරය තුළ අපට හැසිරීමට මහඟු පිටුවහලක්ව පවතින්නේ අප ලබන දහම් පාසල් අධ්‍යාපනයයි.

තම තමන්ට පැවරෙන වගකීම් පැහැර නොහැර, බලකිරීමකින් තොරව ඉටු කිරීම, හැදෙන වැඩෙන දරුවකුගේ ලක්ෂණයක් බව දහම් පාසලෙන් අපි ඉගෙන ගෙන ඇත්තෙමු. එම ඉගෙනුම ක්‍රියාවට නගන දරුවන් ලෙස වේලාසනින් පාසලවෙත පිය නගන්නේ උදෑසන තෙරුවන් වන්දනාවට පෙර, පාසල් පරිසරය පිරිසිදු කිරීම පිණිසය. අපේ ස්වාමීන් වහන්සේ උගන්වා ඇති පරිදි පිරිසිදු කිරීම යනු ඉදලෙන් මිදුල අතුගෑම පමණක් නොවේ. අමදින ගමන් අපි තණකොළ ගලවමු. ගල් කැට ඉවත් කරමු. වැසි නිසා සෝදා පාලුවී ඇති තැන් වැලි පස් ආදිය දමා සම කරමු. අමදින්නේ වැලි ඉවත් නොවන සේ සහ අපිළිවෙළට ඇති වැලි කැට සමව විසිරෙන සේය. ශිෂ්‍ය - ශිෂ්‍යා භේදයකින් තොරව අපි සියලු දෙනා ම එම කටයුතුවලට සහභාගි වෙමු. ඇමදීම කළ යුත්තේ ශිෂ්‍යාවන් විසින් පමණක්ය යන වැරදි හැඟීම අපි දුරු කර ඇත්තෙමු.

පාසල් පරිසරය පිරිසිදුව තබා ගැනීම අපේ යුතුකමක් මෙන්ම වගකීමක් ද වන හෙයින් පිරිසිදු කළ බිමට යළි කොල කෑලි දමා

අපිරිසිදු නොකරමු. නොදැනුවත්ව කවරකු අතින් හෝ වැටුණු කොළ කැබැල්ලක් දුටුවහොත් ඒ මොහොතේම එය ඉවත් කිරීම අපගේ සිරිතය. පාසල් පරිසරය පිරිසිදු කිරීම මෙන්ම අපිරිසිදු නොකිරීමත් බොදු දරුවකුගේ ලක්ෂණයක් බව දහම් පාසලේ පහළ ශ්‍රේණිවලදීම අපි ඉගෙන ගෙන ඇත්තෙමු.

පාසලේ කෙරෙන ආගමික කටයුතුවලට මහත් ඕනෑකමකින් සහභාගි වන පිරිසක් ලෙස වඩාත් ප්‍රසිද්ධියට පත්ව සිටින්නේ අපේ පංතියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ය. උදෑසන බුද්ධ පූජාව සඳහා මල් රැගෙන ඒමට අපි අමතක නොකරමු. අප ගෙනෙන මල් තැන්පත් කර කලාත්මක මල් බඳුන් දෙකක් පිළියෙල වේ. ලොකු මල් බඳුන අනෙකුත් සිසුන් සමග බුදු මැඳුරට පූජා කිරීම සඳහාය. කුඩා මල් බඳුන අපේ පංති කාමරයේ වැඩ සිටින බුදු පිළිම වහන්සේට පූජා කිරීම පිණිසය.

බුදු මැඳුරේ වතාවත් සිදු කිරීම ශ්‍රේණිවලට බෙදා දී ඇත. අපට වෙන් කළ දිනයේදී විහාර මළුවට පිවිසෙන්නේ පාවහන් ගැලවීමෙන් අනතුරුවය. පෙර දින පූජා කරන ලද මල් ඉවත් කර මලසුන සෝදා පිරිසිදු කරමු. මකුළු දැල් ඇත්නම් ඉවත් කරන්නේ සතාගේ ජීවිතයට හානියක් නොවන පරිදිය. බුදු මැඳුර ඇතුළත මෙන්ම පිටත මළුවද හොඳින් අමදින අපි මළුවේ ඇති මල් පැළවලට පොහොර හා ජලය යොදමු. විහාර මළුවේ ඇති මල් ගස්වලින් මල් නෙලා ගැනීම අපේ සිරිත නොවේ.

අප විහාර භූමියෙහි හැසිරෙන්නේ ජීවමාන බුදුරජාණන් වහන්සේ හමුවට ගිය අය ලෙසය. විහාර පරිශ්‍රය පුණ්‍ය භූමියක් මිස ක්‍රීඩා පිට්ටනියක් නොවේ. අපි එහිදී ශබ්ද නගා කතා කිරීම හෝ සිනාසීම නොකරමු. බුදු මැඳුර සහ එය පිහිටි මළුව උඩුයටිකුරු කරමින් නිකරුනේ කාලය ගෙවීමට යොදා ගන්නා තැනක් නොවන බව අපි හොඳාකාරව දනිමු.

දහම් පාසලේ ස්වාමීන් වහන්සේ මෙන්ම පාසලේ බුද්ධ ධර්මය උගන්වන ගුරුතුමාද අපට කියා දී තිබෙන්නේ වන්දනා කිරීම, මල් පූජා කිරීම ආදිය සැදැහැසිතින්ම කළ යුතු බවයි. උවමනාවට එපාවට මෙන් නොකළ යුතු බවයි. පාසලේ උදෑසන වන්දනාවට ඉතා සැලකිල්ලෙන් සහභාගි වන්නේ එබැවිනි. බුදු මැඳුර වෙත මල් බඳුන් වඩමවන්නේ සැදැහැ උපදින ලෙස ලතාවකට සාධු කාර දෙමිනි. මල්

පූජා කරන්නේ ද කණ්ඩායම් කීපයක් වශයෙන් නොව එකම පිරිසක් ලෙස මිහිරියට ගාථා සජ්ඣායනා කරමිනි. ශබ්ද නගා සාධුකාර දීමට, නමස්කාරය කීමට, පන්සිල් සමාදන් වීමට හා ගාථා සජ්ඣායනය කිරීමට ඇතැම්හු ලැජ්ජාශීලි වෙති. එහෙත් අපි එසේ නොවෙමු.

ඊළඟට අප සඳහන් කරන්නේ අපේ පංති කාමරය ගැනයි. අප එය සකසා ගෙන තිබෙන්නේ ද පරිහරණය කරන්නේ ද බෞද්ධ පරිසරය ඉස්මතු වන ලෙසයි. අප පංතියේ හිඳගත් පසුව බිත්තියේ දක්නට ලැබෙන්නේ පාසලේ ආදර්ශ පාඨය සහ **"ආයුබෝවන්, තෙරුවන් සරණයි"** යන ආශිර්වාදයයි. අප එකිනෙකාට ආශිර්වාද කරගන්නේ එම ආශිර්වාද පාඨයෙනි. ගුරුතුමා හෝ ගුරුතුමිය පංතියට පැමිණෙන විට ගෞරවයෙන් නැගී සිට ආයුබෝවන් තෙරුවන් සරණයි කීම අපේ සිරිතය. පෙරලා අපට ආශිර්වාද ලැබෙන්නේ ද එම පාඨයෙන්මය. බිත්ති අපිරිසිදු වන කිසිවක් අපේ පංති කාමරයේ ලියා නැත. ගුරු මේසය පමණක් නොව අපේ ඩෙස් සහ බංකු ද පිරිසිදුව තබා ගන්නා අපි ඒවා අපවිත්‍ර වන කිසිවක් නොලීමටද වග බලා ගනිමු. ඊළඟ වසරේ පැමිණෙන සිසුන්ට පිරිසිදු පංති කාමරයක් භාරදීමේ වගකීම අප වෙත පැවරී ඇති බව අපි දනිමු.

පංති කාමරයේ ඉගෙනීමේ දී ප්‍රශ්න කළයුතු තැන අපි ගුරුතුමාගෙන් ප්‍රශ්න අසමු. නොවැටහුන තැන් ඇතොත් ඒ බවද පවසමු. ඒ සියල්ල කරන්නේ ගුරු ගෞරවයට හානියක් නොවන පරිදිය. ගුරුතුමා අසන ප්‍රශ්නවලට විනීතව පිළිතුරු දීමට අපි පුරුදු වී සිටිමු. ගුරුතුමකු හෝ ගුරුතුමියක පංතියේ නොමැති කාල පරිච්ඡේදවල නිකරුණේ නොසිට තනි තනියෙන් පොතක් කියවා ගැනීම හෝ නියමිත විෂයට අදාළ සාමූහික සාකච්ඡාවක යෙදීම අප අනුගමනය කරන පිළිවෙතයි. පංති කාමරයේ ප්‍රදර්ශනය කර ඇති කිසිදු ලේඛනයක් අපවිත්‍ර කිරීමක් හෝ ඉරා දැමීමක් අපගෙන් සිදු නොවේ. අනෙක් පංති කාමරවල තත්වයද එයයි.

පාසලෙහි මාසිකව හෝ වාරිකව හෝ වාර්ෂිකව හෝ ක්‍රියාත්මක කෙරෙන පෝය වැඩසටහන්, ශ්‍රමදාන, අසරණ සරණ වැඩසටහන්වලට පමණක් නොව ක්‍රීඩා උත්සව ආදියටද අප සහභාගී වන්නේ බෞද්ධ කමට ගැලපෙන

ආකාරයටය. ඇතැම් අය ක්‍රීඩා උත්සව ආදියට දක්වන තරම් උනන්දුවක් සීල භාවනා වැඩසටහන් ආදියට නොදක්වති. අප එසේ නොවේ. පාසලේ කෙරෙන සෑම පොදු කටයුත්තකදීම අපට පැවරෙන කටයුතු හැකිතාක් හොඳින් ඉටු කිරීමට අපි හුරු පුරුදු වී ඇත්තෙමු.

පාසල පටන් ගැනෙන අවස්ථාව මෙන්ම පාසල ඇරෙන වේලාව ද බෙහෙවින් වැදගත්ය. ඡත්ත මානවක ගාථා කලබලයෙන් කියා දිව යෑමක් අපගෙන් සිදු නොවේ. ඡත්ත මානවක ගාථා පමණක් නොව ඒවායේ අර්ථ ඇතුළත් සිංහල ගීද ගායනා කරන අප පාසලෙන් පිටව යන්නේ ඕවාද සිප්ප දානේන.... ආදි ගුරු වන්-දනා ගාථාව සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් හඬ නගා සජ්ඣායනය කර ඒ අවස්ථාවේ තම තමන්ගේ පංති කාමරවල සිටින ගුරුතුමාට හෝ ගුරුතුමියට දණගසා වැඳීමෙන් අනතුරුවය.

**ක්‍රියාකාරකම්**

01. මෙම පාඩමේ සඳහන් හොඳ ශිෂ්‍ය චර්යා දෙක බැගින් පහත සඳහන් ශීර්ෂ යටතේ ලියන්න.

    (අ) බුදු මැඳුර (ආ) පංති කාමරය (ඇ) උදෑසන වතාවත් (ඈ) ගුරු ගෞරවය (ඉ) තෙරුවන් වන්දනාව.

02. ගුරු වන්දනා ගාථාව සහ එහි තේරුම ඇතුළත් සිංහල ගීය කටපාඩමින් ගායනා කරන්න.

# 10. පාඩම

## වඳිමු දළදා, වඳිමු සිරිපා

| | |
|---|---|
| ලොකෙකනාථ වදනම්බුජ රාජ | හංසං |
| වේනෙයිය කෝමුද විකාසන සීත | රංසිං |
| අද්ධින්දුකාර වරරූප | විරාජමානං |
| වන්දාමි වාමමමලං ජින | දන්තධාතුං |

| | |
|---|---|
| බුදුමුව දහම් ජලයෙහි රජ හසකු | වුණ |
| දනමන උපුල් පුබුදන සඳමඬල | වන |
| අඩසඳ ලෙසින් බැබලෙන අතිනිමල | වුණ |
| නමදිමි එවම් දළදා බුදු සමිඳු | මෙන |

| | |
|---|---|
| යන්නම්මදාය නදියා පුලිනේ ච | තීරේ |
| යං සච්ච බද්ධ ගිරිකේ සුමනා | චලග්ගේ |
| යං තත්ථ යෝනක පුරේ මුනිනෝ ච | පාදං |
| තං පාද ලාංඡනමහං සිරසා | නමාමි |

| | |
|---|---|
| නර්මදා නදී තෙර වැලි | තලාවෙහි |
| සච්ච බද්ධ නම් සුන්දර ගිරි | හිසෙහි |
| සමන් කුළෙහි සහ යෝනක නම් | පුරෙහි |
| මුනි සිරිපා වඳිමි සැදැහෙන් යුතුව | ලෙහි |

### ක්‍රියාකාරකම්

01. දළදා වන්දනා ගාථාව හා ශ්‍රී පාද වන්දනා ගාථාවත් ඒවාට අදාළ පද්‍ය දෙකත් කටපාඩම් කරගෙන නිවැරදි උච්චාරණයෙන් ගයන්න.

පැවරුම

01. පන්තිය කණ්ඩායම් දෙකකට බෙදී දළදා වහන්සේ පිළිබඳවත්, ශ්‍රී පාදස්ථානය පිළිබඳවත් තොරතුරු එක් රැස් කර පොත් පිංචක් පිළියෙල කරන්න.

පුහුණුවට

ලොව විහිදා සුදු පැහැ සඳ රැසෙව් සැදී
දෙන නොමඳා සිරි සගමොක් සැප නිසැදී
ලද මුනිඳා දම්කඳ පහස මන බැඳී
වඳු දළදා හිමි තෙතමහල් පහය රැඳී
(සැළලිහිණි සංදේශය)

## 11. පාඩම

## පාළි 1 - නමස්කාර පාඨය

**අ). නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

ඉහත සඳහන් නමස්කාර පාඨය නිවැරදිව නෙවරක් ශබ්ද නගා කියවීම අවශ්‍ය වේ. එය බෞද්ධ සම්ප්‍රදාය යි. ඊට පසුව පදයෙන් පදයට අර්ථය කියන්නට සහ ලියන්නට හැකිවන පරිදි අර්ථාවබෝධය ලැබිය යුතු ය. අර්ථාවබෝධය සඳහා පද පිළිවෙළ අනුව අර්ථය දැනගතයුතු වේ.

**ආ.) පද පිළිවෙළ හැඳින ගනිමු**

තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස නමෝ

**තේරුම දැන ගනිමු.**

ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාර වේවා.

**(ඇ.) පදවල තේරුම දැන ගනිමු.**

| | | |
|---|---|---|
| නමෝ | - | නමස්කාර (වේවා) |
| තස්ස | - | ඒ |
| භගවතෝ | - | භාග්‍යවත් |
| අරහතෝ | - | අර්හත් (පිදීමට සුදුසු) |
| සම්මා | - | සම්‍යක් (යහපත්) |
| සම්බුද්ධස්ස | - | සම්බුදුරජාණන් වහන්සේට |

අලුත් වචන

| | | |
|---|---|---|
| හෙතෙම | - | සෝ |
| ඔවුහු | - | තේ |
| නුඹ/ඔබ | - | ත්වං |
| නුඹලා/ඔබලා | - | තුම්හේ |
| මම | - | අහං |
| අපි | - | මයං |
| නමදියි | - | නමති |
| සිහිකරයි | - | සරති |
| පූජාකරයි | - | පූජේති |
| යයි | - | ගච්ඡති |

## 13. පාඩම

## අභිධර්මය I - චෛතසික

අපි හත්වන ශ්‍රේණියේදී චිත්ත හෙවත් සිත ගැන ඉගෙන ගතිමු. අටවන ශ්‍රේණියේ සිටින අපි දැන් ඉගෙනීමට සූදානම් වන්නේ චෛතසික හෙවත් සිතුවිලි ගැනය. අපගේ පහසුව සඳහා සිත ගැන වෙනමත් චෛතසික ගැන වෙනමත් ඉගෙන ගනු ලැබුවද කිසි විටෙකත් සිත හා චෛතසික වෙන් වෙන්ව නූපදී.

වේදනාව, ප්‍රීතිය, ලෝභය, මසුරුකම නම් වූ මච්ඡරිය, ශ්‍රද්ධාව, අලෝභය, පව්කිරීමට ඇති ලැජ්ජාව නම් වූ හිරිය, පව් කිරීමට ඇති බිය නම් වූ ඔත්තප්පය, බොරුකීමාදියෙන් වැළකීම නම් වූ සම්මාවාචා, කරුණා, ප්‍රඥා යනාදිය ඔබ හොඳට අසා කියවා තිබිය හැකිය. අභිධර්මයේ මේවා හඳුන්වා ඇත්තේ චෛතසික යන නමිනි. මේවා සිතත් සමග එකට යෙදෙන සිතේ ගති නම් වෙයි. එහෙයින් ඒවාට චෛතසික යන නම යෙදේ. චෛතසිකවල ස්වභාවය එකිනෙකට වෙනස්ය. එම වෙනස්කම් අනුව චෛතසික සියල්ල පනස් දෙකක් වේ. මේවායේ ලක්ෂණ හතරක් දක්නට ලැබේ. එනම්,

01. පෙර පසු නොවී සිත සමගම ඉපදීම.
02. පෙර පසු නොවී සිත සමගම නැති වීම.
03. සිත ලබා ගන්නා අරමුණම ගැනීම.
04. සිත උපදින වස්තුවෙහිම ඉපදීම.

මෙම ලක්ෂණ හතර තවදුරටත් මෙසේ පැහැදිලි කළ හැකිය.

★ සිතට චෛතසික නැතිව ඉපදිය නොහැකිය. චෛතසිකවලට සිත නැතිව ඉපදිය නොහැකිය. එහෙයින් සිත උපදින විට ම චෛතසික ද උපදී. පහනක් දල්වන විට අඳුර දුරුවීමත් ආලෝකය පැතිරීමත් පෙර පසු නොවී සිදුවන්නාක් මෙනි.

★ සිත නැතිව චෛතසිකවලට පැවතිය නොහැකිය. එහෙයින් උපන් සිත නැතිවන විටදීම ඒ සමග උපන් සියලුම චෛතසික ද නැතිවෙයි.

★ සිතට රූපය අරමුණු වන විට චෛතසික ද එම රූපයම අරමුණු කරයි. සිතට කළ හැක්කේ රූප, ශබ්ද, ආදී යම් අරමුණක් ගෙන එය දැනගැනීම පමණි. ඊට වැඩි යමක් කළ නොහැකිය. එම අරමුණට ඇලීම, ගැටීම යනාදිය සිදුවන්නේ චෛතසික ක්‍රියාත්මක වීමෙනි.

උදා:- රූපය ප්‍රිය මනාප එකක් නම් සිත එහි ඇලෙයි. අප්‍රිය අමනාප රූපයක් නම් සිත එහි ගැටෙයි.

★ සිත උපදින තැන් හයක් ඇත. එම තැන්වලට වස්තු, වත්ථු යන නම ද යෙදේ. ඇස, කන, නාසය, දිව සම හා මනස ඒවාය. යම් සිතක් ඇස නමැති වස්තුවෙහි උපදින විට චෛතසිකය ද ඒ වස්තුවේ උපදී.

මෙම චෛතසිකවල ස්වභාවය අනුව රාශි හෙවත් කොටස් තුනකට බෙදා දක්වනු ලැබේ. එම රාශිවල තවත් අනු කොටස් ඇත. ඒ බව පහත දැක්වෙන වගුව ඇසුරෙන් තේරුම් ගත හැකිය.

## චෛතසික 52 බෙදී යන අයුරු

| | |
|---|---|
| 1. අඤ්ඤසමාන රාශිය (අන්‍යසමාන රාශිය) චෛතසික 13 | (i) සබ්බචිත්ත සාධාරණ චෛතසික 07<br>(ii) ප්‍රකීර්ණක (පකිණ්ණක) චෛතසික 06 |
| 2. අකුශල රාශිය චෛතසික 14 | (i) අකුශල සාධාරණ චෛතසික 04<br>(ii) අකුශල චෛතසික 10 |
| 3. ශෝභන රාශිය චෛතසික 25 | (i) ශෝභන සාධාරණ චෛතසික 19<br>(ii) විරති චෛතසික 03<br>(iii) අප්පමඤ්ඤා චෛතසික 02<br>(iv) ප්‍රඥා චෛතසික 01 |
| එකතුව 52 | එකතුව 52 |

### ක්‍රියාකාරකම්

01. වේදනා, ලෝභ, අලෝභ ආදියට චෛතසිකය යන නම යෙදී ඇත්තේ කුමන අර්ථයෙන්ද?

02. ඇලෙයි, ගැටෙයි යන වචන සුදුසු පරිදි හිස්තැනට යොදන්න.

(i) මී කුණක් දකින කපුටාගේ සිත එම මී කුණ නැමැති අරමුණෙහි ..................................

(ii) මී කුණක් දකින ඔබේ සිත එම මී කුණ නැමැති අරමුණෙහි ..........................................

(iii) ඔබ ප්‍රිය කරන ගීයක් ඇසෙන විට ඔබේ සිත එම ගී අරමුණෙහි ..........................................

(iv) මී පැණි ටිකක් දිව ගා බලන විට ඔබේ සිත මී පැණි නැමති රස අරමුණෙහි ..........................................

03. හිස්තැන්වලට සුදුසු වචන පමණක් යොදන්න.

දිවටය, නාසයටය, සිතටය, ඇසටය, කයටය, කනටය

(i) අප්‍රිය අමනාප හෝ ප්‍රිය මනාප හෝ ගන්ධ අරමුණක් ලැබෙන්නේ...............................

(ii) ප්‍රිය මනාප හෝ අප්‍රිය මනාප හෝ රස අරමුණක් ලැබෙන්නේ...............................

(iii) අප්‍රිය අමනාප හෝ ප්‍රිය මනාප හෝ ස්පර්ශයක් හෙවත් ඵොට්ඨබ්බ අරමුණක් ලැබෙන්නේ...............................

(iv) ප්‍රිය හෝ අප්‍රිය ධර්ම හෙවත් චෛතසික අරමුණු වන්නේ ...............................

# 14. පාඩම

## ආදර්ශයෙන් සපිරි බුදුසිරිත

තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ හැම චරිත ලක්ෂණයක්ම ආදර්ශවත්ය. කුඩා දරුවාගේ පටන් හැම කෙනෙකුටම ජීවිතය හැඩ ගස්වා ගැනීම සඳහා උදව්කර ගත හැකි ආදර්ශ රාශියක් බුදු සිරිතේ දක්නට ලැබේ. විවිධ පුද්ගලයන් සුමගට ගැනීම සඳහා ක්‍රියා කිරීමේ දී උන්වහන්සේට මුහුණ පෑමට සිදුවූ දුෂ්කරතා හමුවේ බුදුරදුන් ක්‍රියාකළේ කෙසේ ද යන්න විමසා බැලීමෙන් අපේ ජීවිතයට සම්බන්ධ කරගත හැකි ආදර්ශ කිහිපයක් මෙම පාඩම ඇසුරෙන් හැඳින ගනිමු.

### වේරඤ්ජාවේ වස් විසීම

බුදුරජාණන් වහන්සේ දනව් සැරිසරා මගධ රට දක්ඛිණාගිරියේ මධුරා පුරයට වැඩම කළහ. ඉන් නික්ම වේරඤ්ජා පුරයට වැඩම කළහ. බුදුරදුන්ගේ කීර්තිය ඇසූ වේරඤ්ජා නුවර වැසි උදය නම් ධනවත් බමුණා උන්වහන්සේ හමුවට ගොස් දහම් අසා පැහැදීමට පත්ව එම වර්ෂා කාලය එනුවර විසීමට බුදුරදුන්ට ආරාධනා කළේ ය. එම ආරාධනය පිළිගත් බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා සමග එහි වස් විසූහ. එහෙත් බුදුරජාණන් වහන්සේට වස් විසීමට ආරාධනා කළ බව උදය බමුණාට අමතක විය. ඒ කාලයේම මහා දුර්භික්ෂයක් එම පළාතේ ඇතිවිය. බුදුරජාණන් වහන්සේ ඇතුළු මහ සඟරුවනට උදය බමුණාගෙන් හෝ නගර වාසීන්ගෙන් හෝ කිසිදු සංග්‍රහයක් නොලැබිණි.

මේ දිනවල උත්තරා පථයේ සිට අශ්ව වෙළඳාමේ යන වෙළඳුන් සමූහයක් එහි නවාතැන් ගත්හ. බුදුරජාණන් වහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේලාට යැපෙන්නට සිදුවූයේ එම වෙළෙඳුන්ගෙන් ලද යවහාල්වලින් පිසින ලද ආහාරයෙනි. වස්කාලය නිම වූ පසු බුදුරජාණන් වහන්සේ උදය බමුණාගේ නිවසට වැඩම කළ සේක.

බමුණා බුදුරදුන් දැක තමා අතින් සිදු වූ ප්‍රමාද දෝෂය ගැන කම්පා විය. බුදුරදුන් ප්‍රමුඛ මහ සඟන වඩා හිඳුවා දන් පිරිනමා තමා අතින් සිදු වූ ප්‍රමාද දෝෂයට සමාව අයැද සිටියේය. බුදුරජාණන් වහන්සේ ඔහුට කාරුණිකව ධර්මය දේශනා කොට වේරඤ්ජාවෙන් වැඩිසේක.

වේරඤ්ජා සිද්ධිය ඇසුරෙන් අපට මතුකරගත හැකි ආදර්ශ කිහිපයකි. ඉවසීමේ ගුණය, කම්පා නොවීමේ ලක්ෂණය පහසුවෙන් පෝෂණය කළ හැකි බව හා ලද දෙයින් සතුටට පත්වීම ඒ අතර වේ. එමෙන් ම මිනිස් ස්වභාවය හෙවත් මිනිස් ගතිය තේරුම් ගෙන ඒ පිළිබඳව සානුකම්පිකව කටයුතු කිරීමේ ගුණයද අපට තේරුම් ගත හැකිය. අතපසුවීම් හමුවේ කම්පාවට කලබලයට පත් නොවී මැදහත්ව ක්‍රියා කිරීමේ ගුණය ද මෙම සිද්ධිය තුළින් මතුකර ගත හැකිය.

## ආලවක යක්ෂ දමනය

බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්ම සාරථී ගුණය ප්‍රකට කෙරෙන ආලවක යක්ෂ දමනය පිළිබඳ කතාවෙන් ආදර්ශ කිහිපයක් අපට මතුකර ගතහැකිය. ආලවක යක්ෂ දමනය සිදුවූයේ බුදුරදුන් දෙව්රම් වෙහෙර වැඩවසන සමයක දී ය. බුදුරජාණන් වහන්සේ දිනක් අලව් නුවර වැසි ආලවක යක්ෂයාගේ භවනට වැඩම කොට ඔහුගේ ආසනයෙ හි වැඩහුන් සේක. මද වේලාවකින් ආලවක එහි පැමිණියේය. මහණ පිටවයන්නැ'යි නියෝග කළේය. භාග්‍යවතුන් වහන්සේ අවනත භාවයක් පෙන්වා ඉවසීමෙන් යුතුව යක්ෂයාගේ අණ පිළිපැදි සේක. එකවරක් දෙවරක් නොව තුන්වරක් යක්ෂයාගේ වචනය පිළිගෙන විමානයෙන් පිටතටත් ඇතුළටත් වැඩමකළ සේක. බුදුරදුන් දැක්වූ ඒ මෘදු ගතියෙන් ප්‍රයෝජන ගැනීමට සිතූ අලව් යකු තවත් දරුණු විය. බුදුරජාණන් වහන්සේ ඇවිදවීමෙන්ම වෙහෙසට පත් කිරීමට සිතීය. ඔහුගේ ඒ සිත දැනගත් බුදුරජාණන් වහන්සේ "ඇවත්නි මම පිට නොවන්නෙමි. ඔබට කළහැකි යමක් ඇතොත් එය කරන්නැ'යි" වදාරා හුනස්නෙහිම වැඩසිටි සේක. එවිට ආලවක බුදුරදුන්ගෙන් ප්‍රශ්න අසා

වෙහෙසන්නේමැ'යි සිතා තම මාපියන්ගෙන් උගත් ප්‍රශ්න හතරක් ඇසීය. එම ප්‍රශ්න විසඳීම් වශයෙන් බුදුරජාණන් වහන්සේ ඔහුට දම් දෙසූ සේක. දහම් අසා ආලවක සෝවන් ඵලයට පත්විය.

ඉවසීමෙන් සන්සුන්ව යක්ෂයාගේ වචනයට අනුව ක්‍රියා කිරීම තුළින් ඔහුගේ කෝපය සංසිඳවීමට ඉඩ සැලසීම මෙන්ම ගැටුම් ඇතිවීමට ඇති අවස්ථාව මග හැරවීමට බුදුරදුන් තුළ පැවති සුවිශේෂී හැකියාවද මෙයින් ප්‍රකට වෙයි. බුද්ධ චරිතය හා සම්බන්ධ මෙවැනි බොහෝ සිද්ධි හා අවස්ථා ඇසුරෙන් සමාජයේ හැම කෙනෙකුටම ගත හැකි අගනා ආදර්ශ ඇතිබව පැහැදිලිය. එම ආදර්ශ මතුකරගෙන අපේ ජීවිතයට සම්බන්ධ කරගෙන ක්‍රියාකිරීමෙන් බුද්ධ චරිතය හැදෑරීමේ අරමුණ මැනවින් ඉටුවෙයි. ඒ සඳහා බුද්ධ චරිතය විචාරශීලීව හැදෑරීමට උත්සාහ කරමු.

**ක්‍රියාකාරකම්**

01. වේරඤ්ජා සිද්ධිය හා ආලවක යක්ෂ දමනය ඇසුරෙන් මතුකරගත හැකි ආදර්ශ ලියා දක්වන්න.

# 15. පාඩම

## හොඳ බෞද්ධයා හැඳින ගනිමු

විශ්‍රාමික ගුරුවරයෙකු වූ දිසානායක මහතාගේ අභාවය සිදුවී ටික දිනකට පසු දිනක් ඔහුගේ සොහොයුරිය ඉතා කණගාටුවෙන් සිටිනු දුටු සුමේධ,

අම්මේ, මාමා නැති වුණු එක හරිම පාඩුවක් නේද'යි ඇසුවේ ය. ඔව් පුතේ මාමා හරි හොඳ මනුස්සයෙක්.

එදා කතා කළ කීප දෙනෙක්ම කීවෙ මාමා හොඳ බෞද්ධයෙක් කියලයි. හොඳ බෞද්ධයා කියන්නේ කව්ද අම්මේ? ඇයි මාමා හොඳ බෞද්ධයෙක් කිව්වේ?

මාමා නිතරම පන්සල් ගියා. සිල් සමාදන් වුණා. දන් දුන්නා. අසරණ අයට පිහිට වුණා. මේ වගේ හුඟාක් ආගමික වැඩ කළා. ඒකයි හොඳ බෞද්ධයෙක් කීවේ.

ඉතින් ඒ වැඩ අනිත් අයත් කරනවානේ. ඒ අය නරක බෞද්ධයෝද? ඒ ඔක්කෝම හොඳ බෞද්ධයෝ නේද?

මට ඒ ගැන හුඟාක් කියන්න දැන් බෑ. බෞද්ධයකු වෙන්නෙ තෙරුවන් සරණ යෑමෙන්. හොඳ කෙනෙක් වුණත්, නරක කෙනෙක් වුණත් තෙරුවන් සරණ ගියානම් ඒ බෞද්ධයෙක්. මේ ගැන දහම් පාසලේ ගුරුතුමාගෙන් අහන්න. හරියටම හරි උත්තරය ලැබේවි. සුමේධ පන්තියේදී ඒ ගැන ගුරුතුමාගේ විමසුවේ කුතුහලය තවමත් එලෙසම පැවති නිසා ය.

සුමේධ ඉතාම හොඳ ප්‍රශ්නයක් ගැන කල්පනා කරල තියෙන්නෙ. අපට ඒක අද පාඩම කරගන්න පුලුවන්.

අර අම්මා කීව ආගමික වැඩ කරන අය හොඳ බෞද්ධයෝ තමයි. එහෙත්, ඒ ආගමික වැඩ කළත්, ඒ අතර නරක බෞද්ධයොත් ඉන්න පුලුවන් එවැනි අය ආගමික වැඩත් කරනවා. ඒ එක්කම ඉතා නරක වැඩත් කරනවා.

බුදුහාමුදුරුවෝ හොඳ බෞද්ධයා හා නරක බෞද්ධයා ගැන වෙන වෙනම හඳුන්වාදීමක් කරලා තියෙනවා.

ගිහි පැවිදි කියලා බෞද්ධයො කොටස් දෙකක්නේ. එයින් ගිහි බෞද්ධයින් හඳුන්වන වෙනම ආකාරයක් තියෙනවා.

'උපාසක, උපාසිකා කියලයි'. ළමයි කිහිප දෙනෙක් එකවරම හඬ නැගුහ.

හොඳයි, නරක බෞද්ධයින් හඳුන්වන්න බුදුහාමුදුරුවන් යෙදුව වචනය 'උපාසක චණ්ඩාල'. හොඳ බෞද්ධයා හැඳින්වූයේ උපාසක, පුණ්ඩරීක කියල. පුණ්ඩරීක කියන්නේ නෙළුම්මල.

මේ දෙදෙනාගේ ගතිගුණ වෙන වෙනම දක්වා තිබෙන්නේ මේ ලෙසිනුයි.

| **උපාසක චණ්ඩාල (නරක බෞද්ධයා)** | **උපාසක පුණ්ඩරීක (හොඳ බෞද්ධයා)** |
|---|---|
| 01. ශ්‍රද්ධාව නැත්තෙකි. | 01. ශ්‍රද්ධාව ඇත්තෙකි. |
| 02. දුසිල්වත් අයෙකි. | 02. සිල්වත් අයෙකි. |
| 03. සුබ අසුබ නිමිති පිළිගන්නෙකි. | 03. සුබ අසුබ නිමිති නො පිළිගන්නෙකි. |
| 04. කර්මය නො පිළිගන්නෙකි. | 04. කර්මය පිළිගන්නෙකි. |
| 05. තෙරුවන් හැර වෙනත් සරණ සොයන්නෙකි. තෙරුවන් හැර වෙනත් අයට පළමුව සලකන්නෙකි. | 05. තෙරුවන් හැර වෙනත් සරණක් නොපතන්නෙකි. පළමුව තෙරුවනට ම ගරු සැලකිලි කරන්නෙකි. |

'ගුරුතුමනි, තව ටිකක් විස්තර කළොත් නම් හොඳයි' එක් ළමයෙක් කීවේය.

ඔව් අපි ටිකක් විස්තර වශයෙන්, බලමු. ''පළමු කරුණ ශ්‍රද්ධාව. තෙරුවන් සරණ යන්නා ශ්‍රද්ධාවන්තයෙක්. තෙරුවන් සරණ යන්නේ බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි, යන පාඨ කියවමින් බව අපි දන්නවා. එහෙත් එහෙම කියන හැම දෙනාම හරියට තෙරුවන් සරණ ගිය අය නොවෙයිනෙ. ඒ නිසා ශ්‍රද්ධාවන්ත අයත් නොවෙයි.

ඇයි එහෙම කියන්නේ?

ඇත්තටම තෙරුවන් සරණ ගිය අය මුදල් සොයන්න වුවමනා නිසා මැරීම සඳහා සතුන් ඇතිකරන්නේ නැහැ. විනෝදය සඳහාවත් මත් පැන් පානය කරන්නේ නැහැ. ප්‍රශ්නයක් ඇති වුණාම කටුක වචන පාවිච්චි කරමින්, අඬදබරවලට පැටලෙමින් මහා විනාශයක් කර ගන්නේ නැහැ. අසනීප සුව කර ගන්න යාඥාවල යෙදෙන්නේ නැහැ. තෙරුවන් සරණ ගිය අය තමන්ගේ ජීවිතය ගත කරන්නේ බුදුහාමුදුරුවන්ගේ දහමට අනුවයි. දැන්, බෞද්ධයින් බව කියාගන්නා බොහෝ දෙනා මේවා කරනවා නේද?

දහමට අනුව ජීවත් වීම ශ්‍රද්ධාව ඇති අයගේ ස්වභාවයක්. එහෙම නැතිනම්, තෙරුවන් සරණ යන පාඨ හැමදාම කියවූවත්, ඔවුන් ශ්‍රද්ධාව නැති අය. එනිසාම හොඳ බෞද්ධයන් නොවෙයි.

දෙවැනි කරුණ සිල්වත් බව

ගිහි බෞද්ධයන්ට දිනපතා ආරක්ෂා කර ගතයුතු සිල් පද පහක් තියෙනවා. පන්සිල්. හැම බෞද්ධයාම දිනපතා පන්සිල් කියවනවා. ඒත් කී දෙනෙක් ඒවා ආරක්ෂා කරනවා ද?

ප්‍රාණඝාතයෙන් වෙන්වන බව කියන අය කී දෙනෙක් ගෙදර ආහාරයට ගැනීමට සතුන් ඇති කරනව ද? යම් යම් ලාභ ප්‍රයෝජන

බලාපොරොත්තුව කී දෙනෙක් බොරු කියනව ද? සාදවල දී මත්පැන් ගැනීම සාමාන්‍ය පුරුද්දක් කරගෙන තිබෙනවා නේද? සොරකම් කිරීම ගැනත් අපට නිතරම අහන්න දකින්න ලැබෙනවා නේද? මේ ආදී වශයෙන් සලකන විට පන්සිල් පද කියවුනත් ඒවා රැකගන්නෙ කී දෙනාද? සිල් පද රැක ගන්නා අය සිල්වත්, කඩන අය දුස්සීලයි.

තුන්වැනි හා සතරවැනි කරුණු දෙක එකටම කතා කළ හැකියි. හොඳ බෞද්ධයා සැලකිලිමත් වෙන්නේ සුබ අසුබ නිමිති ගැන නොවෙයි. ඔහු කර්මය හා කර්ම විපාක ගැනයි සිතා බලන්නෙ. සමහරු හූනන් ගේ හැඬීම, බල්ලන් ගේ කන්පට ගැසීම, කැරලාගේ ඇඬීම අසුබ නිමිති ලෙසයි හිතන්නෙ. ඒ වගේම සුබ ලෙස පිළිගත් නිමිති රාශියකුත් තිබෙනවා. කෙහොම වුණත් කර්මය ගැන, කර්ම විපාක ගැන අමතක කර සුබ අසුබ නිමිති ගැන සිතමින් කටයුතු කරන අය හොඳ බෞද්ධයන් නොවෙයි.

කර්මය ගැන අපි වෙනම පාඩමකින් ඉගෙන ගනිමු. පස්වන කරුණ තෙරුවන් හැර වෙනත් සරණ සෙවීම. හොඳ බෞද්ධයාට පළමුව මතක් වෙන්නේ තෙරුවනයි. කුමන වැඩක් පටන් ගත්තත්, ගමනක් පිටත් වුණත් පළමුවෙන් තෙරුවන් සරණ සිහි කරලයි කරන්නේ. ගරු සරු දක්වන්නේ, පුද පූජා පවත්වන්නෙ පළමුව තෙරුවනට.

එසේ නැති අය තෙරුවන් සරණ ගිය තරමින් බෞද්ධයන් වුණත් බුදුහාමුදුරුවන් පෙන්නා දීල ඇති ආකාරයට හොඳ බෞද්ධයන් නම් නොවෙයි.

**ක්‍රියාකාරකම්**

01. මේ පාඩමෙන් ඔබ ඉගෙන ගත් හොඳ බෞද්ධයකු කෙරෙහි දැකිය හැකි ගතිගුණ පහක් ලියන්න.
02. හොඳ බෞද්ධයකු ළඟ නොතිබිය යුතු ලක්ෂණ පහක් නම් කරන්න.
03. ඔබ තුළ මෙතෙක් බලපැවැත් වූ එහෙත් අද සිට නැති කර ගැනීමට ඉටාගත් නරක ගති තුනක් ලියන්න.

## 16. පාඩම

## බුදු සසුන ඔපවත් කළ වාදිභසිංහයාණෝ

සියවස් විසිතුනකට අධික කාලයක් මුළුල්ලෙහි නිදහස් නිවහල් රාජ්‍යයක්ව පැවති අපේ මාතෘ භූමිය 1815 කන්ද උඩරට ගිවිසුමෙන් බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට නතු වීමත් සමග සිංහල ජාතියත් බුද්ධ ශාසනයත් කෙමෙන් පරිහානිය කරා ගමන් කරන්නට විය.

පන්සල් ආශ්‍රිතව පැවති බෞද්ධ අධ්‍යාපනය අඩපණ කරන ලද අතර භික්ෂූන් වහන්සේ සතුව පැවති ආධ්‍යාපනික උරුමය උන්වහන්සේලා වෙතින් පැහැරගෙන ක්‍රිස්තියානි මිෂනාරි පූජකයන්ට පවරනු ලැබිණි. බුදු සසුනත් සිංහල බෞද්ධ සංස්කෘතියත් මුළුමනින්ම නොතකා හළ සිංහලයා ගුණ දහමින් පිරිහුණු බටහිර සංස්කෘතිය කරපින්නා ගත් කලුසුද්දන් බවට පත්විය.

දිවයිනේ මෙවැනි පසුබිමක් තිබිය දී දකුණු පළාතේ බලපිටිය මොහොට්ටිවත්ත (මිගෙට්ටුවත්ත) නැමැති ගම්පියසේ රටත්, ජාතියත්, බුද්ධශාසනයත් නගා සිටුවීමේ පුණ්‍ය මහිමයකින් හෙබි පුත්කුමරෙක් ජනිත විය. හින්ගම ලද්දූ අසනේරිස් මැන්දිස් හා කළුදූර මල්දෝද සිල්වා යන දම්පතීන්ගේ එකම පිරිමි දරුවා වූයේ මිගෙල් මැන්දිස්ය. මෙකල බෞද්ධ පාඨශාලා නොතිබූ හෙයින් ගමේ පන්සලේ වැඩ සිටි ධර්මවිනයධර මහතෙරුන් වහන්සේලා වෙතින් අධ්‍යාපනය ලැබීමට සිංහල බෞද්ධ දරුවන්ට සිදුවිය. ඒ අනුව මිගෙල් දරුවා ද බලපිටිය සුභද්‍රාරාමාධිපතිව වැඩ සිටි පූජ්‍ය බලපිටියේ ගුණරතන ස්වාමීන් වහන්සේ වෙතින් මූලික අධ්‍යාපනය ලැබීය. හෙතෙම දෙමාපියන්ගේද අනුමැතිය ඇතිව දොළොස්වෙනි වියේ දී සසුන් ගත විය. එතැන් සිට මිගෙට්ටුවත්තේ ගුණානන්ද යන ශාසනික නාමයෙන් හඳුන්වනු ලැබීය. බලපිටියේ ගුණරතන හා තෙලිකඩ පියරතන යන ස්වාමීන්ද්‍රයන් වහන්සේලා මිගෙට්ටුවත්තේ ගුණානන්ද සාමණේරයන් වහන්සේගේ ආචාර්යයන් වහන්සේලා වූහ. පැවිදි වී ටික කලකින් සිය

ආචාර්යපාදයන් වහන්සේ සමග කොටහේන දීපදුත්තමාරාමයට වැඩම කර එහි වාසය කළහ.

බ්‍රිතාන්‍ය ආධිපත්‍යයත් මිෂනාරි අධ්‍යාපනයත් නිසා මේ අවදිය වන විට සිංහල බෞද්ධයා කෙතරම් අසරණ තත්ත්වයකට පත්ව සිටියේ ද යත් තමා බෞද්ධයෙකියි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට පවා බිය විය. මහා මාර්ගවල ගමන් කරන භික්ෂූන් වහන්සේලාට අන්‍ය ආගමිකයන්ගේ උසුළු විසුළුවලට ලක්වීමට සිදුවිය. කොළඹ නගරයේ භික්ෂූන් වහන්සේ නමක් දැකීම පවා දුර්ලභ දර්ශනයක් විය. මේ තත්ත්වය නිසා කොළඹ භික්ෂු වාසයට නුසුදුසු ප්‍රදේශයක් සේ සැලකිණ. බලපිටියේ ගුණරතන හිමියෝ මිගෙට්ටුවත්තේ ගුණානන්ද සාමණේර භික්ෂු නමත් සමග ආපසු බලපිටියට වැඩම කළහ. මේ අතර ගුණානන්ද හිමියන්ගේ පියා අභාවප්‍රාප්ත වීම නිසා මව රැක බලා ගැනීමට කිසිවකු නොවූ හෙයින් උපැවිදි වීමට සිදුවිය. ඉන්පසුව බලපිටිය වැල්ලවත්ත විසූ ඥාතිවරයෙකු වූ රෝමානු කතෝලික පූජකයකු වෙතින් බයිබලය හා ක්‍රිස්තියානි ධර්මය ගැන පුළුල් දැනුමක් ලබාගත් මිගෙල් තරුණයා ක්‍රිස්තියානි පූජකයෙකු වේදෝයි බියටපත් ඔහුගේ මාමා කෙනෙකු වූ සීනිගම ධීරක්ඛන්ධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ බුදුදහම හැදෑරීමට යොමු කළහ. මේ අවධියේ දොඩන්දූව කුමාරකන්ද උඩ මහා විහාරයේ පැවති ත්‍රිපිටකය පුස්කොළ පොත්වල ලිවීමේ පින්කමට සහභාගි වූ මිගෙල් තරුණයා ධර්මවිනයධර මහතෙරුන් වහන්සේලාගේ හා පින්කම් සංවිධායක ගිහි ප්‍රභූන්ගේ ප්‍රසාදය දිනාගෙන විසි හැවිරිදි වියේ දී පූජ්‍ය තෙලිකඩ සෝනුත්තර නාහිමියන්ගේ ශිෂ්‍යවරයෙකු ලෙස සසුන්ගත විය.

විසිඑක් හැවිරිදි තරුණ භික්ෂු නමක් වශයෙන් 1844දී කොටහේන ශ්‍රී දීපදුත්තමාරාමයට වැඩම කළ ගුණානන්ද හිමියෝ ක්‍රිස්තියානි පූජකයන් ආණ්ඩුවේ ආධාර ලබාගෙන බුද්ධාගම අපහාසයට ලක්කරමින් දේශනා පැවැත්වීමත් බුදුදහමට නිග්‍රහ කරමින් පොත්පත් මුද්‍රණය කර බෙදා හැරීමත් නිසා බුදුසසුනත් බෞද්ධයාත් පත්ව ඇති ඛේදජනක තත්ත්වය පිළිබඳව බලවත් සේ කම්පා වූහ. 1849දී ටොරින්ටන් ආණ්ඩුකාරවරයාගේ නියෝගයක් පරිදි කොළඹ ප්‍රධාන මංසන්ධිවල බෝගස් කපා දමනු ලැබූවත් ඊට එරෙහිව කටයුතු කිරීමට ගිහි පැවිදි කිසිවෙක් ඉදිරිපත් නොවිය. ඉංග්‍රීසි ආණ්ඩුවේ මෙම බෞද්ධ විරෝධී

ක්‍රියාමාර්ගයට එරෙහිව පෙරට ආ අභීත වීරයා මීගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිපාණන් ය. ආණ්ඩුව විසින් කපා දමන ලද බෝගස් තිබූ ස්ථානවල බෝ පැළ රෝපණය කිරීමේ වැඩපිළිවෙලක් ආරම්භ කළ උන්වහන්සේ බෝධිරාජ සමිතිය නමින් සංගමයක් පිහිටුවා බෞද්ධයන් සංවිධානගත කිරීමට ක්‍රියා කළහ.

ක්‍රිස්තියානින් විසින් බුද්ධාගමට විරුද්ධව ගෙන ගිය ව්‍යාපාරයන් මැඩලීමට ගුණානන්ද හිමියන් දැරූ පරිශ්‍රමය උන්වහන්සේගේ පහත සඳහන් ප්‍රකාශයෙන් වටහාගත හැකිය.

''සර්වඥ ශාසනයට වේගන යන හානිය දුටු දීපදුත්තමාරාම විහාරාධිවාසී මොහොට්ටිවත්තේ ගුණානන්ද උන්නාන්සේ වන මම වර්ෂ 1862 පටන් ක්‍රිස්තියානින් බුද්ධාගමට විරුද්ධව ගෙනහැර දක්වන ලද කාරණාවලට උත්තර දීම් වශයෙන්ද ක්‍රිස්තියානි ආගමේ අසත්‍යතාව පෙන්වාදීම් වශයෙන් ද බුද්ධාගමේ සත්‍යතාව ප්‍රකාශ කිරීම් වශයෙන් ද ලංකාවේ තැන්තැන්වල දේශනා කරන්න පටන් ගත්තෙමි. පසුගිය විසිපස් අවුරුද්ද තුළ එසේ කරන ලද දේශනාවල් හාරදහසකටත් වැඩි බව මාගේ දින ලේඛනවලින් පෙනේ''.

ක්‍රිස්තියානි පූජකයන් බුදුදහමට විරුද්ධව ගෙන ගිය අසත්‍ය ප්‍රචාරයන් මැඩලීම දේශනාවන්ට පමණක් සීමා නොකළ මොහොට්ටිවත්තේ හිමියෝ ක්‍රිස්තියානි ආගමේ අසත්‍යතාව පෙන්වාදීම සඳහා මුද්‍රණය කර බෙදා දුන් පොත් සංඛ්‍යාව අති විශාලය. දුර්ලබ්ධි විනෝදනිය, ක්‍රිස්තියානි වාද මර්දනය, මෝහ විසානතිය ආදි ග්‍රන්ථ මෙම පොත් අතර ප්‍රමුඛස්ථානය ගනී.

මිෂනාරි පූජකයන් බුදුදහම පිළිබඳව ඉදිරිපත් කළ මිථ්‍යා මත බිඳහෙළීමට ගුණානන්ද හිමිපාණන් අනුගමනය කළ තවත් ප්‍රබල ක්‍රියාමාර්ගයක් වූයේ ඔවුන් සමග මුහුණට මුහුණලා කළ වාද සමූහයයි. ඒවා අතර 1873 පැවැති පානදුරා වාදය ලෝක ප්‍රකට වූවකි. මෙම වාදයේදී හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන්ගෙන් ලැබුණු ධර්මෝපදේශ තමන්ට මහත් ධෛර්යයක් වූ බව ගුණානන්ද හිමියන්ම සඳහන් කර ඇත.

''පානදුරේ වාදයේ දී කොළඹ විද්‍යෝදය පරිවේණාධිපති හික්කඩුවේ ශ්‍රී සුමංගල ශ්‍රීපාදයේ නායකස්ථවිරයන් වහන්සේගෙන් මට බොහෝ ආධාර උපකාර ලැබුණා පමණක් නොව මෙම පොත සංශෝධනය කිරීම පිණිසත් උපකාර ලැබුණු බව නොමසුරුව කියමි.

පානදුරේ වාදයේ දී ගුණානන්ද හිමිපාණන් වහන්සේ විසින් ප්‍රතිවාදීන්ගේ තර්ක බිඳ හෙලමින් ඉදිරිපත් කළ ධර්ම ශාස්ත්‍රීය කරුණු කෙතරම් සාරවත් හා තර්කානුකූල ද යත් ඒ පිළිබඳ කීර්තිය විදේශයන්හි පවා පැතිරිණි. ටයිම්ස් පත්‍රයේ කර්තෘ ජෝන් කැපර් මහතා ගුණානන්ද හිමියන්ගේ කථාව ඒ අයුරින්ම ඉංග්‍රීසි භාෂාව පරිවර්තනය කර බෙදා හැර ඇත. ඒ ආශ්‍රයෙන් ජෝන් පීබල්ස් පඬිතුමා ''බුද්ධහම හා ක්‍රිස්තියානිය මුහුණට මුහුණලා'' නමින් ලියන ලද ග්‍රන්ථය කිය වූ ඇමරිකන් ජාතික හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාට මේ මහා වාදිභසිංහයා දැන හැඳින ගැනීමට මහත් ආසාවක් ඇතිවිය. ගුණානන්ද හිමියන් සමග ලිපි ගනුදෙනු කිරීම් මගින් දැන හැඳුනුම්කම් ඇති කරගත් ඕල්කට්තුමා, බ්ලැවස්කි මැතිණිය ඇතුළු පරම විඥානාර්ථවාදීන් 1880දී ලංකාවට සම්ප්‍රාප්ත වූයේ පානදුරාවාදයේ ප්‍රතිඵල වශයෙනි. ඕල්කට්තුමාගේ ලංකා ගමනය පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමි, පූජ්‍ය වස්කඩුවේ ශ්‍රී සුභූති නාහිමි ආදී හිමිවරුන්ගේ පුරෝගාමිත්වයෙන් ඇරඹුණ මෙරට බෞද්ධ පුනරුද ව්‍යාපාරයට මහත් ශක්තියක් විය.

ක්‍රිස්තියානි පූජකයින්ගේ තර්ජන ගර්ජන හමුවේ අභීතව හා ආදීනව ක්‍රියා කිරීම මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් තුළ පැවති විශිෂ්ට ගුණාංගයකි. උන්වහන්සේගේ නිර්භීතකම ප්‍රකට කරන අවස්ථා රැසක් ගුණනානන්ද චරිතයෙන් දැකිය හැකිය. එබඳු එක් සිදුවීමක් මෙහි දී සඳහන් කිරීම වැදගත් වනු ඇත.

එකල අගනුවර මිගෙල් නම් බලගතු ක්‍රිස්තියානි පූජකවරයෙක් සිටියේය. ඔහු අශ්ව කරත්තයෙන් ගමන් ගන්නා විට ධර්ම දේශනයක් නිමවා විහාරස්ථානයට වඩින මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්

බක්කි කරත්තයකින් එනු දුටු මිගෙල් පූජකවරයා අශ්ව කරත්තය නතර කර ගුණානන්ද හිමියන්ගෙන් මෙසේ විමසා ඇත.

දන්නවද? මම කවුද? කියල
මම තමයි මිගෙල් යැයි මහ හඬින් ගුගුලේය.
මොහොට්ටිවත්තේ හිමියන් උපහාසාත්මක ලෙස සිනාසී
දන්නවද? මම කවුද? කියල
මමත් මිගෙල් තමයි

යනුවෙන් පූජකයාගේ හඬට වඩා දැඩි ස්වරයකින් ප්‍රකාශ කළේය. එම ප්‍රකාශයෙන් කෝපාවිශ්ට වූ පූජකවරයා ශාන්ත ස්වරයෙන් ඇමතූ ගුණානන්ද හිමියෝ

''**මම තමයි මොහොට්ටිවත්තේ ගුණානන්ද**'' යි ප්‍රකාශ කළ විට උන්වහන්සේ ගැන අසා තිබූ පූජකයා ගුණානන්ද හිමියන්ට ගරුසරු දැක්විය.

ඕල්කට්තුමාගේ මූලිකත්වයෙන් බෞද්ධ පාඨශාලා ආරම්භ කිරීමේ ක්‍රියාදාමයේ දී ද ගුණානන්ද හිමිපාණන් ඉටු කළ මෙහෙය එතුමාට මහත් ශක්තියක් විය. කොළඹ ආනන්ද මහා විද්‍යාලය ආරම්භ කිරීමේ උත්සවයේ දී ද එම විද්‍යාලය ගුණානන්ද විද්‍යාලය වශයෙන් නම් කිරීමට ඕල්කට්තුමා යෝජනා කළ අවස්ථාවේ ඊට අකමැත්ත පළ කළ ගුණානන්ද හිමියන් බුදුරජාණන් වහන්සේගේ අග්‍ර උපස්ථායක හා ධර්ම භාණ්ඩාගාරික ධුර උසුලමින් බුදු සසුනට උදාර මෙහෙයක් කළ ආනන්ද මහරහතන් වහන්සේ අනුස්මරණය කිරීම් වශයෙන් ආනන්ද විද්‍යාල වශයෙන් නම් කළ යුතු යැයි යෝජනා කර ඇත. මෙසේ සම්බුද්ධ ශාසනයේ හා සිංහල ජාතියේ උන්නතිය හා චිරස්ථිතිය උදෙසා තම ජීවිතයම කැපකළ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිපාණෝ හැටහත් වන වියේ දී 1890 සැප්තැම්බර් මස 21 වන දින අපවත් වූහ.

ශ්‍රී ලංකාව, හිරු නොබසින අධිරාජ්‍යය වශයෙන් ප්‍රකට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක් ව පැවති අවධියක ක්‍රිස්තියානි මිෂනාරීන්

බුදුසසුන විනාශ කිරීමටත් ක්‍රිස්තියානි ආගම දිවයින පුරා ක්‍රියාත්මක කිරීමටත් රාජ්‍ය අනුග්‍රහය ඇතිව ක්‍රියා කළ පසුබිම තුළ සිංහල බෞද්ධයාගේ පිනට පහළ වූ යුග පුරුෂයකු වශයෙන් මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිපාණන්ගේ නාමය සදානුස්මරණීය වනු ඇත.

උන්වහන්සේගේ චතුර කථිකත්වයත් අධිෂ්ඨානශීලිත්වය, ආත්ම ශක්තිය, ස්ථානෝචිත ප්‍රඥාව, සමයාන්තර ඥානය හා ප්‍රතිවාදීන් නිරුත්තර කරවන වාග් ශක්තිය, මිසදිටු බලය බිඳ බෞද්ධ බලය නැංවීමට බෙහෙවින් ඉවහල් විය.

19 වන සියවසේ මැද භාගයෙහි ඇරඹුණු මෙරට බෞද්ධ ප්‍රබෝධයේ පුරෝගාමියා වශයෙන් මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් හැඳින්වීම යුක්ති යුක්තය.

**ක්‍රියාකාරකම්**

01. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිපාණන් විසින් මිසදිටු බලය බිඳ හෙළීමට කළ සේවය කෙටියෙන් පැහැදිලි කරන්න.
02. ගුණානන්ද ස්වාමීන් වහන්සේගේ චරිතයෙන් ප්‍රකට වන නායකත්ව ලක්ෂණ පැහැදිලි කරන්න.

**පුහුණුවට**

බුදුසසුන හා බුදු දසුනද අසම සම
හොබවන මහ සවිය ඇරගෙන අතට තම
යුගයේ වීරයා වී දිනූ සිහළ බිම
බැබළෙයි හැමකල්හි ගුණනද සමිඳු නම
(විමල් අබේසුන්දර)

## 17. පාඩම

## දෙගුරුන් ගුණ දැන අදරින් සලකමු

දෙගරුන් නම් අපගේ අම්මා සහ තාත්තා ය. අම්මා තාත්තා යන වචන දෙක තරම් ආදරබර මිහිරි වෙනත් වචන දෙකක් අපට නැති තරම්ය. දස මසක් හෝ ඊට ආසන්න කාලයක් කුසේ දරාගෙන සිට ලේ කිරි කර පොවා අප හදා වඩා ගනු ලැබුයේ අම්මා විසිනි. කැතකුණු අතගා අතපය ඇදකුද නොකර අපට මේ ලෝකය දක්වනු ලැබුයේ අම්මා තාත්තා විසින්ය. අපේ දුකසැප බලමින්, අපට රැකවරණය සලසමින්, අවශ්‍යතා සපුරමින් ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමට මග සලසන්නේද මව්පියන් දෙදෙනාය. අපට ආරක්ෂාව - රැකවරණය සලසන බැවින් මව්පිය දෙදෙනා දේවත්වයෙන් සැලකීමට අපි පුරුදුව සිටිමු. බුදු දහමෙහි පුබ්බ දේව නමින් මව්පියන් හඳුන්වනු ලැබ ඇත්තේද එම හේතුව නිසාය.

| | |
|---|---|
| මව්පියො උතුම්ම | ය |
| අපගෙ පෙර දෙව්වරුම | ය |
| අප රකිනුවෝම | ය |
| වඳිමු මව්පිය දෙදෙන මහිම | ය |

යන පද්‍යය අප කුඩා කලම පාඩම් කරගත් එකකි. එයින් කියැවෙන්නේ ද අපගේ මව්පියන් දේවත්වයෙන් - මූලිකම දෙවියන් ලෙස සැලකීමේ වැදගත්කමය. විපතක් කරදරයක් වූ විට අපට පිහිට වන අය අතර මුලට ම සිටින්නේ මව්පියන් ය. පහත සඳහන් ගීත ඛණ්ඩය අපට සිහිපත් කර දෙන්නේ ද එය යි.

| | |
|---|---|
| විපතක් වූ විට පිහිටට | එන්නේ |
| මවුනි පියාණනි ඔබ | පමණයි |
| බුදුන් ළඟට අපෙ දුක ගැන | දන්නේ |
| මවුනි පියාණනි ඔබ | දෙපළයි |

දරුවන් වන අපට මොන තරම් හිත මිතුරන් සිටිතත් විපතක් පැමිණි විටෙක දැඩි සෙනෙහසින් හා කැපවීමෙන් ඉදිරිපත් වන්නේ දෙමව්පියන් ය. අපගේ දුක් කරදර ගැන නිසිලෙස නිසි වැටහීමක් ඇතිකර ගන්නා අය අතර ඉහළ ම තැන සිටින්නේ මව්පිය දෙදෙනා යි.

අපගේ මුල්ම ගුරුවරුන් දෙපළ ද මෑණියන් වහන්සේ සහ පියාණන් වහන්සේ ය. ආහාරපාන ගත යුතු පිළිවෙළ, අඳින පළඳින හැටි, යහපත් සෞඛ්‍ය පුරුදු, ආචාර සමාචාර විධි, කළයුතු නොකළයුතු දේ පෙන්වා දුන්නේ ද අම්මා සහ තාත්තා ය. ඒ නිසාම මව්පියන් අපේ පූර්ව ආචාර්යවරුන් යැයි බුදුරජාණන් වහන්සේ වදාළහ.

දුකක් නැතුව ලෙඩක් නැතුව දරුවන් සැපසේ සිටිනු දැකීම මව්පියන්ගේ කැමැත්තයි. දරුවන්ට දුකක් පැමිණි විට ඒ දෙදෙනාගේ හදවත කම්පා වෙයි. කරුණාවෙන් බර වෙයි. තමන්ට මොන තරම් කරදර හිරිහැරවලට මුහුණ පෑමට සිදුවූවත් දරුවන් දුකින් මුදවාගැනීමට ඉදිරිපත් වීම මව්පියන්ගේ ස්වභාවය යි. එමෙන් ම තම දරුවන් දියුණුවන අයුරු, සතුටින් දිවි ගෙවන අයුරු දකින මව්පියෝ අවකංව ම සතුටු වෙති. කිසි විටෙක ඊර්ෂ්‍යා නොකරති. දැන හෝ නොදැන හෝ දරුවන් අතින් තමන්ට සිදුවන වැරදි මැදහත් සිතින් ඉවසන මව්පියෝ තිසිවයසට පැමිණි දරුවන්ට නිදහසේ තම වැඩ කටයුතු කරගෙන යෑමට ඉඩ හරිති. මෙසේ මෙත්තා, කරුණා, මුදිතා සහ උපේක්ඛා යන ගුණ සතරින් යුක්ත නිසා මව්පියන්ට බ්‍රහ්ම යන නම යෙදේ.

මව්පියන්ට දරුවන් පෙරදිග මෙති. පෙරදිගින් උදාවන සූර්යයා සත්ත්ව හා ශාක ජීවිතවල පිබිදීමට මහත් බලපෑමක් කරයි. දවසෙහි ආලෝකය ලැබෙන්නේ නැගෙනහිරිනි. දරුවන්ගේ ජීවිත ආලෝකවත් කෙරෙන්නේ දෙමව්පියන් විසිනි. දරුවන්ගේ පෙරදිග මව්පියන් යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කරනු ලැබ ඇත්තේ ඒ නිසා විය යුතුය. මෙබඳු උතුම් මව්පියන්ට සැලකීම ගුණගරුක හොඳ දරුවන්ගේ ලක්ෂණයකි. බුදු වදනට අනුව මව්පියන්ට උපස්ථාන කිරීම උතුම් මංගල කාරණයකි. එනම් දරුවන්ගේ දියුණුවට හේතුවන කරුණකි. තමන්ට හැකියාව තිබියදී මව්පියන්ට නොසලකන දරුවා ගමන් කරන්නේ පිරිහීමේ දොරටුව

කරාය. එසේ මව්පියන්ට නොසලකන දරුවන් බුදු දහමෙහි හැඳින්වෙන්නේ වසලයන් - ඉතා පහත් පුද්ගලයන් ලෙසය. එසේම මව්පියන්ට හිරිහැර කිරීම, සැඩපරුෂ ලෙස දෝෂාරෝපණය කිරීම පහත් ගතියක් ලෙස දක්වෙයි.

මව්පියන්ට සලකන දරුවා සත්පුරුෂයෙකි. පැසසුම් ලැබීමට සුදුස්සෙකි. එබඳු දරුවෝ බුදුරජාණන් වහන්සේගේ පැසසුමට ලක්වූහ. හාමුදුරු නමක් පිඬුසිඟා ලද දෙයකින් වුවද තම මව්පියන් පෝෂණය කරන්නේ නම් එය උතුම් ක්‍රියාවක් බව බුදුරජාණන් වහන්සේ වදාළහ. එක්තරා මව්පිය දෙපළකට සිටි එකම දරුවා පැවිදි විය. එම මව්පියන් වයස් ගත වූ විට උපස්ථාන කිරීමට කිසිවෙක් නොවීය. ස්වාමීන් වහන්සේ පිඬුසිඟා ලත් ආහාරවලින් ඒ දෙදෙනා පෝෂණය කරන බව දැනගත් බුදුරජාණන් වහන්සේ සාධුකාර පවත්වා ප්‍රශංසා කළහ.

පෙර ලංකාවේ රජවරුන් පවා මව්පිය උවටන ඉමහත් ගෞරවයෙන් කළ බවට නිදසුනකි. අටවැනි අග්බෝ රජතුමා, එතුමා දිවා රාත්‍රී දෙකේම මව්පියන්ට උපස්ථාන කළේ ය. රාජ සභාවට යෑමට පෙර මව්තුමියට උපස්ථාන කිරීම එතුමාගේ සිරිතය. එතුමා මාලිගයෙන් පිටව ගියේ මෑණියන් පැදකුණු කරමින් තෙවරක් වන්දනා කිරීමෙන් අනතුරුවය.

ස්වාමීන් වහන්සේලා සහ රජවරුන් පවා එසේ උපස්ථාන කර තිබෙන්නේ දෙමව්පියන්ගේ උතුම් බව නිසා ය. අපේ මව්පියන් අප වෙනුවෙන් අපේ සහෝදර සහෝදරියන් වෙනුවෙන් මොන තරම් කැපකිරීමක් කරත්ද යන්න අපි හොඳින් දනිමු. එබැවින් දෙමව්පියන්ට සැලකීම අපගෙන් විය යුතුමය. ඒ සඳහා අප වැඩිහිටියන් වනතුරු බලා සිටිය යුතු ද? කොහෙත්ම නැත. නව යොවුන් වියේ දරුවන් ලෙස මව්පියන් වෙනුවෙන් අපට කළහැකි දේ බොහෝ ඇත.

ආහාර පානාදිය සපයා දීමෙන් අපට මව්පියන් පෝෂණය කිරීම නොහැකි වුනත් පෝෂණයට අවශ්‍යම වූ සිතේ සතුට සැනසිල්ල මව්පියන්ට ලැබෙන පරිදි අපට ක්‍රියා කළ හැකිය. ඉගෙනීමේ කටයුතුවල නිසිලෙස නොයෙදෙන අකීකරු දරුවන්ගේ මව්පියන්ට කවරනම් සැනසිල්ලක් ද? කවරනම් සතුටක් ද? ඒ නිසා අප කළ

යුත්තේ හොඳට ඉගෙනීමෙන්, හොඳට හැසිරීමෙන් අප ගැන හොඳ ආරංචි දෙමව්පියන්ට ලැබෙන ලෙස කටයුතු කිරීමෙන් ඒ අයට සොම්නස් වන්නට අවස්ථා සැලසීමයි. ගෙදර කටයුතුවලදී, වතුපිටිවල කටයුතුවලදී මෙන්ම ව්‍යාපාරික කාර්යයන්හිදී ද අපට දෙමව්පියන්ට උදව් කළ හැකිය. ඒ අය අපට නියම කරන කටයුතු අවංකව හැකිතාක් හොඳින් සිදුකරන්නේ නම් එයද උපකාරයකි. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද පරිදි ඉහළ ම, අගනා ම මව්පිය උපකාරය වන්නේ ගුණ දහමින් පෝෂණය වීමට ඒ අයට අතහිත දීමය. ඒ සඳහා දරුවන් වන අපට කළ හැකි දේ අතර පහත සඳහන් ඒවාද වේ.

* දිනපතා හවස නිවසේදී තෙරුවන් වඳින මව්පියන්ට මල්බඳුන් ආදි පූජා ද්‍රව්‍ය පිළියෙල කර දීම.

* දිනපතා නිවසේදී වන්දනාමාන නොකරන මව්පියන් ඒ සඳහා උනන්දු කරවීම.

* පින් දහම් කිරීම, බණ ඇසීම, සිල් සමාදන් වීම, භාවනා කිරීම, පරිත්‍යාග කිරීම, දහම් පොත් කියවීම ආදියට මව්පියන් උනන්දු කරවීම.

* මව හෝ පියා හෝ දෙදෙනාම හෝ කුඩා වුවද දුසිරිතකට හුරුවී සිටිත්නම් එයින් මුදා ගැනීමට ක්‍රියා කිරීම.

**ක්‍රියාකාරකම්**

01. ඔබට මව්පියන්ට කළ හැකි උපකාර මොනවාද'යි හැකිතාක් ලියා ගුරුතුමාට ඉදිරිපත් කරන්න.

පැවරුම

01. පන්තියේ සියලුදෙනා එකතුවී මව්ගුණ, පියගුණ ඇතුළත් ගීත හා පද්‍ය එකතුකර කුඩා පොතක් පිළියෙල කරන්න.

පුහුණුවට

යෝ මාතරං වා පිතරං වා
මච්චෝ ධම්මේන පෝසති
දේවාපි නං තකිච්ඡන්ති
මාතා පෙත්ති භරං ජනං

යමෙක් දැහැමින් තම
දෙගුරුන් පිළිදගී නම්
දෙවියනුත් ඒ පුතු
ලෙඩ දුකින් රැක ගන්නේ

# 18. පාඩම

## මෙත්ත සූත්‍රය

බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලා පිරිසකට මෙත්ත සූත්‍රය දේශනා කළේ උන්වහන්සේලාට ඇති වූ අමනුෂ්‍ය උවදුරු දුරු කර ගැනීමට මෙන්ම විදසුන් වඩා මාර්ග ඵල නිවන් අවබෝධ කර ගැනීමටත්ය. ගාථා දහයකින් යුක් මෙත්ත සූත්‍රය දුන් බහුල වශයෙන් හැඳින්වෙන්නේ කරණීය මෙත්ත සූත්‍රය යනුවෙනි. මෙතැන් සිට අපි එම ගාථා අර්ථ සහිතව ඉගෙන ගනිමු.

**01. කරණීයමත්ථ කුසලේන**
**යං තං සන්තං පදං අභිසමෙච්ච**
**සක්කෝ උජූ ච සූජූ ච**
**සුවචෝ චස්ස මුදු අනතිමානි**

නිවනට පැමිණ විසීමට කැමති එසේ ම තමාට හිත පිණිස කටයුතු කිරීමෙහි දක්ෂ තැනැත්තා මේ ගුණ ධර්මවලින් යුක්ත විය යුතුය.

**01. සක්කෝ**

දුක්ඛාදී ආර්ය සත්‍ය අවබෝධ කර ගැනීමට සුදුසු පරිදි පිළිවෙත් පිරීමෙහි දක්ෂයකු වීම.

**02. උජු**

උජු යන ගුණය ගාථාවෙහි දී උජූ යනුවෙන් යොදා ඇත. තමාගේ නැති ගුණ නොදක්වීම, කයින් වචනයෙන් අවංක වීම ආදී වශයෙන් ඍජු, ඇද නැති කෙනෙකු වීම.

**03. සූජු**

සූජු යන ගුණය ගාථාවෙහි දී සූජු යනුවෙන් යොදා ඇත. තමා තුළ ඇති දොස් නොවැසීම, මනසින් අවංක වීම, ආදී වශයෙන් වඩාත් ඍජු ඇද නැති කෙනෙකු වීම.

**04. සුවච**

හොඳ නරක පෙන්වා දෙමින් නුවණැත්තන් විසින් කරන අවවාද ගෞරවයෙන් පිළිගන්නා කීකරු කෙනෙකු වීම.

**05. මුදු**

තළලෙහි රැළි නොනංවන, රවා බැලීමක් නොකරන, පහසුවෙන් අන් යට කතා කළ හැකි, සතුටු සාමීචි කතා කරන මොලොක් කෙනෙකු වීම.

**06. අනතිමානී**

ජාතිය, උගත්කම, ලස්සන, ධනවත්කම ආදී කරුණු නිසා දැඩි ලෙස මානය ඇති කර නොගෙන මානය අඩු කෙනෙකු වීම.

**02.** **සන්තුස්සකෝ ච සුභරෝ ච**
**අප්ප-කිච්චෝ ච සල්ලහුකවුත්ති**
**සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච**
**අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ**

**07. සන්තුස්සකෝ**

ආහාරපාන, ඇඳුම් පැළඳුම්, ගෙවල්, දොරවල්, බෙත්හේත්, ආදී වශයෙන් තමන්ට ලැබෙන දේවල අඩුපාඩු නොකියන, ලද දෙයින් සතුටු වන කෙනෙකු වීම.

**08. සුභරෝ**

වටිනා හෝ නොවටිනා, රසවත් හෝ නීරස දෙයක් ලැබුණු විට එය සතුටු සිතින් පිළිගැනීමෙන් පහසුවෙන් පෝෂණය කළ හැකි කෙනෙකු වීම.

**09. අප්ප-කිච්ච**

හැම විටම පාහේ වැඩ කටයුතුවල නිරත වෙමින්, කතාබහ කරමින් නොසිට කළ හැකි, කළයුතු පමණට වැඩ කටයුතු කිරීමෙන් වැඩ අඩු කෙනෙකු වීම.

**10. සල්ලහුක වුත්ති**

වැඩිපුර ඇඳුම් පැළඳුම් පාවිච්චියෙන් තොරව පමණ ඉක්මවා ගෘහ භාණ්ඩවලින් නිවස පුරවා ගැනීමෙන් තොරව පමණ ඉක්මවා ඔවුනොවුන්ගේ කටයුතුවලට සහභාගි වීමෙන් තොරව සැහැල්ලු පැවැත්මෙන් යුක්ත කෙනෙකු වීම.

**11. සන්තින්ද්‍රිය**

චිත්‍රපට, ටෙලිනාට්‍ය ආදි ප්‍රියමනාප රූප දකීමෙන් ද සංගීතය ආදී ප්‍රියමනාප ශබ්ද ඇසීමෙන් ද ඇස, කන, නාසය, දිව, කය පිනවීමෙහිද ඇලී ගැලී නොසිට අප්‍රිය දේවල් නිසා ද්වේශය ඇති කර නොගන්නා අයකු වීම.

**12. නිපක**

කය වචන රැක ගැනීමේ නුවණින් ද රෝග සෑදීමට හේතුවන ආහාර පානවලින් වැළකීමට අවශ්‍ය නුවණින් ද තැනකට ගැලපෙන ඇඳුම් පැළඳුම් දැරීමේ නුවණින් ද යුතු, තැනට සුදුසු නුවණින් ක්‍රියා කරන්නකු වීම.

**13. අප්පගබ්භ**

ගුරුන්, දෙගුරුන්, පැවිද්දන් වැඩිහිටියන් ආදී අය ඇති නැති තැන්වලදී ඒ අයට ගෞරවයක් ඇතිවන ලෙසට අතපය නොහැසිරවීමෙන් ද කතා නොකිරීමෙන් ද, ආසාව, තරහව, ආදිය ඇති වන අයුරින් නොයෙක් දේ නොසිතමින් ද සංවරව කටයුතු කරන කෙනෙකු වීම.

**14. කුලේසු අනනුගිද්ධෝ**

ඇසුරු කරන පවුල් සමග අසීමිත ලෙස බැඳීම් ඇති කර නොගන්නා අයකු වීම.

03. නච බුද්දං සමාචරේ කිඤ්චි
යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං
සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

15. නුවණැත්තන් විසින් දොස් කීමට සුදුසු වන කිසිදු වරදක් කයින්, වචනින් හෝ මනසින් නොකරන අයකු වීම.

මෙහි දැක්වූ මුල් කරුණු 14 අනුගමනය කළයුතු ඒවාය. පහළොස්වන කරුණ වැලකිය යුතු එකකි. තුන්වන ගාථාවේ අවසන් පේළි දෙකෙන් දක්වා ඇත්තේ මෛත්‍රී භාවනාව කෙටියෙන් වඩන අයුරුය.

ඒ මෙසේය....
සබ්බේ සත්තා සුඛිනෝ හොන්තු
සියලු සත්ත්වයෝ කායික සුවයෙන් සැප ඇත්තෝ වෙත්වා
සබ්බේ සත්තා ඛේමිනෝ හොන්තු
සියලු සත්ත්වයෝ සියලු භය, උවදුරු, දුරුවීමෙන් භය නැත්තෝ වෙත්වා
සබ්බේ සත්තා සුඛිතත්තා භවන්තු
සියලු සත්ත්වයෝ මානසික සුවයෙන් සතුටු සිත් ඇත්තෝ වෙත්වා

මෙතැන් සිට දක්වා ඇත්තේ විස්තර වශයෙන් මෛත්‍රී භාවනාව වඩන අයුරුය.

04. යේ කේචි පාණ භූතත්ථි
තසා වා ථාවරා වා අනවසේසා
දීඝා වා යේ මහන්තාවා
මජ්ඣිමා රස්සකාණුකථූලා

| | | |
|---|---|---|
| තසා වා | : | කෙලෙස් ඇති සත්ත්වයෝද |
| ථාවරා වා | : | කෙලෙස් නැති සත්ත්වයෝද |
| අනවසේසා යේ කේචි | | |
| පාණභූතාඅත්ථි | : | ඉතිරි නැතිවද සියලු ප්‍රාණීහුද |
| දීඝා | : | නයි පොළොං ආදී දිග සත්තු ද |

| | | |
|---|---|---|
| මහන්තා | : | තල් මසුන්, අලි ඇතුන් ඇදී මහත් ශරීර ඇති සත්ත්වයෝද |
| මජ්ඣිමා | : | අස්, ගව, ඌරු ආදී මධ්‍යම ශරීර ඇති සත්ත්වයෝද |
| රස්සකා | : | ඒ ඒ සත්ත්ව කොට්ඨාසවල මිටි ශරීර ඇති සත්ත්වයෝද |
| අණුක | : | ඇසට නොපෙනෙන තරම් කුඩා ශරීර ඇති සත්ත්වයෝද |
| ථූලා | : | ඉබ්බන්, සිප්පි ආදී වටකුරු ශරීර ඇති සත්ත්වයෝද |

**05. දිට්ඨා වා යේව අද්දිට්ඨා**
**යේව දූරේ වසන්ති අවිදූරේ**
**භූතා වා සම්භවේසීවා**
**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා**

| | | |
|---|---|---|
| දිට්ඨා | : | ඇසට පෙනෙන සත්ත්වයෝද |
| අද්දිට්ඨා | : | ඇසට නොපෙනෙන සත්ත්වයෝද |
| දූරේ | : | දුර වසන සත්ත්වයෝද |
| අවිදූරේ | : | ළඟ වසන සත්ත්වයෝද |
| භූතා | : | උපන් සත්ත්වයෝද |
| සම්භවේසි | : | ඉපදීමට සිටින සත්ත්වයෝද |
| සබ්බේ සත්තා | : | සියලු සත්ත්වයෝද |
| සුඛිතත්තා භවන්තු | : | සතුටු සිත් ඇත්තෝ වෙත්වා |

**06. න පරෝ පරං නිකුබ්බේථ**
**නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි**
**බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා**
**නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛ මිච්ඡෙය්‍ය**

| | | |
|---|---|---|
| කත්ථචි | : | කිසි තැනකදී |
| පරෝ පරං නිකුබ්බේථ | : | කෙනෙක් කෙනෙකුට වංචා නොකෙරේවා |
| නං කිඤ්චි | : | ඒ කිසිවකු හට |

| | | |
|---|---|---|
| න අතිමඤ්ඤෙථ | : | අවමන් නොකෙරෙත්වා |
| බ්‍යාරෝසනා(ය) | : | කයින් හෝ වචනයෙන් දොස් දැක්වීමෙන්ද |
| පටිඝ සඤ්ඤා(ය) | : | මනසින් ද්වේෂය, පටිඝයක් ඇතිකර නො ගැනීමෙන් ද |
| අඤ්ඤදස්ස | : | කෙනෙක් කෙනෙකුට (ඔවුනොවුන්ට) |
| දුක්ඛං න ඉච්ඡෙය්‍ය | : | දුකක් කැමති නොවේවා. |

මෛත්‍රී වඩන අයුරු උපමාවකින් දැක්වීම.

**07.** **මාතා යථා නියං පුත්තං**
**ආයුසා ඒක පුත්තමනුරක්ඛෙ**
**ඒවම්පි සබ්බභූතේසු**
**මානසං භාවයේ අපරිමාණං**

මවක් තමාගේම එකම පුතු තම ආයුෂය, පණ මෙන් රකී ද ඒ අයුරින් සියලු සතුන් කෙරෙහි අප්‍රමාණ වූ මෙත් සිත වඩන්නේ ය.

**08.** **මෙත්තං ච සබ්බලෝකස්මිං**
**මානසං භාවයේ අපරිමාණං**
**උද්ධං අධෝ ච තිරියංච**
**අසම්බාධං අවේරං අසපත්තං**

| | | |
|---|---|---|
| අපරිමාණං | : | ප්‍රමාණයක් නැති |
| අසම්බාධං | : | බාධාවක්, සීමාවක් නැති |
| අවේරං | : | වෛර සිත් නැති |
| අසපත්තං | : | සතුරන් නැති |
| මානසං මෙත්තං | : | (තම) සිතෙහි ඇති මෛත්‍රිය |
| උද්ධං | : | උඩ |
| අධෝ | : | යට |
| තිරියං ච | : | සිරස |
| සබ්බ ලෝකස්මින් | : | සියලු ලෝකයෙහි |
| භාවයේ | : | වඩන්නේය. |

භාවනා කිරීමට සුදුසු ඉරියව් දැක්වීම

**09. තිට්ඨං චරං නිසින්නෝ වා**
**සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ**
**ඒතං සතිං අධිට්ඨෙය්‍ය**
**බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු**

| | | |
|---|---|---|
| තිට්ඨං | : | සිටගෙන සිටින්නේ ද |
| චරං | : | ඇවිදින්නේ ද (සක්මන් කරන්නේද) |
| නිසින්නෝවා | : | හිඳගෙන සිටින්නේද |
| සයානෝවා | : | සයනය කරන්නේද |
| යාවතස්ස විගතමිද්ධෝ | : | නොනිදා සිටින තාක් කල් |
| ඒතං සතිං අධිට්ඨෙය්‍ය | : | මේ මෛත්‍රී සිත වඩන්නේය |
| ඒතං | : | මේ මෛත්‍රී විහරණය(වාසය) |
| ඉධ | : | මේ බුදු සසුනෙහි |
| බ්‍රහ්ම විහාරං ආහු | : | උතුම් විහරණයක් යැයි (බුද්ධාදි උතුමෝ) කීහ. |

මාර්ග ඵල නිවන් ලැබෙන අයුරු දැක්වීම

**10. දිට්ඨිං ච අනුපගම්ම සීලවා**
**දස්සනේන සම්පන්නෝ**
**කාමේසු විනෙය්‍ය ගේධං**
**නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතීති**

| | | |
|---|---|---|
| දිට්ඨිං ච අනුපගම්ම | : | වැරදි දෘෂ්ඨිවලට නොපැමිණ |
| සීලවා | : | සිල්වත්ව |
| දස්සනේන සම්පන්නෝ | : | සෝවාන් වීමෙන් හෙවත් නිවැරදි දැක්මෙන් යුක්තව |
| කාමේසු ගේධං විනෙය්‍ය | : | පස්කම් සැපයෙහි ගිජුකම දුරුකොට |
| ජාතු ගබ්බ සෙය්‍යං | : | ඒකාන්තයෙන් මව්කුස පිළිසිඳ ගැනීමට |
| නහි පුන ඒතී | : | නැවත නො එන්නේ ය. |

## ක්‍රියාකාරකම්

01. ''සක්කෝ'' යන ගුණය ශිෂ්‍යයකු වශයෙන් ඔබට වැදගත් වන අයුරු පැහැදිලි කරන්න.

02. බුදුරජාණන් වහන්සේට තරම් අන් කිසිවෙකුටත් මෛත්‍රිය නැත. එහෙත් මෛත්‍රී වැඩීමේදී උපමාවට ගෙන ඇත්තේ මවය. ඒ ඇයි යන්න ඔබට දිය හැකි පිළිතුර කුමක්ද?

03. මෙත්ත සූත්‍රය කටපාඩමින් සජ්ඣායනා කරන්න.

## 19. පාඩම

## වපුරන අයුරුම අස්වැන්න ලැබේ

දිනක් ජේතවන විහාර මළුවේ භික්ෂූන් වහන්සේ නමක් සක්මන් කරමින් සිටියේ ය. පෙර දින රාත්‍රියේ ඇදහැලුණු වර්ෂාව නිසා මඩ වී තිබුණු පොළොවේ ගැඩවිල් පණුවෝ මතුවෙමින් සිටිති. ඒ භික්ෂූන් වහන්සේ ඔවුන් පාගමින් එහා මෙහා ඇවිදිති. මේ දුටු භික්ෂු පිරිසක් බුදුරජාණන් වහන්සේට ඒ බව දැන්වූහ.

''ස්වාමීනි, ගැඩවිල් පණුවන් පාගමින් භික්ෂු නමක් මිදුලේ සක්මන් කරනවා. ඒ සතුන් මැරෙනවා.''

බුදුහාමුදුරුවෝ කරුණු පැහැදිලි කර දුන්හ.

''ඒ භික්ෂුව රහතන් වහන්සේ නමක්. රහතන් වහන්සේලා දැන දැන සතුන් මරන්නේ නැහැ. ඒ භික්ෂුව පෙරකළ පාප කර්මයක් නිසා දැන් ඇස් අන්ධ වෙලයි ඉන්නේ''.

''භාග්‍යවතුන් වහන්ස, අපට ඒ රහතන් වහන්සේ පෙර කළ පාප කර්මය පහදා දෙන්න.'' පෙර භවයක මේ චක්ඛුපාල රහතන් වහන්සේ අක්ෂි වෛද්‍යවරයෙක්. ඔහුගෙන් බෙහෙත් ගත් එක් රෝගී කාන්තාවක්, රෝගය සුව වුණොත් වෛද්‍යවරයාගේ දාසියක වන බවට පොරොන්දුවක් දුන්නා. බෙහෙත් ගැනීමෙන් ඇස් පෙනීම ලැබුණ පසුත්, තමන් පොරොන්දු වූ පරිදි දාසියක වීමට ඇති අකමැත්ත නිසා රෝගය සුව වී නැති බව වෛද්‍යවරයාට කියා සිටියා. එය බොරුවක් බව දැනගත් වෛද්‍යවරයා කෝපයට පත්ව, ඇස් පෙනීම තවදුරටත් යහපත් වීමට යැයි කියා බෙහෙතක් දී ඇගේ ඇස් දෙකම අන්ධ කළා. මෙහි ප්‍රතිඵලයක් වශයෙනුයි රහත් බව ලැබුවත් මේ තෙරුන්ගේ දෑස අන්ධ වුනේ''

අනතුරුව බුදුහාමුදුරුවෝ මෙසේ ද අනුශාසනයක් කළ සේක.

දුෂ්ඨ සිතින් කරන කියන හැමදේම නිසා දුක ම පසුපසින් එනවා කරත්තය අදින ගොනා පසුපසින් එන කරත්ත රෝදය වගෙයි.''

කර්මයක් යැයි හැඳින්වෙන්නේ සිතා මතා කරන කියන සිතන දේය. නරක කර්ම මෙන් හොඳ කර්ම ද තිබේ. යහපත් සිතුවිලි මුල් වී කරන, කියන, සිතන කර්ම යහපත්ය. එසේ යහපත කරන්නා පසුපස සැප පැමිණෙයි. තමා පසුපස එන තමාගේ සෙවනැල්ල මෙනැ යි ඒ ගැන ධම්මපද ගාථාවකින් කියවේ.

අතීත කථාවලින් පමණක් නොව අප දන්නා වර්තමාන කථාවලින් ද කර්මයේ විපාක ගැන දැන ගන්නට ලැබේ. එවැනි එක් සිදු වීමක් මෙසේ ය.

වන සතුන් මරාගෙන ආහාරයට ගැනීමට පුරුදුව සිටි එක් තරුණයෙක් එක්තරා වැසි දවසක තුවක්කුවක් ද ගෙන හාවුන් දඩයමේ ගියේය. ඔහු වැඩි දුර යන්නට පළමු මහා සුළඟක් හමන්නට විය. මේ තරුණයා ඒ ගැන නොතකා වැස්සේ තෙමෙමින් ඉදිරියට ගියේ ය. එක් වරම උස පොල් ගසක් මැදින් කැඩී බිම පතිත විය. එය වැටුනේ මේ දඩයක්කාර තරුණයාගේ හිස මතටය. ඔහුගේ මරණය එතැනම සිදු විය. මෙසේ ගස් කඩා වැටී පාරේ යන වාහනවල සිටින්නන් ද මිය ගිය පුවත් අපට අසන්නට ලැබේ. මෙවැනි කතා ඔබ අසා ඇතුවාට සැක නැත. කර්මය හා කර්ම විපාක ගැන බෞද්ධයන් වශයෙන් අප හොඳින් අවබෝධ කරගත යුතුය.

''අප කරන හැමදෙයක් ම කර්මයක් වනවාදැ'යි එක් ශිෂ්‍යයෙක් ගුරුතුමාගෙන් ඇසී ය.

'' නැහැ. නැහැ. අපගෙන් සිදුවන ඇතැම් ක්‍රියා අප හිතාමතා කරන ක්‍රියා නොවේ. ඒවා කර්ම වෙන්නේ නැහැ. සිතා මතා කරන ක්‍රියා පමණයි කර්ම බවට පත් වන්නේ.''

''සිතන්නේ නැතිව කරන ක්‍රියාවන් තිබෙනවාදැ'යි තව ශිෂ්‍යයෙක් ප්‍රශ්න කළේය. එයට වෙනත් ශිෂ්‍යයකුගෙන් ලැබුණ පිළිතුර මෙයයි.

''ඇයි අපි ඇවිදින විට කුඹින් වගේ සතුන් මැරෙනවා. අපි හිතලම කුඹි පාගනවා. නොවෙයි නෙ.''

''ඔව්, ඒ වගේ නොසිතා ම අපගෙන් සිදුවන ක්‍රියා තිබෙනවා ගෙදර මකුළුදැල් කඩන විට මකුළුවන් මැරෙන්න ඉඩ තිබෙනවා. ඒත් අපි හිතලා ඔවුන් මරෙන්නේ නැහැ. වාහනයක් ධාවනය කරන විට හදිසියේ කෙනෙක් එයට හැපී අතපය කැඩෙන්න පුළුවන්. ඒ රියදුරා හිතලම ඔහු හප්පනවා නොවෙයි.

''හරි, මේ වගේ බොහෝ ක්‍රියා තිබෙනවා හිතා මතා නොකරන. ඒවාට නීතියෙන් වත් දඬුවම් ලැබෙන්නේ නැහැ.''

කර්මය ගැන බුදුරජාණන් වහන්සේ වදාරා ඇත්තේ මේ අයුරිනි. **''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි - චෙතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා''**

''මම චේතනාව කර්මය යැ'යි කියමි.
සිතා කරන කායික වාචසික මානසික ක්‍රියා කර්මය.''

හොඳ චේතනා සහිත කර්ම යහපත් ය. ඒවා කුසල කර්ම ය. නරක චේතනා සහිත කර්ම අයහපත් ය. ඒවා කුසල කර්මය. කුසල කර්මවලට හොඳ විපාක ලැබේ. අකුසල කර්මවලට නරක විපාක ලැබේ.

**ක්‍රියාකාරකම්**

01. **''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි - චෙතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා''** මෙම පාලි පාඨයෙහි තේරුම ලියන්න.

02. මේ ලොවදීම කර්මය පලදීමක් පිළිබඳ කතාවක් වැඩිහිටියකුගෙන් අසා ලියන්න.

03. කර්මය හා කර්ම විපාක විස්තර කරන්න.

## 20. පාඩම

# ලක් බුදු සසුනේ ආදිම තොරතුරු

ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් සිදුවීමකි මහින්දාගමනය. මහින්දාගමනය නම් අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ වැඩමවීමයි. එය සිදුවූයේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වසර 236 කට පසුවය. එනම් ක්‍රිස්තුන් වහන්සේ ඉපදීමටත් පෙරය. සාමාන්‍යයෙන් එම කාලවකවානුව හැඳින්වෙන්නේ ක්‍රිස්තු පූර්ව තුන්වන ශතවර්ෂය කියා ය. එකල දඹදිව රාජ්‍ය පාලකයා වූයේ ධර්මාශෝක රජතුමා ය. දේවානම්පියතිස්ස රජතුමා ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලකයා විය. මෙම රජවරු නොදුටු මිතුරෝ වූහ. ඒ නිසාම ඔවුනොවුන් අතර කලෙක සිට තුටු පඬුරු හුවමාරුව සිදු විණි. වරෙක ධර්මාශෝක රජතුමන් විසින් එවන ලද තුටු පඬුරු අතර පහත සඳහන් අගනා දහම් පඬුර ද විය.

"මම බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් සරණ ගොස් බුදු සසුනේ උපාසකයෙකු බවට පත් වූයෙමි. ඔබ ද සැදැහැ සිතින් එම උතුම් තෙරුවන් සරණ යන්න"

ධර්මාශෝක මහ රජතුමාගේ මෙම දැහැමි ඉල්ලීම දේවානම්පිය තිස්ස රජතුමන්ට ඉටු කර ගැනීමට හැකි වූයේ ශ්‍රී ලංකාවට මිහිඳු මාහිමියන් වැඩම කළ නිසාය. උන්වහන්සේ මෙහි වැඩම කළේ තනිවම නොවේ. ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන තෙරුන් වහන්සේලාත් සුමන සාමණේරයන් වහන්සේ සහ භණ්ඩුක නම් තරුණ උපාසකවරයාත් සමඟ ය.

මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන ඉහත සඳහන් ධර්මදූත පිරිස දෙවන පෑතිස් රජතුමන්ට මුණ ගැසුණේ මිස්සක පව්වේදී හෙවත් මිහින්තලාවේදී ය. එදා පොසොන් පුර පසළොස්වක පොහෝ දිනයකි. දෙවන පෑතිස් රජු තම පිරිසත් සමඟ දඩ කෙළියට ගියේ මිස්සක පව්ව ප්‍රදේශයට ය. දඩ කෙළිය නම්, ක්‍රීඩාවක් හැටියට සතුන් දඩයම් කිරීමයි.

හාමුදුරුවන් දක පුරුදු නැති තිස්ස රජුට තමන් වහන්සේ ඇතුළු පිරිස මිහිඳු මාහිමියන් විසින් හඳුන්වනු ලැබුවේ පහත සඳහන් පරිදිය.

සමණා මයං මහාරාජ - ධම්මරාජස්ස සාවකා
තවේව අනුකම්පාය - ජම්බුදීපා ඉධාගතා

" මහාරජ, අපි ධර්මරාජයන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙමු. ඔබට ම අනුකම්පාවෙන් දඹදිව සිට මෙහි පැමිණියෙමු". මෙම ප්‍රකාශයත් සමඟ රජුගේ සිහියට නැගුනේ සිය මිතුරු ධර්මාශෝක මහ රජු විසින් කලින් එවන ලද දහම් පඬුර සහිත හසුන ය. මිහිඳු මාහිමි සහ රජතුමා අතර පැවති පිළිසඳරකින් පසුව ප්‍රශ්න සහ උත්තර වශයෙන් පහත සඳහන් සංවාදය සිදුවිය.

(අ) අඹ ප්‍රශ්නය

- මහරජ, මේ ගස කුමක් ද?
  මේ ගස අඹ ගසකි.
- මේ අඹ ගස හැර තවත් අඹ ගස් තිබේ ද?
  බොහෝ අඹ ගස් ඇත.
- මේ අඹ ගස ද ඒ අඹ ගස් ද හැර වෙනත් ගස් තිබේ ද?
  බොහෝ ගස් තිබේ. ඒවා අඹ නොවේ.
- ඒ අඹ ගසුත්, අඹ නොවන ගසුත් හැර තවත් ගස් තිබේ ද?
  ඇත ස්වාමීනි. ඒ මේ අඹ ගස ය.
- මහරජ ඔබ නුවණැත්තෙකි.

(ආ) ඤාති ප්‍රශ්නය

- මහරජ, ඔබට නෑයෝ සිටිත් ද?
  ස්වාමීනි, බොහෝ නෑයෝ සිටිති.
- මහරජ, ඔබට නොනෑයෝත් සිටිත් ද?
  නෑයන්ට වඩා නොනෑයෝ සිටිති
- ඒ නෑයනුත් නොනෑයනුත් හැර වෙනත් අයෙක් ඇත් ද?
  ඇත, ස්වාමීනී ඒ මම ය.
- මැනවි මහරජ ඔබ, නුවණැතියෙකි.

රජුගේ බුද්ධිමත් භාවය ගැන පැහැදීමට පත් මිහිඳු මාහිමියෝ චූලහත්ථිපදෝපම සූත්‍රයෙන් දහම් දෙසූහ. බණ ඇසූ රජු ඇතුළු පිරිස තුනුරුවන් සරණ ගියහ. භණ්ඩුක උපාසකවරයාගෙන් ධර්මදූත පිරිස ගැන වැඩිමනත් තොරතුරු දැනගත් රජතුමා මහත් සතුටට පත් විය.

පිරිස නික්ම ගිය පසු පැවිදි උපසපන් කරනු ලැබූ භණ්ඩුක උපාසකතුමා රහත් හිමි නමක් බවට පත්විය. අනතුරුව රැස් වූ දෙව් දේවතාවන් සහිත පිරිසට මිහිඳු මාහිමියන් දහම් දෙසූයේ සමචිත්ත පරියාය සූත්‍රයෙනි. රජතුමන් විසින් පෙරදින කරන ලද ආරාධනාවට අනුව නගරයට වැඩම කළ ධර්මදූත පිරිස රජමාළිගයෙහි වඩා හිඳුවා දන් පැන් පිරිනමන ලදි. එම අවස්ථාවෙහි මිහිඳු මාහිමියන් විසින් දෙසන ලද බණ ඇසූ අනුලා දේවිය ඇතුලු විශාල පිරිසක් සෝවාන් ඵලයට පත් වූහ. අනුලා දේවිය යනු මහානාග නම් යුව රජුගේ බිසවකි. ඒ පිරිසට අසන්න ලැබුනේ විමානවත්ථු, පේතවත්ථු සහ සච්ච සංයුක්ත මාතෘකා කර දේශනා කළ බණ වේ.

මහ සඟරුවන දැකීමට පැමිණි නගරවැසියන්ට රජ මැඳුර ඉඩ මදි වූයෙන් මඟුල් ඇත් හල ද රැස්වීම් ශාලාවක් බවට පත් කෙරිණි. එය ද ප්‍රමාණවත් නොවූ නිසා නන්දන වනයෙහි එළිමහන් සඟරුවනට වැඩහිඳීමට සලස්වන ලදී. මඟුල් ඇත් හලේදී දේවදූත සූත්‍රයෙන් ද නන්දන වනයේදී බාලපණ්ඩිත සූත්‍රයෙන් ද මිහිඳු මාහිමියෝ දහම් දෙසූහ.

නන්දන වනය නගරයට ආසන්න බැවින් රාත්‍රී කාලය වැඩ සිටීමට එය නුසුදුසු බව මිහිඳු මාහිමියෝ පැවසූහ. ඒ සඳහා මහමෙව්නා උයන පිළියෙල කරන ලද අතර පසුව එය සංඝ රත්නයටම පූජා කෙරිණි. පසුකාලයේ මහා විහාරය නමින් ප්‍රසිද්ධියට පත්වූයේ මෙම උයනෙහි ගොඩනඟන ලද ආරාමයයි.

එහි සැලසුම පිළියෙල වූයේ ද මිහිඳු මහ රහතන් වහන්සේගේ උපදෙස් පරිදිය. උයන සඟසතු කර පූජා කිරීමෙන් අනතුරුව රජතුමන් සමඟ උයනෙහි චාරිකා කළ මිහිඳු මාහිමියන් වහන්සේ මහාථූපය,

සීමාමාලකය ආදිය පිහිට තැන් පෙන් වූ බව සඳහන් වීමෙන් එය පැහැදිලි වේ.

මහින්දාගමනයෙන් මසක් ගතවීමට පෙරම දේශීය භික්ෂු පිරිසක් ඇති විය. ඒ දෙවන පෑතිස් රජුගේ බෑණනු කෙනෙකු වූ මහා අරිට්ඨ ඇමතිවරයා තවත් සහෝදරයන් පනස් පස් දෙනෙකු සමඟ පැවිදි වීමෙනි. ලක්දිව බුදු සසුන ස්ථිරව පිහිටීමට එය මහත් පිටුවහලක් විය. මුලදීම බණ අසා සකදාගාමීව සිටි අනුලා දේවිය ඇතුළු කාන්තාවන් භික්ෂූන් වහන්සේට පැවිදි කළ නොහැකි බව මිහිඳු මහ රහතන් වහන්සේ පැවසූහ. උන් වහන්සේ දෙවන පෑ තිස් රජුට ලබා දුන් උපදෙස් මත සංඝමිත්තා තෙරණියන් වහන්සේ ප්‍රධාන භික්ෂුණීන් වහන්සේ දඹදිව සිට වැඩම කරවා ගැනීම නිසා අනුලා දේවිය ඇතුළු කාන්තාවන්ට පැවිදි වීමට හැකිවිය. ඒ ශ්‍රී ලාංකේය භික්ෂුණී සමාජයේ ආරම්භයයි. සංඝමිත්තා තෙරණිය යනු මිහිඳු මාහිමියන්ගේ නැගණියයි. අනුරාධපුරයේ වැඩ සිටින ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරනු ලැබුවේ ද එම තෙරණින් වහන්සේ විසිනි. බෝධීන් වහන්සේ වැඩමවීම ලක් බුදු සසුනේ අතිශය වැදගත් සිද්ධියකි.

දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ වූ තවත් වැදගත් සිදුවීමක් නම් ශ්‍රී ලංකාවට සර්වඥ ධාතු වැඩමවීම ය. බුදුරජාණන් වහන්සේගේ අකු ධාතුව ඇතුළු ශාරීරික ධාතු රැසක් ද පාත්‍රා ධාතුව ද වැඩම කළේ ධර්මාශෝක රජතුමාගේ සහාය ඇතුවය. මිහිඳු මාහිමියන්ගේ උපදෙස් මත ඒ සඳහා දඹදිවට වැඩම කළේ සුමන සාමණේරයන් වහන්සේ ය. අකු ධාතුව නිදන් කර, ගොඩනැගූ දාගැබ ථූපාරාමයයි. එය මහින්දාගමනයෙන් පසුව ලක්දිව ඉදිකළ මුල්ම චෛත්‍යය යි.

මහින්දාගමනය නිසා උතුම් බුදු සසුන අපේ රටට ලැබුණු අතර එය ස්ථිරවම හා ශක්තිමත්ව පවත්වා ගැනීමට අවශ්‍ය දේශීය භික්ෂු පරපුරක් ද බිහි විය. සංඝමිත්තා තෙරණීන් වහන්සේගේ වැඩම වීමත්, ඒ නිසාම භික්ෂුණී පරපුරක් මෙරට ඇති වීමත් මහින්දාගමනයේම ප්‍රතිඵලයකි. භික්ෂුණී සමාජය අනුරාධපුර යුගයේම අභාවයට ගිය නමුත් භික්ෂු සමාජය අද දක්වාම පැවැත ගෙන එයි. මහින්දාගමනයේම ප්‍රතිඵලයක් වශයෙන් අපට ලැබුණු ශ්‍රී මහා බෝධීන් වහන්සේ අදත් වැඩ සිටීම

ආශිර්වාදයකි. ජීවමානව වැඩ සිටින බුදුරජාණන් වහන්සේට මෙන් මහත් ගෞරවයෙන් හා ශ්‍රද්ධාවෙන් සර්වඥ ධාතූන් වහන්සේට අදත් අපි වන්දනා කරමු. ධාතූන් වහන්සේලා තැන්පත් කර දාගැබ් ගොඩනගමු. ඒ ශාසනික සිරිත් ආරම්භ වූයේද මහින්දාගමනයේ ප්‍රතිඵලයක් වශයෙනි. දෙවන පැතිස් රජතුමා ඇතුළු රාජකීයයන් මුලදීම් තෙරුවන් සරණ ගිය නිසා බුදු දහම රජයේ ආගම බවට පත්විය. බුදු සසුන ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම රජයේ වගකීම බවට පත් වූයේ එම යුගයේමය. සමාජයේ සෑම අංශයක් ගැනම සලකා බැලූ විට මහින්දාගමනය තරම් සිංහල ජන ජීවිතයට බලපෑ වෙනත් සිද්ධියක් නැති තරම් ය. මිහිඳු මා හිමියන්, අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ යනුවෙන් හඳුන්වනු ලබන්නේ උන් වහන්සේගේ වැඩමවීම මෙරට ජන ජීවිතය නව මගකට යොමු කළ බැවිනි.

### ක්‍රියාකාරකම්

01. මිහිඳු මාහිමියන් ලක්දිවට වැඩම කළ මුල් දිනවල කරන ලද දේශනා 05 ක් නම් කරන්න.

02. බුදු සසුන මෙරට ස්ථිරවම පිහිටුවීමට මිහිඳු මහරහතන් වහන්සේ ගත් ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.

### පුහුණුවට

අහං බුද්ධං ච ධම්මං ච සංඝං ච සරණං ගතො  
උපාසකත්තං දේසේසිං සක්‍යපුත්තස්ස සාසනේ

ත්වම්පිමානි රතනානි උත්තමානි නරුත්තම  
චිත්තං පසාදයිත්වාන සද්ධාය සරණං වජ

- මහාවංස එකොළොස්වන පරිච්ඡේදය 34, 35 ගාථා -

# 21. පාඩම

## දස කුසල් හා දස අකුසල්

මහ සඟරුවන පිරිවරාගෙන චාරිකාවේ වඩින බුදුරජාණන් වහන්සේ දිනක් සාලා නැමැති ගමට වැඩියහ. බුදුරජාණන් වහන්සේ පිළිබඳ කීර්ති රාවය මෙ ගමට ද පැතිර තිබිණ. සාලා ගම්වැසි බ්‍රාහ්මණයෝ බුදුගුණ අසා තිබුණත් බුදුරදුන් දැක නොසිටියහ. එනිසා එදින උන්වහන්සේ හමුවට පැමිණ තම තමන් රිසි පරිදි වැඳ පුදා පසෙකින් හිඳ ගත්හ. ඉන්පසු, දිගු කලෙක සිට තමන්ගේ සිතෙහි බල පැවැත්වූ ප්‍රශ්නයක් ඉදිරිපත් කළහ.

ස්වාමීනි, ඇතැම් මිනිසුන් මිය ගිය පසු නිරයේ උපදින බව, දුගතිගාමී, වන බව අප අසා තිබෙනවා. තවත් සමහරු මියගිය පසු සුගතිවල, සැප ඇති තැන්වල උපදින බව අසා තිබෙනවා. ස්වාමීනි, මරණින් මතු ඇතමුන් නරකවල හා දුගතිවල උපදින්නත්, ඇතමුන් සුගතිවල, සැප ඇති තැන් වල උපදින්නත් හේතු මොනවාද?

ගෘහපතියෙනි, අධර්මයෙහි හැසිරෙන, අයහපතෙහි හැසිරෙන අය මරණින් මතු උපදින්නේ නිරයවල, දුගතිවල. ධර්මයෙහි හැසිරෙන යහපතෙහි හැසිරෙන අය උපදින්නේ සුගතිවල, සැප අති තැන්වල.

ස්වාමීනි, කෙටියෙන් කළ ඒ දෙසුම වටහා ගන්නට අපට අපහසුයි. කරුණාකර ඒ ගැන තව ටිකක් විස්තර සහිතව දේශනා කරනවා නම් අපට බොහෝ ප්‍රයෝජනවත් වේවි.

එසේ නම් හොඳින් අසා ගන්නැයි බුදුහාමුදුරුවෝ විස්තර වශයෙන් කරුණු පැහැදිළි කර වදාළහ.

ගෘහපතියෙනි, මිනිසුන් කයින් කරන අකුසල් තුනක් වචනයෙන් කරන අකුසල් සතරක් සහ සිතින් කරන අකුසල් තුනක් තිබෙනවා.

සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වැරදි ලෙස හැසිරීම කයින් කරන අකුසල් තුනයි.

බොරුකීම, කේලාම්කීම, පරුෂ වචනකීම හා හිස් ප්‍රලාප දෙඩීම වචනයෙන් කරන අකුසල් සතරයි.

දැඩි ලෝභකම, ක්‍රෝධය සහ මිථ්‍යාදෘෂ්ටිය සිතෙන් කරන අකුසල් තුනයි.

මේ අකුසල් දහය දස අකුසල් නම් වේ. දස අකුසල් කරන අය යෙදෙන්නේ අධර්ම චර්යාවක, විසම චර්යාවක. මේ දස අකුසලයෙන් වෙන්වීම දස කුසල් නම් වේ. දස කුසලයෙහි යෙදෙන අය ධර්ම චර්යාවක යෙදෙනවා. සම චර්යාවක යෙදෙනවා බුදුරජාණන් වහන්සේ මෙහිදී දස අකුසල් හා දස කුසල් පිළිබඳ වෙන වෙනම දීර්ඝ ලෙස විස්තර කළහ. එසේම, දස අකුසල් කරන අය නිරයෙහි හා දුගතිවල මරණින් මතු උපදින අතර දස කුසල් කරන අය සුගතිවල, සැප ඇති තැන්වල උපදින බවත් වදාරා තව ද කරුණක් අවධාරණය කළ සේක. ඒ දස කුසල් තව දුරටත් දියුණු කරගත හොත් මිය යෑමට පළමු මේ ජීවිතයේ දීම මගඵල ලැබීමට වුව ද පුළුවන් බවය.

මේ දේශනාවට සවන් දුන් බමුණු ගෘහපතියෝ ඉතා සතුටට පත් වී, ඒ දහම් කරුණු පිළිගෙන, තෙරුවන් සරණ ගිය උපාසකයන් බවට පත් වූහ. දස අකුසල් හා දස කුසල් ගැන අපට තේරුම් ගත හැකි පරිදි වෙන වෙනම සොයා බැලීමට අපි දැන් උත්සාහ කරමු.

**01.** ප්‍රාණඝාතය හෙවත් සතුන් හා මිනිසුන් මැරීම අකුසලයකි. මිනිසුන් හා සතුන් මැරීමෙන් වැළකීම කුසලයකි. මිනිසුන් මෙන්ම සතුන් මරණයට හා දඬුමුගුරුවලට බියවන බව බුදු දහම උගන්වන කරුණකි. ඒ නිසා මිනිසකු මෙන්ම සතකු ද මැරීම බරපතල වරදකි. බෞද්ධයෝ සියලු සතුන් මැරීමෙන් වැළකී සිටිති. සියලු සතුනට මෛත්‍රී සිත පතුරුවති.

**02.** අදත්තාදානය හෙවත් අන් අය සතු, නොදුන් දෙයක් සොර සිතින් ගැනීම අකුසලයකි. එසේ ගැනීමෙන් වැළකීම කුසලයකි. මිනිසුන්ට

ජීවත් වීම සඳහා පෞද්ගලික දේපල ද, පොදු දේපල ද අවශ්‍ය ය. ඒ නිසා, ඒ ඒ අය සතුදේ ඒ අයගේ අවසරයෙන් තොරව ගැනීම වරදකි. සොරෙන් ගැනීම මෙන්ම, නුදුන් දෙයක්, අයිතිකරුගේ අනුමැතිය නැතිව ගැනීම ද වරදක් ම බව සැලකිය යුතුය.

**03.** කාම මිථ්‍යාචාරය යනු කාමයෙහි වරදවා හැසිරීම යි. අඹුසැමියන් වශයෙන් එකට ජීවත් වීම වරදක් ලෙස බුදුදහම නොපිළිගනියි. වැරදි වන්නේ අන් ස්ත්‍රීන් හෝ අන් පුරුෂයන් සමග කාමයෙහි හැසිරීමයි. එසේ හැසිරීම අකුසලයකි. එයින් වැළකීම කුසලයයි.

**04.** මුසාවාදය යනු බොරුකීමයි. බොරුකීම අකුසලයකි. බොරුවෙන් වැළකී සිටීම කුසලයකි. සිදු නොවූ දේ සිදු වූ දේ ලෙස ද, සිදු වූ දේ සිදු නොවූ දේ ලෙස ද කීම බොරුකීම නම් වේ. බොරු කියන්නාට නොකළහැකි පාපයක් නැති බව දහමෙහි පෙන්වා දී තිබේ. බොරුවෙන් වැළකී සත්‍ය වචනම කතා කළ යුත්තේ ඒ හෙයිනි.

**05.** පිසුණාවාචා යනු කේලාම් වචන ය. කේලාම් කීම අකුසලයකි. කේලමෙන් වැළකීම කුසලය යි. සමඟිව, එකමුතු වී සිටින අය භේද භින්න කිරීමට කියන දේ කේලාම් ය. වෙන් වෙන්ව භේද භින්නව සිටින අය එකමුතු කිරීම සඳහා, සමඟිවීම සඳහා කතා කිරීම බෞද්ධකම ය. එය කුසලයකි.

**06.** ඵරුසාවාචා යනු රළු ගොරෝසු අප්‍රිය වචනය. සිත් රිදවන වචනය. ඒවා කතා කිරීම අකුසලයකි. එයින් වැළකීම කුසලයකි. කතා කළ යුත්තේ ප්‍රිය මනාප, අසන්නන්ගේ සිත් සනසන යහපත් වචන ය.

**07.** සම්ඵප්පලාප හෙවත් ප්‍රලාප යනු හිස් වචන ය. ප්‍රලාප දෙඩීම අකුසලයකි. එයින් වැළකීම කුසලය යි. ප්‍රලාපවලින් සිදුවන්නේ කාලය විනාශ වීම හා අයහපතක්ම ය. ඒ නිසා ඒවා අකුසල ය. ඒවායින් වැළකී අර්ථවත් වචන හෙවත් යහපතක්ම සිදුවන වචන කිව යුතුය.

**08.** අභිජ්ඣා හෙවත් දැඩි ලෝභකම අකුසලයකි. එහි ලක්ෂණය අනුන්ගේ දේට පවා ආශා කිරීමය. එයින් වැළකීම කුසලයකි. අභිජ්ඣාවෙන් වෙන් වීම ත්‍යාගශීලි බව ය.

**09.** ව්‍යාපාදය නම් තරහවයි. ක්‍රෝධය යි. එය ද බරපතල අකුසලයකි. එයින් වැළකීම කුසලය යි. එයට විරුද්ධ සිතුවිල්ල මෛත්‍රිය යි. සැම සතුන් වෙත මෛත්‍රිය පතුරුවන්නෙකි, බෞද්ධයා.

**10.** මිච්ඡාදිට්ඨි යනු වැරදි දැක්මයි. කර්මය හා කර්ම විපාක පිළිනොගැනීම මෙයින් අදහස් වන මූලික කරුණය. මිථ්‍යාදෘෂ්ටිය අකුසලයකි. සම්‍යක් දෘෂ්ටිය හෙවත් නිවැරදි දැක්ම කුසලය යි. එයින් අදහස් වන්නේ කර්මය හා කර්ම ඵලය විශ්වාස කිරීම යි.

මෙසේ දස අකුසල් ද දස කුසල් ද වෙන්වෙන් ව දැනගෙන දස කුසලයෙහි යෙදීමට බොදු දරුවන් වශයෙන් අප ඉටා ගත යුතු ය.

**ක්‍රියාකාරකම්**

01. දස අකුසල් හා දස කුසල් කායික, වාචසික, මානසික, ක්‍රියා වශයෙන් වෙන් කොට දැක්වෙන සටහනක් සකස් කරන්න.

02. අපේ දිනපතා ජීවිතයේ දී ප්‍රාණඝාතයෙන් වෙන්වීමට යොදා ගත හැකි අවස්ථා පහක් ලියන්න.

03. කට රැක ගැනීමට නොහැකි වුවහොත් සිදුවන අයහපත විස්තර කරන්න.

පැවරුම

01. දස අකුසල්වලට අදාළව ලෝවැඩ සඟරාවෙහි ඇතුළත් වදන් සොයා පන්තියෙහි ප්‍රදර්ශනය කරන්න.

# 22. පාඩම

## උතුම් අභිලාශී තෙරණිය

දහම් පාසලේදී මෙන්ම පාසලේදී ද අපි ගිහි - පැවිදි චරිත කථා උගනිමු. චරිත කථා උගත යුත්තේ ඒවායේ ඇතුළත් උසස් චරිත ලක්ෂණ චරිතායනය කර ගැනීමටයි. බෞද්ධ කාන්තාවන් අතර ශ්‍රේෂ්ඨ කාන්තාවක වූ යශෝධරාව පිළිබඳ ව අපි මෙම පාඩමෙන් ඉගෙන ගනිමු.

යසෝධරාව මහාමායා දේවියගේ සොහොයුරෙකු වූ සුප්‍රබුද්ධ රජතුමාගේ හා අමිතා බිසවගේ දියණියයි. ඇය රූපයෙන් හා ගුණයෙන් උසස් තැනැත්තියක ලෙස ප්‍රකටව සිටියාය. ඇගේ රූපශ්‍රීය නිසාම ස්වර්ණ බිම්බය යන අරුතින් බිම්බාදේවි යන අපර නාමයෙන් ද ප්‍රසිද්ධ වූවාය.

ජාතක පොත් වහන්සේට ඇතුළත් ජාතක කතාවල සඳහන් වන පරිදි යසෝධරාව බුදු බව පතන බෝසත්වරයෙකුට ස්වාමි දියණියක වීමට ප්‍රාර්ථනා කරගෙන පැමිණි තැනැත්තියකි. සඳකිඳුරු ජාතකයේදී බෝසතුන්ගේ දිවි ගැලවූ සඳකිඳුරිය ඇයයි. වෙසතුරු අත්බැව්හිදී මිහිකත ගුගුරුවා තම දරුවන් දන් දී දාන පාරමිතාව පිරීමට සහාය දුන් මන්ද්‍රී දේවිය ඇයයි. මෙලෙස තම ස්වාමියාට බුද්ධ කාරක ධර්ම සම්පූර්ණ කර ගැනීමට තම ජීවිතයේ බොහෝ දේ කැප කළ උත්තමාවියක ලෙසද යසෝධරාව හඳුනාගත හැක. රාජ්‍යය දන් දුන් විට ඇය ද රජ සැපත් හැර දමූවාය. මහණ දම් පුරණ විට ඇයද හිමියා සමග වල් වැද දුක් විඳිමින් බෝසතුනට උවටැන් කළාය. දරුවන් යාචක, රාක්ෂසාදීන්ට දන් දෙන විට හඬා වැලපුනත් පසුව ඉවසීමෙන් දුක නැති කර ගත්තේ තම ස්වාමියා බුදු බව පතන කෙනෙකු වූ නිසා ය.

හිතේ නැඟුණු දුක් වේදනාව ඉවසා දරාගත් යසෝදරාව තම හිමියාගේ උතුම් ප්‍රාර්ථනය සමෘද්ධිමත් කර ගැනීමට සතුටු සිතින් ආශිර්වාද

කිරීමට තරම් ගුණවත් වූවාය. ඇයගේ පති භක්තිය යසෝදරාවත දක්වන්නේ මෙලෙසිනි.

කාරණාව බුදු වෙනවා ලකුණු දූනේ
නැර කැටුව ආවා මම සරණ ගෙනේ
භාවනාව තොර නොකරමි සිතින් අනේ
මාළිගාව අඳුරැයි අද සුවාමිනේ

සැළලේ තියෙන කොයි දේවත් රස වේවා
වලේ බඹරු ලෙස පිරිවර වැඩි වේවා
අව්වේ තියෙන රැස් මාලා අඩු වේවා
ගව්වෙන් ගව්ව දිව මාළිග සෑදේවා

සිදුහත් බෝසතුන් සමග සරණ බන්ධනයට පිවිසි යසෝධරාව රාහුල කුමාරයාගේ මව වූවාය. එහෙයින්ම ඇය "රාහුල මාතා" යන නාමයෙන්ද ප්‍රකට වූවාය. සතර පෙර නිමිති දකීමෙන්, රජ සැපත පිළිබඳ කළකිරී සිටි සිදුහත් කුමාරයා, රාහුල පුතු උපන් දිනයේදීම අභිනිෂ්ක්‍රමණය කළේය. එයින් ඇති වූ චිත්ත පීඩාව ඉවසා දරාගත් යසෝධරාව, තම ස්වාමියා ඈත වනයේ තවුස් දිවියක් ගත් කරමින්, කසාවත් හඳින බව දැන, ඇය ද මාළිගය තුළ සැප සොහුනට අඩු ජීවිතයක් ගත කළාය.

පිය මහ රජුගේ ආරාධනයෙන් කිඹුල්වතට වැඩම කළ බුදුරජාණන් වහන්සේ. මහ සඟන පිරිවරා පිඬු සිඟා වඩිනු දුටු යසෝධරාව, තම පුත් රහල් කුමරුට ඔහුගේ පියතුමන් පෙන්වූයේ, "චක්ක වරඞ්කිත රත්ත සුපාදෝ" ආදි ගාථා කියමින් බුදුරජාණන් වහන්සේගේ රූපශ්‍රීය වර්ණනා කරමිනි.

රජ මාළිගයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ දැක වැඳ ගැනීමට ඇය නොපැමිණියාය. බුදුරජාණන් වහන්සේ ඇය සතු අප්‍රමාණ ගුණය සිහිකර පිය රජතුමන් ද කැටුව යසෝධරාවගේ කුටිය වෙතට වැඩම කළහ. එහිදී පිය මහ රජු පසුගිය කාලය තුළ යසෝධරාව පතිභක්තිය බිඳක්වත් අඩු නොකොට කල් ගෙවූ අයුරු ඇය පසසමින් විස්තර කළේය. එවිට බුදුරජාණන් වහන්සේ ඇය මේ භවයේදී

පමණක් නොව, නුවණ නොමේරූ සඳ කිඳුරුව උපන් කලදී පවා තම පතිව්‍රතා බලයෙන් තමන් වහන්සේගේ ජීවිතය රැකගත් බව ප්‍රකට කරමින් චන්ද කින්නර ජාතකය වදාළහ.

මහා ප්‍රජාපතී දේවිය පැවිදි වූ බව හා භික්ෂුණී සංඝ සමාජය පිහිට වූ ආරංචිය ලද යසෝදරාව, තමා වෙත පැවරී තිබුණු සියලු වස්තුව ඥාතීන්ට පවරා දී, ප්‍රජාපතී ගෝතමී තෙරණිය වෙත ගොස් පැවිදි උපසම්පදාව ලැබුවාය. පසුව බුදු රජාණන් වහන්සේ වෙතින් කමටහන් ගෙන බවුන් වඩා රහත් බව ලැබීමත් සමග, ඇය විශිෂ්ට වූ අභිඥා ඥාණද ලැබුවාය. භික්ෂුණී සමාජයේ එතරම් උසස් අභිඥා ඥාණ ලද වෙනත් භික්ෂුණියක නොවූවාය. භික්ෂුණීන් වහන්සේලාට අග තනතුරු පිරිනැමීමේදී යශෝධරා තෙරණිය බුදු රජාණන් වහන්සේ වෙතින් අභිඥාලාභී භික්ෂුණීන් අතුරින් අග තනතුර ලැබූහ. ඇයට මෙම උතුම් අග පදවිය ලද හැකි වූයේ පෙර කරන ලද මහත් වූ කුසලයක අනුසස් වශයෙනි. එය මෙසේය.

පියුමතුරා (පදුමුත්තර) බුදු රජාණන් වහන්සේගේ කාලයෙහි හංසවතී නුවර එක් කුල කුමරියක විසූවාය. දිනක් ඇය තම මව් පියන් ද සමග දහම් ඇසීමට විහාරයට ගියාය. බණ අවසානයේ පියමතුරා බුදු රජාණන් වහන්සේ සිවු පිරිස් මැද මහත් වූ අභිඥා ඇති භික්ෂුණීන් අතුරින් එක් භික්ෂුණියකට අග්‍රස්ථානය පිරිමනු දැක සතුටුව, "මමත් කෙදිනක හෝ අභිඥාලාභී භික්ෂුණීන් අතර අග්‍රස්ථානය ලබන්නෙමි" යි අදිටන් කරගෙන ඊට උවමනා කුසල් දහම්හී යෙදුනාය. පසුව යසෝධරාව ලෙස උපන්නේ ඇයයි. සසර දී ඇය කරන ලද කුසල් දහම්හී අනුසස් බලයෙන් අභිඥාලාභී භික්ෂුණීන් අතරින් අග්‍රස්ථානය ලැබුවාය. තෙරණී නාමාවලියෙහි උන් වහන්සේගේ නම සඳහන් වන්නේ භද්දකච්චානා ක්‍යා යි. ඉවසීම, පතිභක්තිය, සැදැහැ ගුණය, කුසලයෙහි පමා නොවීම, අදිටන වැනි උසස් ගුණාංග හුරු කළ නිසාම ලොව විශිෂ්ට කාන්තා රත්නයක් වූ යසෝධරා තෙරණියගේ චරිතය ආදර්ශයට ගැනීමට අපි හැම විටෙකම උත්සාහ කරමු.

**ක්‍රියාකාරකම්**

1. යසෝධරා තෙරණියගේ චරිතය තුළින් මතු කරගත හැකි උතුම් ගුණාංග 4ක් ලියන්න.

2. යසෝධරාව බෝසතුනට භාර්යාව වීමට පතාගෙන ආ බවට නිදසුන් ගෙනහැර දක්වන්න.

3. කුසලයට සැප විපාක ලැබෙන බව යසෝධරා තෙරණියගේ කථාවෙන් පෙන්වා දෙන්න.

4. යසෝධරාවතේ ඇතුළත් කවි කීපයක් කට පාඩම් කර ගන්න.

පුහුණුවට

ලා දළු බෝපත් සෙමින් සැලෙන සේ යසෝදරා දේවී
වාවනු බැරි තැන රහසේ හැඬුවා
පෙර සංසාරේ ඇසුර මතක් වී
ලා දළු බෝපත් සෙමින් සැලෙන සේ

ලේන කුලේ සිට ආ ගිය මග තොට
සිටියා නොසැලෙන පහන් ටැඹක් වී
නිවන් දකින තුරු මේ සංසාර්
පසුපස ආවා සෙවනැල්ලක් වී

තැලී සෙනේ සිත සැලී හඬන විට
වැටී දෙපා ළඟ යසෝදරාවෝ
පිපී නිවන් මල් සාදුකාර දී
නිවී පහන් විය උදෑසනක් සේ

ගායනය - කරුණාරත්න දිවුල්ගනේ
පද රචනය - රඹුකන සිද්ධාර්ථ හිමි
තනුව - එච්.එම්. ජයවර්ධන

## 23. පාඩම

## අපේ අවමඟුල් සිරිත් විරිත්

කෙනෙකු මිය ගිය පසුව එතැන් සිට අවමඟුල් කටයුතු නිමාවන තෙක් අනුගමනය කෙරෙන චාරිත්‍ර, සිරිත් වශයෙන් හඳුන්වනු ලැබේ. විරිත් වශයෙන් හැඳින්වෙන්නේ එම කාලය තුළ නොකෙරෙන හා නොකළයුතු දේවල්ය. ඕනෑම ජන සමාජයක එම සමාජයට ම ආවේණික වූ අවමඟුල් සිරිත් විරිත් ඇත. ජනවර්ග මෙන්ම ආගම දහම අනුවද එම සිරිත් විරිත්වල විවිධතා හා විශේෂතා දක්නට ලැබේ. එකම ජනවර්ගයක වුවද ප්‍රාදේශීය වශයෙන් හා ආගමික පිළිගැනීම් මත යම් යම් වෙනස්කම් සහිතව අවමඟුල් සිරිත් විරිත් පවත්වනු ලැබේ. සමහර සිරිත් විරිත් කාලීන වශයෙන් හා ධර්මානුකූලව එතරම්ම වැදගත්යැ'යි සිතිය නොහැකි වුවද ඒවා හැඳින ගැනීම වැදගත්ය. ඊට එක් හේතුවක් නම් අවමඟුල තනිකරම පෞද්ගලික කාර්යයක් බවට පත් නොවී පොදු සාමාජික හා ආගමික කටයුත්තක් බවට පත් වී තිබීමයි.

මළගෙයක් යනු දුක, කණගාටුව, වේදනාව, ශෝකය මෙන්ම සංවේගය ද උපදවන තැනකි. බෞද්ධයා මළගෙදරක බාහිර පරිසරය සකස් කරන්නේ දුක, කණගාටුව, වේදනාව හා ශෝකය උපදවන ආකාරයෙන් නොවේ. සංවේගාත්මක සිතුවිලි ජනිත වන ආකාරයෙනි. බුද්ධ පින්තූර වැනි පූජාර්හ පින්තූර හා මියගිය තැනැත්තාගේ ඡායාරූපය හැර අනෙකුත් ඡායාරූප, බිත්ති සැරසිලි ආදිය තාවකාලිකව ඉවත් කිරීම හෝ කණපිට හරවා තැබීම හෝ සාමාන්‍ය සිරිතක්ව පවතී. බුලත් තට්ටුව පිළියෙල කරන්නේද කණපිට හරවා තැබූ බුලත්වලිනි. නිවස අවට සුදුකොඩි එල්ලීම, මළගෙදර එන යන අයත් නිවැසියනුත්

සුදු ඇඳුම් ඇඳීම් ආදිය කරන්නනේ එමඟින්ද සංවේගාත්මක හැඟීම් ජනනය වන බැවිනි. සුදුපාට පිවිතුරු බවේ මෙන්ම චාම් බවේද සංකේතයකි.

නිදිවැරීම සඳහා යැ'යි කියමින් සමහර ක්‍රීඩා මළගෙවල්වලට ඇතුළත් කරගෙන ඇතත් ඒවා අපේ සිරිත් නොවේ. නිවැසියන් දුකට පත්වී ඇති අවස්ථාවක විනෝද ක්‍රීඩාවන්හි යෙදීම කිසිම ආකාරයකින් උචිත වූවක් නොවේ. අපේ පැරැන්නන් මළගෙදරක රාත්‍රිය ගත කළේ සතිපට්ඨාන සූත්‍රය සජ්ඣායනා කරමින් හෝ වෙස්සන්තර ජාතකය කියවමිනි. අද ද සමහර මළගෙවල්වල පටිගත කළ සතිපට්ඨාන සූත්‍රය හෝ මරණානුස්සති ගාථා සිහින් හඬින් ඇසෙන්නට සලස්වනු ලැබේ.

බෞද්ධයාගේ අවමඟුල චාම් හා සරල වූවකි. එබැවින් දේහය තැන්පත් කිරීම සඳහා තෝරාගන්නේ වටිනාකමෙන් අඩු එහෙත් කලාත්මක භාවය ද යම්තරමකට ඇති පෙට්ටියකි. දේහය පෙට්ටියෙහි තැන්පත් කරන්නේද චාම් සරළ ඇඳුමකින් සැරසීමෙනි. ගෞරවය සඳහා දේහයට ඉහළින් වියනක් බැඳීම සිරිතය. දේහයේ හිස බස්නාහිරට සිටින සේ පෙට්ටිය තැන්පත් කිරීම පවත්නා සම්ප්‍රදායයකි. හිස පැත්තෙන් පොල්තෙල් පහනක්ද දල්වනු ලැබේ. පොල්තෙල් පහනින් නැගෙන දුම විෂබීජ නාශයක් ලෙස සැලකේ.

සමාජ සම්මතයට අනුව සමහර දවස් අවසාන කටයුතු සඳහා යොදා නොගැනේ. ඇතැම් පළාත්වල දේහය සහිත පෙට්ටිය එළියට ගන්නේ සූදානම් කරගත් නැකතකටය. මේවා බෞද්ධ සිරිත් නොව වෙනත් සංස්කෘතිවලින් එකතු වූ ඒවාය. නිවසින් පිටතට ගැනීම සඳහා දේහය වැසීමට පෙර පවුලේ කිට්ටුම ඥාතීන්ගේ අවසාන ගෞරවය දක්වේ. ආගමික වතාවත් සිදුකෙරෙන්නේ නිවසේදීය. ඇතැම් විටෙක සුසාන භූමියේදී ද සිදුකරනු ලැබේ. ඒ සඳහා ස්වාමීන් වහන්සේ වැඩමවා ගන්නේ කල්තියා ආරාධනා කිරීමෙනි. කලින් ආරාධනා කළත් උන්වහන්සේ වැඩමවා ගෙන ඒමට අඩුතරමින් එක් අයෙකු හෝ පන්සලට යාම සම්ප්‍රදාය යි. ස්වාමීන් වහන්සේ විසින් මෙහෙයවනු ලබන ශාසනික වතාවත්වලට අමතරව ගුණානුස්මරණ වශයෙන් හා ශෝක ප්‍රකාශක වශයෙන් කථා කීපයක් පවත්වන අවස්ථාද ඇත. ඇතැම් තැන්වල එම කටයුතු ශාසනික වතාවත්වලට පමණක් සීමාවේ. එකම දේ යළි යළිත් කියමින් මියගිය තැනැත්තාටත් වඩා ඔහුගේ මියගිය

ඥාතීන් ගැන වර්ණනා කරමින් දිගින් දිගට ම ගුණකථා පැවැත්වීම අනවශ්‍යය යන්න අද පවත්නා මතයයි.

අවමංගල අවස්ථාවක ස්වාමීන් වහන්සේ විසින් මෙහෙයවනු ලබන ශාසනික වතාවත් පිළිබඳ ව ද අපට දැනීමක් තිබිය යුතු ය. පන්සලේ දී දැහැත් ගොටුවක් පිළිගන්වා මූලික ආරාධනාව කර තිබුණත් අවමඟුල්පළේදී දැහැත් වට්ටියක් පිළිගන්වා යළිත් ආරාධනාව කරනුලැබේ. ස්වාමීන් වහන්සේ මුලින් කරන්නේ රැස්ව සිටින පිරිස පන්සිල්හි පිහිටුවීමයි. ඉන් අනතුරුව මතක වස්ත්‍රය පූජා කෙරේ. ඉතාම කිට්ටු ඥාතීන් මතක වස්ත්‍රය අතට ගැනීමෙන් පසුව එය සඟසතු කිරීම සඳහා ස්වාමීන් වහන්සේ විසින් පහත සඳහන් වාක්‍යය තෙවරක් කියවනු ලැබේ.

**''ඉමං මතකවත්ථං භික්ඛු සංඝස්ස දේම''** මෙම වාක්‍යයේ තේරුම **''මේ මතක වස්ත්‍රය භික්ෂු සංඝයාට පූජා කරමු''** යන්නයි. මිය ගිය තැනැත්තාට පින් පිණිස පූජා කෙරෙන වස්ත්‍රයක් බැවින් මතක වස්ත්‍රය යයි කියනු ලැබේ. මතක වස්ත්‍රය ස්වාමීන් වහන්සේ අතට පූජා කෙරුණු පසුව උන්වහන්සේ කරන්නේ අනිච්චා වත සංඛාරා... ආදී ගාථාව තුන්වරක් සජ්ඣායනා කිරීමයි. එම අවස්ථාවේ ගිහි පිරිස කරන්නේ අනිත්‍යය මෙනෙහි කිරීමයි. පැන් වඩා පින් අනුමෝදන් කිරීම ඉන් අනතුරුව සිදුවේ. පැන් වැඩීම යනු එලන ලද සුදු රෙද්දක් මත පිඟානක් සහ කෝප්පයක් තබා කෙණ්ඩියකින් එම කෝප්පයට පැන් වක්කිරීම යි. පැන් වැඩීම කීපදෙනෙකු කළත් සියලු දෙනම ''ඉදං වෝ ඤාතීනං හෝතු සුඛිතා හොන්තු ඤාතයෝ (මේ පින මියගිය ඥාතීන්ට වේවා, නෑයෝ සැප ඇත්තෝ වෙත්වා) යන්න තෙවරක් සජ්ඣායනා කරති. එම අවස්ථාවේම ''යථාවාරි වහාපූරා....'' ආදී ගාථා ස්වාමීන් වහන්සේ විසින් ද සජ්ඣායනා කරනු ලැබේ. අනුශාසනාව සිදුවන්නේ ඉන් අනතුරුවය. මියගිය තැනැත්තාගේ සැබෑ ගුණයක් වෙතොත් එය ද සිහිපත් කරමින් අවස්ථාවට සුදුසු අනුශාසනාවක් උන්වහන්සේ කරති. ගුණකථා වෙත්නම් ඒවාට ඉඩ ලැබෙන්නේ ඉන් අනතුරුවය.

සුසානභූමිය කරා පෙට්ටිය ගෙන යන විට ඉස්සර කළයුත්තේ දේහයේ දෙපා පැත්තයැයි මතයක් පවතී. වලමත හෝ සෑය මත

දේහය තැන්පත් කිරීමෙන් අනතුරුව එම වල වටා හෝ චිතකය වටා ඥාතීන් ප්‍රදක්ෂිණා කරන්නේත් මියගිය තැනැත්තාට ගෞරව පිණිසය. ප්‍රදක්ෂිණා යනුවෙන් දක්වෙන්නේ දේහය පැත්තට තම දකුණු අත සිටින සේ වටේට ගමන් කිරීමයි. දේහය ඔසවාගෙන වළ වටේ හෝ චිතකය වටේ හෝ ගමන් කිරීම තේරුමක් නැති ක්‍රියාවකි.

පෙට්ටිය වළ තුළ තැන්පත් කර ඥාතීන් විසින් පස් අහුර බැගින් දැමීමෙන් අනතුරුව සම්පූර්ණයෙන් වල වසා දමා පස් මුදුන් කෙරේ. දේහය ආදාහනය කිරීමේදී මියගිය තැනැත්තාගේ බෑණාවරුන් දෙදෙනෙකු විසින් සෑයට ගිනි දැල්වීම සාමාන්‍ය සිරිතය. සුසාන භූමියට පැමිණි අසල්වාසීන් යළිත් මළ ගෙදරට පැමිණ කථාබස් කර යෑම වැදගත් සිරිතක් ලෙස සලකනු ලැබේ. අවමඟුල් හා බැඳුණු සිරිත් විරිත් මෙහි දක්වා නැත. තමන්ට දක්නට ලැබෙන අවමඟුල් සිරිත් විරිත් දෙස බුද්ධිමත්ව හා විමසිල්ලෙන් බැලීමටත් අවිචාරවත් ක්‍රියා ඇත්නම් ඒවා බැහැර කර ධර්මානුකූල සිරිත් අනුගමනය කිරීමටත් අප පුරුදුවිය යුතු ය.

**ක්‍රියාකාරකම්**

01. මෙම පාඩම ඇසුරින් දැනගත් අවමඟුල් සිරිත් අංක පිළිවෙළට පෙළගස්වා ලියන්න.

02. මෙම පාඩමෙහි ඇතුළත් පාලි ගාථා සහ පාඨ ගුරුතුමාගෙන් සම්පූර්ණයෙන් දැනගෙන කටපාඩමෙන් කියන්න.

**පුහුණුවට**

| | |
|---|---|
| මළගෙය විනෝදය සපයන තැනක් | නොවේ |
| එතැනට කැරම් කොළ සෙල්ලම් අයත් | නොවේ |
| නිදිමත ඇතොත් නිඳුවට වරදකුත් | නොවේ |
| බුදුබණ දකින්නට මෙය හොඳ තැනක් | ලොවේ |

## 24. පාඩම

## පාළි III - පැන් හා ආහාර පූජා කිරීමේ ගාථා

අ)

සුගන්ධං සීතලං කප්පං - පසන්නං මධුරං සුභං
පානීයමේතං භගවා - පතිගණ්හාතු උත්තම

ඕජවන්තං රසවන්තං - පණීතං භෝජනං ඉමං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු උත්තම

ඉහත සඳහන් පැන් පූජා කිරීමේ හා ආහාර පූජා කිරීමේ ගාථා දෙක ශබ්ද නගා නිවැරදිව කියවීම අවශ්‍ය වේ. ඊට පසුව පදයෙන් පදයට අර්ථය කියන්නට හැකි වන පරිදි අර්ථාවබෝධය ලැබිය යුතු වේ. ඒ සඳහා පද පිළිවෙළට අනුව අර්ථය දැනගත යුතු ය.

ආ) පද පිළිවෙළ හැඳින ගනිමු

උත්තම භගවා කප්පං සුගන්ධං සීතලං පසන්නං මධුරං සුභං එතං පානීයං පතිගණ්හාතු

උත්තම ඕජවන්තං රසවන්තං ඉමං පණීතං භෝජනං අනුකම්පං උපාදාය පතිගණ්හාතු.

ඇ) තේරුම දැනගනිමු

උතුම් වූ භාග්‍යවතුන් වහන්ස, කැප වූ සුවඳ ඇති, සිසිල් වූ පිරිසිදු වූ මිහිරි වූ පැහැපත් වූ මේ පැන් පිළිගන්නා සේක්වා.

උත්තමයන් වහන්ස, ඔදවත් වූ රසවත් වූ මේ ප්‍රණීත භෝජනය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා.

ඇ) පදවල තේරුම හැඳින ගනිමු.

සුගන්ධං - සුවඳවත් වූ
සීතලං - සිසිල් වූ
කප්පං - යෝග්‍ය වූ
පසන්නං - ප්‍රසන්න වූ
මධුරං - මිහිරි වූ
සුභං - යහපත් වූ
පානීයමේතං - (පානීයං + එතං)
ඒතං - ඒ
පානීයං - පැන්
භගවා - භාග්‍යවතුන් වහන්ස
පතිගණ්හාතු - පිළිගන්නා සේක්වා
උත්තම - උතුම් වූ

ඉ) ඉහත ගාථා දෙක ඇසුරින් සරල පාලි වාක්‍ය රටා ගොඩනගන්නට ඉගෙන ගනිමු.

වාක්‍ය රටා I

| | | | |
|---|---|---|---|
| | මධුරං | පානීයං | |
| | පණීතං | භෝජනං | |
| උත්තම භගවා | මධුරං | ගිලානපච්චයං | පතිගණ්හාතු |
| | රසවන්තං | ඵලාඵලං | |
| | පණීතං | පායාසං | |
| | මධුරං | තාම්බූලං | |
| | පණීතං | භේසජ්ජං | |

වාක්‍ය රටා II

| | | | |
|---|---|---|---|
| උත්තම භගවා | නො භන්තේ | පානීයං<br>භෝජනං<br>ගිලානපච්චයං<br>ව්‍යඤ්ජනං<br>තාම්බූලං<br>පායාසං<br>භේසජ්ජං | පතිගණ්හාතු |

**වචන මාලාව**

| | | |
|---|---|---|
| රසවන්තං | - | රසවත් වූ |
| භෝජනං | - | ආහාර |
| ගිලාන පච්චයං | - | ගිලන්පස |
| ඵලාඵලං | - | පළතුරු |
| පායාසං | - | කිරි ආහාර |
| තාම්බූලං | - | දැහැත් |
| භේසජ්ජං | - | බෙහෙත් |
| අධිවාසේතු | - | පිළිගන්නා සේක්වා |
| නෝ | - | අපගේ |
| භන්තේ | - | ස්වාමිනි |
| ව්‍යඤ්ජනං | - | ව්‍යඤ්ජන |
| පරික්ඛාරං | - | පිරිකර |

**ක්‍රියාකරකම්**

1. පැන් පූජා කිරීමේ හා ආහාර පූජා කිරීමේ ගාථා නිවැරදි උච්චාරණයෙන් යුතුව කියන්න.
2. ඉහත වාක්‍ය රටා I හා II හි වාක්‍යවල සිංහල අර්ථ ලියන්න.

| | | |
|---|---|---|
| සෝ | - | හෙතෙම |
| තේ | - | ඔවුහු |
| පූජේති | - | පූජා කරයි |
| තුම්හේ | - | නුඹලා |
| අහං | - | මම |
| මයං | - | අපි |
| සබ්බං | - | සියල්ල |
| සද්ධාය | - | ශ්‍රද්ධාවෙන් |

3. **පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.**

(i) මම පන්සිල් සමාදන්වෙමි.
(ii) ශිෂ්‍යයා මල් පූජා කරයි.
(iii) ගුරුවරු පහන් දල්වති.
(iv) ඔබ පන්සලට යහි.
(v) නුඹලා සුවඳ දුම් පූජා කරහු.
(vi) අපි ගාථා සජ්ඣායනා කරමු.

**අලුත් වචන**

| | | |
|---|---|---|
| ශිෂ්‍ය | - | සිස්සෝ |
| ගුරුවරු | - | ආචාරියා |
| පහන් | - | පදීපේ |
| මල් | - | පුප්ඵානි / කුසුමානි |
| පන්සලට | - | පණ්ණසාලං |
| සිල් | - | සීලං |
| ගාථා | - | ගාථායෝ |
| දල්වයි | - | ජාලෙති |
| යයි | - | ගච්ඡති |
| සමාදන්වෙයි | - | සමාදියති |
| සජ්ඣායනා කරයි | - | සජ්ඣායති |

# 25. පාඩම

## පාළි IV - දැහැත් හා සුවඳ දුම් පූජා කිරීමේ ගාථා

අ)

නාගවල්ලි දලූපේතං - චුණ්ණ පූග සමායුතං
තාම්බූලං පතිගණ්හාතු - සතං පූජේමිදං ජිනෝ

ගන්ධම්භාර යුත්තේන - ධූපේනාහං සුගන්ධිනා
පූජයේ පූජනීයං තං - පූජා භාජනමුත්තමං

ඉහත සඳහන් දැහැත් පූජා කිරීමේ හා සුවඳ දුම් පූජා කිරීමේ ගාථා දෙක නිවැරදිව ශබ්ද නගා කියවීම අවශ්‍ය වේ. ඊට පසුව පදයෙන් පදයට අර්ථය දැනගත යුතු වේ. ඒ සඳහා පද පිළිවෙල අනුව ගාථාවන්හි අර්ථය කීමට හා ලිවීමට හැකියාව ලබාගත යුතුය.

### ආ) පද පිළිවෙළ හැඳින ගනිමු

(අහං) නාගවල්ලී දලූපේතං චුණ්ණ පූග සමායුතං ඉදං තාම්බූලං සතං පූජේමි ජිනෝ පතිගණ්හාතු.

ගන්ධසම්භාර යුත්තේන සුගන්ධිනා ධූපේන පූජනීයං පූජාභාජනං තං උත්තමං අහං පූජයේ.

### ඇ) තේරුම හැඳින ගනිමු

(මම) නාගවල්ලි දළුවලින් යුක්ත, හුණු පුවක්වලින් යුක්ත, මේ දැහැත් සත්පුරුෂයන් වහන්සේට (බුදුරජාණන් වහන්සේට) පූජා කරමි. බුදුරජාණන් වහන්සේ පිළිගන්නා සේක්වා.

සුවඳ සමූහයෙන් යුත් සුවඳ දුමින්, පරම පූජනීය වූ, පූජාවන්ට බඳුන් වූ (සුදුසු) ඒ උත්තමයන් වහන්සේ මම පුදමි.

ඇ) පදවල තේරුම හැඳින ගනිමු.

| | | |
|---|---|---|
| (අහං) නාගවල්ලී | - | නාගවල්ලි නම් වූ |
| දලූපේතං (දල+උපේත) | - | දළුවලින් යුක්ත |
| චුණ්ණ | - | සුණු හෙවත් හුණු |
| පූග | - | පුවක් |
| සමායුතං | - | යුක්ත වූ |
| තාම්බූලං | - | බුලත් |
| සතං | - | සත්පුරුෂයන් වහන්සේට |
| පූජේමි'දං (පූජේමි+ඉදං) | - | පූජා කරමි |
| ඉදං | - | මේ |
| ජිනෝ | - | බුදුරජාණන් වහන්සේ |
| පතිගණ්හාතු | - | පිළිගන්නා සේක්වා |
| ගන්ධසම්භාර යුත්තේන | - | සුවඳ සමූහයෙන් යුත් |
| සුගන්ධිනා ධූපේන | - | සුවඳ දුමින් |
| පූජනීයං | - | පරම පූජනීය වූ |
| පූජාභාජනං | - | පූජාවන්ට බඳුන් වූ |
| තං | - | ඒ |
| උත්තමං | - | උත්තමයන් වහන්සේ |
| අහං | - | මම |
| පූජයේ | - | පුදමි |

ඉ) ඔබ ඉගෙනගත් ගාථා දෙක ඇසුරින් සරල පාලි වාක්‍ය නිර්මාණය කළ හැකිය. එබඳු වාක්‍ය රටා ගොඩ නගමු.

වාක්‍ය රටා I

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අහං | ඉදං | තාම්බූලං | සතං | පූජේමි | සතො | පතිගණ්හාතු |
| මයං | ඉමානි | භෝජනානි | | පූජේම | | |

වාක්‍ය රටා II

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ත්වං | ඉමිනා | පුප්ඵෙන | බුද්ධං | පූජේහි | බුද්ධෝ | අධිවාසේතු |
| | | දීපේන | | | | |
| තුම්හේ | ඉමේහි | පුප්ඵේහි | | පූජේථ | | |
| | | දීපෙහි | | | | |

වාක්‍ය රටා III

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සෝ | ඉමං | ගිලාන පච්චයං | භගවන්තං | පූජේති | භගවා | පතිගණ්හාතු |
| | | පරික්ඛාරං | | | | |
| තේ | ඉමානි | ගිලාන පච්චයානි | | පූජෙන්ති | | |
| | | පරික්ඛාරානි | | | | |

**ක්‍රියාකරකම්**

01. දැහැත් පූජා කරන ගාථාව හා සුවඳ දුම් පූජා කරන ගාථාව නිවැරැදි ලෙස උච්චාරණය කරන්න.(සාමූහිකව කියවන්න.)

02. (ඉ) යටතේ අහං, මයං, ත්වං, තුම්හේ, සෝ, තේ යන කර්තෘ පද යොදා වාක්‍ය හයක් නිර්මාණය කරන්න.

03. වාක්‍ය රටා II හි තේරුම ලියන්න.

**04. මේවා පාලියට නඟන්න.**

(i) ඔබ මේ දානය සංඝරත්නයට පූජා කරන්න.
(ii) අපි බුදුරදුන්ට මේ පිරිකර පූජා කරමු.
(iii) උපාසක තෙමේ අටසිල් සමාදන් වෙයි.
(iv) නුඹලා මේ මල් බුදුරදුන්ට පූජා කරහු, භාග්‍යවතුන් වහන්සේ පිළිගන්නා සේක්වා.
(v) මම දැහැත් පූජා කරන ගාථාව සජ්ඣායනා කරමි. ගුරුතුමා

එය අසාවා.

(vi) ගුරුවරු මෛත්‍රියෙන් අපට දහම් කියාදෙති. අපි මැනවින් හික්මෙමු.

## අලුත් වචන

| | | |
|---|---|---|
| උපාසකතෙමේ | - | උපාසකො |
| ගුරුතුමා | - | ආචාරියො |
| අටසිල් | - | අට්ඨංග සීලං |
| මෛත්‍රියෙන් | - | මෙත්තෙන |
| අපට | - | අම්හාකං |
| මැනවින් | - | සුග්ගහීත |
| අසාවා | - | සුණාතු |
| හික්මෙමු | - | සික්ඛාම |
| කියාදෙති | - | භාසන්ති |

# 26. පාඩම

## අභිධර්මය II - අන්‍ය සමාන රාශිය

පළමු පාඩම අවසානයේදී චෛතසික පනස් දෙක කොටස්වලට බෙදීගිය අයුරු අපි ඉගෙන ගත්තෙමු. දැන් අපි එම චෛතසික රාශිවලින් අන්‍යසමාන රාශියට අයත් චෛතසික ගැන ඉගෙන ගනිමු.

### අන්‍ය සමාන රාශිය .

සබ්බචිත්ත සාධාරණ චෛතසික 07 ප්‍රකීර්ණක චෛතසික 06 යන මේ චෛතසික දහතුන අන්‍ය සමාන රාශියට අයත් වෙයි. ඒවා අකුසල රාශියත් ශෝභන රාශියත් යන රාශි දෙකට ඇතුළත් චෛතසික සමග යෙදෙන නිසා අන්‍ය සමාන යන නම යෙදී ඇත. අකුසල කුසලට අන්‍ය වන අතර කුසල අකුසලට අන්‍ය ය.

### සබ්බ චිත්ත සාධාරණ චෛතසික

පසුගිය ශ්‍රේණියේදී සිත් අසූනවයක් ඇති බව අප ඉගෙන ගෙන ඇත. එම සිත් අසූනවයෙහිම අඩු නැතිව යෙදෙන චෛතසික හතක් ඇත. ඒවාට සබ්බ චිත්ත සාධාරණ යන්නෙහි අර්ථය " සියලු සිත්වලට පොදු" යන්නයි. එම චෛතසික හත මෙසේය.

1. ඵස්ස
2. වේදනා
3. සඤ්ඤා
4. චේතනා
5. ඒකග්ගතා
6. ජීවිතින්ද්‍රිය
7. මනසිකාර

මෙහි පහත හැඳින්වෙන්නේ ඒවායින් චෛතසික කීපයක් පමණි.

<u>වේදනා චෛතසිකය</u>

ඇසට ප්‍රිය මනාප රූපයක් ලැබුණු විට සුඛ වේදනාව ඇති වේ. අප්‍රිය අමනාප රූපයක් ලැබුණු විට දුක්ඛ වේදනාව ඇති වේ. ප්‍රිය අප්‍රිය දෙකම නැති රූපයක් ලැබුණු විට උපෙක්ඛා වේදනාව ඇති වේ.

මෙසේ විවිධාකාරයෙන් ක්‍රියාත්මක වන්නේ එකම වේදනා චෛතසිකය යි. වේදනා යනු අරමුණෙහි රස විඳින ස්වභාවය යි.

<u>සඤ්ඤා චෛතසිකය</u>

කාන්තාවන් පිරිසක් අතර සිටින තම මව දකින දරුවාට ඇය තම මව ලෙස හඳුනාගත හැකිය. ඇගේ හඬ ඇසුණු විට ඒ තම මවගේ හඬ ලෙස හඳුනාගත හැකිය. මෙසේ අරමුණු හැඳින ගන්නා ස්වභාවය සඤ්ඤාවයි.

<u>චේතනා චෛතසිකය</u>

සැප දුක් විපාක ලබාදීමේ ශක්තිය ඇති චෛතසිකය චේතනාවයි. කයින් හෝ වචනයෙන් හෝ මනසින් යම් ක්‍රියාවක් කරන විට සිත සමග යෙදෙන චෛතසික අතර චේතනා චෛතසිකය ප්‍රධාන වෙයි. දන් දෙන විට ඇති වන්නේ කුසල චේතනාවයි. ඒ නිසා දන්දීම කුසල කර්මයකි. සතෙකු මරණ විට ඇතිවන්නේ අකුසල චේතනාවයි. ඒ නිසා සතුන් මැරීම අකුසල කර්මයකි.

අනෙකුත් සබ්බචිත්ත සාධාරණ චෛතසික පිළිබඳ පසුව ඉගෙනීමට ඉඩ සලසනු ඇත.

<u>ප්‍රකීර්ණක චෛතසික</u>

කුසල, අකුසල, විපාක, කිරිය ආදී සෑම සිත් වර්ගයකම සුදුසු පරිදි යෙදෙන චෛතසිකවලට ප්‍රකීර්ණක යන නම යෙදේ. මෙම චෛතසික හයක් ඇත.

1. විතක්ක
2. විචාර
3. අධිමොක්ඛ
4. වීරිය
5. පීති
6. ඡන්ද

ඇතැම් සිත්වල මෙම චෛතසික හයම යෙදේ. ඇතැම් සිත්වල 5ක් හෝ 4ක් හෝ 3ක් හෝ යෙදෙයි. ඊට අඩුවෙන් නොයෙදේ. පහත දක්වා ඇත්තේ ප්‍රකීර්ණක චෛතසික කිහිපයක කෙටි විස්තරයකි.

**වීරිය චෛතසිකය**

නොපසුබසින ස්වභාවයෙන් යුක්ත වූ වීරිය යි.

**පීති චෛතසිකය**

සිත පිනායන ස්වභාවය ප්‍රීතිය යි.

**ඡන්ද චෛතසිකය**

යමක් කිරීමට ඇති කැමත්ත ඕනෑකම ඡන්දය යි. ලෝභ සිත් දෝස සිත් ආදියේ ඡන්දය යෙදේ.

**ක්‍රියාකාරකම්**

1. අන්‍ය සමාන (අඤ්ඤ සමාන) යන වචනය යෙදී ඇත්තේ කුමන අරුතකින්ද?
2. සබ්බචිත්ත සාධාරණ යන්නෙහි තේරුම කුමක් ද?
3. හිස්තැන් පුරවන්න.

| | |
|---|---|
| ඇසට පෙනෙන රූප හඳුනා ගැනීම | රූප සඤ්ඤාව යි. |
| කනට ඇසෙන ශබ්ද හඳුනාගැනීම | ............... |
| නාසයට දැනෙන ගන්ධ හඳුනාගැනීම | ............... |
| දිවට දැනෙන රස හඳුනාගැනීම | ............... |

කයට දැනෙන ඵොට්ඨබ්බ හඳුනාගැනීම ...............
මනසට දැනෙන ධම්ම හඳුනාගැනීම ..............

4. සුඛ, දුක්ඛ, උපෙක්ඛා යන වචන නිසි ලෙස හිස්තැන්වලට යොදන්න.

(i) පිපාසයෙන් පීඩිතව සිටින විට ඇල් වතුර වීදුරුවක් පානය කිරීමෙන් ඇතිවන්නේ ........... වේදනාවයි.
(ii) ආහාර අනුභව කොට වතුර ටිකක් බීමෙන් ඇතිවන්නේ ............... වේදනාවයි.
(iii) තද උණුවතුර උගුරක් බීමෙන් ඇතිවන්නේ ............... වේදනාවයි.

5. දී ඇති ඡේදය කියවා හිස්තැන් පුරවන්න.

මිනිසෙක් අටසිල් සමාදන් වූ උපාසක මහතෙකුට ආහාර වේලක් දන්දෙයි. එහෙත් ඒ මිනිසා උපාසක මහතාගේ අගුණ කියමින් ගුණ මකමින් අන් අය සමග කථා කිරීමට ද අමතක කළේ නැත.

දන්දීම නිසා මතු භවයකදී ඒ මිනිසාට වස්තුව දේපළ ලැබෙයි. එහෙත් උපාසක මහතාගේ ගුණ මැකීම නිසා ලැබූ වස්තුව ජලයෙන් හෝ ගින්නෙන් හෝ සොර සතුරන්ගෙන් හෝ විනාශ වී යයි.

මෙම සිද්ධියේ දී දන් දෙන විට මිනිසාට ඇතිවූයේ ................ චේතනාවකි. ගුණ මැකීමේ දී ඇතිවූයේ ................ චේතනාවකි.

# 27. පාඩම

## සලකමු කළගුණ

පසුගිය වසරේ ශ්‍රේණි මට්ටමෙන් පැවති දහම් පාසල් ඇගයීමෙන් සමස්ත ලංකා පළමු තැන හිමිවූයේ ශ්‍රී සුමංගල දහම් පාසලේ හත්වන ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ නිපුණ ගුණරත්න ශිෂ්‍යයාටය. ''සරු කුඹුරක වපුල බිජුමෙනි කළගුණය'' නම් වූ ඒ ජයග්‍රාහී රචනාව ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේගේ නියමය මත නිපුණ ගුණරත්න ශිෂ්‍යයා සියලු දෙනාගෙන්ම අවසර රැගෙන ශ්‍රී සුමංගල බෞද්ධ සමිතියට ඉදිරිපත් කළේ මේ අයුරිනි.

කළගුණ සැලකීම යහපත් සමාජයක දක්නට ලැබෙන මහඟු ගුණයකි. කළ උපකාරය සිහිකර නැවත උපකාර කිරීම කළගුණ සැලකීමයි. ඈත අතීතයේ සිටම මිනිසා තුළ දක්නට ලැබෙන මෙම සුවිශේෂි ගුණාංගය අද ක්‍රම ක්‍රමයෙන් සමාජයෙන් ඈත්වී යන බවක් දක්නට ලැබේ. මිනිසුන් අතර පමණක් නොව සතුන් අතර පවා මෙම ගුණය පවතී. එය මැනවින් ප්‍රකට වන කථා රැසක් පන්සිය පනස් ජාතක පොතට ඇතුළත්ව තිබේ. අප මහ බෝසතාණන් වහන්සේ පෙර භවයක ''කාකාළ'' නමින් ගවයෙක්ව ඉපදුනහ. එම ගවයා හදා වඩා පෝෂණය කරන ලද්දේ මහලු කාන්තාවක විසිනි. එයට කළගුණ දක්වනු පිණිස ගැල් පන්සියයක් ගං තොටින් එතෙර කර ලබාගත් කහවණු දහසක මුදල ගවයා කාන්තාවට පිරිනැමුවේය. මේ බව සඳහන් වන්නේ කණ්හ ජාතකයේය.

සමාජයේ ජීවත් වන අප කාටත් අන්‍යෝන්‍ය උදව් උපකාර අත්‍යවශ්‍ය වේ. හුදකලාව ජීවත් වීම අසීරු කරුණකි. එබැවින් යම් කෙනෙකු අපට උදව්වක් කළ විට එය හදපිරි සතුටින් භාරගත යුතුය. එසේ කළ උපකාරය සුළු වූවත් අප එය කුඩා කොට නොසැලකිය යුතුය. සමාජයේ පැවැත්මට එය මනා පිටුවහලක් වනු ඇත. මෙය මැනවින් තහවුරු වන කතා පුවතක් ධම්මපදට්ඨ කථාවේ ඇතුළත් ය.

යස ඉසුරින් පිරිහුණු බමුණෙක් සැවැත් නුවර ජීවත්ව සිටියේය. දිලිඳුකම තිබුණත් බමුණා රාධ නම් තම පුතුට මැනවින් ඉගැන්වීය. සිප්සතර මැනවින් ඉගෙනගත් මේ තරුණයා ළමා අවධියේ සිටම අනුන්ගේ වැරදි සොයන්නවත් තමන් වැරදි කරන්නවත් පෙළඹුනේ නැත. උඩගුකමෙන් අලසකමෙන් බැහැරව කාගේත් සිත් දිනාගෙන කීකරුව කාලය ගත කළේය. තරුණ වියේදීම මව්පියන් අහිමි වූ රාධ පසුකලෙක විවාහ විය. මහලු කල ඔහුට දරුවන්ගෙන් ඇති වූ කරදර නිසා පන්සලකට ගොස් භික්ෂූන් වහන්සේලාට ආවතේව කළේය. ඒ අතර තමන් මහණ කරගන්න යැයි බමුණා කීප විටක්ම ප්‍රකාශ කළත් අසූවියේ සිටි නිසා හෙතෙම මහණ කරන්නට භික්ෂූන් වහන්සේලා අකමැති වූහ.

දිනක් කුළුණුබර දෙනෙතින් ලොව බලනවිට රාධ නම් බමුණාට රහත්වීමට හැකියාව ඇති බව තථාගතයන් වහන්සේට පෙනුණි. විහාර චාරිකාවෙහි නියැලෙන වේලාවක බුදුපියාණන් වහන්සේ බමුණා ළඟට වැඩම කර බමුණාගෙන් ඔබ කුමක් කරන්නේදැයි විමසූහ. එවිට බමුණා භික්ෂූන් වහන්සේලාට වත් පිළිවෙත් කරන බව ප්‍රකාශ කළේය. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ඔබට භික්ෂූන් වහන්සේලගෙන් සංග්‍රහ ලැබෙනවාදැයි විචාළහ. එයට බමුණාගේ පිළිතුර වූයේ ආහාර පමණක් ලැබෙන බවත් තමන් සසුන් ගතකර නොගන්නා බවත්ය.

මෙය ඇසූ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා කැඳවා මේ බමුණා කළ උපකාර සිහි ඇති කෙනෙක් සිටිත්ද'යි භික්ෂූන් වහන්සේලාගෙන් ඇසූහ. එවිට සැරියුත් තෙරණුවෝ තමන් වහන්සේ පිණ්ඩපාතයේ වැඩම වන විට දවසක් බත් සැන්දක් පූජා කළ බව ප්‍රකාශ කළහ. ඒ කළා වූ උපකාරය මොහු දුකින් මුදවන්නට තරම් දෙයක් නොවේද'යි සැරියුත් හිමිගෙන් බුදුපියාණන් වහන්සේ විමසූ සේක. සැරියුත් මහ රහතන් වහන්සේ බණ දහම් උගන්වා රාධ බමුණා මහණ කළේ ඒ අනුවය. සැරියුත් තෙරණුවෝ පිඬුසිඟා වැඩ ලැබෙන දානය රාධ තෙරුන් වහන්සේට පිරිනැමූහ. සිත එකඟ කරගත් රාධ හිමි ටික කලෙකින්ම රහත් බව ලැබුවේය.

තමන් වහන්සේට එක බත් හැන්දක් පූජා කළ බව සිහිකර සැරියුත් තෙරුන් වහන්සේ කළ මේ උදාර ක්‍රියාව භික්ෂූන් වහන්සේ අතර කථා බහට ලක් විණි. මේ බව දැනගත් තථාගතයන් වහන්සේ සැරියුත් තෙරුන් දැන් පමණක් නොවෙයි. අතීතයේදීත් මෙවැනි ප්‍රත්‍යුපකාර කළ බව වදාරා අලීන චිත්ත ජාතකය දේශනා කළ සේක.

පෙර ආත්මයක වඩුවෝ පන්සීයක් ගස් කපා පහුරු බැඳ ගඟේ පා කර අවශ්‍ය තැන්වලට රැගෙන ගියහ. ඒ වනයේ සැරිසරණ මහ ඇතෙකුගේ පයේ කටුවක් ඇනී දැඩි වේදනාවට පත්ව තම පාදයේ ඇති ආබාධය වඩුවන්ට පෙනෙන්නට සැලැස්වීය. වඩුවෝ ඇතාගේ පාදයේ කටුව ඇද දමා සුවපත් කළහ. මේ උපකාරයට ප්‍රත්‍යුපකාරයක් ලෙස ඇත් රජ තමාගේ පුතකු වඩුවන් සිටි තැන රැඳ වූයේය. ඇතා වඩුවන්ගේ කටයුතු මැනවින් ඉටු කළේය. එදා එලෙස ඇත්රජව උපන්නේ මේ සැරියුත් තෙරුන් වහන්සේ බව බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන්හ. කළගුණ සැලකීම තුළින් අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය වන බවට මෙම කථාව මහඟු ආදර්ශයක් සපයයි.

සමගිය සමාදානය ඇතිවීමෙන් යහපත් සමාජයක් ගොඩනැගේ. දසමසක් කුසේ හොවාගෙන දහදුක් විඳ ලේ කිරට හරවා පෙව් අම්මාට කළගුණ දැක්වීම, වෙහෙස මහන්සි වී අව් වැසි දිවා රෑ පිළිබඳ ව නොසිතා අප පෝෂණය කරන පියාණන්ට ප්‍රත්‍යුපකාර කිරීම, සිප් සතර නම් නැණ කිරෙන් අප පෝෂණය කරන ගුරු මෑණිවරුන්ට ගුරු පියවරුන්ට අවවාද ලබා දෙමින් අප දිරිමත් කරන වැඩිහිටියන්ට කළගුණ දැක්වීම අපගේ පරම යුතුකමක් මෙන් ම වගකීමක් ද වේ. සික් පිත් නැති බෝධීන් වහන්සේ දෙස බලා අනිමිස ලෝචන පූජාවෙන් බුදුරජාණන් වහන්සේ කළගුණ මෙනෙහි කළබව ප්‍රකට කරුණකි. ''කතඤ්ඤූ කතවේදී පුග්ගලෝ දුල්ලභෝ ලෝකස්මිං'' යනුවෙන්

කෙළෙහිගුණ දන්නා පුද්ගලයන් ලොව දුලබ බව උන්වහන්සේ දේශනා කර ඇත. එබැවින් යුතුකම් සිහිකර කළගුණ දක්වන්න තිර අදිටනින් කටයුතු කරමු. එවිට යහපත් සමාජයක් ගොඩ නැගෙනු ඇත.

| | |
|---|---|
| ගුරු දෙගුරුන් ඇතුළු කාටත් | කළගුණය |
| ගරු සරු ඇතිව ජීවත් වන | සලකුණය |
| දිරුවත් සිරුර මනසට සුව | දෙනගුණය |
| සරු කුඹුරක වපුළ බිජුමෙනි | කළගුණය |

ඔබ සැමට තෙරුවන් සරණයි.

## ක්‍රියාකාරකම්

01. රාධ තෙරුන් වහන්සේගේ චරිතයෙන් ඔබට ගතහැකි ආදර්ශ මොනවාද?
02. පාඩමට අදාළව සැරියුත් මහරහතන් වහන්සේ තුළ පැවැති සුවිශේෂ ගුණය නම් කරන්න.
03. ''කළ උපකාරයට ප්‍රති උපකාර කරමු'' යන මැයෙන් ඔබගේ අත්දැකීම් ද සමගින් රචනයක් ලියන්න.
04. මරණයට කැපකළ ගවයකු ඉන් මුදවා ගන්නා අයුරු දක්වෙන චිත්‍රයක් නිර්මාණය කරන්න.

## පුහුණුවට

| | |
|---|---|
| කළ ගුණ සලකන අය දෙවියන් | වැනි |
| කළ ගුණ නොතකන අය රකුසන් | වැනි |
| මෙම බණ දැනගෙන සියපණ | විලසිනි |
| කළගුණ සලකමු හදපිරි | බැතියෙනි |

## 28. පාඩම

## දස පින්කිරියවත්

අද අපේ පංතියට වැඩම කළේ ඤාණවිමල පොඩි හාමුදුරුවෝයි. උන්වහන්සේගේ උපදෙස් පරිදි අපි අර්ධ කවාකාර හැඩයට පංතිය පිළියෙල කර ගනිමු. උන්වහන්සේට නමස්කාර කොට අපි වාඩි වූයෙමු.

සිසුන් දෙදෙනෙකුගේ සහාය ඇතිව, තරමක් විශාල අකුරෙන් ලියන ලද ගාථාවක් සහිත පත්‍රිකාව කළුලෑල්ල මත රඳවා, ඤාණවිමල හාමුදුරුවෝ පාඩම ඇරඹූහ.

"දැන් හැම දෙනාම මාත් එක්කම මේ ගාථාව ශබ්ද නගලා කියවමු."

දානං සීලංච භාවනා
පත්ති පත්තානුමෝදනා
වෙයාාවච්චාපචායංච
දේසනා සුති දිට්ඨිජු

මේ ගාථාවේ අතුළත් වෙනවා, අපට පින් සිදු කරගත හැකි කරුණු දහයක්. ඒවා දස පුණ්‍යක්‍රියා, නැතිනම් දස පින්කිරියවත් නමින් හඳුන්වනවා. දැන් අපි පින් කිරියවත් දහය, වෙන්වෙන්ව හඳුනා ගනිමු.

දානය - සීලය - භාවනාව - පත්ති දානය - පත්තානුමෝදනාව - වතාවත්වල යෙදීම - වැඩිහිටියන්ට සැලකීම - බණ දෙසීම - බණ ඇසීම - නිවැරදි දැක්මක් ඇති කර ගැනීම ඒ කරුණු දහයයි.

"අවසර හාමුදුරුවනේ! සමහර වචන තේරුම් ගන්න අමාරුයිනේ." භාග්‍යා එසේ කීවේ පංතියේ හැමෝම දෙස බලමින්.

"ඇත්ත, සමහර වචන අපට හුරු මදි. අපි එකින් එක සරලව හඳුනා ගැනීමට උත්සාහ කරමු."

දානය

පළමුවැන්න දානයයි. පරිත්‍යාගය, දීම දානයට ඇතුළත්. යමක් පරිත්‍යාග කිරීමේ දී ඇතිකර ගනු ලබන සිතිවිල්ලට අනුව පරිත්‍යාගය ක්‍රම දෙකකට කළ හැකියි. එනම්,

01. අනුග්‍රහ බුද්ධියෙන් දීම.
02. පූජා බුද්ධියෙන් දීම වශයෙන්

හාමුදුරුවනේ තෑගි දීම, වැඩක් කළ කෙනෙකුට කුලියක් දීම, යාචකයෙකුට උපකාරයක් කිරීම වගේ දේවල් අනුග්‍රහ බුද්ධියෙන් කරන පරිත්‍යාග නේද? හාමුදුරුවන්ගේ පැහැදිලි කිරීමට ඒ උදාහරණ එක්කළේ ධනංජයයි.

"බොහොම හොඳයි, ධනංජයගේ පිළිතුර. හැබැයි කුලියක් ගෙවීම නම් දානයක් නොවෙයි. සිල්වතුන් ගුණවතුන් උදෙසා කරන පරිත්‍යාග අයත් වන්නේ පූජා බුද්ධියෙන් දෙන දාන කොටසටයි. බුද්ධාදී උතුමන් වහන්සේලාට, සිල් සමාදන් වූ උවැසු උවැසියන්ට දෙන දාන ඊට හොඳ උදාහරණයි. මේ දාන අතරින් වඩාත් උතුම් දානය පූජා බුද්ධියෙන් දෙන දානයයි.

දානයේ නොයෙක් ප්‍රභේද තියෙනවා. එයින් දෙකක් පමණක් අපි හඳුනා ගනිමු.

1. පෞද්ගලික දානය.
2. සාංඝික දානය යනු ඒ දෙකයි.

එක් පුද්ගලයකුට හෝ තෝරාගත් කීපදෙනෙකුට දීම පෞද්ගලිකව දෙන දානයයි. අසවල් අසවල් හාමුදුරුවන්ටය කියලා නම නියම නොකර පොදුවේ සියලුම මහා සංඝරත්නය උදෙසා පූජා කිරීම සාංඝික දානයයි.

සීලය

ඊළඟ පුණ්‍යක්‍රියා වස්තුව සීලයයි. බුදුරජාණන් වහන්සේ විසින් පනවන ලද ශික්ෂාපද පිළිගෙන, ඒවා ආරක්ෂා කිරීමත්, වත් පිළිවෙත්වල යෙදීමත් සීලයයි. තැන්පත්බව, හැදිච්චකම වැනි වචන වලින් ද අදහස් කරන්නේ සීලයයි. සීලයේ කොටස් ගණනාවක් තියෙනවා. ඒවා ගොනුකර ගත්තම චාරිත්‍ර සීලය හා වාරිත්‍ර සීලය වශයෙන් දෙකොටසකට වර්ග කළ හැකියි. සිරිත් හා විරිත් කියන්නේ ද ඒවටයි. කළයුතු යැයි උගන්වා ඇති දේ සිරිත්, වැළකිය යුතු යැයි උගන්වා ඇති දේ විරිත්.

" ස්වාමීන්වහන්ස සිල් සමාදන් වෙනවා කියන්නේ සිල්පද කියවීම ද?" ඥාණවිමල හාමුදුරුවන් දෙසට ඇදිලි බැඳ කසුන් එසේ විමසුවේය.

"කසුන් බොහොම හොඳ ප්‍රශ්නයක් ඇසුවේ, අපේ සමහර වැඩිහිටියන් සිල් සමාදන් වෙනවා කිව්වට හරිහැටි දන්නේ නැහැ. ඒ අය කරන්නෙත් සිල්පද කියවන එක විතරයි. සීලය කියන්නේ කය හා වචනයේ සංවරයයි. හීලෑ කිරීමයි." ඒකෙන් අදහස් වෙන්නේ නැහැ සිල්පද කීම අනවශ්‍ය බව. සිල් සමාදන් වෙනවා කියන්නේ කයින්, වචනින් වැරදි දේ සිදුවීමට ඉඩ නොදී රැක ගැනීමයි.

"හාමුදුරුවනේ සිල් රැකීමේ ආනිසංස ලැබෙන්නේ මරණින් පස්සෙද?" ඒ සුමේධගේ ප්‍රශ්නයයි.

"බුදුහාමුදුරුවෝ සිල් රැකීමේ අනුසස් පහක් දක්වලා තියෙනවා." ඒ මෙහෙමයි.

1. මහත් වූ භෝග (සම්පත්) ලැබෙයි.
2. පිරිසිදු කීර්තියක් පැතිර යයි.
3. ඕනෑම පිරිසක් මැදට නොබියව යා හැකියි.
4. සිහි නුවණින් යුතුව කලුරිය කරයි.
5. මරණින් පසු සැප ඇති තැනක උපදී.

මේ අනුසස්වලින් හතරක්ම, මෙලොවදීම ලැබෙන ඒවා. පරලොවට තියන්නේ එකයි. ගිහි අයගේ නිත්‍ය සීලය පන්සිල්. ඉඩ ලැබෙන හැම වෙලාවකම අටසිල්, දසසිල් වගේ උසස් සිල් රැකීමටත් යොමු වීම බෞද්ධයා අනුගමනය කරන පිළිවෙතයි.

**භාවනා**

භාවනා නම් කුසල් සිත වැඩීමයි. සමථ හා විදර්ශනා වශයෙන් භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙකයි. සමථ භාවනාව නම් සමාධිය දියුණු කිරීමයි. අපේ ඇස, කන, නාසය, දිව හා ශරීරය පිළිවෙළින් රූප, ශබ්ද, ගන්ධ, රස හා ස්පර්ශ සමග ගැටෙන විට හිතේ සිතිවිලි උපදිනවා. එක පැයකට මොන තරම් සිතිවිලි ප්‍රමාණයක් උපදිනවාද? එනිසා හිත හැම විටම අවුල් සහගතයි. ඒ විදියට හැසිරෙන්න ඉඩ නොදී, හොඳ අරමුණක සිත රඳවා තබා ගැනීම සමාධියයි. සමථ භාවනාව පුහුණු කිරීමෙන් සමාධිය ඇති කර ගැනීමට පුළුවනි.

''ස්වාමීන්වහන්ස, භාවනාව කරන්නේ වයසක සීයලා අත්තම්මලා. තරුණ අයට අප වගේ ළමයින්ට භාවනා කරන්න බැරිද?'' ඒ සමාධිගේ ප්‍රශ්නයයි.

''අද තමයි සමාධි එයාගේ නමේ තේරුම දැනගත්තේ.'' ඒකයි ඒ ප්‍රශ්නේ ඇහුවේ. භාවනා කරන්න ඕන වයසට ගිහිල්ලා නෙමෙයි. ඔයගොල්ලන්ගේ වයසෙදිම පටන් ගන්න ඕන. දවසකට විනාඩි කීපයක් හුරු කළාම, කාලයක් ගතවෙන කොට හොඳ ප්‍රතිඵල තියෙනවා. මතක ශක්තිය වේගවත් වෙනවා, වැඩි කරුණු ප්‍රමාණයක් මතකයේ තබා ගැනීමට හැකි වෙනවා. හොඳ සිහියෙන් වැඩ කිරීමට පුළුවන්, ඒ වගේම ශ්‍රද්ධාව, වැඩෙනවා, කලට වේලාවට පිළිවෙළට වැඩ කරනවා, හිත දුර්වල කරන නරක සිතිවිලි ඉවත් වෙනවා මේ විදියේ ප්‍රතිඵල ගොඩක් භාවනාවෙන් ලබන්න පුළුවන්.''

විදර්ශනා භාවනාවෙන් කෙරෙන්නේ මොකක්ද? ධනංජය ප්‍රශ්න කළේය. විදර්ශනා කියන වචනයේ තේරුම, ගැඹුරු දර්ශනය, සුවිශේෂි දැක්ම කියන එකයි. කෙනෙකුට මාර්ගඵල ලබාගෙන නිවන් අවබෝධ

කළ හැක්කේ විදර්ශනාවෙනුයි. විදර්ශනා භාවනාවෙන් කෙරෙන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ත්‍රිලක්ෂණ අනුව මේ ලෝකයේ සියල්ල දෙස නුවණින් බැලීමට හුරුවීමයි. පිළිකුල් භාවනාව, මරණානුස්සති භාවනාව ඊට හොඳ නිදසුන් දෙකක්.

**පත්ති දානය**

පින්කමක් කරලා එයින් ලැබෙන පින, වෙනත් කෙනෙකුට අනුමෝදන් කිරීම පත්තිදානය කියලා හඳුන්වනවා. අද බොහෝ දෙනා පින්කම්වල යෙදෙන්නේ මියගිය ඥාතීන්ට පින් අනුමෝදන් කිරීම සඳහායි.

"ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ" මේ ගාථාව කියලා මියගිය ඥාතීන් සිහිපත් කර, පින් අනුමෝදන් කිරීම සිරිතක්. දෙවියන්ට පින් අනුමෝදන් කිරීමත් බොහෝ ඈත කාලයක සිට පැවතෙන සිරිතක්.

**පින් අනුමෝදන් වීම (පත්තානුමෝදනා)**

අනුන් අනුමෝදන් කරවන පින්, සතුටින් පිළිගැනීම, පින් අනුමෝදන් වීමයි. මියගිය අයගෙන් පරදත්තුපජීවි ප්‍රේතව උපන් අයට, පින් අනුමෝදන් විය හැකියි. ජීවත්වෙන අයටත් පින් අනුමෝදන් වෙන්න පුළුවන්.

"ස්වාමීන් වහන්ස! අපි දනගෙන හිටියේ මැරුණ අයටයි පින් අනුමෝදන් වෙන්න පුළුවන් කියලා. ඒත් ඔබ වහන්සේගෙන් අවසර ලැබෙනවා ජීවත්වෙන අයටත් අනුමෝදන් වියහැකි බව. ඒ ගැන පැහැදිලි කළොත් හොඳයි." අනුශ්කගේ ප්‍රශ්නයට පන්තියේ හැමදෙනාගේම අවධානය යොමු විය.

කවුරුහරි පින්කමක් කරන කොට, එය දකලා, අහලා සතුටුවෙන්න පුළුවන්නම්, ඒක පින් අනුමෝදන්වීමක්. එනිසා ජීවත්වෙන අයටත් පින් අනුමෝදන් වෙන්න පුළුවන්."

**වෙයාාවච්ච (වතාවත් කිරීම)**

බුද්ධාදී රත්නත්‍රයට, මව්පිය ගුරුවරුන්ට, වැඩිහිටියන්ට, රෝගීන්ට, ආගන්තුකයන්ට සහ වෙනත් සුදුස්සන්ට වතාවත් කිරීම වෙයාාවච්ච පිනයි. විහාරගෙවල්, විහාරමළු, බෝ මළු, පන්සල්, මහජනයා, ගමන් කරන මාර්ග පොදු නාන ස්ථාන වැනි තැන් පිරිසිදු කිරීම, පිළිසකර කිරීම, මව්පිය ගුරුවරුන් හා වැඩිහිටියන් නැවීම, පිරිසිදු කිරීම, උණුපැන් සිසිල් පැන් ආදිය ලබාදීම ආදිය ද, වෙයාාවච්ච පිනට අයත් වෙනවා.

වතාවත් කරන අයගේ හිත් සතුටුවීම, දකින අය ප්‍රසාදයට පත්වීම, දෙවියන් සතුටුවීම, විශාල පිනක් හිමිවීම හා මරණින් මතු සැප ඇති තැන්වල ඉපදීම, වෙයාාවච්ච පුණ්‍ය කර්මයට ලැබෙන අනුසස් වෙනවා.

**අපචායනය**

අපචායනය කියන්නේ ගරු කළයුතු පුද්ගලයනට, ස්ථාන හා වස්තූන්ට ගරු කිරීමයි. වයසින්, ගුණානුවණින් හා සීලයෙන් උසස් අය, ගරුකළ යුත්තෝය. ගරු කිරීම කයින්, වචනයෙන් හා සිතින් යන තුන් ආකාරයටම කළ හැකියි. රටවල් අනුව, ජාතීන් අනුව, ආගම්වලට අනුව ගරු කිරීමේ වෙනස්කම් ද පවතිනවා.

**අභිවාදන සීලිස්ස - නිච්චං වද්ධාපචායිනෝ**
**චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති - ආයුවණ්ණෝ සුඛං බලං**

මේ ගාථාවෙන් අපට කියා දෙනවා, අපචායනයේ අනුසස්. ගරු කළ යුත්තන්ට ගරු කරන්නාහට ආයුෂය, ශරීර වර්ණය, සැපය හා බලය යන ධර්ම වැඩෙනවා.

**ධර්ම දේශනා**

බුදුරජාණන් වහන්සේගේ ධර්මය අනෙක් අයට දේශනා කිරීම හා කරවීම ධර්ම දේශනා පුණ්‍යකර්මය යි. ධර්ම දේශනා කරන තැනැත්තා, ලාභ කීර්ති ප්‍රශංසා ආදිය අපේක්ෂා නොකර,

කරුණා පෙරදැරිව, අසන්නා සැපතට පත් කරලීමේ අදහසින්ම දේශනා කළ යුතු යි. ධර්ම දේශනා කිරීම සියලු දානයන්ට වඩා උසස්. (සබ්බදානං ධම්මදානං ජිනාති) බණ ඇහුවොත් තමයි කෙනෙක් පව්කම්වලින් ඈත් වෙලා, පින්කම් වල යෙදෙන්නේ. ඒ නිසයි ධර්ම දානය උසස්ම දානය වෙන්නේ.

## ධර්ම ශ්‍රවණය

බණ ඇසීමත් ඉතාම වටිනා පින්කමක්. කෙනෙකුට යහපත් අයෙකු වීමට තියෙන හොඳම මග බණ ඇසීමයි. ''තං සුණාථ, සාධුකං මනසි කරොථ'' කියලා බොහොමයක් සූත්‍ර දේශනා වල සඳහන් වෙනවා. හොඳින් අහලා හිතේ ධාරණය කරගන්න කියලයි දක්වෙන්නේ. හොඳින් බණ අහන කෙනෙකුට ලැබෙන අනුසස් පහක් තියෙනවා. නොඇසූ දේ අහන්න ලැබීම, ඇසූ දේ නිවැරදි කර ගැනීම, සැක ඇති තැන් සැකහැර දැන ගැනීම, තමන් දරන මතය නිවැරදි කර ගැනීම හා හිත පිරිසිදු කර ගැනීමයි.

## දිට්ඨිජු (දෘෂ්ටිය පිරිසිදු කිරීම)

දිට්ඨි, දෘෂ්ටි, දිටු මේ වචනවලින් හැඳින්වෙන්නේ කෙනෙකුගේ දැක්මයි. එකිනෙකා තුළ තිබෙන දැක්ම වෙනස්. බුදුහාමුදුරුවන් වහන්සේ දැක්ම දෙකොටසකට බෙදා දැක්වූවා.

එනම්,
1. සම්මා දිට්ඨිය
2. මිච්ඡා දිට්ඨිය

සම්මා දිට්ඨිය කොටස් කීපයකට බෙදෙනවා. මේ පින් කිරියවත් වලදී ගන්නේ කම්මස්සකතා සම්මා දිට්ඨියයි. සමහර සූත්‍රවල එය දස වස්තුක සම්මා දිට්ඨිය ලෙසින් දැක්වෙනවා. දන් දීමෙන් පලක් ඇත. පූජා පැවැත්වීමෙන් පලක් ඇත, පුද පඬුරු යැවීමෙන් පලක් ඇත, පිං පව්වලට ඵල විපාක ඇත. පරලොව වසන්නවුන්ගේ මෙලොව උපතක් ඇත, මෙලොව වසන්නවුනගේ පරලොව යාමක් ඇත, මවට කරන ලද හොඳ නරක

වල ඵල විපාක ඇත, පියාට කරන ලද හොඳ නරකවල විපාක ඇත. මළාට පසු නැවත උපදින සත්ත්වයෙක් ඇත. මෙලොව පරලොව දෙක ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කරගෙන දේශනා කරන මහණ බමුණන් ඇත. මෙම පිළිගැනීම් සම්මා දිට්ඨියට ඇතුළත්. ''දසවස්තුක මිථ්‍යා දෘෂ්ටිය කියන්නේ මේවා නො පිළිගැනීමයි. හාමුදුරුවනේ මිථ්‍යා දෘෂ්ටිය තියෙන අය නේද පව් කරන්නේ?'' භාග්‍යා නැවතත් ප්‍රශ්නයක් ඇසුවාය.

''ඔව්, මිත්‍යා දෘෂ්ටිය ඇති අයට සත්‍යය වැටහෙන්නේ නැහැ.ඒ නිසාම නරක දේ හොඳ යැයි හිතා කිරිමෙන් පව් රැස් කරනවා."

ඒ අය මේ ජීවිතයේදීත් දුකට පත්වෙලා තැවෙනවා. මිය ගිහිල්ලා දුගතිවල උපදිනවා. නිවන් දැකීමට තියෙන මග ඇහිරෙනවා. මිථ්‍යා දෘෂ්ටිය බරපතලම වරදක්.

අද අපි පින් සිදුකර ගැනීමට පුළුවන් කරුණු දහයක් ගැන කතාකළා. ගුරුවරු, මව්පියන්, වැඩිහිටියන් එක්ක සාකච්ඡා කරලා තවදුරටත් මේවා පැහැදිලි කරගෙන හැකි හැම වෙලාවකම ක්‍රියාත්මක කරන්න හිතට ගන්න ඕන.

**ක්‍රියාකාරකම් :**

1. දස පින් කිරියවත් පිළිවෙළින් ලියන්න.

2. දහම් පාසලේ දී හෝ නිවසේ දී හෝ ඔබ සිදුකළ පින් කිරියවත් කීපයක් හඳුන්වා දෙන්න.

3. (i) දහම් පාසලේ දී අනුග්‍රහ බුද්ධියෙන් දිය හැකි දාන 03 ක් ලියන්න.

   (ii) එයින් එකක් ඔබේ දහම් පාසල තුළ ක්‍රියාත්මක කරන්න.

4. අපචායනයේ යෙදෙන කෙනෙකුට ලැබෙන අනුසස් මොනවාදැයි ලියා දක්වන්න.

05. සිල්වත්වීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන මොනවා ද?

# 29. පාඩම

## ඇසූපිරූතැන් ඇති ඛුජ්ජුත්තරා උවැසිය

භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවක - ශ්‍රාවිකාවන් වහන්සේලාට අග තනතුරු ප්‍රදානය කළේ ඒ ඒ ශ්‍රාවක ශ්‍රාවිකාවන් පුරන ලද පාරමිතාවන් අනුවය. එසේම විවිධ කුසලතා පින්පල තිබූ උපාසක උපාසිකාවන්ට ද පදවි පිරිනැමූහ. එලෙස ඇසූ පිරූ තැන් ඇති උවැසියන් අතර අග තනතුර ලත් ඛුජ්ජුත්තරාව ගැන අපි මෙම පාඩමෙන් ඉගෙන ගනිමු. වත්ස ජනපදයේ අග නගරය වූ කොසඹෑනුවර උපත ලද උත්තරා කුදු වූ සිරුරකින් යුක්ත වූවාය. එබැවින් ඇය හැඳින් වූයේ ඛුජ්ජුත්තරා යන නමිනි. පසුකලෙක එතුමිය උදේනි රජතුමාගේ අග මෙහෙසිය වූ සාමාවතී බිසවගේ සේවිකා තනතුරට පත් වූවාය. ඇයට හිමි රාජකාරිය වූ යේ දිනපතා සාමාවතී දේවියට මල් සැපයීමයි. ඒ සඳහා දවසකට කහවණු අටක් රජතුමාගෙන් ඇයට ලැබුණි. ඇය මල් මිලට ගත්තේ සුමන නම් මල් කරුවාගෙනි.

දිනක් මල් ගැනීමට ගිය ඛුජ්ජුත්තරාව අමතා ''ඛුජ්ජුත්තරාවෙනි, මම අද බුදු පාමොක් මහ සඟරුවනට දන් පිළිගන්වන දවස, ඔබටත් පුලුවන් ඒ පින්කමට සම්බන්ධවීමෙන් පසුව මල් අරගෙන යන්නැ" යි මල්කරු පැවසුවේය.

එයට එකඟ වූ ඛුජ්ජුත්තරා සැදැහැසිතින් යුතුව දන් පිළිගන්වා බුදුරජාණන් වහන්සේ වදාළ අනුමෙවෙනි බණ අසා සෝවන් වූවාය. වෙනදා කහවණු අටෙන් හතරක් සොරාගෙන මල් රැගෙන ගිය එතුමිය මෙදින කහවණු සියල්ලටම මල් අර ගත්තාය. ඇය එසේ කළේ සෝවාන් වූ අයෙකුගේ සිත කිසිදු වංචාවකට ඉඩ නොදෙන බැවිනි. යම් ලෙසකින් තිදොරින් වරදක් වුවහොත් එය නො සැඟවීම සෝවාන් වූ අයෙකුගේ ලක්ෂණයකි. ඒ බව රතන සූත්‍රයේ සඳහන් ව ඇත්තේ මේ අයුරිනි.

"කිඤ්චාපි සො කම්මං කරෝති පාපකං
කායේන වාචා උද චේතසා වා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨ පදස්ස වුත්තා"

වළාකුලෙන් මිදුන සඳක් මෙන් අඳුරෙන් එළියට පැමිණි ඛුජ්ජුත්තරා උවැසිය තමන් රැගෙන ආ මල් සාමාවතී දේවියට දුන්නාය. මල් රැස දුටු බිසව විමතියට පත්ව මෙසේ විමසුවාය.

| | |
|---|---|
| සාමාවතී දේවිය | :- රජතුමා අද දෙගුණයක් මල්ගෙන ඒමට කහවණු දුන්නා ද? |
| ඛුජ්ජුත්තරා උවැසිය | :- නැත දේවින් වහන්ස, |
| සාමාවතී දේවිය | :- එසේ නම් මේ තරම් මල් කොහෙන් ද? |
| ඛුජ්ජුත්තරා උවැසිය | :- අනිත් දවස්වල මල් ගෙනාවේ කහවණු හතරට. ඉතිරි කහවණු මම අරගත්තා. |
| සාමාවතී දේවිය | :- ඇයි අද ඔබ එසේ නොකළේ? |
| ඛුජ්ජුත්තරා උවැසිය | :- බුදුහාමුදුරුවන් ගෙන් බණ අසා ධර්මාවබෝධය ලත් නිසා. |

සොරකමක් මෙසේ හෙළි වූ විට උදහසට ලක්ව තර්ජනය කර ඇය හෝ ඔහු සේවයෙන් පහ කිරීම බලවතුන්ගේ සිරිතය. එහෙත් මෙහිදී සාමාවතී බිසව ප්‍රකාශ කළේ "මැණියනි ඔබ ඇසූ බණ අපටත් කියා දෙන්න" යන්නයි. මෙබඳු අවස්ථාවක දී ක්ෂණික තීරණ ගන්න, කෝපයෙන් මුසපත් වී සැහැසිකම් කරන අයට සාමාවතී දේවිය මහඟු ආදර්ශයක් සැපයුවාය.

දේවියගේ ඇරයුම පිළිගත් ඛුජ්ජුත්තරා උපාසිකාව, ධර්මයේත්, දේශකයාගේත් ගරුත්වය රැක ගැනීමට සිතා "මම ධර්මය ප්‍රකාශ කරන්නම්. ඊට පෙර මා සුවඳ දියෙන් නාවා පිරිසිදු සළු අන්දවා අසුනක් පනවා දෙන්නැයි පැවසුවාය. ඇයගේ ඉල්ලීම ඉටුවිණ. රජ බිසවක මෙසේ දාසියකට මෙහෙවර කිරීම විශ්මය දනවන පුවතකි. මෙයින් පැහැදිලි වන්නේ ධර්මයට ගරු කිරීමේ පිළිවෙතයි. බණ

ඇසීමේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් ගැන ලෝවැඩ සඟරාවේ මෙසේ ද දක්වා ඇත.

දිවමන් මුනිඳුන් දුටු මෙන් තොසවා
බණ දත්තන්හට වැඳ අත් ඔසවා
පදයෙන් පදයට අදරින් අසවා
එපිනෙන් නිරයට යන මං වසවා

ඛුජ්ජුත්තරා ඉහත සිරිත් විරිත්වලට අනුව දක්ෂ ලෙස ධර්මය දේශනා කළාය. දහම් ඇසූ සාමාවතී බිසව ඇතුළු පිරිස සෝවන් වූහ. අනතුරුව සියලු දෙනා ඛුජ්ජුත්තරාවන්ට නමස්කාර කළහ. මානය පසෙකලා රජ මෙහෙසිවරුන් එලෙස වැඳුම් පිදුම් කිරීම ආදර්ශවත් ක්‍රියාවකි. මග ඵල ලත් තැන් සිට සාමාවතී දේවිය ඛුජ්ජුත්තරා උවැසිය මව් පදවියෙහි හා ගුරු තනතුරෙහි තබා කටයුතු කළාය. එමෙන්ම බුදුපියාණන් වහන්සේ වෙතට ගොස් නිතරම බණ අසා එම ධර්මය තමාට පවසන ලෙස ද සාමාවතී බිසව ඇයගෙන් අයැද සිටියාය. මෙසේ කටයුතු කිරීම නිසා කෙටි කලකින් ම ඛුජ්ජුත්තරා ත්‍රිපිටකධර උපාසිකාවක් වූවාය. භාග්‍යවතුන් වහන්සේ බහුශ්‍රැත උපාසිකාවන් අතර අගතනතුරට ඇය පත් කළහ. ඛුජ්ජුත්තරාවන්ට මෙම උතුම් ශාසනික පදවිය ලබාගත හැකි වූයේ පෙර ඇය කළ කුසලයක විපාක වශයෙනි.

පෙර බඹදත් නම් රජතුමෙක් පසේ බුදුවරයන් වහන්සේලා අටනමකට පාත්‍ර පුරවා උණු කිරිබත් පූජා කළේය. පාත්‍ර රත් වී ඇති බැවින් උන්වහන්සේලාට ඒවා ගෙන යාම අපහසු විය. මෙය දුටු කාන්තාවක් උන්වහන්සේලාගේ පහසුව සඳහා දරණු අටක් පූජා කළාය. ඛුජ්ජුත්තරා ලෙස උපන්නේ එම කාන්තාවය. එම පින්කමේ ආනිසංසයෙන් ඛුජ්ජුත්තරාවට බහුශ්‍රැත බව ලැබුණි. තව ද ධර්ම කථික උපාසිකාවන් අතර අගතනතුර ද ලැබුණේ ඛුජ්ජුත්තරාවන්ට ය.

උත්තරා කුදු වූයේ මදක් කුදු වූ පසේ බුදුරජාණන් වහන්සේ නමකගේ ගමන් විලාසය උපහාසාත්මකව රඟ පා යෙහෙලියන්ට පෙන්වීම හේතුවෙනි.

අනුන්ගේ කතාබහ ගමන් විලාස ආදී දුර්වලකම් උපහාසයට ලක්කිරීමෙන් තමන්ටත් මෙවන් දේ සිදුවන බව සිතා ඒවායින් මිදීමට උත්සාහ කළ යුතුය. ඛුජ්ජුත්තරා දාසියක වූවේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී බරණැස සිටුතුමාගේ දියණියකව ඉපිද සිරුර සරසමින් සිටින විට එතැනට පැමිණි රහත් මෙහෙණින් වහන්සේ නමක් ලවා ආභරණ පෙට්ටිය ගෙන්වා ගැනීම නිසාය.

මේ කරුණුවලින් පින හෝ පව කුඩා යැයි නොසිතා ඒවායේ අනුසස් ආදීනව මැනවින් හඳුනාගෙන කටයුතු කළ යුතු බව පැහැදිලි වේ. ශාන්ති නායකයාණන් වහන්සේ උස් පහත් කුදු මිටි යනා දී කිසිදු භේදයකින් තොරව සියල්ලන්ට ම පොදුවේ ධර්ම දායාදය ලබාදුන් සේක. ඛුජ්ජුත්තරාවන් ද එසේ සරණ ලද කාන්තාවකි. ශරීරයේ අංගෝපාංග කෙලෙස පැවතුණ ද ධර්මාවබෝධයට එය බාධාවක් නොවේ. අවශ්‍ය වනුයේ ඥාණ ශක්තිය පමණි. අපිත් මෙම කථාව ආදර්ශයට ගෙන අකුසලින් වැලකී කුසල් කිරීමට උත්සහාවත් වෙමු.

**ක්‍රියාකාරකම්**

01. කුසල් අකුසල්වල ඵලවිපාක ඛුජ්ජුත්තරා උවැසියගේ කථා පුවත ඇසුරෙන් ගෙනහැර දක්වන්න.
02. සාමාවතී දේවියගේ සහ ඛුජ්ජුත්තරා උවැසියගේ චරිතයෙන් ගතහැකි ආදර්ශය ලියා දක්වන්න.
03. ඛුජ්ජුත්තරා උවැසියගේ චරිතයෙහි දැක්වෙන සිද්ධියක් චිත්‍රයට නගන්න.

පුහුණුවට

| | |
|---|---|
| මාප්පමඤ්ඤේථ පාපස්ස | - න මං තං ආගමිස්සති |
| උදබින්දු නිපාතේන | - උදකුම්භෝපි පූරති |
| පූරති බාලෝ පාපස්ස | - ථෝක ථෝකම්පි ආචිනං |

(ධම්ම පදය)

| | |
|---|---|
| පව් පල තමා වෙත නො එතැයි සිතා | ගෙන |
| පව සුළු කොට සිතා අවමන් නොකළ | මැන |
| කළය ද පිරේ දිය බිඳ බිඳ වැටී | මෙන |
| අනුවණයා එලෙස ඇත පව් පුරව | ගෙන |

| | |
|---|---|
| මාප්පමඤ්ඤේථ පුඤ්ඤස්ස | - න මං තං ආගමිස්සති |
| උදබින්දු නිපාතෙන | - උදකුම්භෝපි පූරති |
| පූරති ධීරෝ පුඤ්ඤස්ස | - ථෝක ථෝකම්පි ආචිනං |

(ධම්ම පදය - පාපවග්ග)

| | |
|---|---|
| පින් පල තමා වෙත නො එතැයි සිතා | ගෙන |
| පොඩි පින්කම වුවද අවමන් නොකළ | මැන |
| කළය ද පිරේ දිය බිඳ බිඳ වැටී | මෙන |
| නුවණැත්තා එලෙස ඇත පින් පුරව | ගෙන |

## 30. පාඩම

## ත්‍රි ශික්ෂාව හැඳින ගනිමු

පුරපසළොස්වක පොහෝදා සිල් සමාදන් වන උපාසක උපාසිකාවනට, ත්‍රි ශික්ෂාව විස්තර කර දෙන ලෙස අටවන ශ්‍රේණියේ දරුවන්ට නියම කරන ලද්දේ ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේ විසිනි. දරුවන්ගේ ඉල්ලීම පරිදි පන්තිභාර ගුරුතුමා ධර්ම සාකච්ඡාවක් මගින් ත්‍රි ශික්ෂා විස්තර කර දීමට වැඩ සට-හනක් සකස් කළේය. නියමිත දින ධර්ම සාකච්ඡාව මෙසේ සිදුවිය.

ගුරුතුමා :- පින්වත් උපාසක පියවරුනි, උපාසක මෑණිවරුනි අප සූදානම් වන්නේ ධර්ම සාකච්ඡාවක් කිරීමටයි. ඒ සඳහා අපට ලැබී ඇති මාතෘකාව ත්‍රි ශික්ෂාවයි. දහම් පාසලේ අට ශ්‍රේණියේ සිසුන් හය දෙනෙක් එයට සහභාගි වෙනවා. මේ සිල් සමාදන් වී සිටින උපාසක උපාසිකාවන්ටත් වරින් වර එයට සහභාගි විය හැකියි. මම සාකච්ඡාව මෙහෙයවනවා පමණයි. විශේෂයෙන් කිව යුතු කරුණක් තිබුණොත් පමණක් මම එය විස්තර කර දෙනවා.

මා කැමතියි සුමිත් මාතෘකාව ගැන පළමුවෙන්ම කෙටි හැඳින්වීමක් කරනවා නම්.

සුමිත් :- එහෙමයි. ශික්ෂාව කියන්නේ හික්මීම. සංවරය කියන්නෙත් එයටයි. ත්‍රි කියන්නේ තුනයි. එනිසා සංවර තුනක් ත්‍රි ශික්ෂාව නමින් හඳුන්වනවා. සංවර වන ආකාර තුනක් කියලත් කිව හැකියි.

ගුරුතුමා :- සුමිත් ඔබ ත්‍රි ශික්ෂාව කෙටියෙන් හඳුන්වපු හැටි හොඳයි. සුධර්මාට පුළුවන් නේද මේ හික්මීමේ තුන් ආකාරය කියා දෙන්න.

සුධර්මා :- එහෙමයි. ත්‍රි ශික්ෂාව නම්කර ඇත්තේ මෙහෙමයි.

1. ශීල ශික්ෂාව 2. සමාධි ශික්ෂාව 3. ප්‍රඥා ශික්ෂාව. එයින් සීල ශික්ෂාවට ඇතුළත් වන්නේ අයහපත් වැරදි කායික ක්‍රියාවලින් වැලකී, යහපත් නිවැරදි කායික ක්‍රියා කිරීමත්, අයහපත් වැරදි වචන කතා කිරීමෙන් වැලකී, යහපත් නිවැරදි වචන කතා කිරීමත් යන හික්මීමයි.

එක් උපාසිකාවක් ප්‍රශ්නයක් ඇසුවාය. දුවට පුළුවන් නේද අපට පැහැදිළි කරල දෙන්න ක්‍රියා සහ වචන නිවැරදි වෙන්නේ කොහොමද කියල?

**සුධර්මා** :- ඔව්. යහපත්, නිවැරදි කියල කියන්නේ යම් ක්‍රියාවක් කරන කෙනාට හොඳ ප්‍රතිඵල ලබා දෙන අතර අනිත් අයටත් හොඳ ප්‍රතිඵල ලැබෙනවා නම් තමා.

**ගුරුතුමා** :- ඒ කාරණය තව ටිකක් විස්තර කළොත් හොඳයි. සරත්ටත් පුළුවන් ඒක පැහැදිලි කරන්න.

**සරත්** :- ප්‍රාණඝාත කිරීමෙන් ඒ සතාගේ ජීවිතය නැති වෙනවා. ඒ ක්‍රියාව කරන අයත් ඝාතකයෙක් වෙනවා. එයාට පව් රැස් වෙනවා. බොරුවක් කීවාම අසන කෙනා මුළාවෙනවා. කියන්නාත් බොරුකාරයෙක් වෙනවා. එයාගෙ වචන අනිත් අය පිළිනොගන්න පටන් ගන්නවා.

මේ ආකාරයටම අනෙක් පව්කම් ගැනත් තේරුම් ගන්න පුළුවන්. පස්පව් නරකයි කියන්නෙත් වැරදියි කියන්නෙත් ඒකයි. ඒ වගේම දස අකුසල් නරකයි කියන්නෙත් වැරදියි කියන්නෙත් ඒකයි. පව්කම්වලින් වෙන් වීමෙන් තමන්ට වෙන්නෙත් යහපතක් අනුන්ට වෙන්නෙත් යහපතක්. පව්කම් වැරදියි, නරකයි. පින්කම් නිවැරදියි හොඳයි. අකුසල් වැරදියි, නරකයි. කුසල් නිවැරදියි හොඳයි.

**ගුරුතුමා** :- මේ දරුවන් හොඳින් පැහැදිලි කළ ආකාරයට අයහපත් වැරදි ක්‍රියා බැහැරකර, යහපත් නිවැරදි ක්‍රියා කිරීමෙන් හා කතා කිරීමෙන් කායික ක්‍රියා සහ වචන හික්මවා ගැනීම සීල සංවරය බව අපට තේරුම් ගන්න පුළුවන්. ඉතාම කෙටියෙන් කීවොත් කායික

ක්‍රියා සහ වචන සංවර කර ගැනීම සීලය යි. අපට ලැබී ඇති කාලය සීමාසහිත නිසා අපි ඊලඟට සමාධි ශික්ෂාව ගැන කතා කරමු.

සුජානිට පුළුවන් සමාධි ශික්ෂාව ගැන විස්තර කරන්න.

සුජානිඃ- සමාධිය කියන්නේ කුසල් සිතේ එකඟ බව. සිත එක යහපත් අරමුණක තබාගැනීම. නිතරම එහෙ මෙහෙ ගමන් කිරීම සිතේ හැටියි. එහෙම වෙන්නේ නොයෙකුත් සිතිවිලි නිසා. සිත එහෙ මෙහෙ ගමන් කරන්නේ අකුසල් සිතිවිලි නිසා නේදැ'යි එක් උපාසකතුමෙක් ඇසුවේය.

ගුරුතුමා :- ඔව් ඒක හරි. බොහෝ දුරට නීවරණ නමින් හැඳින්වෙන අකුසල් සිතිවිලි පහක් අප තුළ බලපවත්වනවා. ඒවා නිසා තමයි සිත විසිරියන්නේ. සමාධියෙන් සිදුවන්නේ ඒ සිතුවිලි ටික වේලාවකට යටපත් වීමයි. අකුසල් සිතිවිලි යටපත් වන නිසා ඒ ටික වේලාවකට සිත පිරිසිදු වෙනවා. ඒක තාවකාලිකව සිදුවන්නක්.

නීවරණ මොනවාදැයි හැඳින්වීමක් කළොත් හොඳයැයි තව උවසුවෙක් යෝජනා කළේය.

ගුරුතුමා :- ඔව් කුසලා ඒ ගැන හැඳින්වීමක් කරනවද?

කුසලා :- නිවන් මග ආවරණය කරන නිසා නීවරණ කියනවා. නීවරණ පහක් තියෙනවා.

01. කාමච්ඡන්දය කියන්නේ කාමයට ඇති ආසාව. මෙහි කාමය කියන්නෙ කාම වස්තුවලටයි. කාම වස්තු පහයි. ප්‍රියමනාප රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන්නේ ඒ පහටයි. ඒවාට ඇති ආසාව කාමච්ඡන්දයයි.

02. ව්‍යාපාදය කියන්නේ ක්‍රෝධයයි, තරහවයි, නැසේවා, වැනසේවා යන සිතුවිලිලයි.

03. ථිනමිද්ධ කියන්නෙ සිතේ උදාසීන කමට, කම්මැලිකමට.

04. උද්ධච්ච කියන්නෙ සිත විසිරීයාම. කුක්කුච්ච කියන්නේ තමන් කළ පව්කම් ගැනත් නොකළ පින්කම් ගැනත් ඇති පසුතැවීම. උද්ධච්ච, කුක්කුච්ච දෙකම එක නීවරණයක් ලෙසයි සැලකෙන්නේ.

05. විචිකිච්ඡාව කියන්නේ සැකයට. බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය, ශික්ෂාව ආදී කරුණු ගැන ඇතිවන සැකය.

ගුරුතුමා:- දැන් අපට පැහැදිලියි මේ කියන නීවරණ යටපත් වීමෙන් කුසල සිතක ඇතිවන එකඟකම සමාධිය බව, ඊළඟට ප්‍රඥා ශික්ෂාව ගැන නුවන්ගෙන් අහමු.

නුවන්:- ප්‍රඥාව කියන්නේ ඥානය අවබෝධය, බුදුදහමේ ප්‍රඥාව කියන්නේ ඇතිවීම හා නැතිවීම පිළිබඳ නිවැරදි දැක්මයි. නිවැරදි ප්‍රඥාව ලැබෙන්නේ සිතේ තිබෙන සියලු කෙලෙස් නැතිවුණාමයි. විශේෂයෙන්ම පංචස්කන්ධයේ ඇතිවීම හා නැතිවීම දැකීමයි. ඇතිවීම හා නැතිවීම දකින විට සිතේ කෙලෙස් ටික ටික ඉවත් වෙනවා. එවිට චතුරාර්ය සත්‍යය තේරුම් ගන්න පුළුවන්.

ගුරුතුමා:- මෙහිදී අප විශේෂයෙන් සඳහන් කරන්න ඕනැ ත්‍රිශික්ෂාව කියන්නේ නිවන් මග බව. ආර්ය අෂ්ටාංගික මාර්ග යේ අංග අටම මේ ත්‍රික්ෂාව තුළ ඇතුළත් වෙනවා. ඉදිරියේ දී ඒ ගැන විස්තරාත්මකව සාකච්ඡා කරන්න පුළුවන්. මා හිතනවා අපි අද වෙලාවෙ හැටියට ප්‍රමාණවත් ධර්ම සාකච්ඡාවක් කළා කියල. අද මේ සාකච්ඡාවට සහභාගි වුන සුමිත්, සුධර්මා, සරත්, සුජානී, කුසලා, නුවන් කියන දරුවන් කිහිප දෙනාටත් ඒවාගේම උපාසක පියවරු, උපාසක මැණිවරු සියලු දෙනාටත් තෙරුවන් සරණ පතමින් සාකච්ඡාව අවසන් කරනවා.

උපාසක මහතෙක් නැගිට සාකච්ඡාවට සහභාගිවීම ගැන ගුරුතුමාටත් දරුවන්ටත් ප්‍රශංසා කළේය. ඇත්තටම දහම් පාසලේ අපේ දරුවන් මේ තරම් හොඳට දහම් ඉගෙන ගෙන තිබීමත්, එය විස්තර කිරීමට

දක්ෂව සිටීමත් ප්‍රශංසා කළයුතු කාරණයක්. එය අනිත් දරුවන්ටත් හොඳ ආදර්ශයක්. උපාසක උපාසිකාවන් හැම දෙනා වෙනුවෙන්ම මම මේ දරුවන්ටත්, ගුරුවරුන්ටත් තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

**ක්‍රියාකාරකම්:-**

01. ඉගෙන ගැනීමේ දී සමාධිය වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

02. පන්සිල් ආරක්ෂාකර ගැනීමෙන් කය සහ වචනය සංවර වන ආකාරය විස්තර කරන්න.

පැවරුම:-

01. පන්සලේ ස්වාමීන්වහන්සේ හමු වී ආර්ය මාර්ගයේ අංග අට ත්‍රිශික්ෂාව තුළ අන්තර්ගත වන ආකාරය පැහැදිලි කර ගන්න.

## 31. පාඩම

## සීලානුස්සති භාවනාවේ යෙදෙමු

දාන, සීල, භාවනා වශයෙන් ප්‍රධාන පින්කම් තුනකි. පින් යනුවෙන් හැඳින්වෙන්නේ සිත පිරිසිදු කෙරෙන ක්‍රියාවන්ය. කුල්ලකින් අපද්‍රව්‍ය පොළා හැර ධාන්‍ය පිරිසිදු කරන්නාක් මෙන් පින්කම්වලින් කෙලෙස් මල බැහැර කර සිත පිරිසිදු කෙරෙයි. දාන සීල දෙකත් භාවනාවට අරමුණු කර ගත හැකි හෙයින් ප්‍රධාන පින්කම භාවනාව යැයි කිව හැකිය.

භාවනාවේ ප්‍රධාන කොටස් දෙකකි. එකක් සමථ භාවනාවයි. අනෙක විපස්සනා භාවනාවයි. සිතේ ශක්තිය වැඩි දියුණු කෙරෙන භාවනාව සමථ භාවනාවයි. නුවණේ හෙවත් ප්‍රඥාවේ ශක්තිය වැඩි දියුණු කෙරෙන භාවනාව විපස්සනා භාවනාවයි. සමථ භාවනාවට චිත්ත භාවනා යන නම ද විපස්සනා භාවනාවට පඤ්ඤා භාවනා යන නම ද භාවිත වේ.

සිතේ හැකියාව මතු වීමට ඉඩ නොදී සිත ආවරණය කර ගෙන තිබෙන, සිත වසා ගෙන තිබෙන, කිලිටි මානසික ගති හෙවත් නීවරණ සමනය කෙරෙන බැවින් චිත්ත භාවනාවට සමථ භාවනාව යැයි කියනු ලැබේ. නීවරණ 5කි. ඒවා නම්කර තිබෙන්නේ කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා කියායි. ඒවායේ බලය මැඩ පවත්වා සිතේ සැබෑ ශක්තිය මතු කර ගැනීමට උපකාර වන භාවනා අරමුණු නොහොත් කර්මස්ථාන හතළිහක් දහමෙහි දැක්වේ. ඒවා හැඳින්වෙන්නේ සම සතළිස් කර්මස්ථාන කියායි. එක් අතකින් ඒවා සමථ භාවනාවේ ප්‍රභේදය. සම සතළිස් කර්මස්ථාන කාණ්ඩ වශයෙන් නම් කර තිබෙන්නේ මෙසේය.

| | |
|---|---|
| දස කසිණ | 10 |
| දස අසුභ | 10 |
| දස අනුස්සති | 10 |

| | |
|---|---|
| සතර බ්‍රහ්ම විහාර | 04 |
| සතර ආරුප්ප | 04 |
| ආහාරේ පටික්කූලසඤ්ඤා | 01 |
| ධාතු වවත්ථාන | 01 |

මේවා විස්තරාත්මකව හැදෑරිය යුත්තේ පසු අවස්ථාවකය. දැනට නම් වශයෙන් මතක තබා ගැනීම ප්‍රමාණවත්ය. දස අනුස්සති අතර සඳහන් වන එකකි සීලානුස්සතිය. අනුස්සතිය නම් නැවත නැවත සිහි කිරීමයි. බුදුගුණ නැවත නැවත සිහිපත් කිරීම බුද්ධානුස්සතියයි. දහම් ගුණ නැවත නැවත සිහි කිරීම ධම්මානුස්සතියයි. ඒ අනුව සීලය පිළිබඳ නැවත නැවත සිහි කිරීම සීලානුස්සතියයි.

නැවත නැවත සිහිපත් කරන්නේ කවරකුගේ සිල් පිළිබඳවද? කුමන සීලයක් පිළිබඳවද? සිහිපත් කරන්නේ වෙන කෙනෙකුගේ සිල් පිළිබඳව නොවේ. සීලානුස්සතිය වඩන තැනැත්තාගේ සිල් පිළිබදවය. විශේෂයෙන් මෙම භාවනාව භාවිත කෙරෙන්නේ පැවිදි පක්ෂය විසින් වුව ද සිල්වත් ගිහියන්ට ද භාවිත කළ හැකිය. පැවිද්දා තමා රකින පැවිදි සීලය පිළිබදවත් ගිහියා තමන් සමාදන්ව සිටින සීලය පිළිබදවත් නැවත නැවත සිහිපත් කරමින් කරන භාවනාව සීලානුස්සති භාවනාවයි. මෙහි සීලය මෙනෙහි කිරීම යනු කුමක් කිරීමද? තමන් ආරක්ෂා කරන සීලයෙහි පිරිසිදු බව, අංග සම්පූර්ණ බව මෙනෙහි කිරීමයි.

සීලය දුබල වන අපිරිසිදු වන ක්‍රම කීපයක් ඇත. ඇතැම් විට සමාදන් වී ඇති ශික්ෂාපදවලින් මුල එක හෝ අග එක බිඳී යා හැකිය. ඇතැම් විට මැද ශික්ෂා පදයත් බිඳී යා හැකි අතර ශික්ෂා පද කීපයක් එක දිගට හෝ තැනින් තැනින් හෝ බිඳී යෑමට ඉඩ ඇත. එසේ කවර ආකාරයකින් හෝ තමාගේ සීලයට හානියක් වී නැති බව ප්‍රසන්න සිතින් මෙනෙහි කරන විට සිදු වන්නේ සීලානුස්සති භාවනාවයි. අවංකවම මෙම භාවනාව කළ හැක්කේ හොඳින් සිල් රකින කෙනෙකුටය. ශික්ෂාපද බිඳී හෝ සිදුරු වී හෝ ඇත්දැයි විමසා බැලීම භාවනාවක් නොවේ. බිඳී සිදුරු වී නැති බව නැවත නැවත මෙනෙහි

කිරීමයි භාවනාව. එම මෙනෙහි කිරීම භාවනා වාක්‍ය බවට පත් කර ගතහොත් පහත සඳහන් පරිදි විය හැකිය.

1. කිසිම කැඩීමක් බිඳීමක් නැති බැවින් මගේ ශීලය අතිශයින් පිරිසිදුය.
2. කිසිම සිදුරක් නැති බැවින් මගේ ශීලය අතිශයින් පිරිසිදුය.
3. කිසිම පැල්ලමක් නැති බැවින් මගේ ශීලය අතිශයින් පිරිසිදුය.
4. කිසිම කැළලක් නැති බැවින් මගේ ශීලය අතිශයින් පිරිසිදුය.

මීට ඉහත ශ්‍රේණිවල භාවනා පාඩම් වලදී පැහැදිලි කර ගත් පරිදි ඇඟපත පිරිසිදු කරගෙන තිසරණ සහිත පන්සිල් සමාදන් වීම ආදී පූර්ව කෘත්‍ය නිමා කර තමන් කැමති ඉරියව්වකින් යුක්තව මෙම සීලානුස්සති භාවනාව පුහුණු කළ හැකියි. දහම් පාසල් දරුවන්ට, තමන් කඩ නොකර රකින එකම ශික්ෂාපදය හෝ නැවත නැවත මෙනෙහි කළ හැකිය. එය පැරණි පොත් වල සඳහන් වන උපදේශයක් නම් නොවේ. පඤ්ච සීලයේ පස්වෙනි ශික්ෂා පදය හොඳින් ආරක්ෂා කළ දරුවකුට පහත සඳහන් පරිදි භාවනා කළ හැකිය.

''මම කිසිම දිනක මත් වතුර, මත් ද්‍රව්‍ය භාවිතා කර නැත්තෙමි. ඒ අතින් මගේ සීලය පිරිසිදුය. මාගේ සීලය පිරිසිදුය. මාගේ සීලය පිරිසිදුය.''

අපි සිතමු කවුරු හෝ ගිහියකු සොරකමට ඇබ්බැහි වී සිට යම් දිනක එයින් වැළකී දිගටම සොරකමින් වැළකීමේ ශික්ෂාපදය ආරක්ෂා කළැයි කියා, ඔහුට සීලානුස්සතිය පහත සඳහන් ආකාරයට පුහුණු කළ හැකියි.

''මම......දින සිට මේ දක්වා අනුන්ට අයත් දෙයක් සොර සිතින් නොගත්තෙමි. ඒ අතින් මගේ සීලය පිරිසිදුය. මාගේ සීලය පිරිසිදුය. මාගේ සීලය පිරිසිදුය."

අනෙකුත් ශික්ෂා පද ද මේ ආකාරයෙන් භාවනාවට යොදා ගත හැකියි.

මෙසේ සීලානුස්සතිය වැඩිය හැක්කේ තමාටම තමන් අවංක වූ අයකුට පමණය. එසේ භාවනා කරන තැනැත්තා තමාගේ හෘදය සාක්ෂ්‍යය තමාටම දෝෂාරෝපණය නොකරන තත්වයට පත් වේ. ඔහුට නිරාමිස සතුටක් සොම්නසක් ඇති වේ.

පිරිසිදු සීලයෙන් යුක්ත තැනැත්තාට සීලානුස්සති භාවනාවේ. යෙදීමේ ප්‍රතිඵල වශයෙන් නොබියව ඕනෑම සභාවකට යෑමට හැකි වෙයි. එම අවස්ථාවේ ආරක්ෂා කරමින් සිටින සීලයට වඩා උසස් සීලයක් ආරක්ෂා කිරීමේ පෙළඹීම ඇති වේ. එසේම සීලානුස්සති භාවනාවට සූදානම් වීමේ දී තමන් ආරක්ෂා කරන සීලයෙහි යම් අඩුපාඩුවක් දුටුව හොත් එය සකස් කර ගැනීමට ද අවස්ථාව සැලසේ. හෙතෙම නිවන් මගෙහි ගමන් කරන්නෙක් ද වේ.

**ක්‍රියාකාරකම්**

01. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා නම් කර, ඒවා පුණ්‍ය ක්‍රියා ලෙස හැඳින්වෙන්නේ ඇයි දැයි පැහැදිලි කරමින් වාක්‍ය කීපයක් ලියන්න.

02. සීලානුස්සති භාවනාව වඩන ආකාරය ඔබේ වචනවලින් ලියා දක්වන්න.

**පැවරුම**

1. අනුස්සති දහය සොයා දැනගෙන අභ්‍යාස පොතෙහි ලියන්න.

# 32. පාඩම

## අනුරපුරයේ අපේ උරුමය

පුරාණයේ ජීවත් වූ මිනිසුන් නිර්මාණය කළ ගොඩනැගිලි, පිළිම, කැටයම්, චිත්‍ර හා භාවිත කළ උපකරණ, මෙවලම් ආදියෙන් අදට ඉතිරි වී ඇති දේ පුරාවස්තු යනුවෙන් හඳුන්වනු ලැබේ. අනුරාධපුර යුගය යනු අනුරාධපුරය ලංකාවේ අගනුවර වශයෙන් පැවති අවුරුදු 1500ක් පමණ වූ අති දීර්ඝ කාලයකි. මේ කාලය තුළ අනුරාධපුරයේ පමණක් නොව ලංකාවේ වෙනත් ස්ථානවලද ඉදිකරන ලද ගොඩනැගිලි ආදිය එම යුගයට අයත් පුරාවස්තු ලෙස සලකනු ලැබේ.

මිහිඳු මාහිමියන් වහන්සේ ලක්දිවට වැඩමවීමට පළමු ලංකාවේ ගොඩනැගිලි ආදියේ පුරාවස්තු දුලභය. එයට හේතුව එකල කරන ලද නිර්මාණ සඳහා භාවිත කර ඇත්තේ කල් නොපවතින ද්‍රව්‍ය වීමය. බුදුදහම මෙරටට හඳුන්වාදීමෙන් පසු ගල්, ගඩොල් වැනි කල් පවත්නා ද්‍රව්‍ය වලින් ගොඩනැගිලි හා කලාකෘති නිර්මාණය කළ නිසා ඒවායේ නටබුන් රැසක් ලැබී තිබේ.

බුදුදහම ඉතා ඉක්මණින් රට පුරා පැතිරී ගියේය. මේ නිසා දෙයාකාරයක ඉදි කිරීම් බිහිවන්නට විය.

1. භික්ෂූන් වහන්සේන්ගේ අවශ්‍යතා සඳහා කරන ලද ගොඩනැගිලි සහ
2. ගිහි පැවිදි දෙපිරිසගේම වන්දනා හා පුදපූජා ආදිය සඳහා අවශ්‍ය නිර්මාණ ඒ වර්ග දෙකයි.

මුලදී ම භික්ෂූන් වහන්සේ ගල්ගුහාවල වැඩ විසූහ. මිනිස්සු කටාරම් කොටා ජලය ඇතුළට නොඑන ලෙස ඉදිරියෙන් බිත්තියක් බැඳ රැකවරණ සලසා ගල්ගුහා සකස් කොට පූජා කළහ. මේවායේ ලියා

ඇති ඉපැරණි ශිලා ලේඛනවල ඒ බව සඳහන් වේ. මෙවැනි ගල්ගුහා, මිහින්තලය, වෙස්සගිරිය, සිතුල්පව්ව වැනි තැන දක්නට ලැබේ.

දේවානම්පියතිස්ස රජතුමා මහා විහාරය ද එයට අවශ්‍ය ගොඩනැගිලි ද රාශියක් තැනවීය. පසුව ථූපාරාමය, අභයගිරිය, ජේතවනය, වැනි ආරාම රාශියක් ඉදි වූයේය. ජනතාව විසින් ගම්වල පන්සල් ඉදිකොට ඒවායේ භික්ෂූන් වහන්සේ වාසය කරවන ලදහ. මේ ආරාම ආශ්‍රයෙන් ඉදිවුණු ගොඩනැගිලි අතර විනයකර්ම සඳහා අවශ්‍ය උපෝසථාගාර (පොහොය ගෙවල්), රැස්වීම් ශාලා (සන්නිපාත ශාලා), දාන ශාලා, භාවනානුයෝගී භික්ෂූන් සඳහා පධානඝර නම් වූ ගොඩනැගිලි, ආරෝග්‍ය ශාලා ප්‍රධානය.

දුටුගැමුණු රජතුමා මහල් නවයකින් යුක්තව කරවන ලද ලෝවාමහාපාය මහා විහාරයේ පොහොය ගෙයයි. අනුරාධපුරයේ මහාපාලි නමින් හැඳින්වූ දාන ශාලාවක් විය. මිහින්තලයේ ද අගනුවර ද ආරෝග්‍ය ශාලා තිබිණි. මේවායේ නටබුන් අද දක්නට ලැබේ.

බුදුදහම හඳුන්වා දීමෙන් පසු ලක්දිව ඉදිවුණු පළමු ඓතිහාසික ස්තූපය ථූපාරාමයයි. මිහිඳු හිමිපාණන්ගේ අනුශාසනා පරිදි දේවානම්පියතිස්ස රජතුමා විසින් අශෝක රජුගෙන් ලබාගත් බුදුරජාණන් වහන්සේගේ දකුණු අකුධාතුව තැන්පත් කොට මෙය ඉදිකරන ලදී. එය කුඩා ස්තූපයකි. විශාල දාගැබ් ඉදිකිරීම ඇරඹුණේ දුටුගැමුණු රජතුමාගෙනි (ක්‍රි.පූ. 161-137). පළමුව මිරිසවැටිය ද ඉන්පසු රුවන්වැලි සෑය නම් ලද මහාථූපය ද කරවන ලදී. ථූපාරාමය අඩි 62 ක් උස වන අතර මහාථූපය අඩි 338 ක් උස අතිවිශාල චෛත්‍යයකි.

වළගම්බා රජු (ක්‍රි.පූ. 89-77) විසින් අභයගිරි සෑය ද, මහසෙන් රජු විසින් ජේතවනාරාම චෛත්‍යය ද ගොඩනංවන ලදී. ලක්දිව කරවන ලද විශාලතම ස්තූපය ජේතවනයයි. එය මුලදී අඩි 400 ක් පමණ උස් බව සඳහන් වේ. මිහින්තලයේ අම්බස්තලය හා මහාසෑය ද මාගම තිස්ස මහා චෛත්‍යය ද, කැලණි ස්තූපය ද දීඝාපියේ හා තවත් නොයෙක් තැන කරවන ලද ස්තූප රාශියක් දාම් යුගයට අයත්ව අදත් දක්නට ලැබේ.

මහා දාගැබ්වලට සම්බන්ධ කර සතර පැත්තේ වාහල්කඩ නම් වූ ගොඩනැගිලි සතරක් තනවන ලදී. ඉතා අලංකාර කැටයම් රැසක් වාහල්කඩ දෙපස කණුවල හා හරස් තීරුවල දක්නට ලැබේ. මිහින්තලයේ කණ්ඨක චේතියෙහි ඇති වාහල්කඩ කැටයම් ඉතා විසිතුරු ඒවාය.

බෝධීන් වහන්සේ වටා ඉදිකළ බෝධිඝර ද, ථූපාරාමය, මැදිරිගිරිය වැනි කුඩා චෛත්‍ය වටා ඉදිකළ චේතියඝර ද පුරාවස්තූන් අතර වැදගත් ගොඩනැගිලිය. හොඳින් සුරැකී ඇත්තේ නිල්ලක්ගම බෝධිඝරය පමණි. අපේ ජනතාව බුදු පිළිම වන්දනාවට පෙළඹීමට පළමු බුදුරදුන් වැඩසිටි ආසනය සංකේතවත් කළ ගල් ආසනයක් තනා වන්දනා කරන ලදී. එය මැදිකොට තැනූ ආසනඝර රැසක නටඹුන් ද මේ යුගයෙන් හමුවෙයි.

පිළිම ගෙවල් හෙවත් බුදුමැදුරු ද විශේෂයෙන් වැදගත් ගොඩනැගිලිය. ඒ අතර ජේතවනාරාම භූමියෙන් හමු වී ඇති උස බුදු මැදුර හිටි පිළිමයක් තැන්පත් කිරීමට සෑදූ බව පෙනේ.

ගොඩනැගිලි ආශ්‍රිතව කලාත්මක නිර්මාණ රාශියක් බිහි වී තිබේ. පඩිපෙළ ඉදිරියේ ඇති සඳකඩපහණ හා ඒ දෙපස පිහිට වූ මුරගල් ද, පඩිපෙළ දෙපස අත්වැල ලෙස තැනූ කොරවක්ගල් ද කැටයමින් අලංකාර කර තිබේ.

මේ යුගයේ නිපද වූ බුදු පිළිම බෝසත් පිළිම ඇතුළු කලා කෘති රාශියක් රට පුරා අද ද දක්නට ලැබේ. ඒ අතර අනුරාධපුර මහමෙව්නාවේ හා තොලුවිල සමාධි ප්‍රතිමා දෙක ලෝක ප්‍රකට හිඳි පිළිම දෙකකි. හිටි පිළිම අතරින් කලාවැව ඉවුරේ පිහිටි අවුකන බුදුරුව හා රුවන්වැලි සෑ මළුවේ ඇති බුදුපිළිම කිහිපය අගනා කලා කෘති ලෙස සැලකේ.

කැටයම් කලාවේ ද සුන්දර නිර්මාණ අනුරාධපුර යුගයේ අපට ලැබී තිබේ. ගල් කණු, පඩි පේළි, ගොඩනැගිලි බිත්ති ආදිය විවිධාකාර කැටයමින් අලංකාර ලෙස සරසා තිබේ. චිත්‍ර කලාවේ ද උසස් නිර්මාණ

ගණිනාවක් නටබුන් තත්වයෙන් හෝ දක්නට ලැබේ. ඒ අතර හිඳගල හා සීගිරියේ ඇති චිත්‍ර සඳහන් කළ යුතුම ඒවාය. මෙසේ අනුරාධපුර යුගය ලාංකීය ගෘහනිර්මාණ ශිල්පයේ ද පිළිම නෙළීමේ කලාවේද කැටයම් හා චිත්‍ර කර්මාන්තයේ ද උසස් නිර්මාණ රාශියක් බිහිකළ යුගයකි. මහා ථූපයත්, බිසෝ මාලිගය නම් තැන ඇති සඳකඩ පහණත්, මුරගලත්, මහමෙව්නාවේ සමාධි බුදු පිළිමයත්, සීගිරි චිත්‍රත් වර්තමාන ශ්‍රී ලංකාවට ද ලෝක ව්‍යාප්ති ප්‍රශංසාවක් හිමිකර දීමට සමත්ව තිබේ.

## වාරි කර්මාන්තය

ලංකාව වාසභූමිය කරගෙන සිටි ආර්ය ජනතාව ඉතා ඈත අතීතයේ සිට ම කෘෂිකර්මය ගැන ද වාරි කර්මාන්තය ගැන ද දැන සිටියහ. මේ දැනුම මල්පල දරමින් මහා වාරිකර්මාන්ත දියුණුවන්නට පටන් ගැනුණේ දේවානම්පියතිස්ස (ක්‍රි.පූ. 250-210) යුගයෙන් පසුව බව පෙනේ. තිසා වැව ඒ රජතුමාගේ කෘතියකි.

ගංගා හරහා සුදුසු තැන්වලදී කළුගල් යොදා වේලි බැඳ ජලය ඇළ මගින් කුඹුරු කරා ගෙන යෑම වාරි කටයුතුවල එක් අංශයකි. කුඩා වැව් ඉදිකොට කුඹුරු කරා ජලය සැපයීම අනෙක් අංශයයි. කුඩා වැව මහ වැවක් බවට පත් කිරීමේ පළමු පියවර ක්‍රි.ව. 1 සියවසේදී රජකළ වසභ (ක්‍රි.ව. 69-109) රජු විසින් ගන්නා ලදී. ඒ රජු විසින් මහවැව් 6 ක්ද ඇළවල් 12 ක් ද කරවන ලද බව සඳහන් වේ. ඒ අතර ඉතා වැදගත් කෘතිය වූයේ ඇළහැර යෝධ ඇළයි. පසු කාලයේ මින්නේරිය මහ වැවට සැ.30ක් දුර ජලය ගෙන එන ලද්දේ මේ ඇළ මාර්ගයෙනි.

අති විශාල වැව් තැනීම ආරම්භ කළ රජතුමා මහසෙන් (ක්‍රි.ව. 276 - 303) ය. ඔහු මහා වැව් 16ක් ද මහ ඇළක් ද කර වූයේය. අක්කර 4670ක් විශාල මින්නේරිය වැව ඔහු කර වූ විශාලතම වැවයි. කවුඩුලු වැව, හුරුලු වැව, මහ කනදරාව හා මහ ගල්කඩවල යන වැව් ද මහසෙන් මහරජු විසින් කරවන ලදී.

ඇළහැර - මින්නේරිය - කවුඩුල ව්‍යාපෘතිය ලංකාවේ ආර්ථිකය නව මගකට යොමු කරවීමට සමත් වූ මහසෙන් රජුගේ අතිවිශාල වාරි

ව්‍යාපෘතියයි. කලා ඔය හරස් කොට කලා වැව බඳවන ලද්දේ ධාතුසේන (ක්‍රි.ව. 459-477) රජතුමා විසිනි. එය සතරස් සැතපුම් 10 ක ප්‍රදේශයක් පුරා ව්‍යාප්ත වූණ අති මහත් වැවකි. කලා වැවේ සිට අනුරාධපුර තිසා වැව දක්වා ජය ගඟ නම් වූ ඇළ මගින් සැතපුම් 54 ක් දුරට ජලය ගෙන යන ලදී.

මුගලන් රජතුමා (ක්‍රි.ව 535. 555) නාච්චදූව හා පදවිය ඇතුළු වැව් ගණනාවක් කර වූයේය. වැව් කර්මාන්තය සම්බන්ධයෙන් මේ යුගයේ අමතක නොකළ යුතු රජවරු දෙදෙනෙකි, I අග්බෝ (575-608) හා II අග්බෝ (608-618) රජවරුන්.

මහවැලි ගඟ, අඹන් ගඟ, මල්වතු ඔය, කලා ඔය යන ගංගා ඇසුරු කොට ගෙන ඇළවේලි බැඳ වැව් තනා ඒ වැව් එකිනෙක අතර ඇළ මගින් සම්බන්ධතා ඇතිකොට රජරට පුරා විහිදී යන ඉතා සංකීර්ණ වාරි මාර්ග පද්ධතියක් අනුරාධපුර යුගය අවසානය වන විට අපේ පාලකයන් විසින් ගොඩනංවා තිබිණි. මෙසේ අපට අතීතයෙන් වැව් හා වාරිමාර්ග දහස් ගණනක් දායාද වී තිබේ. ඒවා ප්‍රතිසංස්කරණය කර ගතහොත් රට ස්වයං පෝෂිත කිරීම එතරම් අපහසු කාර්යයක් නොවේ.

**ක්‍රියාකාරකම්**

01. පහත සඳහන් වගුව පුරවන්න.
අනුරාධපුරයේ රජවරුන් විසින් ඉටු කරන ලද කාර්යය

| රජතුමා | වැව | වාරි කර්මාන්තය | දාගැබ | ආගමික ගොඩනැගිල්ල |
|---|---|---|---|---|
| | | | | |

02. දේවානම්පියතිස්ස යුගයට පළමු ලක්දිව ගොඩනැගිලි ආදියේ නටබුන් නොලැබෙන්නටත් ඉන්පසු කළ කෘතිවල නටබුන් ලැබෙන්නටත් හේතුව කුමක්ද?

03. අනුරාධපුරයෙන් ලැබී ඇති විශිෂ්ට බෞද්ධ කලා කෘතීන් මොනවාද?

04. භික්ෂූන් වහන්සේගේ අවශ්‍යතා සඳහා කරන ලද ගොඩනැගිලි සහ වන්දනා හා පුදපූජා සඳහා කරන ලද ගොඩනැගිලි වෙන වෙනම දක්වන වගුවක් සාදන්න.

# 33. පාඩම

## සුවදායි නින්දක් ගුණදායි ආහාර රටාවක්

මිනිස්, තිරිසන් දෙවර්ගයටම පොදු වූ ප්‍රධානම අවශ්‍යතා දෙකකි, ආහාර සුව නින්ද. ඒ දෙකෙනුත් ආහාර වඩා වැදගත් වන බව පහත සඳහන් බුදු වදන් හෙළි කරයි.

01. ''සියලු සත්වයෝ ආහාරයෙන් සිටින්නෝය"
02. ''රෝග අතර ඉහලම රෝගය කුසගින්නය"

ආහාර නොමැතිකම අප කොතරම් පීඩාවට පත් කරන්නක් ද යන්න කුසගින්න, සාගින්න, බඩගින්න යන වදන්වලින්ම ධ්වනිත වෙයි. බඩගිනි වූ විට අපට එය හොඳටම දැනේ. ජීවත් වීම සඳහා ආහාරපාන වල අවශ්‍යතාව කාටත් පැහැදිලි වන්නකි. එසේ වුවද අප නිතරම සිහියට ගත යුත්තකි, ආහාර අනුභව කරන්නේ ජීවත් වීමට මිස ජීවත් වන්නේ ආහාර ගැනීමට ම නොවන බව. ඒ නිසාම අප කුමන හෝ ආහාරයක් කෙසේ හෝ ගැනීම වෙනුවට ගුණදායී ආහාර රටාවකට හුරු පුරුදු විය යුත්තෝ වෙමු. එහිදී අහිතකර ආහාර රටාවලින් ඉවත් වී තමන්ට හිතකර ආහාර රටාවක් හුරු කර ගැනීම ද අවශ්‍යය.

ආහාර රටාව යන්නෙන් අදහස් වන්නේ ගන්නා ආහාර වර්ගය, ආහාර ප්‍රමාණය, ආහාර ගන්නා වේලාව, ආහාරවල ගුණාත්මක භාවය ආදිය ගැන සැලකිලිමත් වෙමින් අනුගමනය කරන පිළිවෙත ය. එම පිළිවෙත කුඩා කාලයේදී අපට ම තීරණය කළ නොහැකිය. ඒ සඳහා මවත් පියාත් ඇතුළු වැඩිහිටියන්ගේ මග පෙන්වීමක් අවශ්‍යයි. වෛද්‍යවරුන්ගේ මෙන් ම පවුල් සෞඛ්‍ය නිලධාරීන්ගේ උපදෙස් පිළිපැදීම ද එහි දී වැදගත් වෙයි.

දරුවන්ගේ කායික වර්ධනය සඳහා ප්‍රෝටීන බහුල ආහාර ගැනීම අවශ්‍යය. එසේ වුව ද සැලැසුමකින් තොරව, ප්‍රමාණය ඉක්මවා එබඳු ආහාර ගැනීමෙන් අධිබර හා තරබාරු තත්ත්වවලට ගොදුරු වේ. එය

කුඩා කල ම දියවැඩියාව වැනි රෝග වැළඳීමට හේතු වේ. බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙන්නේ ආහාර පිළිගැනීමේදී මෙන් ම අනුභවයේදී ද පමණ දැන ක්‍රියා කළයුතු බව ය. අධික තෙල් මිශ්‍ර, අධික සීනි මිශ්‍ර, අධික ලුණු මිශ්‍ර ආහාර කටට රසවත් වුවද ඒවා කය ලෙඩ කරන බැවින් සීමා සහිතව ගත යුතු බව ය වෛද්‍යවරුන් පවසන්නේ. භෝජනයෙහි පමණ දැන වැළඳීම යන බෞද්ධ ඉගැන්වීමේ වැදගත් කම මෙහිදී ඉස්මතු වෙයි.

ළමා කාලයේ සිටම ආහාර ගැනීමේදී සැලකිලිමත් විය යුතු තව පැත්තක් වෙයි. එනම් කෘත්‍රිම ආහාර ගැනීමෙන් වැලකීමය. සම්පූර්ණයෙන් ම වැලකීමට නොහැකි නම් එම ආහාර ගැනීම සීමා කිරීමටත් අවශ්‍යය. කල් තබා ගැනීම සඳහා යොදන විවිධ රසායනික ද්‍රව්‍ය ශරීරයට හිතකර නොවන බව වෛද්‍ය මතයයි. ස්වභාවික රසකාරක වන කුළුබඩුවලින් බැහැරව විවිධ රසකාරක යෙදූ ආහාර මෙන්ම පාරිභෝගිකයාගේ සිත් දිනා ගැනීම සඳහා වර්ණකාරක යෙදූ ආහාර ද ශරීරයට අහිතකරය. අප එම ආහාරවලින් වැළකිය යුතුය.

මීළගට නින්ද පිළිබඳව අවධානය යොමු කරමු. මෙහි මූලදීම සඳහන් කරන ලද පරිදි නින්ද අපට අවශ්‍ය වූවකි. එය කායික හා චෛතසික නිරෝගීභාවය සඳහා උපකාර වන්නකි. ඒ ඒ පුද්ගලයාගේ වයස, සෞඛ්‍ය තත්ත්වය ආදිය මත නිද්දේ අවශ්‍ය කාලසීමාව තීරණය විය යුතුය. භාවනානුයෝගීන්ට ජාගරියානුයෝගය හෙවත් නිදිවැරීම සම්පත්තියකි. ඉගෙන ගන්නා දරුවන්ට යම් ප්‍රමාණයකට නිදිවර්ජිතව සිටීම අවශ්‍ය වේ. එසේ වුවද අධික ලෙස නිදිවැරීම සෞඛ්‍යයට අහිතකරයි. නින්ද අපට කායික විවේකයක් පමණක් නොව මානසික විවේකයක් ද සපයයි. භෞතික යන්ත්‍රයකට වුවද විරාමයක් අවශ්‍ය බව අපි දනිමු.

අපේ සිතට අසහනයක්, වේදනාවක් ඇති වූ විටෙක ටික වේලාවක් නිදාගෙන අවදි වුවහොත් තරමක හෝ සහනයක් ලැබෙන බව අපි දනිමු. අධික වෙහෙසකට පත් වූ විටෙක නිදාගෙන අවදි වූ විටෙක ද කයට මහත් සැහැල්ලුවක් දැනේ. එයින් පැහැදිලි වන්නේ නින්ද අපගේ සිතට මෙන්ම කයටත් විශ්‍රාමයක් ලබාදෙන බවය. නිදිමත හැදෙන්නේ කය නින්ද ඉල්ලන නිසාය. එය නොසලකා හරිමින්, මැදියම් රැය වනතුරු අනවශ්‍ය ලෙස කාලය ගත කිරීම සෞඛ්‍යය පිරිහීමට හේතුවේ.

කායිකව දුබල වේ. ඇසේ රෝග, හිසේ රෝග ඇති වේ. ඒ හේතුව නිසා ම අධ්‍යාපන කටයුතු ද අඩාල වේ. චක්ඛුපාල ස්වාමීන් වහන්සේ නිදි වැරුවේ උසස් පරමාර්ථයක් ඇතිව වුවද එහි ප්‍රතිඵලයක් ලෙස ඇස් දෙක අන්ධ විය. අතීත කර්ම වේගයක්ද එහිදී ක්‍රියාත්මක වූ බව සැබෑය. එසේ වුවද අධික ලෙස නිදි වැරීමේ ආදීනව තේරුම් ගැනීමට ද එම සිද්ධිය උපකාර වේ. සැලසුම් සහගතව නිදාගැනීමට සහ පිබිදීමට පුරුදු වීම කවරෙකුට වුව ද හිතකර වේ. තම හැසිරීමේ රටාවට අනුකූල නොවන ලෙස නිදිබර බවක් ඇති වුවහොත් ඉරියව් මාරු කිරීම ආදියෙන් එය වෙනස් කර ගත හැකිය. අප වැළකිය යුත්තේ අධික ලෙස නිකරුණේ නිදි වැරීමෙනි.

දියුණු වීමේ දොරටු අතර එකක් නිරෝගීකම. එම නිරෝගීකම රැක ගැනීම සඳහා අනවශ්‍ය ලෙස නිදි වැරීමෙන් වළකිමු. බුද්ධිමත් ආහාර රටාවක් හුරු පුරුදු කර ගනිමු.

**ක්‍රියාකාරකම්**

01. ශරීර සෞඛ්‍යයට අහිතකර ආහාරපානවලින් වැළකීමට ඔබට ගත හැකි පියවර පැහැදිලි කරමින් වාක්‍ය 20ක පමණ ඡේදයක් ලියන්න.

02. ප්‍රමාණවත්ව නිදි වැරීමේ ආනිසංසත්, අධිකලෙස නිදිවැරීමේ ආදීනවත් වගුවකින් ඉදිරිපත් කරන්න.

## 34. පාඩම

## සිංහල බෞද්ධ ප්‍රබෝධයේ පුරෝගාමියා

ශ්‍රී ලංකාව ''පෙරදිග මුතු ඇටය'' යන විරුදාවලිය ලැබීමට තරම් ලෝක පූජිත වූයේ බුදුසමයෙන් පෝෂණය වූ ජාතියක් වෙසෙන රටක් වූ බැවිනි. 1815 දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත්ව තිබූ ශ්‍රී ලංකාව 1948 දී විදේශාධිපත්‍යයෙන් මුළුමනින්ම නිදහස් රටක් බවට පත්විණ. ඉංග්‍රීසි පාලන සමයේ මෙරට වඩාත් සැලකිලි ලැබුනේ ඉංග්‍රීසි උගත් ක්‍රිස්තු භක්තිකයන්ට පමණි. සිංහල බෞද්ධයන්ට කිසිදු සැලකිල්ලක් නොලැබුණි. මේ නිසාම සිංහල බෞද්ධයෝ ඉංග්‍රීසි ඉගෙන ගෙන ක්‍රිස්තියානි ආගම වැළඳ ගත්හ. රජයේ රැකියා හා තාන්න මාන්න ලැබුණේ ද ඔවුන්ටමය. බටහිර ක්‍රමයට හැඩ ගැසුණු මෙරට සිංහලයෝ තම භාෂාව, සිරිත් විරිත් හා බුදුදහම නොසලකා හැරියහ. යුරෝපීය සංස්කෘතියට හැඩගැසුණු බොහෝ දෙනා ආරිය සිංහල නම් පවා අතහැර ඩේවිඩ්, එඩ්වඩ්, සොලමන්, ආදී පිරිමි නම් ද, ඇග්නස්, මේරි, ජොසපින් ආදී කාන්තා නම් ද භාවිත කිරීමට පුරුදුව සිටියහ.

බුදුදහම බෞද්ධ අධ්‍යාපනය මෙන්ම සිංහල සිරිත් ද පිරිහුණු ජාතික අභිමානය හීන වූ මේ අවධියේ බොහෝ දෙනා ඉංග්‍රීසි පාලකයන් අනුගමනයට පෙළඹී සිටියහ. ඉංග්‍රීසි පාලනයට යටත්ව අපේ මුතුන් මිත්තන් නිවටයන්ව සිටි සමයක ජාතික ආගමික හැඟීම් පුබුදුවා ඔවුන් අවදි කිරීමට සමත් වීරවරයෙක් සිංහලයන් අතරෙන්ම බිහිවිය. ඒ ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමාය.

1864 සැප්තැම්බර් 17 වෙනි දින උපත ලද මේ උදාර වීරවරයා මුල දී හැඳින්වුයේ ඩේවිඩ් හේවාවිතාරණ යන නමිනි. එතුමාගේ පියා මාතර හිත්තැටියේ දොන් කරෝලිස් හේවාවිතාරණ මුදලිතුමාය. මව මල්ලිකා හේවාවිතාරණ මැතිණියයි. මොවුන් පදිංචිව සිටියේ කොළඹ කොටහේනේය.

කුඩා ඩේවිඩ් හේවාවිතාරණයන් මූලික අධ්‍යාපනය ලබා ගත්තේ ක්‍රිස්තියානි පාසල්වලිනි. එම පාසල්වල ක්‍රිස්තු ධර්මය අනිවාර්ය විෂයයක් විය. මෙසේ පාසල් අධ්‍යාපනය ලබන අතර, හේවාවිතාරණයන් කොළඹ විද්‍යෝදය පරිවේණාධිපතිව වැඩසිටි හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්ගෙන් සිංහල, පාලි හා බුදුදහම ඉගෙන ගැනීමෙන් ජීවිතය ආලෝකවත් කර ගත්තේය. පසු කලෙක එතුමාගේ කටයුතු සාර්ථක වීමට හේතු වුයේ බුදු දහමත්, කිතු දහමත්, ඉංග්‍රීසි බසත් මැනවින් උගෙන තිබීමයි. හෙතෙම පාසල් වියේ සිටම චතුර කථිකයෙක්ද විය.

ප්‍රසිද්ධ පානදුරා වාදයේ නායකත්වය ගෙන කටයුතු කළ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ ඇසුරද ඩේවිඩ් හේවාවිතාරණයන්ට ලැබිණ. මෙකල සිදු වූ වැදගත් සිදුවීමකි, පානදුරා වාදයේ වාර්තා කියවා ප්‍රසාදයට පත්ව සිටි සෙන්පති හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා බුදුදහම හැදෑරීමට ලංකාවට පැමිණීම. මේ අතරතුර විද්‍යෝදය පිරිවෙනේදී ඩේවිඩ් හේවාවිතාරණයන්ට ඕල්කට්තුමාත්, රුසියන් ජාතික සමාජ සේවිකාවක වූ බ්ලැවැට්ස්කි මැතිණියත් හමුවීම සිංහල බෞද්ධයන්ගේ භාග්‍යයක් විය. ඒ වන විට ඉංග්‍රීසි ආණ්ඩුව යටතේ ලිපිකරු රැකියාවක් කරමින් සිටි ඩේවිඩ් හේවාවිතාරණ තරුණයා "මම ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන්ගේ ගැත්තෙක් නොවෙමි." යි කියා එම රැකියාවද අතහැර එවකට බෞද්ධ ආගමික හා සමාජසේවා කටයුතු වල නියැලී සිටි ඕල්කට්තුමා සමග එක්විය. එය එතුමා තුළ පැවති සසර පුරුද්දක් විය හැකිය.

1894 දී ඩේවිඩ් හෙවාවිතාරණයන් ඉන්දියාවේ පැවති පරම විඥානාර්ථ සමාගමේ සාංවත්සරික උත්සවයට සහභාගි වීම සඳහා ඉන්දියාවට ගියේය. ආපසු ලංකාවට පැමිණි එතුමා තමාගේ ඩේවිඩ් යන ඉංග්‍රීසි නාමය අතහැර ඒ වෙනුවට ධර්මපාල යන ආර්ය සිංහල නම භාවිත කිරීමට පටන් ගත්තේය. සිංහලයන්ට ආර්ය සිංහල නම් තැබීමට පටන්ගෙන ඇත්තේ ඉන් පසුවය. එතැන් පටන් එතුමන් අනගාරික ධර්මපාල නමින් හැඳින්විණ. බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කරමින් බුදුසමයටත්, සිංහල ජාතියටත් මෙහෙයක් සිදු කිරීමට ඉටාගත් හෙතෙම ඕල්කට්තුමා සමග එක්ව එතුමාගේ ඉංග්‍රීසි කථා සිංහලට නගමින් දිවයිනේ බොහෝ ප්‍රදේශවල සංචාරය කළේය. දක්ෂ කථිකයෙකු වූ

ධර්මපාල තුමා ජාතික සිරිත් විරිත් හා ආර්ය සිංහල නම් භාවිත කිරීමේ අගය පහදා දෙමින් කථා පැවැත්වීය. ධර්මපාල තුමාගේ කථා තුළින් බොහෝ සිංහලයන්ගේ නිවටගති හා උදාසීනකම් නිග්‍රහයට ලක්විය. කොතරම් වැදගත් උසස් මුදලි මුහන්දිරම් කෙනෙකු වුවත් ඔහු පරගැතියෙකු නම් කුසීත කම්මැලියෙකු නම් ඔහුට නිර්දය ලෙස පහර දුන්නේය.

අනගාරික ධර්මපාල තුමා මෙරට කාන්තා අධ්‍යාපනය ගැනද විශේෂ අවධානයක් යොමු කළේය. ලංකාවේ ප්‍රථම බාලිකා විද්‍යාල වන කොළඹ සංඝමිත්තා විද්‍යාල ධර්මපාලතුමාගේ පුරෝගාමීත්වයෙන් ආරම්භ වූවකි. එය ශිෂ්‍ය නේවාසිකාගාරයකින් ද යුක්ත විය. වැඩිහිටි අධ්‍යාපනය පිළිබඳව ද ධර්මපාලතුමාගේ අවධානය යොමු විය. ඒ සඳහා සිංහල බෞද්ධයා පත්‍රය වැනි පුවත්පත් උපයෝගී කර ගත්තේය. බුද්ධ දේශනා ඇසුරෙන් ලියන ලද ලිපි මේ සඳහා ඉවහල් විය. ස්වරාජ්‍යයක් පිහිටුවා ගැනීමට නම් තම රටවැසියන් දැනුවත් කිරීමේ අවශ්‍යතාව ද පළ කළේය.

1906 දී බෞද්ධ මහජන මතය ප්‍රචලිත කිරීම සඳහා සිංහල බෞද්ධයා පත්‍රය ආරම්භ කළේය. ජාතික ආගමික කටයුතුවලට කැපවී ක්‍රියා කළ එතුමා අමද්‍යප සටනේ පුරෝගාමියෙක් විය. ගව මස් කෑමට ද විරුද්ධ වූ ධර්මපාල තුමා ගවමස් කන්නන් සහ රා බොන්නන් සැලකුවේ වසලයන් ලෙසිනි. 1915 දී සිංහල මුස්ලිම් අරගල ඇතිවිය. එකල සිංහල නායකයන් ඉංග්‍රීසි ආණ්ඩුව විසින් සිරභාරයට ගත් අතර, එවකට ඉන්දියාවේ සිටි ධර්මපාල තුමාද සිරභාරයට ගත්තේය. අවුරුදු හතක් නිවාස අඩස්සියේ සිටි එතුමා එම කාලය ආගමික කටයුතු සඳහා යොදා ගත්තේය. දේශීය කර්මාන්ත නගා සිටුවීමට ක්‍රියා කළ ධර්මපාල තුමා පිටරට භාණ්ඩ මෙරටට ගෙන්වීමට විරුද්ධ විය. මෙරට කර්මාන්ත නගා සිටුවීම සඳහා විශේෂ පුහුණුවක් ලබා දීමට කිහිපදෙනකු පිටරට යැවීමට ද කටයුතු කළේය.

**විදේශ සේවය**

1889 දී ඕල්කට්තුමා සමග ධර්මපාලතුමා ජපානයේ බෞද්ධයින්ගෙන් ලද ආරාධනයක් අනුව එහි කියෝතෝ නුවර පවත්වන ලද බෞද්ධ සම්මේලනයට සහභාගී විය. ෂඩ්වර්ණ බෞද්ධ කොඩිය ප්‍රථම වරට

ජපන් අහසේ ලෙළ දුන්නේ ද මේ ගමනේදීය. 1891 දී එතුමා දඹදිව බුද්ධගයාවට ගියේය. හින්දු පූජක මහන්තා යටතේ තිබූ බුද්ධගයා විහාරය දැක ධර්මපාලතුමා මහත්සේ කම්පාවට පත් විය. බෝසතාණන්වහන්සේ බුද්ධත්වයට පත් ස්ථානය මිථ්‍යාදෘෂ්ටිකයින්ගෙන් මුදවාගෙන සුදුසු තත්ත්වයට පත් කිරීමට එතුමා අදිටන් කර ගත්තේය. "සිංහලයිනි නැගිටිව් බුද්ධගයාව බේරා ගනිව්" යනුවෙන් එතුමා අළුත් සටනක් ආරම්භ කළේය. 1891 දී මහාබෝධි සමාගම ආරම්භ කරන ලද්දේත් මේ සඳහාය. ඒ වෙනුවෙන් ලෝවැසියන්ගේ අනුග්‍රහය ලබා ගැනීම පිණිස ඉංග්‍රීසියෙන් "බුඩිස්ට්" නමැති සඟරාව ද ආරම්භ කළේය. 1892 දී ඇමෙරිකාවේ චිකාගෝ නුවර පැවති ආගම් පිළිබඳ සම්මේලනයේදී ලංකාව නියෝජනය කළේ අනගාරික ධර්මපාලතුමාය. එහි සිට ලංකාව බලා එන ගමනේදී හොනලුලුවුපත්වලදී කෝටිපති දානපතිනියක වූ පෝස්ටර් මැතිණිය ධර්මපාලතුමාට හඳුනා ගන්නට ලැබුණි. බුද්ධගයාව බේරා ගැනීමේ සටනට හා බෞද්ධ සමාජසේවා කටයුතුවලට එතුමියගෙන් ධර්මපාලතුමාට ආධාර ලැබුණි. හින්දු මහන්තාගෙන් බුද්ධගයාව බෞද්ධයින්ට ලබා දීමට එරෙහිව ධර්මපාලතුමාට හිරිහැර ඇති වූවත්, නීති මාර්ගයෙන් කටයුතු කළ එතුමාට ජය අත්විය. බුද්ධගයාව බෞද්ධයින්ට අයත් බව උසාවිය ප්‍රකාශ කළ අතර 1896 දී බුද්ධගයාවේදී ප්‍රථම වරට වෙසක් උත්සවය පවත්වන ලදී. 1901 දී බරණැස් නගරයේ සාරානාත් හි හෙවත් ඉසිපතනයේ ඉඩමක් මිලදී ගෙන වන්දනාකරුවන් සඳහා විශ්‍රාම ශාලාවක් පිහිටුවීය. බුදුරදුන් විසින් ප්‍රථම ධර්මදේශනාව පවත්වන ලද ඉසිපතන මිගදායේ මූලගන්ධකුටි විහාරය ඉදි කිරීම ද ආරම්භ කළේය. 1908 දී ධර්මප්‍රචාරය සඳහා කල්කටාවේ ඉඩමක් මිළ දී ගෙන 1920 දී එහි ධර්මරාජික විහාරය ඉදි කළේය.

ලෝකප්‍රසිද්ධ විවේකානන්ද ස්වාමි ධර්මපාලතුමාට අසීමිත ගෞරවයක් දක්වා ඇත. එතුමාගේ ධර්මප්‍රචාරක කටයුතු සඳහා සුප්‍රකට විදේශීය කාන්තාවන්ගෙන් ද ආධාර හා සහාය ලැබුණි. චිකාගෝ නුවර දෘෂ්ටි සම්මේලනයේදී හැඳිනගත් මේරි පෝස්ටර් රොබින්සන් මැතිණිය ඉන් එක් අයෙකි. සාරානාත් හි මූලගන්ධකුටි විහාරය ද ලන්ඩන් විහාරය ද පිහිටුවීමට මෙතුමියගෙන් ආධාර ලැබී ඇත.

ධර්මපාලතුමා බුදුදහම ප්‍රචාරය කරමින් ලෝකයේ විවිධ රටවලට ගියේය. ඇමෙරිකා එක්සත් ජනපදය, එංගලන්තය, තායිලන්තය, ජපානය හා හොනලුලු යන රටවල් ඊට අයත්ය. ජර්මනියට ගිය අවස්ථාවක දී මුණගැසුණු වෛද්‍ය පෝල්ඩාල්කේ මහතා තම නිවස බෞද්ධ කටයුතු සඳහා පරිත්‍යාග කර ඇත. මහාබෝධි සමාගමේ ශාඛාවක් ද බර්ලින් නුවර පිහිටුවන ලදී.

1931 දී ඉන්දියාවට ගිය අනගාරික ධර්මපාලතුමා මූලගන්ධකුටි විහාරයේදී සිරි දේවමිත්ත ධර්මපාල නමින් පැවිදි වී 1932 දී උපසම්පදාව ද ලැබීය. වැඩිකල් නොගොස් අසනීප වී 1933 අප්‍රියෙල් 29 වෙනි දින දේවමිත්ත ධර්මපාල හිමිපාණෝ අපවත් වූහ. බුදුදහම ලෝකයේ ප්‍රචාරය කිරීම සඳහා තවත් විසිපස් වතාවක් උපදීවායි එතුමා ප්‍රාර්ථනා කළ බව කියනු ලැබේ. ධර්මපාලතුමා බුදුදහම ලංකාවේත් ලෝකයේත් පැතිරවීම සඳහා කටයුතු කළ විශ්ව ධර්මදූතයෙකි. සිංහල සිරිත් විරිත් බේරා ගැනීමට සටන් කළ වීරයෙකි. සුද්දන් ඉදිරියේ නිර්භයව ක්‍රියාකළ නිර්භීත සිංහලයෙකි. බුද්ධගයාව හින්දූන්ගෙන් බේරාගත්, බුදුදහමේ දියුණුවට අනුපමේය සේවාවක් කළ එතුමා, සිංහල ජාතියේ පිනට පහළ වූ මිණිපහනක්ම වූයේය.

**ක්‍රියාකාරකම්**

01. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ චරිතයෙන් ඔබට ගතහැකි ආදර්ශ පැහැදිලි කරන්න.

02. ධර්මපාල චරිතයේ අන්තර්ගත නායකත්ව ලක්ෂණ විස්තර කරන්න.

**පුහුණුවට**

සම්බුද්ධ ධර්මයත් - මේ සිංහල දේශයත්
ඝන තිමිර පටලයෙන් - වැසී ගිය අවදියක
එම අඳුරු දැ දුරුකොට - ප්‍රදීප ස්ථම්භයක් මෙන්
මුළු ලකම බැබලවීය

දහම්සෝ නිරිඳුගෙන් - පසු ජගත් තලයේම
සුපිරිසිදු බුදුදහම - පතුරුවා මහ මෙතින්
ජගත් මහා පුරුෂයෙකු - බවට පත් වී පසිඳු
මෙසිරිලක් මැණිගේ - මහා අභිමානවත්
මුදුන්මල් කඩම යැයි - ලොවේ පිළිරැව් දෙවූ
අගාරික සව් ඉසුරු - සපිරි සැපවත් දිවිය
කෙළ පිඩක් මෙන් ඉවත - ලා ලොවට කැපවෙමින්
සඳුන රට දැය සමය - ජීවිතය දෙවැනි කොට
සුරැක දිවි සඵල කළ - ලක්බිමේ මෑතකදී
ජන්ම ලාභය ලැබූ - අභිමානවත් පුතණුවෝ
සිරි ධම්මපාල නම් - අනගාරික වූ ඔබය

ධර්මපාල හස්න
බලංගොඩ ප්‍රඥාවංශ හිමි

# 35. පාඩම

## පිරිහීමේ දොරටු වසාලමු

දියුණුවීමට කවුරුත් ප්‍රිය කරති. පරිහානියට කිසිවෙක් කැමති නොවේ. විවිධ ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගන්නේත් විවිධ වෘත්තීන්හි නියැලෙන්නේත් දියුණුව පිණිස ය. දියුණුව උත්සාහයෙන් ලබාගත යුතුය. පරිහානිය නිරායාසයෙන් ම ළගා වන්නකි. මෙලොව දියුණුවන්නාගේ ගති ලක්ෂණ "දියුණුවේ දොරටු" පාඩමෙන් හත්වන ශ්‍රේණියේ දී ඉගෙන ගෙන ඇත. එම දියුණුවේ දොරටු වසාලන "පරාභව මුඛ" හෙවත් "පිරිහීමේ දොරටු" පිළිබඳව පරාභව සූත්‍ර දේශනාවට අනුව කරුණු විමසා බැලීම මෙම පාඩමේ අරමුණ වේ.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් විහාරයෙහි වැඩසිටි සේක. එකල එක්තරා දේවතාවෙක් රැ පෙරයම ඉක්ම ගිය විට මනා වර්ණයෙන් මුළු ජේතවනයම ඒකාලෝක කරමින් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. එසේ පැමිණ උන්වහසේට වැඳ එකත්පස්ව සිටි ඒ දේවතාවා පුද්ගලයාගේ පිරිහීමට අදාළ වන කරුණු බුදුරජාණන් වහන්සේගෙන් විමසීය. එයට පිළිතුරු ලෙස පිරිහීමේ දොරටු ඇතුළත් පරාභව සූත්‍රය දේශනා කළහ. එම සූත්‍ර දේශනාවෙහි එන පරාභව මුඛ මෙතැන් සිට සැකෙවින් හැඳින ගනිමු.

සුවිජානො භවං හොති - සුවිජානො පරාභවෝ
ධම්මකාමෝ භවං හොති - ධම්මදෙස්සී පරාභවෝ

ඉහත සඳහන් ගාථාවට අනුව කුසල්වලට, නිවැරදි දේට දේවේෂ කිරීම "ධම්ම දෙස්සී වීම" පිරිහෙන පුද්ගලයාගේ පළමු ලක්ෂණයයි. බුදුදහමට අනුව තමාටත් අනුන්ටත් හිතකර වන ක්‍රියා කුසල්ය. පන්සිල්, දස කුසල් වශයෙන් හඳුන්වන එම කුසල ක්‍රියා වැඩි දියුණු කළ යුතුය. තමාටත් අනුන්ටත් අහිතකර වන ක්‍රියා අකුසල්ය. පස්පව්, දස අකුසල් ලෙස හඳුන්වන එම අකුසල ක්‍රියා අත්හළ යුතුය.

අසන්තස්ස පියා හොන්ති - සන්තේ න කුරුතේ පියං
අසතං ධම්මං රොචේති - තං පරාභවතෝ මුඛ

අසන්තස පියා හොන්ති - අසත්පුරුෂයන්ට හෙතෙම ප්‍රිය කරයි.
සන්තේ න කුරුතේ පියං - සත්පුරුෂයන්ට ප්‍රිය නොකරයි.
අසතං ධම්මං රෝචේති - අසත්පුරුෂ ධර්මයට ප්‍රිය වේ.

පිරිහෙන පුද්ගලයා සත් පුරුෂ ඇසුර ප්‍රිය නොකරයි. සවන් දීමට ප්‍රිය කරන්නේ යහපත් පුද්ගලයන් කරන කථාබහ නොව නරක අය කරන ප්‍රකාශයන්ය. එබැවින් නරක ගති පුරුදු වේ. එසේම වටිනා අදහස් නැති අසභ්‍ය පොත් පත්, චිත්‍ර කතා, පත්තර, රූපවාහිනී වැඩසටහන් ආදිය ඇසුරු කරයි. එසේ වන්නේ නොවටිනා දෙයත්, නරක ඇසුරත් ප්‍රිය කිරීම නිසාය. ඒවායින් වැළකීම දියුණුවේ ලක්ෂණයකි.

නිද්දාසීලි සභාසීලී - අනුට්ඨාතා ච යෝ නරෝ
අලසෝ කෝධ පඤ්ඤාණෝ - තං පරාභවතෝ මුඛං

නිද්දාසීලී - නිදන සුලු බව

ඇතැම් අය නිතර නිතර නිදා ගැනීමට වැඩි කැමැත්තක් දක්වති. එහෙත් අපගේ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ සැතපුණේ පැය දෙකක් පමණ වූ සුළු කාලයකි. අන් සැම මොහොතකම අන් අයට සරණ වූ සේක. එය ආදර්ශයට ගෙන නිදා ගැනීමට ම ලොල් නොවී දෛනික කටයුතු සිදු කිරීමට ළමා අවදියේ සිට ම අප පුරුදු පුහුණු විය යුතුය. සාර්ථක ජීවිතයක් ඔබට ගත කළ හැක්කේ එවිටය.

සභාසීලි - පිරිස්මැද කතාබහ කරමින් කල්ගත කිරීමට ඇති කැමැත්ත

ඇතැම්හු පිරිසක් සමග එකතු වී හිස් දේ කථා කරමින් අල්ලාප සල්ලාපයෙහි යෙදෙති. මෙය දොඩමලු ගතියයි. එබඳු අයට සාර්ථක ජීවිතයක් ගත කිරීමට නුපුළුවන.

අනුට්ඨාතා - උත්සාහයෙන් තොර බව

බාධක මැඩගෙන ඉදිරියට යා හැක්කේ උත්සාහය ඇත්නම් පමණි. එය එක්වර ම සපුරාගත නොහැකිය. පළමු වැයම අසාර්ථක වූ විට කීපවතාවක්ම වැයම් කර කාර්ය සඵල කරගත යුතුය.

අලසෝ - කම්මැලිකම

ධෛර්ය සම්පන්නකමට බාධකව සිටින්නේ අලසකමයි. අව්ව, වැස්ස, සීතල, උෂ්ණාදිය ගැන සිත සිතා කුසීතව සිටීමෙන් තමාගේ අරමුණු ඉටුකරගත හැකි නොවේ. කාලයෙහි නිසිඵල නොගෙන වේලාව අවේලාව නොබලා නිදා ගැනීම අලසකමේ තවත් ලක්ෂණයකි. කම්මැලි වුවහොත් හොඳින් පාඩම් කිරීමාදිය කළ නොහැකිය. ඒ නිසා සිදුවන්නේ පරිහානියකි.

කෝධ පඤ්ඤාණෝ - නිතර කිපෙන සුළු බව

සුළු දෙයකින් වුවත් නිතර කිපෙන සුළු බව.

යෝ මාතරං වා පිතරං වා - ජිණ්ණකං ගත යොබ්බනං
පහූසන්තෝ න භරති - තං පරාභවතෝ මුඛං

යමෙක් තමනට හැකියාව තිබිය දී මහලුව ජරාවට ගිය මව හෝ පියා හෝ පෝෂණය නොකරයිද එය පිරිහීමට හේතුවකි. දරුවන් සැපවත් කිරීමට මව්පියන් නොගන්නා වෙහෙසක් නොමැත. දරු-වන්ගේ දුකේදී, පිහිට වන අතර සැපේදී සතුටු වෙති. දරුවන්ට සමසිත් පතුරුවමින් සලකන්නේ සමාන ලෙසටය. මෙසේ සැලකුම් ලබන දරුවන් විසින් දෙගුරුන් රැක බලා ගැනීම යුතුකමකි. එසේ නොවන්නේ නම් එය පිරිහීමේ දොරටුවකි.

යෝ බ්‍රාහමණං වා සමණං වා - අඤ්ඤං වාපි වණිබ්බකං
මුසාවාදේන වඤ්චේති - තං පරාභවතෝ මුඛං

යමෙක් තමා වෙත පැමිණෙන ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණ පූජකයකු හෝ වෙනත් යම්කිසි යාචකයකු හෝ බොරුවෙන් රවටයිද එය පිරිහීමට හේතුවකි.

පහූත විත්තෝ පුරිසෝ - සහිරඤ්ඤෝ සභෝජනෝ
ඒකෝ භුඤ්ජති සාදූනි - තං පරාභවතෝ මුඛං

බොහෝ ධන ධාන්‍ය හා සැප සම්පත් ඇති පුද්ගලයන් ඒවා තනියම පරිහරණය කරයි ද එය පිරිහීමට කරුණකි.

ජාතිත්ථද්ධෝ ධනත්ථද්ධෝ - ගොත්තත්ථද්ධෝ ච යෝ නරෝ
සඤ්ඤාතිං අතිමඤ්ඤේති - තං පරාභවතෝ මුඛං

ජාතිය නිසා, ධනය නිසා, ගෝත්‍රය නිසා ඇතිවන මානයෙන් යුක්ත වූ යමෙක් සිය නෑදෑයන් පහත් කර සලකයිද එය පිරිහීමට හේතුවේ.

ඉත්ථී ධූත්තෝ සුරා ධූත්තෝ - අක්ඛධුත්තො ච යෝ නරෝ
ලද්ධං ලද්ධං විනාසේති - තං පරාභවතෝ මුඛං

යම් මිනිසෙක් ස්ත්‍රීන්ට ලොල් වූයේ ද සුරාවට ලොල් වූයේ ද සූදුවට ලොල් වූයේ ද එයින් තමනට ලැබෙන ලැබෙන දේ විනාශ කරයි ද එය පිරිහීමට හේත්තුවකි.

සේහි දාරේහිසන්තුට්ඨයෝ - වේසියාසුපදිස්සති
දිස්සති පරදාරේසු - තං පරාභවතෝ මුඛං

තම බිරින්දන්ගෙන් සෑහීමකට පත් නොවී වෙසඟනන් සහ පර අඹුවන් වෙත යන්නා පිරිහීමට පත් වේ.

අතීත යොබ්බනෝ පෝසෝ - ආනේති තිම්බරුත්ථනිං
තස්සා ඉස්සා න සුපති - තං පරාභවතෝ මුඛං

තරුණ විය ඉක්ම ගිය පුද්ගලයෙක් තිඹිරි ඵල වැනි පියයුරු ඇති යොවුන් කතක විවාහ කර ගනියි ද ඇය කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් නො නිදා සිටියි ද එය පිරිහීමට කරුණකි.

ඉත්ථිං සොණ්ඩිං විකිරණිං - පුරිසං වාපි තාදිසං
ඉස්සරියස්මිං ඨපාපේති - තං පරාභවතෝ මුඛං

සුරාවට, සූදුවට, මස් මාළු ආදියට අනවශ්‍ය ලෙස මුදල් වියදම් කරන ස්ත්‍රියක හෝ පුරුෂයකු අධිපති බවෙහි යොදවයි නම් එය පිරිහීමට හේතු වේ.

අප්පභෝගෝ මහා තණ්හෝ - ඛත්තියේ ජායතේ කුලේ
සෝච රජ්ජං පත්ථයති - තං පරාභවතෝ මුඛං

රජ කුලෙහි උපන් අල්ප වූ භෝග සම්පත් ඇති මහත් තෘෂ්ණා ඇති පුද්ගලයෙක් රාජ්‍ය නායකත්වය ප්‍රාර්ථනා කරයි ද එය පිරිහීමට හේතුවකි.

ඒතේ පරාභවේ ලෝකේ - පණ්ඩිතෝ සමවෙක්ඛිය
අරියෝ දස්සන සම්පන්නෝ - ස ලෝකං භජතේ සිවං

නැණවත් පුද්ගලයා ලෝකයෙහි ඇති පිරිහීමට හේතුවන මෙම කරුණු නුවණින් සලකා බලා ආර්ය දර්ශනයෙන් යුක්තව නිරුපද්‍රිතව දෙව්ලොවට පැමිණේ.

මෙම සූත්‍ර දේශනාවට අනුව දියුණුවන පුද්ගලයාත් පිරිහෙන පුද්ගලයාත් පහසුවෙන් හඳුනාගත හැකිය. දියුණුව සොයා යන්නා නැවියකු විසින් හසුරුවනු ලබන නැවක් බඳුය. පරිහානියට ගොදුරු වන්නා මෙහෙයවන්නකු නොමැතිව හිඳැල්ලේ පාවී යන නැවක් වැනිය. මෙය මැනවින් දැන හැඳින අප අපගේ ජීවිතය ක්‍රමවත් ව සකසා ගන්නේ නම් පරාභවමුඛවලින් වැළකිය හැකිය. එවැනි අය දියුණු වෙති. එබැවින් අපි ළමා වියේ සිටම පිරිහීමේ දොරටු වසා දැමීමට පුරුදු පුහුණු වෙමු.

**ක්‍රියාකාරකම්:**

01. පුද්ගල පරිහානියට හේතුවන කරුණු 5ක් ලියා දක්වන්න.
02. නිද්දාසීලී, සභාසීලී යන කරුණු දෙක පිරිහීමට හේතුවන අයුරු පැහැදිලි කරන්න.

## 36. පාඩම

## සමුපකාරය හා ආගන්තුක සත්කාරය

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක ස්වාමීන් වහන්සේ, අපේ දහම් පාසලට වැඩම කළහ. විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ මුණ ගැසී සාකච්ඡා කිරීමෙන් පසුව, දහම් පාසල ආරම්භයේදීම ගුරු ශිෂ්‍ය දෙපිරිස අමතා, උන් වහන්සේ අනුශාසනාවක් කළහ. දැන් අපි ඒ අනුශාසනාවට සවන් දෙමු.

දහම් පාසලේ ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේගෙන් අවසරයි ආචාර්ය මණ්ඩලයේ භවතුනි, දූ දරුවනි, අද උදෑසන මේ විහාරස්ථානයට පැමිණියායින් පසු මට ලොකු සතුටක් දැනුනා. ඒ සතුටින්ම තමයි මේ අනුශාසනාව කරන්න ඕන කියලා හිතුවේ. අපේ රටේ දහම් පාසල් ආරම්භ කළේ බුදුදහම උගන්වන තැනක් හැටියටම නෙවෙයි. බෞද්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ස්ථානයක් හැටියටයි. දරුවනි! බෞද්ධයෙකු තුළ ගොඩනගා ගතයුතු සාරධර්ම රාශියක් තියෙනවා. අද ඔබේ දහම් පාසලට පැමිණි මට, දැක ගන්න ලැබුනා එයින් සාරධර්ම දෙකක්. ඒ තමයි සමුපකාරී බව හා ආගන්තුක සත්කාරය.

දරුවනි! මට මේ වේලාවේදී සිහිපත් වෙනවා, බුදුරදුන් වැඩසිටි අවධියේ සිදු වු එක් සිදුවීමක්. අනුරුද්ධ, නන්දිය, හා කිම්බිල කියන ස්වාමීන් වහන්සේලා කමටහන් රැගෙන භාවනාවට වැඩම කළා ගෝසිංග වනයට. ටික දවසකට පස්සේ බුදුරජාණන් වහන්සේ, උන්වහන්සේලා බැලීමට ගෝසිංග වනයට වැඩියා. වන පාලකයා දැනගෙන හිටියේ නැහැ. මේ බුදුහාමුදුරුවෝ බව. ඒ නිසා ඔහු උන්වහන්සේට වනයට ඇතුල්වෙන්න අවසර දුන්නේ නැහැ.

වන පාලකගේ වචන ඇසුණ අනුරුද්ධ රහතුන් වහන්සේ, එතැනට වැඩම කළා. "මේ අපේ ශාස්තෘවරයා, බුදුරජාණන් වහන්සේයි. උන්වහන්සේට අප සිටින ස්ථානයට වඩින්නට ඉඩ දෙන්නැයි" කියා බුදුරජාණන් වහන්සේට නමස්කාර කොට වැඩම කරවාගෙන ගියා.

උන්වහන්සේලා තුන් නමගෙන් ප්‍රධානියා අනුරුද්ධ රහතුන් වහන්සේයි. බුදුරජාණන් වහන්සේ අනුරුද්ධ රහතුන් වහන්සේගෙන් ඇහුවා. ඔබ වහන්සේලා සතුටින් සමගියෙන් ඉන්නවාද? හොඳින් බණ භාවනා කරනව ද? කියලා. අනුරුද්ධ රහතන් වහන්සේ දිග විස්තරයක් ඉදිරිපත් කළා.

''අපට අපි තුන්දෙනා තුන් දෙනෙක් කියලා හිතෙන්නේ නැහැ. එක් කෙනෙක් කියලයි හිතෙන්නේ. උදෙන්ම අවදිවන තැනැත්තා උදේ කළයුතු පැන් පෙරා තැබීම, ඇමදීම, පාත්‍රා පිරිසිදු කිරීම ආදිය ඉටු කරනවා. පිඬුසිඟා වැඩියම, මුලින්ම ආපසු වැඩම කළ තැනැත්තා දාන ශාලාව පිළියෙල කිරීමාදිය සිදු කරනවා. ඒ නිසා ස්වාමීනි, අපි හරිම සතුටින් ඉන්නේ. හරියට කිරියි වතුරයි මිශ්‍ර වුණා වගෙයි. බණ භාවනා ආදියත් හොඳට සිදු කරනවා.''

අනුරුද්ධ හාමුදුරුවෝ මේ විදියට පැවසුවාම බුදුරජාණන් වහන්සේ සාධුකාර දී එය අනුමත කළා. දරුවනි! මේ තමයි සමූපකාරී බව. මිනිසා උපතින්ම සමූපකාරී සත්ත්වයෙක්. සමූපකාරී බව කියන්නේම සමූහයක් ජීවත්වෙන තැනදී, එකිනෙකා තම තමන් හොඳහැටි අවබෝධ කරගෙන තිබෙන කටයුතු අන්‍යෝන්‍ය වශයෙන් බෙදා හදාගෙන සිදු කිරීමයි. අනුරුද්ධ තෙරුන් වහන්සේ වදාළේ ඒකයි. අපට දෙතුන් දෙනෙක් ඉන්නවයි කියලා හිතෙන්නේ නැහැ. වැඩ කටයුතු පංගුපේරුවට කරන්නෙත් නැහැ. තමන්ගේ වැඩක් හැටියට සලකා සියල්ල ඉටු කරනවා කියල.

මම දැක්කා මේ දහම් පාසලේ ලොකු, පොඩි භේදයක් නොමැතිව හැමෝම පන්සල අවට පිරිසිදු කිරීමේ යෙදිලා ඉන්නවා. කිසිම කෙනෙක් අත් බැඳගෙන බලාගෙන සිටියේ නැහැ. හැමෝම ඒ වැඩේ යෙදුණු නිසා, ටික වෙලාවකින් පන්සල් වත්තම පිරිසිදු වුණා. මේ තමයි සමූපකාරී බව. අපේ නිවසේදී, කාර්යාලයේදී. පාසලේදී හැම තැනකදීම සමූපකාරීව කටයුතු කළ හැකිනම් කොයි තරම් සතුටින් වැඩ කළ හැකිද? කොන තරම් වැඩ ප්‍රමාණයක් කළ හැකිද? පුංචිකාලේ ඉඳළම අපි සමූපකාරීව කටයුතු කිරීමට හුරු වෙමු.

ආගන්තුක සත්කාරය ගැනත් වචනයක් මතක් කරන්න ඕන. භික්ෂූන් වහන්සේලා විසින් සම්පූර්ණ කළයුතු වත් පිළිවෙත් අතර, එකක් ආගන්තුක සත්කාරය. තමන්ගේ විහාරස්ථානයට පිටින් භික්ෂු නමක් වැඩම කළවිට උන්වහන්සේ ඉදිරියට ගොස් පිළිගැනීමේ සිට, කළයුතු වතාවත් රාශියක් විනයෙහි සඳහන් වෙනවා. පාත්‍රා, සිවුරු තැබීමට තැනක් පෙන්වීම, මුව අත් පා දොවා ගැනීමට උවමනා පැන් ආදිය තැබීම, අසුන් පැනවීම, දැහැත් ගිලන්පස පිළිගැන්වීම, වැසිකිළි කැසිකිළි ඇති තැන් පෙන්වා දීම වැනි කටයුතු වැනි කටයුතු එයින් කීපයක්, බුදු හාමුදුරුවන් වහන්සේද ආගන්තුක සත්කාරය ඉතා ඉහළින් ඉටු කළ ශාස්තෘවරයෙක්. උන් වහන්සේ හමුවට පැමිණි බ්‍රාහ්මණ, අචේල, නිගණ්ඨ, පරිබ්‍රාජක වැනි අන්‍යාගමිකයන්ද ගරු සරු ඇතිව, පිළිගෙන සතුටු සාමිචි කතාවෙහි යෙදුනා.

ඒ උතුම් ගුණාංගය අද මෙතනදි මම හොඳින් දැක්කා. ප්‍රධානාචාර්ය හාමුදුරුවන් හමුවීමට කලින්, මේ දරුවන් මාව පිළිගත්තා. සංඝාවාසය වෙත කැඳවාගෙන ආවා. ලොකු හාමුදුරුවන්ට මුණ ගැසීමට සලසා දුන්නා. ඔබේ නායක හාමුදුරුවොත් ප්‍රියශීලි විදියට කතා කළා. ආසනයක් පිළියෙල කර දී ගිලන්පස පිළිගැන්වූවා. බෞද්ධ ඉගැන්වීම් හරියටම ක්‍රියාත්මක කරන දහම් පාසලකට එන්න ලැබීම සතුටට කරුණක්. හැම දහම් පාසලකම දරුවන් මේ ආදර්ශය ගන්නේ නම් අපට මහා ලොකු සතුටක්. අප බලාපොරොත්තු වෙන්නේ මේ වගේ සාරධර්මවලින් පිරුණු පිරිසක්, දහම් පාසල තුළින් බිහිවෙනවා දකින්නයි. ඔබ හැමදෙනාටම තෙරුවන් සරණයි!

**ක්‍රියාකාරකම්**

01. ඔබේ නිවසට පැමිණි ඔබ හොඳින් දන්නා ආගන්තුකයකුට කළ සත්කාර ලියන්න.
02. ''සහයෝගයෙන් වැඩකර සතුටින් දිවිගෙවමු'' මේ මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

**පැවරුම**

02. සමුපකාරී බවෙහි අගය කියවෙන කථා හෝ සිදුවීම් පිළිබඳ වාර්තා එක්රැස් කරන්න.

## 37. පාඩම

## පාළි V - ප්‍රාර්ථනා ගාථා

අ)

ඉමිනා පුඤ්ඤකම්මේන - මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා

ඉදං මේ පුඤ්ඤං - ආසවක්ඛයාවහං හෝතු
සබ්බදුක්ඛා පමුච්චතු

ප්‍රාර්ථනා ගාථා දෙක කීපවරක් ශබ්ද නගා කියවන්න. ඊට පසුව පදයෙන් පදයට අර්ථය දැන ගන්න. අර්ථාවබෝධය ලබා ගැනීමට පද පිළිවෙළ අනුව තේරුම දැන ගන්න.

ආ) පද පිළිවෙළ හැඳින ගනිමු

ඉමිනා පුඤ්ඤකම්මේන යාව නිබ්බාන පත්තියා මේ බාල සමාගමෝ මා හෝතු සතං සමාගමෝ හෝතු.

ඉදං මේ පුඤ්ඤං මෙ ආසවක්ඛය ආවහං හෝතු සබ්බදුක්ඛා පමුච්චතු

ඇ) තේරුම දැනගනිමු

මේ පින්කමෙන් මට, නිවනට පත්වනතුරු අසත්පුරුෂ ඇසුරක් නොවේවා. සත්පුරුෂ ඇසුරක් වේවා. මේ පින්කම මට නිවන් ලබාදෙන්නක් වේවා. සියලු දුකින් මිදේවා.

ඈ) පදවල තේරුම හැඳින ගනිමු.

ඉමිනා - මේ
පුඤ්ඤකම්මේන - පින් කමින්

මා - එපා (නොවේවා)

මේ - මට

බාල සමාගමෝ - බාල ඇසුරක් (අසත් පුරුෂ ඇසුරක්)

සතං සමාගමෝ - සත්පුරුෂ ඇසුරක්

හෝතු - වේවා.

යාව නිබ්බාන පත්තියා- නිවනට පැමිණෙන තෙක්/තුරු

ඉදං - මේ

පුඤ්ඤං - පින

ආසවක්ඛය - නිවන

ආවහං - කැඳවීම, ළගාකරවීම

සබ්බ දුක්ඛා - සියලු දුකින්

පමුච්චතු - මිදේවා

ඉ) ප්‍රාර්ථනා ගාථා ඇසුරින් පාලි වාක්‍ය රටා නිර්මාණය කිරීමට ඉගෙන ගනිමු.

වාක්‍ය රටා I

| | | | | |
|---|---|---|---|---|
| මේ | ඉමිනා | පුඤ්ඤ කම්මේන | මා | බාල සමාගමෝ |
| | | | | අසප්පුරිස සමාගමෝ |
| | | | | පාප සමාගමෝ |
| | | | | අධම්ම සමාගමෝ |
| | | | | අසාධු සමාගමෝ |
| අම්හාකං | | | | විසම සමාගමෝ |

වාක්‍ය රටා II

| | | | |
|---|---|---|---|
| මේ | සතං | සමාගමෝ | හෝතු |
| අම්හාකං | සත්පු | | |
| | කලයාණ | | |
| | සප්පුරිස | | |
| | සාධු | | |
| | ධම්ම | | |

වාක්‍ය රටා III

| | | |
|---|---|---|
| මේ | ආසවක්ඛයං | හෝතු |
| අම්හාකං | නිබ්බානං | |
| | චිත්තං | සමාධියතු |
| | සබ්බදුක්ඛං | විනස්සතු |
| | සබ්බ භයො | |
| | සබ්බ රෝගෝ | |

වචන මාලාව

| | | |
|---|---|---|
| අම්හාකං | - | අපට/අපගේ |
| අසප්පුරිස | - | අසත්පුරුෂයා |
| පාප | - | පව් (පව් කරන පුද්ගලයා) |
| අධම්ම | - | අධර්ම / අයහපත |
| අසාධු | - | අයහපත (අයහපතෙහි හැසිරෙන තැනැත්තා) |
| විසම | - | නරක හැසිරීම (දුශ්චරිතයන්හි හැසිරෙන තැනැත්තා) |
| සත්ථු | - | ශාස්තෘන් වහන්සේ |
| කල්‍යාණ | - | (යහපත්ව හැසිරෙන තැනැත්තා) යහපත |
| නිබ්බානං | - | නිවන |
| චිත්තං | - | සිත |
| සබ්බදුක්ඛං | - | සියලු දුක් |
| සබ්බ භයෝ | - | සියලු බිය |
| සබ්බ රෝගෝ | - | සියලු රෝග |
| සමාධියතු | - | සමාධිගත වේවා (තැන්පත් වේවා) |

## ක්‍රියාකරකම්

01. ප්‍රාර්ථනා ගාථා නිවැරදි උච්චාරණයෙන් යුතුව කට පාඩමින් කියන්න.
02. "ඉ" යටතේ ඇති වාක්‍ය රටා ලියා දක්වන්න.
03. ඒවායෙහි සිංහල අර්ථ ලියන්න.
04. මේවා පාලියට නගන්න.

(i) මේ පින්කමෙන් මට අසත්පුරුෂ ආශ්‍රයක් නොවේවා.
(ii) නිවනට පැමිණෙන තෙක් අපට සත්පුරුෂ ඇසුරම වේවා.
(iii) මෛත්‍රී භාවනාවෙන් මාගේ සිත සමාධිගත වේවා.
(iv) මේ පින්කම අපට නිවන් කැඳවන්නක්ම වේවා.
(v) අපට කල්‍යාණ මිත්‍ර ඇසුරක්ම ලැබේවා. එයින් අපගේ සියලු බිය දුරුවේවා.

# 38. පාඩම

## පාළි VI - ආරක්ෂක ගාථා

අ)

සබ්බේ බුද්ධා බලප්පත්තා - පච්චේකානඤ්ච යං බලං
අරහන්තානඤ්ච තේජේන - රක්ඛං බන්ධාමි සබ්බසෝ

ආරක්ෂාව සලසමින් පිරිත් නූල් ගැටගසන්නේ මේ ගාථාව සජ්ඣායනා කරමින්. මේ ආරක්ෂක පිරිත් ගාථාව නිවැරදිව කිහිපවරක් ශබ්ද නගා කියවන්න. ඊට පසුව පදයෙන් පදයට අර්ථය දනගන්න. අර්ථාවබෝධය ලබා ගැනීමට පද පිළිවෙළ තේරුම් දන ගනිමු.

ආ) පද පිළිවෙළ හැඳින ගනිමු

සබ්බේ බුද්ධා බලප්පත්තා (තේසංච) පච්චේකානඤ්ච අරහන්තානඤ්ච යං බලං (අත්ථි) තේන තේජේන සබ්බසෝ රක්ඛං බන්ධාමි.

ඇ) තේරුම දැනගනිමු

සියලු බුදුරජාණන් වහන්සේලා (ඤාණ) බලයට පත්වූවෝය. උන්වහන්සේලාගේද පසේ බුදුරජාණන් වහන්සේලාගේද රහතන් වහන්සේලාගේද යම් බලයක් ඇද්ද ඒ තේජසින් හාත්පසින්ම ආරක්ෂාව සලසමි.

ඈ) පදවල තේරුම හැඳින ගනිමු.

සබ්බේ - සියලු
බුද්ධා - බුදුරජාණන් වහන්සේලා

| | | |
|---|---|---|
| බලප්පත්තා | - | ඥාණ බලයට පත්වූහ. |
| පච්චේකානඤ්ච | - | (පච්චේකානං + ච) |
| | | පසේ බුදුරජාණන් වහන්සේලා |
| ච | - | ද |
| යං | - | යම් |
| බලං | - | බලය |
| අරහන්තානඤ්ච | - | (අරහන්තානං + ච) රහතන් වහන්සේලාගේ |
| ච | - | ද |
| තේජේන | - | තේජසින් (බලයෙන්) |
| සබ්බසෝ | - | හාත්පසින් |
| රක්ඛං | - | ආරක්ෂාව |
| බන්ධාමි | - | සලසමි |

**ඉ) ආරක්ෂක පිරිත් ගාථාව ඇසුරින් සරල පාලි වාක්‍ය රටා ගොඩනගමු.**

වාක්‍ය රටා I

| | | | | |
|---|---|---|---|---|
| අහං | සබ්බ බුද්ධානුභාවේන | තුය්හං | රක්ඛං | බන්ධාමි |
| | සබ්බ ධම්මානුභාවේන | | | |
| | සබ්බ සංඝානුභාවේන | | | |
| | පච්චේක බුද්ධානුභාවේන | තුම්හාකං | | |
| | අරහන්තානං අනුභාවේන | | | |
| මයං | රතනත්තයානුභාවේන | | | බන්ධාම |

වාක්‍ය රටා II

| | | | |
|---|---|---|---|
| සබ්බ බුද්ධානුභාවේන<br>සබ්බ ධම්මානුභාවේන<br>සබ්බ සංඝානුභාවේන | තුය්හං | සබ්බ දුක්ඛං | විනස්සතු |
| | | සබ්බ භයෝ | |
| | | සබ්බ රෝගෝ | |
| රතනත්තයානුභාවේන<br>ජිනසාවකානුභාවේන<br>පිටකත්තයානුභාවේන | තුම්හාකං | සබ්බන්තරායා | විවජ්ජන්තු |
| | | සබ්බූපද්දවා | හරන්තු |
| | | සබ්බගහදෝසා | |

වචන මාලාව

| | | |
|---|---|---|
| සබ්බ බුද්ධානුභාවේන | - | සියලු බුදුරජාණන් වහන්සේලාගේ ආනුභාවයෙන් |
| සබ්බ ධම්මානුභාවේන | - | සියලු ධර්මයන්ගේ ආනුභාවයෙන් |
| සබ්බ සංඝානුභාවේන | - | සියලු සංඝයාගේ ආනුභාවයෙන් |
| පච්චේක බුද්ධානුභාවේන | - | සියලු පසේ බුදුරජාණන් වහන්සේලාගේ ආනුභාවයෙන් |
| අරහන්තානං අනුභාවේන | - | රහතුන් වහන්සේලාගේ ආනුභාවයෙන් |
| රතනත්තයානුභාවේන | - | ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් |
| ජිනසාවකානුභාවේන | - | බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලාගේ ආනුභාවයෙන් |
| පිටකත්තයානුභාවේන | - | ත්‍රිපිටකයේ ආනුභාවයෙන් |

| | | |
|---|---|---|
| තුය්හං | - | ඔබට/ ඔබගේ |
| තුම්හාකං | - | තොපට/ තොපගේ |
| සබ්බ දුක්ඛං | - | සියලු දුක් |
| සබ්බ භයෝ | - | සියලු බිය |
| සබ්බ රෝගෝ | - | සියලු රෝග |
| සබ්බූපද්දවෝ | - | සියලු උපද්‍රව |
| සබ්බ ගහදෝසා | - | සියලු ග්‍රහ දෝෂ |
| විනස්සන්තු | - | විනාශවෙත්වා |
| විවජ්ජන්තු | - | දුරුවෙත්වා |
| හරන්තු | - | බැහැර වෙත්වා |

**ක්‍රියාකරකම්**

01. ආරක්ෂක පිරිත් ගාථාව නිවැරදිව සජ්ඣායනා කරන්න.
02. වාක්‍ය I රටා හා II පාලි වාක්‍ය ලියා තේරුම් ලියන්න.
03. (අ) කොටසේ සඳහන් පාලි වාක්‍යවලට ගැලපෙන සිංහල වාක්‍ය (ආ) කොටසින් තෝරාගෙන ලියා දක්වන්න.

04. පාලි වාක්‍යයට සුදුසු සිංහල වාක්‍ය ගලපන්න.

(i) අහං සබ්බ බුද්ධානුභාවේන තුය්හං රක්ඛං බන්ධාමි.
(ii) රතනත්තයානුභාවේන තුය්හං සබ්බ රෝගා විනස්සන්තු.
(iii) මයං අරහන්තානං තේජේන තුම්හාකං රක්ඛං බන්ධාම.
(iv) ජින සාවකානුභාවේන තුම්හාකං සබ්බූපද්දවා හරන්තු.

05. මේවා පාලියට නගන්න.

01. බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලාගේ ආනුභාවයෙන් ඔබගේ සියලු උවදුරු බැහැරවේවා.
02. මම සියලු බුදුරජාණන් වහන්සේලාගේ ආනුභාවයෙන් නුඹට ආරක්ෂාව සලසමි.
03. අපි රහතන් වහන්සේලාගේ තේජසින් ඔබට ආරක්ෂාව සලසමු.
04. ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් ඔබගේ සියලු රෝග විනාශ වේවා.

# 39. පාඩම

## අභිධර්මය III - අකුශල රාශිය

අන්‍යසමාන රාශියට අනතුරුව දක්වා ඇත්තේ අකුශල රාශියයි. මෙම රාශිය අකුසල සාධාරණ චෛතසික හා අකුසල චෛතසික යනුවෙන් දෙපරිදිය. මෙම චෛතසික යෙදෙන්නේ අකුශල සිත්වල පමණි. එහෙයින් ඒවා අකුසල රාශිය යනුවෙන් හඳුන්වා ඇත. අකුසල රාශියට අයත් චෛතසික හැඳිනගෙන ඉන් කීපයක් පිළිබඳ පැහැදිලි කර ගනිමු.

<u>අකුසල සාධාරණ චෛතසික 04</u>

අකුසල් සිත් දොළසකි. සෑම අකුසල් සිතකට ම අඩු නැතිව යෙදෙන
චෛතසික 04කි. ඒවාට අකුසල සාධාරණ යන නම යෙදී ඇත්තේ එහෙයිනි. එම චෛතසික හතර මෙසේය.

1. මෝහ
2. අහිරික
3. අනොත්තප්ප
4. උද්ධච්ච

<u>අහිරික චෛතසික:</u>

පාපයට ලැජ්ජා නැති ස්වභාවයයි.

**අකුසල චෛතසික 10:**

| | |
|---|---|
| 1. ලෝභ | 6. මච්ඡරිය |
| 2. දිට්ඨි | 7. කුක්කුච්ච |
| 3. මාන | 8. ථීන |
| 4. දෝස | 9. මිද්ධ |
| 5. ඉස්සා | 10. විචිකිච්ඡා |

එක් එක් අකුසල සිතකට සුදුසු පරිදි මෙම චෛතසික යෙදෙයි.

උදා:- ලෝභ සිතකට ලෝභ, දිට්ඨි ආදී චෛතසික යෙදෙන අතර දෝස සිතකට දෝසය සමග ඇතැම් විට ඉස්සා, මච්ඡරිය ආදිය ද යෙදේ.

ලෝභය:- අරමුණෙහි ඇලෙන ගතිය ලෝභයයි. රූප, ශබ්ද ආදී අරමුණු ප්‍රිය නම් සිත එම අරමුණුවල ඇලෙයි. රාගය, ආදරය, ආශාව ආදි වචනවලින් ද මේ ලෝභය අදහස් කෙරෙයි.

දිට්ඨි:- දන්දීම ආදියෙන් පින් නැත. සතුන් මැරීමාදියෙන් පව් නැත යනාදි වශයෙන් වරදවා දකින ස්වභාවය දිට්ඨියයි. මෙය මිථ්‍යා දෘෂ්ටියයි.

මාන:- අසවලාට වඩා තමා උසස්ය.
අසවලාත් තමාත් සමානය.
අසවලාට වඩා තමා පහත්ය.

යනුවෙන් තමා විසින් තමා ගැන මැන ගන්නා ගතිය මානය යි.

මෙතෙක් අප විසින් අන්‍යසමාන රාශියට අයත් චෛතසික හා අකුසල රාශියට අයත් චෛතසික පිළිබඳ සාමාන්‍ය දැනීමක් ලබාගෙන ඇත. එහෙත් එකම සිතක හෝ මෙම රාශි දෙකට අයත් චෛතසික යෙදී ඇති අයුරු මෙතෙක් අපි නොදනිමු. පහත දක්වා ඇත්තේ සිත් කීපයක මෙම රාශි දෙකට අයත් චෛතසික යෙදී ඇති ආකාරයයි.

**විරති චෛතසික 03**

1. සම්මා වාචා
2. සම්මා කම්මන්ත
3. සම්මා ආජීව

**අප්පමඤ්ඤා චෛතසික 02**

4. කරුණා
5. මුදිතා

**පඤ්ඤා චෛතසික 01**

6. පඤ්ඤා

ඉන් කිපයක් ගැන පැහැදිලි කිරීමක් පහත දැක්වේ.

| | |
|---|---|
| **සම්මා වාචා:-** | බොරු කීමෙන්, කේලාම් කීමෙන්, පරුෂ වචන කීමෙන්, හිස් වචන කීමෙන් වළකින ස්වභාවයයි. |
| **සම්මා කම්මන්ත:-** | සතුන් මැරීමෙන්, සොරකම් කිරීමෙන්, කාමයෙහි වරදවා හැසිරීමෙන් වළකින ස්වභාවයයි. |
| **කරුණා:-** | අනුන් දුකින් මුදවනු කැමති ගතිය. |
| **මුදිතා:-** | අනුන්ගේ සම්පත් ගැන සතුටුවන ස්වභාවයයි. |
| **පඤ්ඤා:-** | අරමුණ වරදවා නොගෙන ඇති සැටියෙන් දකින ස්වභාවයයි. විද්‍යාව, අමෝහය යනුද ප්‍රඥා චෛතසිකම ය. |

පහත දක්වා ඇත්තේ එක් ශෝභන සිතක් සමග ශෝභන චෛතසික යෙදෙන ආකාරයයි.

කාම ශෝභන සිත් විසිහතරට අයත් විපාක සිත් අටෙහි මුල්ම විපාක සිතෙහි චෛතසික යෙදෙන අයුරු පහත දක්වා ඇත.

සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික විපාක සිත: එහි යෙදෙන චෛතසික

| | |
|---|---|
| 1. සබ්බ චිත්ත සාධාරණ චෛතසික | 07 |
| 2. ප්‍රකීර්ණක චෛතසික | 06 |
| 3. ශෝභන සාධාරණ චෛතසික | 19 |
| 4. ප්‍රඥා චෛතසික | 01 |
| **එකතුව** | 33 |

ලෝකෝත්තර සිත්වල චෛතසික යෙදෙන අයුරු මෙසේ ය. ලෝකෝත්තර සිත් අටකි. මාර්ග සිත් 4 ඵල සිත් 4 යනුවෙනි.

1. සෝතාපත්ති මාර්ග සිත 2 එම ඵල සිත
3. සකදාගාමි මාර්ග සිත 4 එම ඵල සිත
5. අනාගාමි මාර්ග සිත 6 එම ඵල සිත
7. අර්හත් මාර්ග සිත 8 එම ඵල සිත

**සෝතාපත්ති මාර්ග සිත**
එහි යෙදෙන චෛතසික

| | |
|---|---|
| 1. සබ්බ චිත්ත සාධාරණ චෛතසික | 07 |
| 2. ප්‍රකීර්ණක චෛතසික | 06 |
| 3. ශෝභන සාධාරණ චෛතසික | 19 |
| 4. විරති චෛතසික | 03 |
| 5. ප්‍රඥා චෛතසික | 01 |
| **එකතුව** | **36** |

අනිකුත් ලෝකෝත්තර සිත් හතෙහි ද මෙම චෛතසික 36ම යෙදෙයි.

**ක්‍රියාකාරකම්**

01. සම්මා වාචා, සම්මා කම්මන්ත යන චෛතසික දෙක පිළිබඳ වෙන වෙනම හැඳින්වීම් ලියන්න.
02. කාය, චිත්ත යන වචන යුගලය යෙදී සැදී ඇති ශෝභන චෛතසික දොළහ නම් කරන්න.

දහම් පාසල් සිසුන් සඳහා
නොමිලයේ
බෙදාදීම පිණිසයි

ඩිපීස්කෑන් සිකියුර් ප්‍රින්ට් සොලුෂන්ස් (පුද්ගලික) සමාගම